# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 592 — 1990 ජනවාරි 05 වැනි සිකුරාදා — 1990.01.05

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස — පළාත් පාලනය

([illegible])



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | — | අය වැය ලේඛන ... ... ... | — |
| [illegible] ... ... ... | — | [illegible] ... ... ... | — |
| පළාත් පාලන සභා [illegible] දැන්වීම ... ... | — | [illegible] දැන්වීම ... ... ... | — |
| ආදායම් හා වියදම් ප්‍රකාශන ... ... ... | — | විවිධ දැන්වීම ... ... ... | 9 |



[illegible] ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම [illegible]

ගැසට් පත්‍රයේ සෑම කොටසකටම [illegible] 12.00 [illegible]

ගැසට් පත්‍රයේ පළ කිරීම [illegible] 1990 ජනවාරි 12 වන දින පළ කෙරෙන ගැසට් පත්‍රයට [illegible] දැන්වීම, 1989 දෙසැම්බර් 29 දින දහවල් 12.0 [illegible] මුද්‍රණාලයට ලැබිය යුතුයි.

නෙවිල් [illegible],
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1989 දෙසැම්බර් මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

[illegible] ප්‍රාදේශීය සභාව

[illegible] වාහන බදු [illegible] —1990 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා [illegible] උපලේඛනයේ සඳහන් [illegible] 1990 වර්ෂය [illegible] 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් [illegible] 1990 [illegible] 31 [illegible] මෙයින් දැනුම් දෙනු ලැබේ.

[illegible]
විශේෂ [illegible]
[illegible] ප්‍රාදේශීය [illegible]

1989 දෙසැම්බර් මස 18 දින,
[illegible] ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

| | රු. ශත |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ත්‍රීරෝද රථයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, එක් විස්සොවෙක්, බයිසිකලයක් හෝ | |
| ත්‍රිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම: | 25 |
| (1) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18 |
| (2) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 |
| සෑම කරත්තයක් සඳහාම | 20 |
| සෑම විස්සොවක් සඳහාම | 7 50 |
| සෑම අශ්වයෙකු ඇත්තියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 |
| සෑම ගොනෙකු සඳහාම | 50 |

1-72/2

---

මහර ප්‍රාදේශීය සභාවේ අංක 03 උප කාර්යාලය, මල්වානබිම්බිටිය—මුත්පිටිය

1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍රදීමේ පනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් [illegible] නම් ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයේදී පවත්වාගෙන යාම සඳහා 1990 වර්ෂයට බලපත්‍ර [illegible] ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බැවින් 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 6 වන වගන්තියෙන් [illegible] මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අදාළ හෝ එකී [illegible] සඳහා [illegible] මලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් [illegible] 04 ක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් [illegible] ඉදිරිපත් [illegible] දන්වා සිටිනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | සමාජශාලාව සහාධිපති, කළමනාකරුගේ නාමය | සමාජශාලාවේ නම | සමාජශාලාව නම කරවුනු කාර්යාලය, බලපත්‍රය දෙනු ලබන ස්ථානය |
|---|---|---|---|
| පී. ආර්. ඒ. [illegible], අංක 65, මල්වාන බිම්බිටිය, මුත්පිටිය | [illegible] | එකමුතු ක්‍රීඩා සමාජය | අංක 1/26, මල්වානබිම්බිටිය, මුත්පිටිය |

පී. ආර්. කළුආරච්චි,
විශේෂ කොමසාරිස්,
මහර ප්‍රාදේශීය සභාව.

1989 දෙසැම්බර් මස 20 දින,
අංක : 03, ප්‍රාදේශීය උප කාර්යාලය,
මල්වානබිම්බිටිය,
මුත්පිටිය.

1-70

---

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

පළාත් පාලන ආයතන (පොදු ආදායම් අනුරූ විධිවිධාන) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදායම් අනුරූ විධිවිධාන) පනතේ (261 අධිකාරිය) 3 වන වගන්තිය යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරගෙන ඇති පහත සඳහන් නිර්දේශ එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

නිර්දේශය—පළාත් පාලන නිර්ධන හා ඉදිකිරීම් [illegible] 1988 අගෝස්තු 23 වැනි දින අංක 580/7 දරන [illegible] පොදු ආදායම් අනුරූ [illegible] 1 වැනි කොටසේ [illegible] 11 වැනි කොටසේ 1—42 [illegible] රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ විශේෂ කොමසාරිස් එල්. ඩී. ඒ. ඩී. කෝරලගේ වන මම පළාත් පාලන ආයතන (පොදු ආදායම් අනුරූ විධිවිධාන) පනතේ (261 වන අධිකාරය) 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශය කරමි.

එල් ඩී. ඒ. ඩී. කෝරලගේ,
විශේෂ කොමසාරිස්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

1989 දෙසැම්බර් මස 06 වෙනි දින,
රුවන්වැල්ල,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1-107

1990.01.05


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 520/7 — 1988 අගෝස්තු 23 වැනි අඟහරුවාදා — 1988.08.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස — පළාත් පාලනය

## අතුරු ව්‍යවස්ථා

**1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ මෙහි පහත දක්වා ඇති කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා එම වගන්තිය අනුව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 ( ) වගන්තිය සමග කියවිය යුතු 122 සහ 126 වන වගන්තිවලින් ප්‍රාදේශීය සභාවලට බලය ලැබී ඇති අතර, එම අතුරු ව්‍යවස්ථා ඉහත කී 2 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමට බලය දෙනු ලැබේ.

1988 අගෝස්තු මස 17 දින,
බත්තරමුල්ලේ දී.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

### අතුරු ව්‍යවස්ථා

### I වන කොටස

සියලු සම්මත අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපණය කිරීමට අදාළ අතුරු ව්‍යවස්ථා.

මේ සම්මත අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපණය කිරීමේ දී ප්‍රාදේශීය සභාවක් විසින් යථා පරිදි පිළිගනු ලැබූ යම් සම්මත අතුරු ව්‍යවස්ථාවක සඳහන් ''ප්‍රාදේශීය සභා'' ''සභාපතිවරයා'' ''ලේකම්වරයා''; සහ ''ප්‍රාදේශීය සභා ප්‍රදේශය'' යන යෙදුම්වලින් පිළිවෙළින් ඒ ප්‍රාදේශීය සභාව, ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා, ඒ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සහ ඒ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය අදහස් වන්නේය.

### II වන කොටස

#### උකස් ලියාපදිංචි කිරීම

1. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි, කිසියම් නිශ්චල දේපළක සෑම උකස් ලාභියකු විසින් ම හෝ, කිසියම් මියගිය උකස් ලාභියකුගේ කිසියම් උරුමක්කාරයකු හෝ නැතහොත් නීත්‍යානුකූල නියෝජිතයකු විසින්, එවැනි යම් උකසක් ප්‍රාදේශීය සභා කාර්යාලයෙහි ලියාපදිංචි කිරීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේ ය.

2. ප්‍රාදේශීය සභා කාර්යාලයෙහි උකසක් ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු විසින්ම,—

(අ) උකස් ලාභියාගේ හෝ උකස් ලාභියා මියගිය අයකු නම්, ඔහුගේ කිසියම් උරුමක්කාරයකුගේ හෝ නැතහොත් නීත්‍යානුකූල නියෝජිතයාගේ නම සහ ලිපිනය ;

(ආ) උකස්කරුගේ නම සහ ලිපිනය ; සහ

(ඇ) දේපළ පිළිබඳ විස්තරයක් හා දේපළ හඳුනා ගැනීම පිණිස අවශ්‍ය විය හැකි තොරතුරු,

දක්වෙන ප්‍රකාශයක්, (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කරනු ලැබිය යුතු ය.

3. 2 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශයක් ලැබී, ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා නියම කරනු ලබන ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබූ විට, සභාපතිවරයා විසින්, නම් සහ ලිපිනයන් ද අවශ්‍ය විස්තර ද ප්‍රාදේශීය සභා කාර්යාලයෙහි ඒ සඳහා තබා ඇති ලේඛනයක ඇතුළත් කිරීමට සලස්වනු ලැබිය යුතුය.

4. මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, යම් උකසක් සහ නම් සහ ලිපිනයන් ලියා පදිංචි කර ඇත්තේ යම් දේපලක් වෙනුවෙන් ද, ඒ දේපළ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු වරිපනම්, බදු හෝ ගාස්තු කිසිවක් අය කිරීම, ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තහනමට ගැනීමක දී එම දේපළ විකිණීම සඳහා දැන්වීම පල කිරීමට යටත් පිරිසෙයින් දින දහයක් ගතවීමට පෙර, තහනමට ගැනීම, විකිණීම සඳහා නියම කරන ලද දිනය, සහ තහනමට ගන්නා කරනු ලැබූ යම් මුදලක් අයකර ගැනීම සඳහා ද ? ඒ මුදල සඳහන් ලියවිල්ලකින් වූ දැන්වීමක්, සභාපතිවරයා විසින් නම් සහ ලිපිනයන් ලියා පදිංචි කර ඇති තැනැත්තා වෙත හෝ තැනැත්තන් වෙත භාර දීම හෝ තැපෑලෙන් යැවීම හෝ කරනු ලැබිය යුතුය.

5. විකිණීමට පෙර යම් අවස්ථාවක, 4 වන අතුරු ව්‍යවස්ථාව යටතේ භාර දෙන ලද දැන්වීමෙහි සඳහන් මුදල ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබුවහොත්, එම දේපළ තහනමින් මුදා හරිනු ලැබේ.

6. මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, නීතිඥ අධිකරණයක් විසින් එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සිය පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතුය.

## 2. ප්‍රසිද්ධ මාවත් භාවිතයට ගැනීම

1. ප්‍රාදේශීය සභාවට අයත් වූ හෝ ප්‍රාදේශීය සභාව භාරයේ තිබෙන්නා වූ හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් තුළ පිහිටි, විවෘත භූමි භාග හෝ මහජනයාගේ විනෝදය සඳහා වූ ස්ථාන හෝ කිසිවක්, (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවෙහි සභාපතිවරයාගේ ලියවිල්ලකින් වූ අවසරය නොමැතිව, සභාපතිවරයා විසින්, ප්‍රසිද්ධ දැන්වීමක් මගින් තහනම් කරනු ලැබූ යම් කාර්යයක් සඳහා පාවිච්චි කරනු නොලැබිය යුතුය.

2. (අ) එවැනි ස්ථානයක් ප්‍රයෝජනයට ගන්නා කිසිම තැනැත්තකු විසින් එහි බාධා ඇති කිරීම හෝ, එය නීත්‍යානුකූලව ප්‍රයෝජනයට ගන්නා වෙනත් තැනැත්තෙකුට වූ අවහිර වන ආකාරයෙන් එහි හැසිරීම හෝ කරනු නොලැබිය යුතුය. එවැනි ස්ථාන, ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන රීතිවලට අනුව, යහපත් හැසිරීමෙන් යුතුව පාවිච්චි කිරීමේ කොන්දේසිවලට යටත්ව, පෙරවරු 7 සිට පස්වරු 6 දක්වා කාලය තුළ දී මහජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘතව තබනු ලැබේ.

(ආ) වැව්, පොකුණු, හෝ ජල මූලාශ්‍ර පිහිටා ඇති යම් භූමි භාගයක් හෝ ස්ථානයක් ප්‍රයෝජනයට ගන්නා කිසිම තැනැත්තකු එම වැව් පොකුණෙහි හෝ ජල මූලාශ්‍රයෙහි නෑම හෝ එහි ජලය අපවිත්‍ර වන ආකාරයකට, වෙනත් යම් දෙයක් කිරීම හෝ නොකළ යුතුය.

(ඇ) එවැනි භූමි භාගයක් හෝ ස්ථානයක් ප්‍රයෝජනයට ගන්නා කිසිම තැනැත්තකු විසින් එහි කිසියම් කණුවක් ගිලී කිරීම හෝ එහි වැවෙන පැළෑටි හෝ මල් සභාපතිවරයාගේ අවසරය නොමැතිව කඩා ගැනීම හෝ, එහි වැවෙන ගස්වලට සහ පඳුරුවලට කිසියම් හානියක් සිදු කිරීම හෝ කරනු නොලැබිය යුතුය.

3. (අ) එවැනි භූමි භාගයක හෝ ස්ථානයක හෝ ප්‍රාදේශීය සභාව විසින් සපයන ලද ආසනයක් කිසිම තැනැත්තකු නිදා ගැනීමේ කාර්යය හෝ කාර්යයක් සඳහා පාවිච්චි නොකළ යුතු අතර, කිසිම තැනැත්තකු, එවැනි ආසන මත නැගී සිටීම හෝ එවැනි ආසනවලට හානි කිරීම හෝ අවහිර කිරීම හෝ නොකළ යුතුය.

(ආ) කිසියම් ආසාදන රෝගයකින් පෙළෙන්නා වූ කිසිම තැනැත්තකු එවැනි යම් ආසනයක් පාවිච්චි නොකළ යුතුය.

4. කිසිම තැනැත්තකු විසින්, යම් මුදු ඉඩමකින් හෝ පොදු ඉඩමකින් හෝ වැලි, පස්, ගල් හෝ වැවෙන්නාවූ පැළෑටි හෝ ගස් කිසිවක් ඉවත් ගෙන යාම හෝ එවැනි භූමියක මතු ස්වරූපය වෙනස් කිරීම හෝ විරූප කිරීම කරනු නොලැබිය යුතුය.

5. ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකුම, වරදක් කරන අතර, අධිකරණය විසින් එසේ වරදක් කරනු ලැබූ දී රුපියල් පන්සිය පනහකට නොවැඩි දඩයකට මතු යටත් විය යුතුය.

## 3. වාහන යානාදිය ධාවනය කරවීම

ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත වූ මාර්ගවල හෝ වීදිවල කිසියම් රිය කැදිරියක්, කරත්තයක්, ට්‍රයිෂෝවක්, අත් කරත්තයක්, බිල් බැරෝවක්, තල්ලු ත්‍රිසිකලයක්, වෙලෝසිපීඩයක්, මෝටර් රථයක්, මෝටර් ලොරියක්, මෝටර් සයිකලයක්, හෝ වෙනත් යම් වාහනයක් ධාවනය කර ඇදගෙන යන, තල්ලු කරගෙන යන, පැදගෙන යන හෝ, එවැනි වාහනයක් භාරව සිටින හෝ යම් අශ්වයකු නැතහොත්, වෙනත් යම් සතකු ගෙන යන තැනැත්තෙක් එවැනි සතකු පිට නැගී යන හෝ සෑම තැනැත්තකුම වෙනත් වාහනයක් හෝ සතකු පසුකර යන විටක හැර, මාර්ගයේ වම් පසින් පාරේ වමට ආසන්නයෙන් හෝ එසේ ගෙන යාම කළ යුතුය. එසේ පසුකර යන විට, එම තැනැත්තා විසින් එකී වාහනයට හෝ සතාට දකුණු පසින් ගොස් ඉක්මවන පැත්තෙන් එය පසුකර ගොස්, පාරේ වමට හෝ වම් පස ආසනයට වාහනය ආපසු පැමිණිය යුතුය.

2. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් වීදියක හෝ මාර්ගයක කිසියම් කාල සීමාවක් සඳහා භාණ්ඩ බර පැටවීම අවශ්‍ය වන ඉහත සඳහන් රිය කැදිරියක් කරත්තයක්, ට්‍රයිෂෝවක් හෝ වෙනත් වාහනයක් සහ සෑම අශ්වයකුම හෝ වෙනත් සතකුම හැකිතාක් දුරට පාරේ අයිනට හෝ තබා කර හෝ තැබිය යුතු අතර වාහනයක් සම්බන්ධයෙන් වූ විට, එම යතිය මාර්ගයට සමාන්තරව තිබිය යුතුය. එසේ වුවද රිය කැදිරි ට්‍රයිෂෝ වෙනත් වාහන භාණ්ඩ බර පැටවීමේ ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් නියම කරන ලද යම් ස්ථානයකට හෝ නැවතුම් පොළකට මිස නොතැබිය යුතුය.

3. ත්‍රිවිල ආධාරය නොමැති කදින් යුත් යම් කරත්තයක්ම පිටුපට කරත්තය පැදවීමේ දී හැකිතාක් දුරට කරත්තය යන්නාවූ දිශාවට සමාන්තරව තබා ගත යුතුය. පා තබනයේ මට්ටමට වැඩි මට්ටමකින් මිනුම් කළ යුතු හෝ යටින් හෝ දක්වා ගෙන යාම නොකළ යුතු. කරත්තයක් යන දිශාවට යන්නාවූ කිසියම් පසින් කරත්තයක් භාණ්ඩ බර කර තිබෙනවිට, එය අනිකුත් යාම හෝ පසුකර යාමට නැත් කිරීමට ප්‍රමාණය ඉඩ හරින්නා කරත්තය මාර්ගයට පාඩු නොවන පරිදි භාණ්ඩ නොකළ යුතුය.

4. සෑම මෝටර් බස් රථයකම, මෝටර් ලොරියකම හෝ මෝටර් රථයකම රියදුරු එය ධාවනය කිරීමේ දී හැකිතාක් දුරට එම මෝටර් ලොරිය හෝ මෝටර් රථය ගමන් කරන්නා වූ දිශාවට මාර්ගයේ වම් පැත්තේ අයිනෙන් එම මෝටර් බසය, මෝටර් ලොරිය හෝ රථය පැදවිය යුතු අතර, විරුද්ධ දිශාවට යන්නාවූ වෙනත් වාහනයක් භාණ්ඩ බර කර තිබෙනවිට හෝ එය පැයකට සැතපුම් 10කට අඩු වේගයකින්, ධාවනය වෙනවිට හෝ මිස, මෝටර් බසයක මෝටර් ලොරියක හෝ මෝටර් රථයක කිසිම රියදුරකු ඒ අනෙක් වාහනය පසුකර යාම හෝ පසුකර යාමට උත්සාහ කිරීම හෝ නොකළ යුතුය.

5. කුලියට මගීන් ගෙනයාම සඳහා ධාවනය කරන මෝටර් රථයක රියදුරු, මෝටර් රථ නතර කිරීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සකස් කරනු ලැබ ඇති රැඳවුම් පොළක හෝ නැවතුම් පළක හැර, කිසිම මෝටර් රථයක් නතර නොකළ යුතුය. එවැනි නැවතුම් පළක කිසි මෝටර් රථයක් නතර කළහොත් එම නැවතුම් පළෙහි ඉඩ ඇති විටදී සහ ඊට යාබදව අවශ්‍ය වේලාවට වඩා දිගු වේලාවක් එය නතර කර තබා නොගත යුතුය.

6. සෑම වාහනයකම රියදුරු පහත දැක්වෙන ක්‍රමවලට අනුකූලව වාහන ගමනා ගමනය පාලනය කිරීම සඳහා යොදා ගනු ලබන මාර්ග ආලෝක සංඥාවලට අවනත විය යුතුය.

(1) මෙහි මින්මතු ''නතර කිරීමේ රේඛාව'' යනුවෙන් හඳුන්වනු ලබන සුදු රේඛාවක් මාර්ගයේ කිසියම් කොටසක් හරහා ඇඳ සෑම ආලෝක සංඥාවකටම අනුබද්ධව සපයා ඇත.

(2) සංඥා මගින් පාලනය කිරීමට අදහස් කරන්නේ යම් දිශාවකට එන වාහන පේළියක්ද ඒ වාහන පේළියට මුහුණලා පහත දැක්වෙන ආලෝක හෝ සංඥා එකක් හෝ වැඩි ගණනක් සංඥා දීමේ කාර්යය සඳහා උපයෝගී කරගනු ලැබේ.

(i) පහතින් කළුවෙහි ''නවතිනු'' යන වචනය සහිත රතු ආලෝකයක්.

(ii) කහ ආලෝකයක්.

(iii) පහතින් කළුවෙහි ''යනු'' යන වචනය සහිත කොළ පැහැති ආලෝකයක්.

(iv) ආලෝකමත් කළ කොළ පැහැති ඊතලයක්.

(3) වර්ණ ආලෝක දැක්වෙන ඉහත සඳහන් පහන් හෝ සංඥා සිරස් අතට තිබෙන අතර, රතු ආලෝකය දැක්වෙන පහන ඉහළින්ම ද කොළ පැහැති ආලෝකය දැක්වෙන පහන පහළින්ම ද ඇත.

(4) වාහන ගමනා ගමනය පාලනය කිරීමේ කාර්යය සඳහා, සංඥා ආලෝක දක්වෙන අනුපිළිවෙළ මෙසේය :—

(අ) රතු, හෝ කොළ පැහැති ඊතලය සහ රතු පැහැය එක විට ;

(ආ) කහ පැහැය සහ රතු පැහැය එක විට ;

(ඇ) කොළ පැහැය ;

(ඈ) කහ පැහැය ;

(5) ඉහත කී ආලෝක සංඥාවල වැදගත්කම පහත දක්වෙන පරිදි වේ :—

(අ) රතු සංඥාවෙන් අදහස් වන්නේ, (ආ) ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර, කොළ පැහැති ආලෝකය දක්වෙන තුරු නතර කිරීමේ රේඛාවෙන් ඔබ්බට කිසිදු වාහන ගමනා ගමනයක් සිදු නොවිය යුතු බවයි.

## 4. වීදිවල දේශන පැවැත්වීම

1. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත් අවසර පත්‍රයක් ප්‍රකාර සහ ඒ අවසර පත්‍රයෙහි නිශ්චිත කාලපරිච්ඡේදයක් සහ සීමා කිරීම් ඇතුළත මිස, කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභාවේ සීමා ඇතුළත යම් රථ වාහන පිරිසකට හෝ සමූහයකට හෝ දේශන කිරීම හෝ කථා පැවැත්වීම හෝ යම් රැස්වීමක් හෝ කැඳවනු නොලැබිය යුතුය.

2. මේ අතුරු ව්‍යවස්ථාව කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, යම්කිසි අධිකරණ බලය ඇති අධිකරණයක දී වරදකරු කරනු ලැබූ විට, රුපියල් සිය පණහකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

## 5. අවහිර කිරීම සහ අලුතු ඇදාගැනීම

1. ප්‍රාදේශීය සභා සීමා තුළ පිහිටි යම් ගොඩනැගිල්ලක්, වීදියක් හෝ යම් මුඩු ඉඩමක් හෝ වෙනත් භූමියක් හෝ ස්ථානයක් නැතහොත් යම් වීදි රේඛාවක් නිසි අවසරය නොලබා වෙනස් කර ඇති විට (මෙහි මින් මතු ''සභාපතිවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පෙනී යන අවස්ථාවක එම ගොඩනැගිල්ල හෝ කොටු කිරීම ඉදිකර තිබෙන හෝ අවහිරය හෝ අලුතු ඇදා ගැනීම සිදු කර තිබෙන ඉඩමෙහි හෝ වීදි රේඛාව වෙනස් කිරීම සිදු කර ඇත්තේ යම් ඉඩමක් තුළින් හෝ මත්තෙහි ද ඒ ඉඩමෙහි හෝ ස්ථානයෙහි අයිතිකරු යයි කියා සිටින්නාට හෝ හිමිකම් පාන්නාට, එම තැනැත්තාගේ හිමිකම් පැවට පදනම් වන සෑම ඔප්පුවක්ම, ලේඛනයක්ම සහ සාධක පත්‍රයක්ම ද, එම ස්ථානයේ යම් පිඹුරක් වේ නම්, ඒ පිඹුරද ඉදිරිපත් කරන ලෙස, එම සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් ඉල්ලා සිටිනු ලැබීම නීත්‍යානුකූල වන්නේය. එම ඉඩමෙහි හෝ ස්ථානයෙහි පදිංචිකරු එහි අයිතිකරු නොවේ නම්, එහි අයිතිකරුගේ නම සහ වාසය කරන ස්ථානය පිළිබඳව සම්පූර්ණ තොරතුරු සපයන ලෙස සභාපතිවරයා විසින් ඉල්ලීමක් කර දින දහයක් ඇතුළත දී ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සැපයීමට ඒ පදිංචිකරු බැඳී සිටින්නේය. එසේ අයිතිකරු යයි කියනු ලබන තැනැත්තා විසින්, එකී ඉඩම හෝ ස්ථානය සම්බන්ධයෙන් තම හිමිකම් පැවට පදනම් වන සෑම ඔප්පුවක්ම, ලේඛනයක්ම, සහ සාධක පත්‍රයක්ම, එකී ඉඩමේ හෝ ස්ථානයේ පිඹුරක් ඇත්නම් එයද, සභා ඉදිරිපත් කරන ලෙස, සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබීමෙන් ඉක්බිති දින දහයක් ඇතුළත දී ඒවා තමන් සන්තකයෙහි තිබේ නම් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එවැනි ඔප්පුවක්, ලේඛනයක්, සාධක පත්‍රයක් හෝ පිඹුරක් තම සන්තකයෙහි නොතිබේ නම්, ඒවා කවුරුන් සන්තකයෙහි තිබෙන්නේ දැයත්, ඉහත සඳහන් දින දහයේ කාල සීමාව ඇතුළත, සභාපතිවරයා වෙත ඔහු දන්වා සිටිය යුතුය. එවැනි යම් ඔප්පුවක්, ලේඛනයක් සාධක පත්‍රයක් හෝ පිඹුරක් සන්තකව සිටින සෑම තැනැත්තකුම, ඒවා ඉදිරිපත් කරන ලෙසට සභාපතිවරයා විසින් ලියවිල්ලකින් ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු දින දහයක් ඇතුළත දී ඒවා ඉදිරිපත් කිරීමට බැඳී සිටින්නේය.

2. ඉහතින්ම වන වගන්තියෙහි සඳහන් ඔප්පු, ලේඛන, සාධක පත්‍ර සහ පිඹුරු ඒවා අදාළ වන ස්ථානයේ දී හෝ සභාපතිවරයා විසින් නියම කරනු ලබන වෙනත් ස්ථානයකදී හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතුය. ඒවා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට ඉහතින්ම වූ වගන්තියෙන් දී ඇති බලයට, අවශ්‍ය වන පරිදි එම ඔප්පු, ලේඛන, සාධක පත්‍ර සහ පිඹුරු පරීක්ෂා කිරීමේ සහ ඒවායේ පිටපත් ගැනීමේ බලයද ඇතුළත් වන ලෙස සැලකිය යුතුය. සභාපතිවරයා විසින් එම ඔප්පු ලේඛන, සාධක පත්‍ර සහ පිඹුරු පරීක්ෂා කරනු ලැබීමට සහ ඒවායේ පිටපත් ගනු ලැබීමට අදාළ සෑම තැනැත්තකුම ඉඩ දිය යුතු අතර එම කාර්ය සඳහා පිටපත් ගැනීම පිණිස අවශ්‍ය වන කාල සීමාවකට, එම ඔප්පු, ලේඛන, සාධක පත්‍ර සහ පිඹුරු සභාපතිවරයා විසින් රඳවා ගනු ලැබිය හැකිය.

3. යම් ගොඩනැගිල්ලක් හෝ කොටු කිරීමක් ඉදිකර ඇත්තේ හෝ අලුතු ඇදාගැනීමක් හෝ 1 වන අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ආකාරයේ වීදි රේඛාවේ වෙනසක් හෝ සිදුකර ඇත්තේ හෝ යම් ඉඩමක්, ස්ථානයක් හෝ පරිශ්‍රයක් මත ද ඒ ඉඩමට, ස්ථානයට සහ පරිශ්‍රයට සහ පරීක්ෂා කිරීම හෝ මැනීම අවශ්‍ය යයි සභාපතිවරයා සිතන වෙනත් යම් ඉඩමකට සහ පරිශ්‍රයකට, එහි පදිංචිකරු වෙත සාධාරණ දැනුම් දීමක් කිරීමෙන් පසුව, සභාපතිවරයා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ වෙනත් තැනැත්තකු ඇතුළු වීම ද, එම ගොඩනැගිල්ල, කොටු කිරීම, අවහිරය, නැතහොත් අලුතු ඇදා ගැනීම හෝ කනුව පවතින නැතහොත් සභාව සතු මාර්ගය තිබෙන යම් වීදියකින් හෝ ඉඩමකින් හෝ ස්ථානයකින් කළ අලුතු ඇදා ගැනීමක් ද එසේ නැත්නම් වීදි රේඛාව ඇත්ත වශයෙන්ම වෙනස් කර තිබේද යන්න සභාපතිවරයාට නිශ්චය කර ගත හැකි වීම සඳහා අවශ්‍ය පරීක්ෂණ සහ මැනුම්, ඒ පිළිබඳ ඉඩම ස්ථාන හෝ පරිශ්‍ර සම්බන්ධයෙන් කිරීම ද නීත්‍යානුකූල වන්නේය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ යම් නඩු කටයුත්තක දී සභාපතිවරයාගේ බලය පිට සාදන ලද කිසියම් සිතියමක් හෝ සැලැස්මක් යන්නෙහි ? ඉදිරිපත් කරනු ලැබුවහොත්, එහි සඳහන් කරුණු, සම්බන්ධයෙන් පවතින තත්ත්වයක් පිළිබඳව සත්‍යයක සාක්ෂි සාධනය කරනු ලැබුවහොත් මිස, තීරණාත්මක සාක්ෂි විය යුතුය.

5. ඉතා කී ගොඩනැගිල්ල කොටු කිරීම හෝ අවහිරය, සභාව සතු වී පවතින නැතහොත් සභාව භාරයේ තිබෙන යම් වීදියකට අයත් ඇඳා ගැනීමක් ලෙස හෝ නිසි අවහිරය නොමැතිව වීදි රේඛාව වෙනස් කර ඇති බවහෝ එවැනි ඇනීමකින් හෝ පරීක්ෂණයකින් පසුව සභාපතිවරයාට පෙනී ගියහොත් එම ගොඩනැගිල්ල හෝ කොටු කිරීම ඉදිකර ඇත්තා වූ හෝ අවහිරය හෝ අලුතු ඇඳා ගැනීම හෝ වෙනස් කිරීම සිදුකර ඇත්තා වූ හෝ දූවමෙහි යෙහි පරිශ්‍රයෙහි අයිතිකරු නැතහොත් පදිංචිකරු යයි කියනු ලබන තැනැත්තා වෙත සභාපතිවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් කරනු ලැබීමෙන්, සභාපති වරයාගේ බලය පිට, එම පරිශ්‍රයෙහි හෝ ස්ථානයෙහි මැනීමක් කර ඇති බවත්, එම දැන්වීමෙහි සඳහන් ස්ථානයක දී අයිතිකරු නැතහොත් පදිංචිකරු යයි කියනු ලබන තැනැත්තාට එය පරීක්ෂා කිරීම සඳහා විවෘතව ඇති බවත්, නැතහොත් සභාවේ නිලධාරියකු මගින්, කිසියම් නියම කරගත් වේලාවක දී එය අලුතු ඇඳා ගැනීම හෝ වෙනස් කිරීම ඔහු වෙත පෙන්වා දීමට සැලැස්වීමට සභාපතිවරයා සූදානම් බවත් එම ඉඩමට හෝ පරිශ්‍රයට ඇති සහ අයිතිය තහවුරු කිරීම සඳහා සහ එවැනි යම් ගොඩනැගිල්ලක් කොටු කිරීමක්, අවහිරයක් හෝ අලුතු ඇඳා ගැනීමක් ඉවත් කිරීම හෝ නීති විරෝධී ලෙස වෙනස් කර ඇති පූර්ව වීදි රේඛාව පුනස්ථාපනය කිරීම හෝ වැලැක්වීම සඳහා එම දැන්වීම බාරදී මාසයක් ඇතුළත එම තැනැත්තා විසින් හෝ ඔහු එය දරන්නේ හෝ එයට හිමිකාර පාන්නේ යම් තැනැත්තකු යටතේ ද, ඒ තැනැත්තා විසින් හෝ නීති කටයුතු කරනු ලැබුව හොත් මිස, ඒවා ඉවත් කිරීමට හෝ එය ප්‍රතිස්ථාපනය කිරීමට ලෙස එකී සභාපතිවරයා කටයුතු කර ගෙන යන බවත්, දන්වා සිටිය යුතුය. නියම කරන ලද කාලය තුළ එසේ නීති කටයුතු කරනු නොලැබුව හොත් හෝ හිමිකාරී ඔප්පු කරනු නොලැබුව හොත් හෝ, නීති කටයුතු කරනු ලැබුවද නිසි ලෙස පවත්වාගෙන යනු නොලැබුව හොත්, එම අයිතිකරු යැයි හෝ පදිංචිකරු යැයි කියනු ලබන තැනැත්තා වෙත සභාපතිවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම දැන්වීමෙහි සඳහන් කාලය තුළදී එම ගොඩනැගිල්ල, කොටු කිරීම, අවහිරය හෝ අලුතු ඇඳා ගැනීම ඉවත් කරන ලෙස හෝ, නීති විරෝධී ලෙස වෙනස් කර ඇති පූර්ව වීදි රේඛාව පුනස්ථාපනය කරන ලෙස හෝ නියම කරනු ලැබිය හැකිය. සඳහන් කර ඇති කාලය ඇතුළත එම අයිතිකරු යැයි හෝ පදිංචිකරු යැයි හෝ කියනු ලබන තැනැත්තා විසින්, එම නියමය අනුව කටයුතු කිරීම පැහැර හැරියහොත් ඔහු වරදක් කරන අතර, සභාපතිවරයා විසින් එම ගොඩනැගිල්ල, කොටු කිරීම, අවහිරය නැතහොත් අලුතු ඇඳා ගැනීම ඉවත් කිරීමට සැලැස්විය යුතුය. නැතහොත් වෙනස් කරන ලද වීදි රේඛාව කලින් පැවැති වීදි රේඛාව වන පරිදි පුනස්ථාපනය කළ යුතුය. තවද එවැනි වෙනස් කිරීමක් හෝ පුනස්ථාපනය කිරීමක් ක්‍රියාත්මක කිරීම සඳහා සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු යම් ඕනෑම ගොඩනැගිල්ලකට, වෙන්තකට කොටු කිරීමකට, හෝ වෙනත් පරිශ්‍රයකට ඇතුළු වීම ද, අවශ්‍ය තැනැත්තන් සහ උපකරණ සහ දේවල් සමග ඒවා තුළට ඇතුළු වීමට සැලැස්වීම ද, නීත්‍යානුකූල වන්නේය. ඒ වෙනුවෙන් දරන ලද වියදම් එම ගොඩනැගිල්ල අවහිරය අලුතු ඇඳා ගැනීම හෝ වීදි රේඛාවේ වෙනස් කිරීම, ඉදිකරන ලද්දේ නැතහොත් සිදු කරන ලද්දේ යම් ඉඩමක හෝ පරිශ්‍රයක ද එම ඉඩමෙහි හෝ පරිශ්‍රයෙහි අයිතිකරු ලෙස හිමිකාරී පාර්ශ්ව විසින්, ගෙවනු ලැබිය යුතු අතර, ඒවා මේ පනත යටතේ ප්‍රාදේශීය සභාව විසින් අය කරනු ලැබිය හැකි ලෙස නියමිත වියදම් ලෙස නිගමනය කොට තීරණය කර අය කර ගනු ලැබිය යුතුය.

6. මේ අතුරු ව්‍යවස්ථා වලින් කිසිවක් කඩ කිරීම සම්බන්ධයෙන් රුපියල් පන්සිය පණසකට වැඩි නොවන දඩයක් පැනවීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු අතර කඩ කිරීම දිගටම කරගෙන යන විටක, අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ කඩ කිරීම පිළිබඳව අවධානය යොමු කරවමින් සභාපතිවරයා විසින්, හෝ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද යම් නිලධාරියකු විසින් හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව, කඩ කිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් පනස් පණසක් නොඉක්මවන අතිරේක දඩයකින් ද දඬුවම් ලැබිය යුතුය.

## 6. වාහන නතර කර තැබීම

1. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ අතුරු ව්‍යවස්ථාවල—

''රියදුරු'' යන්නෙන් එකලා පෙඩල් පයිකලයක් හෝ ට්‍රයිසිකලයක් සම්බන්ධයෙන් වන විට, එය පදවන්නා ද, අශ්වකරත්තයක් හෝ තල්ලු කරන කරත්තයක් සම්බන්ධයෙන් වන විට, එම කරත්තය ඇදගෙන යන හෝ තල්ලු කර ගෙනයන හෝ තැනැත්තා ද, ට්‍රයිෂෝවක් සම්බන්ධයෙන් වන විට, එය පදවා ගෙනයන තැනැත්තා ද අදහස් වේ ;

''නතරකර තැබීම'' යන්නෙන්, වාහනය අවල තත්ත්වයකට ගෙන ඒම හෝ පුද්ගලයන් සහ බඩු වාහනයට නංවා ගැනීමේ හෝ බිමට බැස්වීමේ කාර්ය නොවන වෙනත් කාර්යයක් සඳහා නතර කර තැබීමට සැලැස්වීම හෝ අදහස් වේ ;

''වාහනය'' යන්නෙන්, යාන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ පදවනු ලබන්නා වූ ද, ගොඩ බිමෙහි ප්‍රවාහන මාධ්‍යයක් ලෙස උපයෝගී කර ගනු ලබන්නා වූ නැතහොත් උපයෝගී කර ගැනීමට හැකිවූ ද, යම් සාත්‍රිම උපක්‍රමයක් අදහස් වන නමුත්, 1951 අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ මෝටර් රථයක් මීට ඇතුළත් නොවේ.

2. වාහන නතර කර තැබීම හෝ නතර කිරීම තහනම් කරන, සීමා කරන නැතහොත් පාලනය කරන, එසේ නැතහොත් නාගරික ප්‍රදේශය ඇතුළත යම් වීදියක හෝ වීදියක කොටසක, වාහන සඳහා වෙන්කර ඇති යම් වාහන නතර කිරීමේ ස්ථානයක් සඳහන් කරන දැන්වීමක්, ප්‍රකටව පෙනී යන ආකාරයකට අන් ඒ වීදියේ සිට නැතහොත් වීදියේ කොටසෙහි සිට පෙනී යන ආකාරයකට හෝ (මෙහි මින් මතු ''සභාපතිවරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ, සභාපතිවරයාගේ අණ පරිදි හෝ ප්‍රදර්ශනය කරනු ලැබිය හැකිය.

3. 2 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීමක් මගින්, යම් වීදියක හෝ වීදියක කොටසක වාහන නතර කිරීම හෝ නතර කර තැබීම හෝ තහනම් කරනු ලබන ඇති අවස්ථාවක,—

(අ) යම් නිලධාරියකු විසින් හෝ බලධාරියකු විසින්, ඒ වීදියෙහි හෝ එහි කොටසක ඉදි කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද, යම් වාහන ගමනා ගමන සංඥාවකට හෝ දැන්වීමකට අවනත වීමේ ; හෝ

(ආ) එම වීදියෙහි හෝ එහි කොටසෙහි ඒ අවස්ථාවේ පවතින යම් වාහන ගමනා ගමන තුවයක් නිසි පිළිවෙල අනුගමනය කිරීමේ ; හෝ

(ඇ) එම වාහනයකට බඩු පැටවීමේ හෝ එම වාහනයෙන් බඩු බෑමේ ;

කාර්ය සඳහා අවශ්‍ය කාල සීමාව සඳහා හැර, වාහනය ඒ වීදියෙහි හෝ වීදියේ කොටසෙහි හෝ නවතා තැබීමට සැලැස්වීම වාහනයේ රියදුරු විසින් කරනු නොලැබිය යුතුය.

4. යම් වීදියක හෝ වීදියක කොටසක, වාහන නතර කිරීම හෝ නතර කර තැබීම, 2 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රදර්ශනය කරන ලද යම් දැන්වීමක් මගින්, තහනම් කර හෝ සීමා කර හෝ නොමැති අවස්ථාවක, ඒ වීදියෙහි හෝ වීදියේ කොටසෙහි වාහන ගමනා ගමනය පාලනය කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධාරියකු විසින්, වාචික වියාන හෝ සංඥා දෙනු ලැබිය හැකිය. පොලිස් නිලධාරියා විසින් සඳහන් කරන ලද ආකාරයට හෝ සඳහන් කරන ලද කාල සීමාව සඳහා හෝ හැර, අන් ආකාරයකට ඒ වීදියෙහි හෝ එහි කොටසෙහි වාහනය රඳවා තබා ගැනීමට සැලැස්වීම, වාහනයක රියදුරු විසින් කරනු නොලැබිය යුතුය.

5. මේ අතුරු ව්‍යවස්ථා වලින් කිසිවක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පණසකට නොවැඩි දඩයකට, ඔහු යටත් විය යුතුය.

## 7. වැඩ කටයුතු කර ගෙන යාම

1. (මෙහි මින් මතු ''සභාපතිවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින්, ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නැනැත්තකු නැතහොත් නැනැත්තන් විසින්, සියලු සාධාරණ වේලාවල දී සියලුම අවශ්‍ය සහ නිසි සේවකයන්, කම්කරුවන්, වැඩකරුවන්, රිය මැදිරි, සතුන් සහ වෙනත් දේ සමග ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමා ඇතුළත, පවත්නා වූ හෝ ඇති කිරීමට අදහස් කරන්නා වූ හෝ වීදියකට යාබද හෝ ආසන්න ඉඩමකට සහ වෙනත් දේ සමග ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමා ඇතුළත, පවත්නා වූ හෝ ඇති කිරීමට අදහස් කරන්නා වූ හෝ වීදියකට යාබද හෝ ආසන්න ඉඩමකට ඇතුළු වීම ද එවැනි, යම් වීදියක්, අනුරේඛනය කිරීමේ, මැනීමේ, සැදීමේ, කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, එළි කිරීමේ, වැඩි දියුණු කිරීමේ හෝ වැට ගැසීමේ කාර්ය සඳහා හෝ, ඒ මත ඇති යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක්, අගලක්, නලයක්, කේබලයක් හෝ වෙනත් උපකරණයක් ගොඩනැඟීම, තැනීම, අලුත්වැඩියා කිරීම, එළි කිරීම, සැදීම හෝ වැඩි දියුණු කිරීම සඳහා හෝ, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන යටතේ යම් ක්‍රියාවක්, කාරණයක්, හෝ දෙයක් ඉටු කිරීම සඳහා හෝ අවශ්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේවල්, එසේ කිරීම සහ ඉටු කිරීම ද නීත්‍යානුකූල වන්නේය.

2. තවද ඉහත කී පරිදි බලය පවරන ලද නැනැත්තා හෝ නැනැත්තන් විසින්, තමා විසින් හෝ තමා යටතේ සේවයේ නියුක්ත කර ගන්නා සේවකයන්, වැඩකරුවන් සහ කම්කරුවන් ද සමඟ, සියලු සාධාරණ වේලාවලදී සියලුම අවශ්‍ය සහ නිසි රිය මැදිරි, සතුන් සහ වෙනත් දේ සමග පවත්නා වූ හෝ ඇති කිරීමට අදහස් කර ඇත්තා වූ වීදියක්, අනුරේඛනය කිරීමේ, මැනීමේ, සැදීමේ, කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ අලුත්වැඩියා කිරීමේ, එළි කිරීමේ, වැඩි දියුණු කිරීමේ හෝ වැට ගැසීමේ හෝ අනුරේඛනය කිරීමට, මැනීමට, සැදීමට කිරීමට, විවෘත කිරීමට, වෙනස් කිරීමට, හැරවීමට, අලුත්වැඩියා කිරීමට, එළි කිරීමට, වැඩි දියුණු කිරීමට හෝ වැට ගැසීමට වෙනත් ආකාරයකින් සහාය වීමේ කාර්ය සඳහා හෝ ඒ මත ඇති යම් පාලමක්, වැටක්, කාණුවක් වේල්ලක්, අගලක්, නලයක්, කේබලයක් හෝ වෙනත් උපකරණයක් ගොඩ නැඟීම, තැනීම, අලුත්වැඩියා කිරීම, එළි කිරීම, සැදීම හෝ වැඩි දියුණු කිරීම සඳහා හෝ එවැනි යම් මහා මාර්ගයක හෝ ඒ අසල යම් නාල හෝ කම්බි මාර්ගවල නැතහොත් ගොඩනැඟිලිවල අවශ්‍ය කිසියම් හෝ අලුත් වැඩියා කිරීම් සඳහා හෝ එවැනි වීදියකට සම්බන්ධ යම් වැඩකට සේවයේ නියුක්ත කර ගෙන ඇති ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකුගේ හෝ ඔහුගේ සේවයෙහි යොදා ගනු ලැබ ඇති යම් වැඩකරුවන්ගේ, රිය මැදිරිවල නැනැත්තන්ගේ හෝ දේවල ප්‍රයෝජනය සඳහා එවැනි යම් වීදියකට යාබද හෝ ආසන්න යම් ඉඩමක සහ ඉඩමකින් ජලය, දැව අතු විසිලි, ගල්, බොරලු මැටි හෝ වෙනත් යම් ද්‍රව්‍ය සෙවීම, හෑරීම, කැපීම, ඇනීම සහ ඉවතට ගෙන යාමද ඒවා වෙනත් යම් නැනැත්තකුගේ භූමිය මැද්දේ යොතු ඇතුළුවන්නාතු ලෙස සලකනු නොලැබ ඉවතට ගෙනයෑමද නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද ප්‍රමාණවත් ද්‍රව්‍ය අසල මුඩු ඉඩම්වලින් හෝ පොදු හෝ අත්හැර දමන ලද ඉඩම්වලින් හෝ පහසුවෙන් ලබා ගත හැකි නම්, ඉහත සඳහන් බලයලත් නැනැත්තා හෝ නැනැත්තන් විසින් එම ද්‍රව්‍ය, එම පහසුවෙන් ලබා ගත හැකි තැනින් ලබා ගත යුතු අතර, එසේ ලබාගත නොහැකි නම් හිස යම් අංගනයකින් නිවසකට යන මාවතකින් හෝ කෘෂි පිටියකින් හෝ කොටු කරන ලද ගෙවත්තකින් වැට්ලකින්, කුඹුරකින් හෝ වත් පෙදෙසින් එහි අයිතිකරුගේ අවසරය නොමැතිව එම ද්‍රව්‍ය සඳහා හෑරීම හෝ කැපීම හෝ එම ද්‍රව්‍ය ඉන් ඉවතට ගෙන යාම හෝ කරනු නොලැබිය යුතුය, තවද එසේ ගන්නා ලද සියලු ද්‍රව්‍ය සඳහාද ඒවා ලබා ගැනීමෙන් සහ ගෙන යාමෙන් සිදුවූ අලාභ සඳහා ද ඒවායේ අයිතිකරුට සාධාරණ වන්දි ගෙවනු ලැබිය යුතුය; තවද එම ද්‍රව්‍ය ලබා ගන්නේ යම් ආකාරයකින් හෝ වළකින් ද එය යම් නැනැත්තකුට හෝ සතෙකුට අනතුරුදායක නොවන පරිදි එම නැනැත්තා හෝ නැනැත්තන් විසින් ඒවා කොටු කිරීම හෝ ආරක්ෂා වැටකින් වෙන් කිරීම හෝ කරනු ලැබිය යුතුය.

3. පවත්නා හෝ ඇති කිරීමට අදහස් කරන හෝ වීදියක්, අනුරේඛනය කිරීමේදී මැනීමේදී සැදීමේ දී කිරීමේ දී විවෘත කිරීමේ දී වෙනස් කිරීමේ දී, හැරවීමේදී,-අලුත්වැඩියා කිරීමේදී හෝ ඒ මත වූ යම් පාලමක් වැටක් කාණුවක්, වේල්ලක් අගලක් නලයක්, කේබලයක් හෝ කිසියම් ආකාරයකින් ඊට සම්බන්ධ වූ වෙනත් උපකරණයක් ගොඩ නැඟීමේ දී තැනීමේදී අලුත්වැඩියා කිරීමේ දී ඉහත සඳහන් පරිදි බලය පවරනු ලැබූ නැනැත්තකු හෝ නැනැත්තන් විසින් එවැනි යම් වැඩ කරන ස්ථානයකින් ඉවත් කිරීමට අවශ්‍ය පස්, කසළ හෝ ද්‍රව්‍ය ඊට යාබද හෝ ආසන්න යම් ඉඩමකට විසි කිරීම නීත්‍යානුකූල වන්නේය. එසේ වූද එම පස් කසළ සහ ද්‍රව්‍ය සාධාරණ කාලයක් ඇතුළත ඉවත් කළ යුතුය.

4. පවත්නා හෝ ඇති කිරීමට අදහස් කරන යම් වීදියක, කිසියම් වැඩක් කර ගෙන යාමේදීට කිසියම් ආකාරයකින් සම්බන්ධ කාර්යයකදී, ඉහත සඳහන් පරිදි බලය පවරනු ලැබූ නැනැත්තකු හෝ නැනැත්තන් විසින්, ඊට යාබද හෝ ආසන්න භූමි තුළින් පාරක් තනනු ලැබීම නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද එවැනි පාරක් යම් ගොඩනැඟිල්ලක් පිහිටා තිබෙන කිසියම් භූමියක් මතින් හෝ කොටු කරන ලද ගෙවත්තක් හෝ අංගනයක් මතින් හෝ සාදනු නොලැබිය යුතුය.

5. ඉහත සඳහන් පරිදි බලය පවරන ලද නැනැත්තා හෝ නැනැත්තන් විසින්, ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ යම් වීදියක වැටෙන හෝ වීදියක ඉහළින් තිබෙන සියලු ගස්, පදුරු හෝ ලඳු කැලෑ සහ ගස්වල සියලු කොල හෝ අතු හෝ මුල් කපා ඉවත් කර, ඊට යාබද හෝ ආසන්න යම් භූමියක තැබීම හෝ යම් අවහිරයක් ඇති කිරීම සහ එම කාර්යය සඳහා එම ගස් පදුරු ලඳු කැලෑ කොළ අතු හෝ මුල් කැපීමට පැමිණීමට හෝ ඉවත් කර ගෙන යාමට අවශ්‍ය නැනැත්තන් සතුන් සහ උපකරණ සමග යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වීම ද නීත්‍යානුකූල වන්නේය.

6. ඉහත සඳහන් පරිදි බලය පවරනු ලැබූ යම් නැනැත්තකුට හෝ නැනැත්තන්ට, එසේ කිරීම අවශ්‍ය යයි පෙනී යන කවර අවස්ථාවකදී වුවද යම් වීදියක තැත්තකස්, වැටවල්, බෙට්ටි, අගල්, කාණු හෝ පෙරී මිනු හෝ ඔහුන් විසින් ඉදි කරනු ලැබීම හෝ සාදනු ලැබීම නීත්‍යානුකූල වන අතර, එවැනි වැටවලට, බෙට්ටිවල, අගල්වලට, කාණුවලට හෝ පෙරිවලට යාබද ඉඩම්වල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ විසින්, ඒවා හොඳින් අලුත්වැඩියා කළ තත්ව යෙන් මනාව තබාගත යුතු යයි මෙයින් නියම කරනු ලැබේ.

7. යම් වීදියකට හෝ පාලමට හෝ ඇලකට හෝ ඇති කිරීමට අදහස් කරන වීදියකට හෝ පාරකට හෝ ඇලකට යාබද හෝ ආසන්නයේ පවතින යම් ඉඩම් හා භූමි තුළින්, යම් වීදියක් හෝ පාරක් හෝ ඇලක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, වැඩිදියුණු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ඉදිකිරීම සඳහා අවශ්‍ය යයි සභාපතිවරයා ලියවිල්ලකින් බලය පවරන ලද නැනැත්තා හෝ නැනැත්තන් අදහස් කරන සියලු අගල්, මිලි සහ කාණු හෝ ජල මාර්ග ඒ නැනැත්තා හෝ නැනැත්තන් විසින් සෑදීම, හෝදා හැරීම, පිරිසිදු කිරීම සහ විවෘතව තැබීම ද බැහැර මාර්ග මිංගෙවිල් පලක හෝ පාලම් සෑදීම සහ සවි කිරීම ද නීත්‍යානුකූල වන්නේය.

8. ඉහත සඳහන් පරිදි බලය පවරනු ලැබූ නැනැත්තකු හෝ නැනැත්තන් විසින්, යම් ගල් හෝ බොරලු ගොඩක් හෝ යම් කොටසක් හෝ ද්‍රව්‍යක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ කිසියම් හෝ දෙයක් යම් වීදියක් හෝ පාරක් මත තැබීම ද, අලුත් වැඩියාවල් කිරීම පහසු කිරීම සඳහා හෝ අලුතින් අලුත්වැඩියා කළ වීදියට හෝ මාර්ගයට හානි සිදුවීම වැළැක්වීම සඳහා හෝ අවශ්‍ය පරිදි, එම වීදිය හෝ පාර අලුත්වැඩියා කරනු ලබන කාල සීමාව තුළදී ද, අලුත්වැඩියා කිරීම ආරම්භ කිරීමට පෙරාතුව යම් කාලයක් තුළ ද, අලුත්වැඩියා කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව ද, ඒවා එහි තිබෙන්නට ඉඩ හැරීම ද, නීත්‍යානුකූල වන්නේය. එසේ වුවද මාර්ගය මැද්දේ යන නැනැත්තන්ට අනතුරු හෝ කරදර සිදුවීම වැළැක්වීම පිණිස, මිනු හෝ ඔහුන් විසින්, නිසි සහ සාධාරණ ආරක්ෂක පියවරවල් ගනු ලැබිය යුතුය.

9. මහජනයාට ආරක්ෂාව සැලසීමේ කාර්යය සඳහා හෝ වීදිවල අලුත්වැඩියා කිරීම් කරගෙන යන අතරතුර දී නැතහොත් සභාපතිවරයා විසින් ඒවායේ වැඩ කටයුතු කරමින් ගෙන යන අතරතුර දී කරත්තවලට, බර්යන්ගේ, රිය මැදිරිවල සහ අශ්වයන්ගේ හෝ වෙනත් සතුන්ගේ ගමනා ගමනය වැළැක්වීම පිණිස හෝ වීදියක් හරහා හෝ යම් වීදියක පිහිටුවා ඇති වැටක්, බාධක කණු ද්වාර, දම්වැලක් හෝ කුළුණක් ගලවා දැමීම, වෙනස් කිරීම හෝ ඉවත් කිරීම හෝ එවැනි ඇති යම් ආලෝකයක් හෝ ආලෝක නිවා දැමීම හෝ ඉවත් කිරීම, කිසිම නැනැත්තකු විසින් කරනු නොලැබිය යුතුය.

10. සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකුට හෝ නිලධාරීන්ට යම් අනතුරු වැළැක්වීමට ඉදිකර දී ඇති බිල්ඩිං හෝ අඩිතාලම් ... කිසිවක් ක්‍රියාවේ යෙදවීමේ හේතුවෙන් සිවියම් දල්ලයක් හෝ හානියක් දරන්නට සිදුවන සෑම නිලධාරියකුටම ඒ සඳහා වන්දි ලැබීමේ හිමිකම ඇත. එසේ ඉල්ලුම් කරන ලද්දේ ... කරන ලදයි කියන යම් ක්‍රියාවක්, කරුණක් හෝ දෙයක් සම්බන්ධයෙන්ද එම ක්‍රියාව, කරුණ හෝ දෙය සිදුව මාස තුනක් ඉකුත් වීමට පෙර යම් අවස්ථාවක දී, තම හිමිකම් පැමිණීම් ප්‍රමාණය සම්පූර්ණ ලෙස දක්වමින්, සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි විස්තර ද සහගතව, ඒ සඳහා වූ ඉල්ලීම සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ඉහත කී කාල සීමාව ඇතුළත එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් නොකරන ලද නම්, කරන ලදයි කියන හානිය සඳහා වූ වන්දි හිමිකම් පෑමට අවසර දෙනු නොලැබෙන අතර, එය අයකර ගැනීමෙන් පසු වළක්වනු ලැබේ. "වන්දි ප්‍රමාණය" නම්, කරන ලදයි කියන හානිය සඳහා වූ වන්දි හිමිකම් පෑමට අවසර දෙනු නොලැබෙන අතර, එය බේරුම්කරුවකු සභාපතිවරයා සම්බන්ධයෙන් එකඟත්වයකට එළඹීමට නොහැකි නම්, එය බේරුම් කිරීමක් මගින් තීරණය කර ගනු ලැබිය යුතු අතර, එක් බේරුම්කරුවකු සභාපතිවරයා විසින් ද අනෙක් බේරුම්කරු වන්දි සඳහා හිමිකම් පාන නිලධාරියා විසින් ද, නම් කරනු ලැබිය යුතුය. වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් විනාශය පවත්වා ගෙන යාමට පෙර බේරුම්කරුවන් අතර තිබිය හැකි මත භේදයක් තීරණය කිරීම සඳහා තීරකයකු ලියවිල්ලක් මගින් පත්කර ගත යුතුය. තවද යොමු කර ඇති කාරණය අනුව, බේරුම්කරුවන්ගේ හෝ තීරකයාගේ ප්‍රදානය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

## 8. ගොඩනැගිලි සහ කාණු ඉදිකිරීම

1. (අ) යම් කාණුවක් සාදනු ලැබ හෝ කණිනු ලැබ හෝ ඇත්නම් යම් වීදියක් අයිතිනම් ද, එම වීදියට යාබද යම් නිවසක, ඉඩමක හෝ පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින්, (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව සහ නියම කිරීම අවශ්‍ය යයි සභාපතිවරයා සලකන කොන්දේසිවලට යටත්ව සහ, ඔහු විසින් විධාන කරන ආකාරයට මිස, එවැනි යම් කාණුවක් මත, යම් පාලමක් වේදිකාවක්, ගොඩනැගිල්ලක් හෝ කිසියම් ආකාරයක වූවද ඉදිකිරීමක් ඉදිකිරීම හෝ තැබීම කරනු නොලැබිය යුතුය.

(ආ) එම අයිතිකරු හෝ පදිංචිකරු විසින්, එම පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ කිසියම් ආකාරයක වූවද ඉදිකිරීම, සභාපතිවරයා සෑහීමට පත්වන පරිදි යහපත් තත්ත්වයකින් තබන්නනු කරනු ලැබිය යුතුය.

(ඇ) කිසියම් පාර්ශ්වයකට එසේ මිරිවා ඇති යම් නිවසකට, ඉඩමකට හෝ ස්ථානයකට ඒ පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ ඉහත කී පරිදි වූ ඉදිකිරීම නොමැතිවුවහොත් එවැනි බව හෝ ඉහත කී පරිදි ඉදිකරන ලද්දක් හෝ තබන ලද්දක් නොවන වෙනත් පාලමක්, වේදිකාවක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් මගින් ප්‍රවේශයක් පවතින බව සභාපතිවරයාට දැනගන්නට ලැබුණු හොත්, එකී අයිතිකරුට හෝ පදිංචිකරුට එය ඉදිකරන ලෙස, තබන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඒ පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ ඉදිකිරීම, නැතහොත් එයට යටින් ඇති කාණුව, යහපත් තත්ත්වයෙන් තබන්නනු කිරීම ඔහු විසින් පැහැර හරිනු ලැබ හොත්, එය යහපත් තත්ත්වයට පත් කරන ලෙස එකී අයිතිකරුට හෝ පදිංචිකරුට සභාපතිවරයා විසින් දැන්වීමකින් දැනුම් දීම නීත්‍යානුකූල වන්නේය.

(ඈ) ඒ දැන්වීම භාර දෙනු ලැබී දවස් තිහක් ඇතුළත හෝ එම කාර්යය කිරීමට එකඟ වූ ඒ දැන්වීමේ සභාපතිවරයා විසින් සඳහන් කරනු ලැබ ඇත්නම් එසේ දැන්වීම භාර දීමෙන් දවස් දහහතරක් ඇතුළත හෝ, එසේ දෙන ලද දැනුම් දීමක නියමයන් සපුරාලීම ඔහු පැහැර හැරිය හොත්, අවස්ථාවෝචිත පරිදි අයිතිකරු හෝ පදිංචිකරු වෙනුවෙන් තවද සභාපතිවරයා විසින් ඒ වැඩ කිරීමට පැලැස්විය හැකි අතර එකී වියදම් සහ වියදම් එකී අයිතිකරු හෝ පදිංචිකරු ගෙවිය යුතුය.

2. අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන්නේ නම්, ගොඩනැගිල්ලකට යාව ඇති අංගනයක හෝ භූමියක නැතහොත් ගොඩනැගිලි අතර හෝ ගොඩනැගිලි පේළියක් අතර හෝ ඇති යම් පටු පාරක, පාරක හෝ අඩි පාරක අයිතිකරුට හෝ අයිතිකරුවන්ට, සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමාණවත් කාලයක් ඇතුළත ඒ අංගනය, භූමිය, පටුපාර, පාර හෝ අඩි පාර අවස්ථාවෝචිත පරිදි එවැනි යම් ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලිවල හෝ ගොඩනැගිලි පේළියක සිට මීටර් 4.5 ක් නොඉක්මවන දුරකට, තල් අනුව සභාපතිවරයා විධාන කරන යම් ආකාරයකට පහත් කරන ලෙස ද ඒ අංගනයේ භූමියේ, පටු පාරේ, පාරේ හෝ අඩි පාරේ ජලය බැස යාමේ කාර්යය සඳහා ළඟම ඇති ප්‍රාදේශීය සභා පල්දෝරුව හෝ කාණුව දක්වා ප්‍රමාණවත් කාණු හෝ නල සපයන ලෙස ද සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේය. ඒ කාණු හෝ නල සභාපතිවරයා නියම කරන ද්‍රව්‍යවලින් ද විශාලත්වයෙන් හෝ මට්ටමකින් ද ඔප්නාවකින් ද විය යුතු අතර එකී ප්‍රාදේශීය සභා පල්දෝරුව හෝ කාණුව සමග එසේ නියම කරන ස්ථානයේදී සන්ධි වන පරිදි ද විය යුතුය. එසේ වූව ද ඒ අයිතිකරු විසින් සැපයිය යුතු කාණු හෝ නල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, ඔහු ඉල්ලුම් කළ විට, සභාපතිවරයා විසින් ගැනුම් මිලට සැපයිය යුතුය. ඒ අයිතිකරු හෝ අයිතිකරුවන්, එවැනි දැන්වීමක නියම කර ඇති කාලය ඇතුළත, එකී නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හැරිය හොත් ඔහු විසින් හෝ ඔවුන් විසින් වරදක් කරනු ලැබේ. තවද සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධාරියක් විසින් කම්කරුවන් සමග එම ස්ථානයට ඇතුළු වී ඒ අවශ්‍ය වැඩ කිරීමට පැලැස්විය යුතු අතර, එකී මිරිවැය සහ වියදම් අයිතිකරු විසින් ගෙවිය යුතුය.

එසේ වූවද ළඟම ඇති ප්‍රාදේශීය සභා පල්දෝරුව හෝ කාණුව, ඒ අංගනයේ, භූමියේ, පටු පාරේ, පාරේ හෝ අඩි පාරේ සිට මීටර් 30.5 කට වැඩි වේ නම්, ප්‍රාදේශීය සභා වේ කැමැත්ත කලින් ලබා නොගෙන එවැනි දැන්වීමක් නිකුත් නොකළ යුතුය.

3. යම් පෞද්ගලික පල්දෝරුවක් හෝ කාණුවක්, එය අයිතිකරුගේ ගොඩනැගිල්ලට යටින් හිබුණ ද පිටතින් තිබුණ ද ඒ පල්දෝරුවට හෝ කාණුවට හිමි වාසානුයක් ලැබීම මිණිස සභාපතිවරයා නියම කරන ප්‍රමාණවත් කාලයක් ඇතුළත, අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන යම් නල සවිකරන ලෙස, ඒ පල්දෝරුව හෝ කාණුව අයිතිකරුට, සභාපතිවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ කාණු හෝ නල, සභාපතිවරයා විධාන කරන විශාලත්වයකින් හා ද්‍රව්‍යයකින් විය යුතු අතර එසේ විධාන කරන ලෙස දක්වා ගෙන යා යුතුය. නියමිත කාලය ඇතුළත ඒ දැන්වීමෙහි නියමයන් අනුව ක්‍රියා කිරීම ඒ අයිතිකරු පැහැර හැරියහොත් ඔහු වරදක් කරන්නේය. තවද සභාපතිවරයා හෝ යම් නිලධාරියක් සහ සභාපතිවරයා විසින් බලය දෙන ලද කම්කරුවන්, ඒ ස්ථානයට ඇතුළු වී නියමිත වැඩය කිරීමට පැලැස්විය හැකි අතර, එකී මිරිවැය සහ වියදම් ඒ අයිතිකරු විසින් ගෙවිය යුතුය.

4. යම් පල්දෝරුවක් හෝ කාණුවක් හා සම්බන්ධව එහා ආවරණය කළ කාණුවක් හෝ නලයක් තැනීම හෝ එලීම අවශ්‍ය බව පෙනී ගිය විටක ඒ කාණුව තැනීම හෝ පයිප්පය එලීම සඳහා, එය, ජලය බැස්සවීම අවශ්‍ය ගොඩනැගිල්ලක හෝ ස්ථානයක සහ පොදු කාණුව හෝ පල්දෝරුව අතර මැද ඇති ඉඩමක් හෝ ඉඩම් හරහා නොයාම අවශ්‍ය වන විට සභාපතිවරයා හෝ තත්කාර්යය සඳහා ඔහුගේ ලිඛිත අධිකාරයක් යටතේ ක්‍රියා කරන යම් නිලධාරියකු හෝ විසින් එම කාණුව තැනීම හෝ නල එලීම කරගෙන ගොස් සම්පූර්ණ කිරීමට සභාපතිවරයා අදහස් කරන බවට ඒ අතර මැද ඇති ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරුට හෝ පදිංචිකරුට දින දෙකක කල් දීමකින් පසු, එම ඉඩමට හෝ ඉඩම්වලට ඇතුළු වී ඒ කාණුව තැනීම හෝ නල එලීම කරගෙන ගොස් සම්පූර්ණ කිරීම, නීත්‍යානුකූල වන්නේය. ඒ ඉඩමේ අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු, සභාපතිවරයාගේ ලිඛිත කැමැත්ත ලබා නොගෙන, ඒ කාණුවක් හෝ නලයක් වෙනස් කිරීම, හෝ ඉවත් කිරීම හෝ ප්‍රතිසංස්කරණය හෝ නොකළ යුතුය.

5. (i) යම් පල්දෝරුවක් හෝ කාණුවක් හා සම්බන්ධව එහා ආවරණය කළ කාණුවක් හෝ නලයක් තනන ලෙස හෝ එලන ලෙස දැන්වීමක් භාර කරනු ලැබ ඇති සෑවර හෝ නිලධාරියකු විසින්, ඒ කාණුව තැනීම හෝ නලය එලීම මිණිස එය ජලය බැස්සවීම අවශ්‍ය ගොඩනැගිල්ල හෝ ස්ථානය සහ පොදු පල්දෝරුවක් හෝ කාණුවක් අතර මැද ඇති ඉඩමක් හෝ ඉඩම් හරහා ගෙන යාම අවශ්‍ය බවට, සහතිකයක් නිකුත් කරන ලෙස සභාපතිවරයා වෙත ඉල්ලුම් කළ හැකි අතර එසේ සහතිකයක් නිකුත් කිරීම සුදුසු යැයි සභාපතිවරයා සලකන්නේ නම්, ඒ බවට ලිඛිත සහතිකයක් ඒ නිලධාරියාට නිකුත් කළ හැකිය.

(ii) එම සහතිකය නිකුත් කරනු ලැබීමෙන් පසුව සහ අතර මැද ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරුට හෝ අයිතිකරුවන්ට ප්‍රමාණවත් වන්දියක් ගෙවීමෙන් පසුව සාධාරණ වෙලාවක වුව ද, ඒ අතර මැද ඉඩමේ හෝ ඉඩම්වල අයිතිකරුට හෝ පදිංචිකරුට තමා ඒ කාණුව තැනීම හෝ නල එලීම සම්පූර්ණ කිරීමට අදහස් කරන බවට දෙදිනක කල් දීමකින් පසුව, ඒ නිලධාරියා විසින් අවශ්‍ය හා හිමි සේවකයන්, කම්කරුවන්, වාහන හා සතුන් සහ වෙනත් උපකරණ වුවද රැගෙන, ඒ අතර මැද ඉඩමට හෝ ඉඩම්වලට ඇතුළු වී, ඒ කාණුව තැනීම හෝ නලය එලීම කරගෙන ගොස් සම්පූර්ණ කිරීම, නීත්‍යානුකූල වන්නේය.

(iii) එකී වැසිකිළි මුදල් ප්‍රමාණය සහ ,අවශ්‍ය වුවහොත්, එය කොටස් කර දීම, ඒ පිළිබඳව කොන්දේසියක් ඇති වූ අවස්ථාවක, බෙදුම්කරුවන් අතරෙහි නැති විනිශ්චය කිරීම සඳහා යොමු කළ යුතුය. ඒ බෙදුම්කරුවන්ගෙන් එක්කෙනෙකු ඉහත කී නැතහොත් විසින් ද අනෙක් බෙදුම්කරු ඇදළ ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් ද නම් කළ යුතුය.

(iv) වැසිකිළි මුදල් ප්‍රමාණය ගැන විභාග කිරීමෙහි යෙදීමට පෙර, බෙදුම්කරුවන් විසින් ලියවිල්ලක් මගින් තීරකයකු පත්කර ගත යුතුය. යුක්ති සහගත වැසිකිළි මුදල් ප්‍රමාණය හෝ එය කොටස් කළ යුතු ආකාරය හෝ පිළිබඳව එකඟත්වයකට පැමිණීමට බෙදුම්කරුවන් අසමත් වූ හොත්, නඩුව එකඟ නොවන කරුණු හෝ කරුණු මඩුළු විසින් එකී තීරකට යොමු කළ යුතුය. මුහුගේ තීරණය අවසානාත්මක වන්නේය.

(5) බෙදුම්කරුවකු නම් කරන ලෙස දැනුම්දීමක් ලැබී දවස් දහයක් ඇතුළත එසේ බෙදුම්කරුවකු පත් කිරීම එකී අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් පැහැර හරිනු ලැබුව හොත්, ඉහත කී නැතහොත් විසින් පත් කරන ලද බෙදුම්කරු, එම වැසිකිළි මුදල් ප්‍රමාණය සහ එය කොටස් කළ යුතු ආකාරය තීරණය කළ යුතුය.

6. යම් ගොඩනැඟිල්ලක් ඉදිකරන හෝ විශාල කරන හෝ වැඩිදියුණු කරන නැතහොත් ගොඩනැඟිල්ලක ඉදිරිපස අලුත් කරන, අලුත්වැඩියා කරන හෝ වෙනස් කරන සෑම තැනැත්තෙක්ම හෝ ඒම කාණුවක් කපන නැතහොත් කාණුවක උඩින් පාලමක්, බෝක්කුවක් හෝ නිර්මිතයක් තනන හෝ යම් වැසිකිළියක් හෝ කුණුදිය වළක් තනන සෑම තැනැත්තෙක්ම හෝ තමා වෙත නියමයක් නැවත ඇති බලපත්‍ර ප්‍රකාර සභාපතිවරයා විසින්, යම් ගොඩනැඟිල්ලක් කාණුවක්, වැසිකිළියක් හෝ කුණුදිය වළක් ඉදිකරන ලෙස, වෙනස් කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස නියම කරනු ලැබිය හැකි යම් තැනැත්තෙක් හෝ තැනැත්තන්ම, ඒ කටයුත්ත සම්පූර්ණ කිරීමෙන් පසුව දවස් දහයක් ඇතුළත ඒ පිළිබඳව, සභාපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

7. (i) යම් තැනැත්තකු විසින්, මෙහි පහත දක්වෙන කොන්දේසිවලට යටත්ව මිස වාසස්ථානයක් වශයෙන් ගෙයක් හෝ පැල්පතක් ඉදිකිරීම හෝ වාසස්ථානයක් වශයෙන් එවැන්නක පදිංචි වීමට ඉඩදීම නොකළ යුතුය.

(අ) කිසිම අවස්ථාවක වීත්ති පොල් අතුවලින් සාද නොතිබිය යුතු අතර, කිසි පරිදි සපරාදු කර ඇතු නැමට හැකිවන පරිදි වරිච්චි, ගඩොල්, කළුගල් හෝ වෙනත් යෝග්‍ය ද්‍රව්‍යයකින් තිබිය යුතුය.

(ආ) මනුෂ්‍ය වාසය සඳහා ප්‍රයෝජනයට ගන්නා සෑම කාමරයක් සඳහා ම යටත් පිරිසෙයින්, මීටර් 1.8 ක් උස සහ මීටර් .9 ක් පළල දොරක් සහ උසින් මීටර් .9 ට සහ පළලින් මීටර් .6 නොඅඩු ප්‍රමාණයක එක් ජනේලයක් තිබිය යුතුය.

(ඇ) සෑම විටම මීටර් .3 කට නොඅඩු ප්‍රමාණයක් පොළොව මට්ටමට උසින් තිබිය යුතුය. එසේ වුවද පිහිටීම අනුව ඊට වඩා වැඩි උසක් නියම කිරීමට ප්‍රාදේශීය සභාවට නිදහස ඇත්තේය. පැල්පත් පේළි හෝ කට්ටි දෙකක් අතර අඩුම වශයෙන් . මීටර් 4.5 ක විවෘත ඉඩකඩක් තිබිය යුතුය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනිව ඉදි කරන ලද යම් ගෙයක් හෝ පැල්පතක් වෙනස් කරන ලෙස හෝ කඩා දමන ලෙස එහි අයිතිකරුට ලියවිල්ලකින් දැනුම් දීමෙන් පසු එක් මාසයක් ඇතුළත එසේ කිරීම පැහැර හැරියහොත් හෝ නොසලකා හැරියහොත්, ප්‍රාදේශීය සභාව විසින් එය එකී අයිතිකරුගේ වියදමින් කඩා දැමීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේය.

(iii) සභාපතිවරයාගේ අනුමතිය නොමැතිව යම් ගොඩනැඟිල්ලක් හෝ ගොඩනැඟිල්ලක කොටසක්, පොල් අතු කොළ, පිදුරු, තණකොළ හෝ ඊ සඳුරු හෝ වෙනත් කවර වූ හෝ ජ්වලනශීල දහන ද්‍රව්‍යයකින් ඉදිකරන, අලුත් කරන හෝ ඉදිකිරීමට නැතහොත් අලුත් කිරීමට සලස්වන යම් තැනැත්තෙක් වරදක් කරන්නේය.

8. (i) වාසස්ථානයක් ලෙස ප්‍රයෝජනය ගැනීමට අදහස් කර ඇති හෝ ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැඟිල්ලක් කවර හෝ හේතුවක් නිසා මනුෂ්‍ය වාසය සඳහා යෝග්‍ය නොවන බව සභාපතිවරයාට පෙනී ගියහොත්, ඒ ගොඩනැඟිල්ල ඒ කාර්යය සඳහා තවදුරටත් ප්‍රයෝජනයට ගැනීම තහනම් කරන මෙන් මහේස්ත්‍රාත් අධිකරණය වෙත සභාවේ නිලධරයකු ලවා ඉල්ලීමක් කරවීමට, සභාපතිවරයා විසින් සැලැස්විය යුතුය. සුදුසු යැයි ඒ මහේස්ත්‍රාත්වරයා සලකන පරීක්ෂණයකින් පසුව, මහු විසින් ඉහත කී පරිදි තහනම් කිරීමේ ලිඛිත ආඥාවක් නැතහොත් සාධාරණයයි සහ යෝග්‍ය යැයි මහු සලකන වෙනත් යම් ආඥාවක් කරනු ලැබිය හැකිය.

(ii) එවැනි යම් තහනම් කිරීමේ ආඥාවක් කරනු ලැබ ඇති විට එය මනුෂ්‍යවාසය සඳහා අයෝග්‍ය බවට පත්කළ හේතු සමා සැනීමට ගත් වන පරිදි දුවස් කර ඇති බවට සභාපතිවරයා සහතික කරන තෙක් හෝ, ඉහත කී පරිදි වූ තහනම, මහේස්ත්‍රාත්වරයා විසින් ලිඛිත ආඥාවක් මගින් ඉවත් කර ගන්නා තෙක් හෝ ගොඩනැඟිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු එය මනුෂ්‍ය වාසය සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම නොකළ යුතුය.

9. වාසස්ථානයක් හෝ ජනාලයක් ලෙස හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැඟිල්ලක් හෝ ගොඩනැඟිලි පේළියක් ප්‍රමාණවත් උසකින් තොරව හෝ කිසි ජලාපවහනයකින් තොරව තනා තිබීමේ හේතුවෙන් හෝ, කසළ ශෝධනය ප්‍රයෝගිකව කළ නොහැකි වීමේ හේතුව නිසා හෝ ඒ ගොඩනැඟිල්ල හෝ ගොඩනැඟිලි පේළිය සහ ඇවනත් පැල්පත් හෝ මඩු එකට ආසන්නව ඇති ආකාරය නිසා හෝ, ඒවා යේ පදිංචිකරුවන්ට නැතහොත් ඒ අවට පදිංචිකරුවන්ට රෝග වැළඳීමේ අන්තරාවක් ඇති කිරීමට ඉඩ ඇති බව නැතහොත් කවර හෝ හේතුවක් නිසා මහජන සෞඛ්‍යය හෝ ආරක්ෂාව අන්තරාවට පත් වීමට ඉඩ ඇති බව, සභාපතිවරයාගේ මතය වේ නම්, මහු විසින් ඒ පැල්පතේ හෝ මඩුවේ හෝ ප්‍රකාරව නොනතා තැනක පවී කිරීමට සලස්වන ලිඛිත දැන්වීමක් මගින්, එකී අයිතිකරුට, හෝ පදිංචිකරුට නැතහොත් ඒ පැල්පත හෝ මඩුව මිනිවා ඇති ඉඩමේ අයිතිකරුට, ඒ පැල්පත හෝ මඩුව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස නැතහොත් අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන පරිදි එය වැඩිදියුණු කිරීමට ක්‍රියා කරන ලෙස හෝ නියම කළ හැකිය. මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වන සෑම උල්ලංඝනයක්ම රුපියල් පන්සිය පණහක් නොඉක්මවන දඩයකින් ද, අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගෙනෙරම අවධානය යොමු කරමින්, ප්‍රාදේශීය සභාපති සභාපතිවරයා විසින් නැතහොත් ප්‍රාදේශීය සභාව විසින් බලය පවරාලද නිලධාරියකු විසින්, ලිඛිත දැන්වීමක් භාර දීමට සැලැස්වීමෙන් පසුව, ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දවසක් සඳහා ම රුපියල් පනහක් නොඉක්මවන අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

## 9. කසළ ශෝධනය

1. මුළු ප්‍රාදේශීය සභා ප්‍රදේශයම සඳහා හෝ එහි යම් නිශ්චිත කොටසක් සඳහා හෝ කසළ ශෝධන සේවාවක් ආරම්භ කරනු ලැබූ විට, එම සේවාව විහිදුවන ලැබ ඇති ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ස්ථානයක පදිංචිකරු විසින්, තම ස්ථානයේ සියලු අප, කුණු රොඩු සහ වෙනත් කසළ ආවරණය කරන ලද, උසින් සෙන්ටි මීටර් 60 කට අඩු නොවන්නා වූද විෂ්කම්භය පතුලින් සෙන්ටි මීටර් 35 කට සහ ඉහළින් සෙන්ටි මීටර් 45 කට අඩු නොවන්නා වූද කසළ භාජනයක හෝ, ප්‍රමාණයෙන් සෙන්ටි මීටර් 60 x සෙන්ටි මීටර් 90 ක කලු පැහැති පොලිතීන් මල්ලක හෝ බැන්දක් කරනු ලැබිය යුතුය.

2. 1 වන අතුරු ව්‍යවස්ථාව සඳහන් කිසියම් ස්ථානයක පදිංචිකරු—

(අ) ප්‍රාදේශීය සභාව විසින් කලින් කල දැනුම් දෙනු ලබන කාලය ඇතුළත දිනපතාම 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් භාජනය මාර්ගයේ වාහන ගමනා ගමනයට බාධා නොවන පරිදි එම ස්ථානයෙන් පිටත මාර්ගය අයිනේ තැබීමට සැලැස්විය යුතුය ; සහද

(ආ) සභාවේ කසළ ශෝධන කම්කරුවන් විසින්, භාජනය හිස් කරනු ලැබීමෙන් පැය භාගයක් ඇතුළත දී භාජනය රැගෙන යාමට සැලැස්විය යුතුය.

3. 2 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාලපරිච්ඡේදයන් අතරතුර දී හැර, 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කිසිම සභාග ව්‍යාපාරයක්, කිසිම තැනැත්තකු විසින් පවත්වාගෙන යනු නොලැබිය යුතුය.

4. දරිද්‍රතාවය හේතු කොට ගෙන සභාව විසින් නිදහස් කරනු ලැබූ පදිංචිකරුවකු නොවන, සභාග සෝදන සේවාව මගින් සේවය සලසනු ලබන යම් ස්ථානයක පදිංචිකරු විසින්, සභාව ඒ සඳහා නියම කරනු ලබන සභාග සෝදන ගාස්තුවක් සභාව වෙත මස් පතා ගෙවනු ලැබිය යුතුය.

5. ප්‍රාදේශීය සභාව විසින් එසේ කිරීමට යම් තැනැත්තකුට බලය පවරා ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් විදියකින්, හෝ ප්‍රසිද්ධ ස්ථානයකින්, දූවිලි, අලු, කුණු රොඩු, සභාග හෝ අප ද්‍රව්‍ය එකතු කිරීම හෝ ඉවත් කර ගෙන යාම කරනු නොලැබිය යුතුය.

6. 1 වන අතුරු ව්‍යවස්ථාව හෝ 2 වන අතුරු ව්‍යවස්ථාව හෝ 5 වන අතුරු ව්‍යවස්ථාව හෝ කඩ කරන යම් තැනැත්තකු වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබීම මත රුපියල් පනහක දඩයකට නොවැඩි දඩයකින් දඬුවම් පමුණුවනු ලැබිය යුතුය.

7. මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභාව යන්නට, ප්‍රාදේශීය සභා විසින් එහි බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් පවරනු ලැබ ඇති යම් නිලධරයකු ද ඇතුළත් වේ.

## 10. [illegible]

1. කිසියම් ගොඩනැඟිල්ලක පදිංචිව සිටිය යුතුයයි (මෙහි මින් මතු "සෞඛ්‍ය නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය නිලධරයාගේ මතය වන සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක්, එම ගොඩනැඟිල්ලෙහි පදිංචිව සිටින බව පෙනී යන හැම අවස්ථාවකදීම එහි පදිංචිව සිටිය යුතු බවට සෞඛ්‍ය නිලධරයාගේ මතය වන සංඛ්‍යාව ඉක්මවා සිටින තැනැත්තන් සංඛ්‍යාව, එම ගොඩනැඟිල්ලෙන් ඉවත් විය යුතු යයි, සෞඛ්‍ය නිලධරයා විසින් නියම කරනු ලැබිය හැකි අනුකූල වන්නේය. එවැනි නියමයක් කිරීමෙන් පසු යම් අවස්ථාවක එම ගොඩනැඟිල්ලෙහි පදිංචිව සිටිය යුතු සංඛ්‍යාවට වඩා වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් එහි පදිංචිව සිටින බව පෙනී ගියහොත්, එම ගොඩනැඟිල්ලෙහි අයිතිකරු වරදකට වරදකරු විය යුතුය.

2. (1) පදිංචිය සඳහා ප්‍රයෝජනයට ගනු ලබන යම් ගොඩනැඟිල්ලක්, එහි පදිංචිකරුවන්ගේ සෞඛ්‍යයට අනතුරුදායක වන තරමට අධික ජන වාසයකින් යුක්ත යයි සෞඛ්‍ය නිලධරයාට පෙනී ගියහොත්, එවැනි අධික ජන වාසයක් නැතිකර කිරීමේ ආඥාවක් කරන ලෙස ඔහු විසින් මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකිය. එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, ඔහු සෑහීමකට පත්වන පරිදි, ආඥාවක් කිරීමෙන් එම ආඥාවෙහි සඳහන් කළ කාලයට වැඩි නොවන කාල සීමාවක් තුළදී, එම ගොඩනැඟිල්ලේ පදිංචිකරුවන්ගේ, කුලී නිවැසියන්ගේ හෝ වෙනත් අයගේ සංඛ්‍යාව අඩු කිරීමෙන් එහි අධික ජන වාසය නිසා ඇතිවන තත්ත්වය නැති කරනු ලැබිය හැකිය. එසේ නැතහොත් සාධාරණ යයි හෝ යුක්තියයි ඔහු සලකන වෙනත් ආඥාවක් කරනු ලැබිය හැකිය.

(2) එකී ගොඩනැඟිල්ලේ අයිතිකරු එම අතුරු කුලියට දී තිබේ නම්, එහි පදිංචිකරුවන්ගේ, කුලී නිවැසියන්ගේ සහ වෙනත් නියම සේවකයන්ගේ සම්පූර්ණ මේ වගන්තියේ කාර්යයන් සඳහා ගොඩනැඟිල්ලේ අයිතිකරු ලෙස සලකනු ලැබිය යුතුය.

(3) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ආඥාවක් අනුව අයිතිකරු විසින් ගොඩනැඟිල්ලෙන් ඉවත් විය යුතු ලෙස නියම කරනු ලැබූ විට, තැනැත්තන් ඉවත් කිරීමට ඔහුට බලය ඇත්තේය; පදිංචිකරුවකු හෝ වෙනත් සේවකයකු එසේ ඉවත්ව යා යුතුය.

## 11. ලැගුම් නිවාස

1. (1) ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස, කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ලැගුම් නිවාසයක් පවත්වාගෙන යනු නොලැබිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, 24 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරනු ලැබූ යම් වර්ෂයක් වෙනුවෙන් ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනයේ දී අවසන් විය යුතුය.

2. කිසිම තැනැත්තකුට—

(අ) මහේස්ත්‍රාත්වරයකු විසින් හෝ සමාදාන විනිශ්චයකාරවරයකු විසින් හෝ අත්සන් තබන ලද යහපත් චරිතයක් ඇති බවට සහතිකයක්, ඔහු (මෙහි මින් මතු "සෞඛ්‍ය නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය නිලධරයා වෙත ඉදිරිපත් නොකරයි නම්, හෝ, ඔහු යහපත් චරිතයකින් යුක්ත තැනැත්තකු බවට ඔහු ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය නිලධරයා අන් ලෙසකින් සෑහීමට පත් නොකරයි නම්; සහ

(ආ) බලපත්‍රය අවශ්‍ය ස්ථානය, පහත දැක්වෙන කොන්දේසිවලට එකඟ—

(1) ස්ථානය ශක්තිමත් ලෙස ගොඩ නගා තිබිය යුතු බවට සහ එය මනාලෙස අළුත්වැඩියා කර තිබිය යුතුව හැර සෑම කාමරයක්ම, මනා වාතාශ්‍රයෙන් යුක්තව සහ හොඳින් ආලෝකය සපයා, වර්ග අඩි 100 ට වඩා අඩු නොවන බිම් ප්‍රමාණයකින් යුක්ත වන පරිදි තනා ඇති බවට සහ සෑම කාමරයක්ම වර්ග මීටර් 11.15 ක අවම ප්‍රදේශයක් [illegible] වර්ග ඵලයක් තිබෙන බවට;

(2) සෑම කාමරයකටම සෑම කොටසකම බිමේ සිට උසින් මීටර් 3.05 කට අඩු නොවන බවට සහ සුදු පිරියම් කර ඇති බවට;

(3) සියලු පොළවල් පොළොවේ සිට යටත් පිරිසෙයින් මීටර් 1.83 ක් විය යුතු බවට;

(4) වහල යකඩ ස්ථිර ද්‍රව්‍යයකින් සෙවිලි කර ඇති බවට;

(5) ද්‍රව්‍යයක් කර ඇති කොටස් පොළ ගඩොල් සහිත හෝ සුදු පිරියම් කර හෝ ඇති බවට;

(6) පොළොවට සම්පූර්ණයෙන්ම සිමෙන්ති දමා ඇති බවට;

(7) එම ස්ථානයේ ප්‍රමාණවත් ජලාපවහන පහසු ඇති බවට;

(8) නිවාසයේ අප ද්‍රව්‍ය අඩංගු කිරීමට ප්‍රමාණවත් විශාලත්වයකින් යුත් සභාග භාජන හැකිතාක් එම ස්ථානයේ සපයා ඇති බවට;

(9) ස්ථානයට බලපත්‍ර ලබාගනු ලබන්නේ යම් තැනැත්තන් සඳහා ද ඒ සෑම තැනැත්තන් දක්වා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහ වැසිකිළි සපයා ඇති බවට;

(10) එම ස්ථානයට හොඳ ජල සැපයුමක් සලසා තිබෙන බවට සහ නාන කාමර සැපයුම සහ ජලය පහසුකම් දිය නෑම තැනැත්තන් මගින් බීමට හෝ ජලය අපවිත්‍ර නොවන ආකාරයට සපයා ඇති බවට; සහ

(11) එම ස්ථානයට [illegible] සඳහා කාර්යක්ෂම පිරිසක් සහිතව නැත්නම් අනුකූල වන්නේ නම්, මිස ලැගුම් නිවාසයක් තබා ගැනීමට සඳහා වූ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

3. ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකු විසින්ම, සභාවේ නමද, "බලපත්‍රලත් ලැගුම් නිවාසය" යන වචන ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව සිත්තරු කරන ලද පුවරුවක්, එම ස්ථානයේ පිවිසුම් දොරටුව අසල පෙනෙන ස්ථානයක සවිකර තබනු ලැබිය යුතුය.

4. ලැඟුම් නිවාසක සෑම බලපත්‍රලාභියකු විසින්ම, ලැඟුම් නිවාසවලට අදාළ මේ අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පිටපතක් සහ බලපත්‍රය, ලැඟුම් බලපත්‍රලත් ස්ථානයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සලස්වනු ලැබිය යුතුය. තවද සභාපතිවරයා විසින් නැතහොත් ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තකු විසින් සියලු සාධාරණ වේලාවල දී පරීක්ෂා කිරීම පිණිස ලබාගත හැකි වන පරිදි, සියලු පදිංචිකරුවන්ගේ නම් සහ ලිපින ලැයිස්තුවක් ඔහු විසින් තබා ගනු ලැබිය යුතුය.

5. බලපත්‍රයට යටත්ව, සභාපතිවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු, ලැඟුම් නිවාසයේ සැලැස්මෙහි නිදා කාමර ලෙස නිශ්චිතව වෙන් කර ඇති කාමරවල හැර, වෙනත් කිසිම කාමරයක යම් තැනැත්තකුට නිදා ගැනීමට අවසර දීම, ලැඟුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු විසින් කරනු නොලැබිය යුතුය.

6. යම් කාමරයක නිදාගැනීමට ඉඩදෙනු ලබන සංඛ්‍යාව ලෙස සැලැස්මෙහි සභාපතිවරයා විසින් නිශ්චය කොට දක්වා ඇති සංඛ්‍යාව වැඩි තැනැත්තන් සංඛ්‍යාවකට යම් කාමරයක නිදා ගැනීමට, ලැඟුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු අවසර නොදිය යුතුය. යම් කාමරයක් සඳහා නිශ්චිත තැනැත්තන් සංඛ්‍යාව, කාමරයේ පොළවේ වර්ගඵලයේ සෑම වර්ග මීටර් තිස් හතරක් සඳහාම එක් තැනැත්තකුට වැඩි නොවිය යුතු අතර, මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා, වයස අවුරුදු දහයට අඩු ළමයින් දෙදෙනෙක් එක් තැනැත්තකු ලෙස ගණන් ගත යුතුය.

7. ලැඟුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම, කාමරයෙහි පරිමාණයන් සහ එහි නිදා ගැනීමට අවසර දෙනු ලබන තැනැත්තන්ගේ උපරිම සංඛ්‍යාව, දක්වෙන පුවරුවක්, එක් එක් කාමරයෙහි සවිකර තැබිය යුතුය.

8. ස්වාමිපුරුෂයා සහ භාර්යාවද, දෙමව්පියන් සහ දරුවන්ද සම්බන්ධයෙන් වූ විට හැර, වයස අවුරුදු දහයට වැඩි පුරුෂයන්ට සහ ස්ත්‍රීන්ට, එකම නිදා කාමරයෙහි නැවතීමට, ලැඟුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු අවසර නොදිය යුතුය.

9. ලැඟුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු එහි දුරාචාර කාර්යයන් සඳහා භාවිත වීමට ඉඩ නොදිය යුතුය. එය තුළ නිසි හැසිරීම සහ සදාචාර පවත්වා ගෙන යනු ලැබීම ගැන ඔහු වගකිව යුතුය.

10. බලපත්‍ර ලත් ස්ථානයේ නතරවන එක් එක් තැනැත්තාගේ නම, රැකියාව, නිත්‍ය පදිංචි ස්ථානය, අන්තිම තාවකාලික හෝ ස්ථිර පදිංචිය, සඳහන් ලේඛනයක්, ලැඟුම් නිවාසයක, සෑම බලපත්‍රලාභියකු විසින් තබා ගනු ලැබිය යුතුය.

11. ලැඟුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම, එක් එක් නිදා කාමරවල ජනේල, එක් එක් දිනයේ යටත් පිරිසෙයින් පැය හතරක්වත්, සම්පූර්ණ පළලට විවෘත කර තැබීමට සැලැස්විය යුතුය.

එසේ වුවද ජනේල විවෘත කර තැබීම අවශ්‍ය නොවන තත්ත්වයක කාලගුණයක් පවතින විට බලපත්‍රලාභී විසින්, යම් ජනේලයක් විවෘත කිරීමට සැලැස්වීම හෝ විවෘත කර තැබීමට සැලැස්වීම හෝ අවශ්‍ය නොවන්නේය.

12. සෑම වර්ෂයකදීම මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් යන මාසවලදී පමණ වතාවක් සහ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් නියම කරනු ලබන වෙනත් අවස්ථාවල සෑම කාමරයකම අභ්‍යන්තර බිත්ති සහ සිවිලිම් හුණු පිරියම් කිරීමට ද දැවයෙන් කළ කොටස් හුණු පිරියම් කිරීමට ද, ඒවා තෙල් සායම් නොකොට ඇත්නම් උණු ජලය සහ සබන් යොදා සේදීමට ද, ලැඟුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම සැලැස්විය යුතුය.

13. ලැඟුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම, ලැඟුම් නිවාසයේ සෑම කොටසක්ම එහි වටාපිටාව, සහ කාණු නොකඩවා අලුත්වැඩියා කර පිරිසිදුව සහ බලපත්‍රලත් ස්ථානයේ යම් කාණුවකින්, වැසිකිළියකින්, කසළ වලකින් හෝ වෙනත් පිළිවෙතකින් උද්ගත වන දුර්ගන්ධ වලින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතුය. සෑම භාණ්ඩ, භාජන, සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂක තත්ත්වයකින් තබා ගැනීමට ඔහු සැලැස්විය යුතුය.

14. ලැඟුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම, මධ්‍යාහ්නයට පෙර, දිනකට යටත් පිරිසෙයින් එක් වරක්වත් සෑම කාමරයක්ම, දොරකඩක්ම, කිසි පොළවම, බරාදයක්ම, කාණුවක්ම සහ ස්ථානයට අයත් ඉඩමක්ම අතුගෑමට සැලැස්විය යුතුය.

15. ලැඟුම් නිවාසයකම සෑම බලපත්‍රලාභියකුම, පිසින ලද සියලු ආහාර මැස්සන්ට සහ කෘමීන්ට ඇතුළු විය නොහැකි ආකාරයකට තබා ගැනීමට සැලැස්විය යුතුය.

16. ලැඟුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම, සියලු කුණුකොල්ලු සහ අපද්‍රව්‍ය, හෝ වෙනත් පිළිකුල් ද්‍රව්‍ය, ලෝහවලින් හෝ මල නොබැඳෙන ලෝහයකින් හෝ සාදන ලද ආවරණ භාජනයක එකතු කර තැබීමටත් දිනපතා එහි ස්ථානයෙන් ඉවත් කරනු ලැබීමටත් සැලැස්විය යුතුය. අපද්‍රව්‍ය ඇත්ත වශයෙන්ම එහි බහාලන අවස්ථාවලදී හැර, භාජනය සෑම විටම වසා තැබිය යුතුය.

17. ලැඟුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු විසින්, යම් බෝවෙන, ස්පර්ශයෙන් බෝවෙන හෝ වර්ම්ගත රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකු තම ස්ථානයට ඇතුළත් කර ගැනීම කරනු නොලැබිය යුතුය.

18. (i) ලැඟුම් නිවාසයක යම් තැනැත්තකුට, බෝවෙන ස්පර්ශයෙන් බෝවෙන හෝ වර්ම ගත රෝගයක් වැළඳුන හොත් එම ලැඟුම් නිවාසයේ බලපත්‍රලාභී විසින්, ඒ බව ලැඟුම් නිවාසය පිහිටා ඇති කොට්ඨාශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත හෝ සභාපතිවරයා වෙත හෝ වහාම දැනුම් දෙනු ලැබිය යුතුය. එම ලැඟුම් නිවාසයේ බලපත්‍රලාභී විසින්, සභාපතිවරයා විධාන ආකාරයකට එම නිවාසය පොදු විෂබීජ නාශක කර විෂබීජ නාශ හුණු පිරියම් කිරීමට සැලැස්විය යුතුය.

(ii) එම ස්ථානය පරීක්ෂා කරනු ලැබ රෝග බෝවීමෙන් එම ස්ථානය නිදහස් බවට සභාපතිවරයා විසින් සහතික කරනු ලබන තුරු (I) වන ඡේදයෙහි සඳහන් ලැඟුම් නිවාසයක බලපත්‍රලාභී විසින් කිසිදු නවාතැන්කරුවකු ඇතුළත් කර ගැනීම කරනු නොලැබිය යුතුය.

19. ලැඟුම් නිවාසයක කිසිදු බලපත්‍රලාභියකු විසින්, ගොඩනැගිල්ල තුළ ගවයන් එළුවන් හෝ කුකුළන් තබා ගැනීමට ඉඩ නොදිය යුතුය.

20. ලැඟුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකු විසින්ම එම නිවාසයට අයත් සෑම දිය වැසිකිළියකම වළ වැසිකිළියකට හෝ අනු පොසයකම ආසනය, බිම සහ බිත්ති පිරිසිදු සහ සනීපාරක්ෂක තත්ත්වයෙන් තබා ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය තාක් දුරට එම ආසනය බිම සහ බිත්ති කලින් කල පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

21. ලැඟුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම එම නිවාසයේ භාවිත කරනු ලබන සියලු ඇඳුරු සහ ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට සහ සෑම ඇඳ ආවරණයක්ම පිරිසිදු සහ සනීපාරක්ෂක තත්ත්වයෙන් තබා ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වන තාක් දුරට එම ඇඳුරු ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට සහ ඇඳ ආවරණ කලින් කල පිරිසිදු කරනු ලැබීමට සැලැස්විය යුතුය.

22. (i) සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලියවිල්ලකින් බලය පවරණ ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකු විසින් හෝ සියලු සාධාරණ වේලාවලදී, යම් ලැඟුම් නිවාසයකට ඇතුළුව එය පරීක්ෂා කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

(ii) ලැඟුම් නිවාසයේ බලපත්‍රලාභී හෝ එය භාරව සිටින තැනැත්තා හෝ විසින්, සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියකුට ලැඟුම් නිවාසයට ඇතුළුව එය පරීක්ෂා කිරීමට ඉඩදිය යුතු අතර, එම සභාපතිවරයාට හෝ නිලධාරියාට අවශ්‍ය විය හැකි සියලු තොරතුරු ඔහු විසින් ලබා දෙනු ලැබිය යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, නීති අධිකරණයක වරදකරු කළ විට රුපියල් පන්සිය පණහකට නොවැඩි දඩයකින් ද වරද දිගටම කරගෙන යන අවස්ථාවක එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එම කඩ කිරීම පිළිබඳව දැනුම් දෙන කරවමින් සභාවේ වරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකුගෙන් ලියවිල්ලකින් වූ දැන්වීමක් භාර දීමෙන් පසුව, ඉන් කඩ කිරීම දිගටම කරගෙන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පණහකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතුය.

24. නීති අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් පනවනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් දෙවරක් හෝ ඊට වැඩි අවස්ථා ගණනක හෝ කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු වූ බලපත්‍රලාභියකුගේ බලපත්‍රය, එම අධිකරණය විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර, එම අවලංගු කිරීම වෙනුවෙන් යම් වන්දියක් ලබා ගැනීමේ අයිතියක් එම බලපත්‍ර ලාභීට නොතිබිය යුතුය.

## 12. අගුමෙවල් සහ වැසිකිළි ඉදිකිරීම සහ නඩත්තුකිරීම

01. යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ඒ සඳහා අවසර පත්‍රයක් ලබා ගෙන ඇත්නම් මිස එම ස්ථානයෙහි යම් අගුමෙයක් හෝ වැසිකිළියක් ඉදි කරනු නොලැබිය යුතුය.

02. යම් තැනැත්තකු 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක ඔහු ඉදිකිරීමට අදහස් කරන අගුමෙහි හෝ වැසිකිළියෙහි හෝ සැලැස්මක් සහ පිරිවිතර සපයන ලෙස සභාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

03. සභාපතිවරයා විසින් 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රදානය කරනු ලබන අවසර පත්‍රයක් මගින්, ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද වර්ගයක සහ එම අවසර පත්‍රයෙහි නිශ්චිත කරනු ලැබ ඇති ස්ථානයෙහි එහි නිශ්චිත ආකාරයක අගුමෙයක් හෝ වැසිකිළියක් සපයන ලෙස ඉල්ලුම්කරුට විධාන කරනු ලැබිය හැකිය.

04. සභාපතිවරයාගෙන් අවසර පත්‍රයක් නොමැතිව හෝ 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක නිශ්චිත කිසියම් නියමයකට පටහැනිව හෝ, යම් ස්ථානයක යම් අගුමෙයක් හෝ වැසිකිළියක් හෝ ඉදි කරනු ලැබ ඇත්නම්, සභාපතිවරයා විසින් ම එම ස්ථානයෙහි අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් එම අගුමෙය හෝ වැසිකිළිය එම දැන්වීමෙහි නිශ්චිත කාලසීමාව ඇතුළත කඩා දමන ලෙස එම අයිතිකරුට හෝ පදිංචිකරුට විධාන කරනු ලැබිය හැකිය.

05. සභාපතිවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් යම් ස්ථානයක පදිංචිකරු හෝ අයිතිකරු වෙත භාර දීමෙන් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද පරිමාණයක සහ වර්ගයක අගුමෙයක් හෝ වැසිකිළියක් එම දැන්වීමෙහි නිශ්චිත කර ඇති ආකාරයකට සහ එහි නිශ්චිත කර ඇති සම්බන්ධිත කාලය ඇතුළත එම ස්ථානයෙහි ඉදිකරන ලෙස එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත විධාන කරනු ලැබිය හැකිය.

06. සභාපතිවරයාගේ මතයට අනුව, යම් අගුමෙයක් හෝ වැසිකිළියක්—

(අ) ගොඩනැඟිල්ලේ ව්‍යුහය සම්බන්ධයෙන් දෝෂ සහිත නම්, හෝ

(ආ) එය පාවිච්චි කරනු ලබන්නේ යම් කාර්යයක් සඳහාද ඒ කාර්යය සඳහා නුසුදුසු නම් හෝ

(ඇ) සනීපාරක්ෂක නොවේ නම් හෝ සෞඛ්‍යයට හානිකර නම්, හෝ

(ඈ) වසුරු ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් සපයා ඇති කාර්යයකට සම්බන්ධ නොවේ නම් හෝ ඉන් පසුවෙන් සේවයක් සැපයිය නොහැකි නම්,

අගුමෙය හෝ වැසිකිළිය සපයා ඇති යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ දැන්වීමෙහි නිශ්චිත කාලය ඇතුළත එහි සඳහන් ආකාරයට එම අගුමෙය හෝ වැසිකිළිය හෝ අලුත් වැඩියා කරන ලෙස, වෙනස් කරන ලෙස හෝ නැවත ඉදිකරන ලෙස සභාපතිවරයා විසින් එම අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ විධාන කරනු ලැබිය හැකිය.

07. අගුමෙයක් හෝ වැසිකිළියක් සපයා ඇති යම් ස්ථානයක සෑම පදිංචිකරුවකුම, සියලු කාලවකවානුවලදීම එම අගුමෙය හෝ වැසිකිළිය සනීපාරක්ෂක තත්ත්වයකින් සහ හොඳ අලුත්වැඩියා කළ තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතුය.

08. කිසියම් නිශ්චිත ප්‍රදේශයක වසුරු කාර්යක්ෂම ඉවත් කිරීම සඳහා එම ප්‍රදේශයේ ස්ථානවල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විසින් පවු මාවත් සපයනු ලැබිය යුතු යයි ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලබන කොං අවස්ථාවක වුවද සභාපතිවරයා විසින් එම ප්‍රදේශයේ යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, එම දැන්වීමෙන් නිශ්චිත කාලය තුළ කිසිදු විට මීටර් 3.0 කට වැඩි නොවන පළලකින් යුක්ත එහි සඳහන් තත්ත්වයක පවු මගක් සභාපතිවරයා විසින් එම දැන්වීමෙහි නිශ්චිත කරනු ලබන ආකාරයකට සපයන ලෙස සභාපතිවරයා විසින් විධාන කරනු ලැබිය හැකිය.

09. යම් තැනැත්තකු විසින් ඉදි කිරීමට අදහස් කරන යම් ගොඩනැඟිල්ලක යම් සැලැස්මක් ද වනහොත්, හෝ පිරිවිතරයක් සභාපතිවරයා විසින් අනුමත කිරීම සභාව විසින් අනුමත කරන ලද පරිමාණයක සහ වර්ගයක අගුමෙයක් හෝ වැසිකිළියක් ඒ ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීමට එම තැනැත්තා එකඟ වූව හොත් මිස ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

10. මේ අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූයේ යම් තැනැත්තකු වෙත ද ඒ සෑම තැනැත්තකු ම ඒ දැන්වීමෙහි නිශ්චිත කාල සීමාව ඇතුළත ඒ දැන්වීමේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය.

11. මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සිය පණහකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතුය.

## 13. ග්‍රැමෆෝනයන්, ශබ්ද වාහිනී යන්ත්‍ර ආදිය ක්‍රියා කරවීම

1. කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත, ග්‍රැමෆෝනයක් ශබ්ද වාහිනී යන්ත්‍රයක්, ශබ්ද විකාශන යන්ත්‍රයක් හෝ ස්වයංක්‍රීය හෝ යාන්ත්‍රිකව ශබ්දය නිපදවන හෝ ප්‍රතිරාවය කරන වෙනත් උපකරණයක් ක්‍රියා කරවීමෙන් හෝ ක්‍රියා කරවීමට සැලැස්වීමෙන් හෝ ක්‍රියා කරවීමට වෙනත් තැනැත්තකුට ඉඩ දීමෙන්, එම ශබ්දයේ අධිකත්වය හෝ එහි පුනරාවර්තනය හෝ එහි අඛණ්ඩ ස්වභාවය හේතු කොටගෙන අසල්වාසී ස්ථානවල පදිංචිකරුවන්ට පීඩාකාරී වන යම් ශබ්දයක් නිපදවීම හෝ ප්‍රතිරාවය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතුය.

2. ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කරනු ලබන සෑම කඩ කිරීමක් සඳහාම රුපියල් පන්සිය පණහකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතුය.

3. එසේ වුවද, විදියක්, ප්‍රසිද්ධ ස්ථානයක්, කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් හෝ මහජනයා ඇතුළත් කර ගනු ලබන්නා වූ ද යම් විදියකට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට යාබද වූ ද ස්ථානයක් නොවන ස්ථානයක ඉහත කී පරිදි යම් උපකරණයක් ක්‍රියා කරවන, ක්‍රියා කරවීමට සලස්වන හෝ ක්‍රියා කරවීමට වෙනත් යම් තැනැත්තකුට ඉඩදෙන යම් තැනැත්තකුට විරුද්ධව එවැනි යම් කඩ කිරීමක් සම්බන්ධයෙන්,—

(අ) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත, පීඩාව බලපෑ අසල්වාසී සහ මුළිකයන් නියෝජනය කරන ගෘහ සංඛ්‍යාවක් විසින් පීඩාව පිළිබඳ ලියවිල්ලකින් පැමිණිලිකර ඇත්නම් ; සහ

(ඇ) ලැබී ඇති පැමිණිල්ලෙහි ස්වභාවය සඳහන් කරමින් වහාම හෝ නියමිත කාල සීමාවක් ඇතුළත හෝ පිළියම් කරන ලෙස ඉල්ලමින් සභාපතිවරයා විසින් ඒ තැනැත්තා වෙත ලියාපදිංචි තැපැල් මගින් යවන ලද දැන්වීමක් භාරදී ඇත්නම් ; සහ

(ඈ) එම දැන්වීම ලැබුණු විට වහාම හෝ නියමිත කාල සීමාව ඇතුළත හෝ ඒ අනුව කටයුතු කිරීම ඒ තැනැත්තා පැහැර හැර හෝ මිස, තාවූ කටයුතු පවරනු නොලැබිය යුතුය.

## 14. හෝටල්

1. (1) මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් හැඳින්වෙන, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ඒ කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ඇතිව හැර කිසිම තැනැත්තකු විසින්, හෝටලයක් පවත්වා ගෙන නොයා යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, එය 22 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කර ඇත්තේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින අවසාන වන්නේය.

2. බලපත්‍රය ලබාගැනීමට ඇති ස්ථානය, මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිම තැනැත්තකුට හෝටලයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලැබීමට හිමිකම නොමැත.

(1) ස්ථානය ශක්තිමත්ව ඉදිකර තිබිය යුතු අතර මනා අලුත්වැඩියා තත්ත්වයෙන් තිබිය යුතුය. තවද සෑම කාමරයකටම හොඳින් වාතාශ්‍රය සහ ආලෝකය සපයා තිබිය යුතු අතර, විවෘත කළ හැකි ජනෙල් සවිකර තිබිය යුතුය. විවෘත කළ විට ජනෙල්වල වර්ග ප්‍රමාණය, කාමරයේ පොළොව මතුපිට වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් එක් පංගුවකට වඩා අඩු නොවිය යුතුය. සෑම කාමරයකම අවම භූමි ප්‍රමාණය වර්ග මීටර් 11.15ක් විය යුතුය.

(2) සෑම කොටසකම සෑම කාමරයකම බිත්ති උසින් මීටර් 3.05 කට අඩු නොවිය යුතු අතර, හුණු පිරියම් කර තිබිය යුතුය.

(3) අඩුව, පොළොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 1.83ක් උසින් විය යුතුය.

(4) වහල යම් ස්ථිර ද්‍රව්‍යකින් සෑදා තිබිය යුතුය.

(5) ලීයෙන් කළ සියලු කොටස් තෙල් සායම් ගා හෝ හුණු පිරියම් කර තිබිය යුතුය.

(6) බිම්මහලෙහි බිම සම්පූර්ණයෙන් සිමෙන්ති දමා තිබිය යුතුය.

(7) ස්ථානයට ප්‍රමාණවත් ජලාපවහනයක් සපයා තිබිය යුතුය.

(8) ස්ථානයට ප්‍රමාණවත් විශාලත්වයකින් යුත් කසළභාජන, නිවාසයෙන් ඉවතලන ද්‍රව්‍ය දැමීම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබිය යුතුය.

(9) සියලු සෞඛ්‍යාරක්ෂක අවශ්‍යතා සපුරා ලීමට සඳහා ප්‍රමාණවත් ස්නානය කිරීමේ සහ වැසිකිළි පහසුකම් ද සපයා තිබිය යුතුය. ස්ථානය සඳහා බලපත්‍රය ලබා ගන්නේ තැනැත්තන් යම් සංඛ්‍යාවකගේ ඉඩ පහසුකම් සඳහා ද ඒ සෑම දසදෙනෙකුට ම යටත් පිරිසෙයින් එක් වැසිකිළියක් බැගින් වන සේ එම වැසිකිළි පහසුකම් සම්පාදිත විය යුතුය.

(10) ස්ථානයට සුදුසු ජලසම්පාදනයක් සපයා තිබිය යුතුය. ස්ථානය කරන තැනැත්තන් නිසා බීමට සපයා ඇති ජලය අපවිත්‍ර වීම වැළැක්වෙන සේ බීමට ගන්නා ජලය සැපයුම සහ ස්නානය කිරීමේ ඉඩපහසුකම් පිළිවෙල කර තිබිය යුතුය.

(11) මැතාවින් දුම් පිටවන දුම් කවුළුවක් සහිත මුළුතැන්ගෙයක් ලෙස වෙන් කරන ලද වෙනම කාමරයක් ස්ථානයෙහි තිබිය යුතුය.

3. (1) යම් හෝටලයක් සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති කාලසීමාව තුළ යම් අවස්ථාවක ඒ හෝටලයේ කාර්ය සඳහා පාවිච්චි කරන ගොඩනැඟිල්ල (2)වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල නොවන තත්ත්වයකට පත් වූවහොත් ඒ ගොඩනැඟිල්ල එකී විධිවිධානවලට අනුකූල තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය සියලු දෑ දැන්වීමේ නියමිත කොට දැක්වෙන දිනයකට පෙර සිදු කරන ලෙස නියම කරන දැන්වීමක් සභාපතිවරයා විසින් හෝටලයේ බලපත්‍රධාරියා වෙත භාර කරවීමට සැලැස්විය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ කිසිම හෝටල් බලපත්‍රලාභියක් ඒ දැන්වීමේ නියමිත කොට දැක්වෙන කාලය ඇතුළත ඒ දැන්වීම අනුව කටයුතු කිරීම පැහැර නොහැරිය යුතුය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ වූ කවර හෝ දැන්වීමක් බලපත්‍රධාරියකු හෝටල් ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ ඇලවූ කොට හෝ බලපත්‍රධාරියා විසින් ඒ ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති තැනැත්තකු වෙත භාර කියහොත් හෝ එය බලපත්‍රධාරියාට භාර දෙනු ලැබ ඇතැයි සැලකිය යුතුය.

4. සෑම හෝටල් බලපත්‍රධාරියකුම හෝටල පිළිබඳ වන මේ අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ පිටපතක් රාමුගත, හෝටලයේ ප්‍රධාන දොරටුව ළඟ එල්ලා තැබීමට සැලැස්විය යුතුය. ඔහු විසින් ඔහුගේ සියලුම සේවා නියුක්තයන්ගේ නම් සහ ලිපින දැක්වෙන ලැයිස්තුවක් සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ සියලු යුක්ති සහගත වේලාවන්හි පරීක්ෂා කළ හැකි වන සේ, බලපත්‍ර ලත් ස්ථානයෙහි තබා ගත යුතුය.

5. හෝටලයක් සඳහා වන සෑම බලපත්‍රයකට ඒ බලපත්‍ර ලත් ස්ථානයේ සැලැස්මක් අමුණා තැබීමට, සභාපතිවරයා විසින් සැලැස්විය යුතු අතර, ඒ සැලැස්මේහි නිදන කාමර සහ ඒ එක් එක් කාමරයේ බිම ප්‍රමාණයෙන් එක් තැනැත්තකු සඳහා වන ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 3.72 කට වැඩි වන පරිදි, ඒ එක් එක් කාමරයේ නිදා ගැනීමට අවසර ඇති තැනැත්තන් සංඛ්‍යාව පෙන්නුම් කළ යුතුය. වයස අවුරුදු දහයට අඩු ළමයින් දෙදෙනෙකු, මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා එක් තැනැත්තකු ලෙස ගණන් ගත යුතුය

6. බලපත්‍රයට අමුණා ඇති හෝටලයේ සැලැස්මේ, නිදන කාමර ලෙස නියමිතව වෙන්කර ඇති කාමරයක හැර, කිසිම තැනැත්තකුට හෝටලයේ නිදා ගැනීමට කිසිම හෝටල බලපත්‍ර ධාරියකු විසින් ඉඩ නොදිය යුතුය.

7. සැලැස්මේ නියමිතව දැක්වෙන සංඛ්‍යාවට වැඩි තැනැත්තන් සංඛ්‍යාවකට කිසිම කාමරයක නිදා ගැනීමට කිසිම හෝටල බලපත්‍රධාරියකු විසින් ඉඩ නොදිය යුතුය.

8. බලපත්‍රලත් ස්ථානයෙහි නතර වී සිටින එක් එක් තැනැත්තාගේ නම, රැකියාව, උපන් ස්ථානය සහ අවසාන තාවකාලික හෝ ස්ථිර ලිපිනය දැක්වෙන ලේඛනයක් සෑම හෝටල් බලපත්‍රධාරියකු විසින් ම තබා ගත යුතුය.

9. එක් එක් නිදන කාමරයේ පත්තල, සෑම දිනයකම යටත් පිරිසෙයින් පැය තුනකට වරක් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සෑම හෝටල බලපත්‍රධාරියකු විසින්ම සැලැස්විය යුතුය.

රෝග වූවද කාලගුණ තත්වය අනුව පත්තල විවෘත තැබීම අවශ්‍ය වන අවස්ථාවන්හිදී යම් ජනේලයක් විවෘත කළ යුතු යයි හෝ විවෘත කර තැබිය යුතු යයි බලපත්‍ර ධාරියාට නියම නොකළ යුතුය.

10. සෑම හෝටල් බලපත්‍රධාරියකු විසින්ම, අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේදී ද සභාපතිවරයා විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් වේලාවන්හිදී ද සෑම කාමරයකම ඇතුළත බිත්ති හුණු පිරියම් කිරීමට හෝ තෙල් සායම් ආලේප කර ඇත්නම් සබන් සහ උණුවතුරෙන් සේදීමට සැලැස්විය යුතුය.

11. සෑම හෝටල් බලපත්‍රධාරියකු විසින්ම හෝටලයේ සෑම කොටසක්ම සහ එය වටා ඇති කාණු පිරිසිදුව සහ මදුරුවන්ගෙන් තොරව ද තබා ගැනීම සැලැස්විය යුතුය. ඒ ස්ථානයේ ඇති කසළ බහාලන භාජන ආදිය සහ උපකරණ ආදිය පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් තබා ගැනීම සැලැස්විය යුතුය.

12. (1) සෑම හෝටල් බලපත්‍රධාරියකු විසින්ම ඔවුන්ගේ සේවකයන් දවසකට වරක්වත් සෑම කාමරයක් අතුගා පිරිසිදු කර, විශේෂයෙන් ඇඳ ඇතිරිලි සහ කොට්ට උර ද අතු ගෑමට සැලැස්විය යුතුය.

(2) සෑම හෝටල් බලපත්‍රධාරියකු විසින්ම සියලු කැලිකසළ ගෙන අපද්‍රව්‍ය සහ වෙනත් මිටියාවි ද අනුමැත පිළිවෙළට හෝ ගැලවීමට යොමු කරනු ලැබිය යුතු අතර, ඒවා බලපත්‍රලත් ස්ථානයෙන් දිනපතාම ඉවත් කරනු ලැබීමට සැලැස්විය යුතුය. එම කැලිකසළ ගෙන අපද්‍රව්‍ය හෝ මිටියාවි ද භාජනයට බහාලන අවස්ථාවේ දී හැර අන් සෑම වේලාවකම ඒ භාජනය වසා තැබිය යුතු සැලැස්විය යුතුය.

13. පිසින ලද සියලු ආහාර මැස්සන් හෝ වෙනත් කෘමීන් ගෙන් ආරක්ෂාවන පරිදි තැබීමට සෑම හෝටල් බලපත්‍රධාරියකුම විසින්ම සැලැස්විය යුතුය.

14. යම් ආසාදක ස්පර්ශක හෝ වමනය රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකු බලපත්‍රලත් ස්ථානයට කිසිම හෝටල් බලපත්‍රධාරියකු විසින් ඇතුළු කර නොගත යුතුය.

15. හෝටලයේ සිටින යම් තැනැත්තෙක් යම් ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් රෝගී වුවහොත් ඒ හෝටලයේ බලපත්‍රධාරියා ඒ බව ඒ හෝටලය පිහිටා ඇති ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට හෝ සභාපතිවරයාට හෝ අනුමැතව දැනුම් දිය යුතු අතර, හෝටලය හිස් කරන ලෙස සභාපතිවරයා විසින් නියම කරනු ලැබුවොත් බලපත්‍රධාරියා විසින් එය එසේ හිස් කළ යුතුය.

තවද ඒ ආසාදනයට භාජනවූ තැනැත්තා විසින් පාවිච්චි කරන ලද ඇඳ ඇතිරිලි, රෙදිපිළි සහ වෙනත් භාණ්ඩවල විෂබීජ නැසීමට හෝ අවශ්‍ය වුවහොත් ඒවා විනාශ කිරීමට ද සභාපතිවරයා විධාන කරන ආකාරයට, මහජන මුදලින් එය ද ධූමායනය කිරීමට, එහි විෂබීජ නැසීමට සහ හුණු ආලේප කිරීමට ඒ බලපත්‍රධාරියා විසින් ඉඩ දෙනු ලැබිය යුතුය.

16. ආසාදක හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන තැනැත්තකු සොයාගනු ලැබූ හෝටලයකට, කිසිම හෝටල බලපත්‍රධාරියකු විසින්, ඒ බලපත්‍රලත් ස්ථානය ආසාදනයෙන් තොර බවට සභාපතිවරයා විසින් පරීක්ෂා කර සහතික කරන තෙක්, කිසිම ගනුදෙනුකාර අමුත්තෙකු භාර නොගත යුතුය.

17. හෝටලය ඇතුළත බල්ලන්, බළලුන් හෝ කුකුළන් තබා ගැනීමට කිසිම හෝටල බලපත්‍රධාරියකු විසින් ඉඩ නොදිය යුතුය.

18. සෑම හෝටල බලපත්‍රධාරියකුම, බලපත්‍රලත් ස්ථානය මීයන්ගෙන්, දඩාවතේ යන බල්ලන්ගෙන්, බළලුන්ගෙන් සහ තවයන්ගෙන් ද මැස්සන් ගෙන්, මදුරුවන්ගෙන් සහ රෝග වාහක කෘමීන්ගෙන් ද තොරව තබාගත යුතුය.

19. (1) සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ඒ කාර්යය සඳහා පොදුවේ හෝ විශේෂයෙන් බලය දෙන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු හෝ විසින් සියලු යුක්තිසහගත වේලාවන්හිදී කවර හෝ හෝටලයකට ඇතුළුවීම සහ එය පරීක්ෂා කිරීම, නීත්‍යානුකූල වන්නේය.

(2) සභාපතිවරයාට හෝ හෝටලයක් පවත්නා ස්ථානයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝටලයේ බලපත්‍රධාරියා හෝ හෝටලය භාරව සිටින තැනැත්තා හෝ විසින් ඉඩදිය යුතු අතර, සභාපතිවරයාට හෝ ඒ අවසර නිලධරයාට හෝ අවශ්‍ය විය හැකි සියලු සහාය සපයනු ලැබිය යුතුය.

20. හෝටල් සම්බන්ධයෙන් වන මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳව වන සෑම උල්ලංඝනය කිරීමක් ම රුපියල් සත්සිය පනහක් නොඉක්මවන දඩයකින් ද ඒ උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ සභාපතිවරයා විසින් නැතහොත් සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධරයකු විසින් ඒ උල්ලංඝනය සම්බන්ධ අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් භාර කරවනු ලැබීමෙන් පසුව හෝ ඒ වරද සිදුවන් කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන් ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින් ද දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

21. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, හෝටල් සම්බන්ධයෙන් වන මේ යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රධාරියකුගේ බලපත්‍රය ඒ අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, ඒ අවලංගු කිරීම වෙනුවෙන් කිසි වන්දියක් ලැබීමට ඒ බලපත්‍රධාරියාට හිමිකමක් නොමැති විය යුතුය.

## II. බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි

1. (1) (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ඇත මිස කිසිම තැනැත්තකු විසින් බත්කඩයක්, ආපනශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් පිහිටුවීම හෝ එහි ව්‍යාපාරය කරගෙන යාම නොකළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, 25 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවොත් මිස, එම බලපත්‍රය නිකුත් කිරීමට විෂය වූ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින කාලාවසාන විය යුතුය.

(3) සෑම බලපත්‍රයක්ම නිකුත් කිරීම ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තුවලට යටත් විය යුතුය.

2. බලපත්‍රය නිකුත් කරන ලද ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, බත් කඩයක් හෝ ආපනශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් පවත්වා ගෙන යාම සඳහා වූ බලපත්‍රයක් ලැබීමට කිසිම තැනැත්තකු හිමිකම් නොලැබිය යුතුය. එම කොන්දේසි මෙසේය :—

(1) එම ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් ද මනා ව්‍යාතාශ්‍රයකින් ද මනා ආලෝකයකින් ද යුක්තව පැවතිය යුතු අතර, සෑම කාමරයකම වර්ග මීටර 11.15 ක පමණට ප්‍රදේශයක් තිබිය යුතුය. වාතය කළ හැකි ජනේල සෑම කාමරයකටම සපයා තිබිය යුතු අතර, එම ජනේල විවෘත කළ විට ඒවායේ වර්ග ප්‍රමාණය ගොබිම වර්ග ප්‍රමාණයෙන් දහයෙන් පංගුවකට නොඅඩු විය යුතුය.

(2) සෑම කොටසකම සෑම කාමරයකම බිත්ති උසින් මීටර 2.4 කට නොඅඩු විය යුතු අතර, එම බිත්ති ගඩොලින්, ගලින් හෝ කොන්ක්‍රීට් වලින් තනා ඇතුළත පැත්තේ හුණු කපරාරු කර හුණු ගා තිබිය යුතුය.

(3) සියලු කොලුවලට බිම මට්ටමේ සිට යටත් පිරිසෙයින් මී. 1.83 කට උසින් තිබිය යුතුය.

(4) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය.

(5) ලීවලින් සාදන ලද සියලු කොටස්වල තෙල් සායම් හෝ හුණු ගා තිබිය යුතුය.

(6) මුළු බිම ප්‍රදේශයටම සිමෙන්ති දමා තිබිය යුතුය.

(7) එම ස්ථානයට මනා ජලාපවහනයක් ද, පරිසරයක්ෂක සහල සංස්කෘතිද ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් ද සපයා තිබිය යුතුය.

3. (1) යම් බත් කඩයක්, ආපනශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කාලය තුළ යම් අවස්ථාවක දී එම බත්කඩයේ, ආපනශාලාවේ හෝ තේ හෝ කෝපි කඩයේ කාර්යය සඳහා භාවිතා කරනු ලබන යම් ගොඩනැගිල්ලක් 2 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව පැවතීම අවසානවන අවස්ථාවක, දන්වීමේ නිශ්චිතව සඳහන් දිනයකට පෙර එම ගොඩනැගිල්ල, එම විධිවිධානවලට අනුකූල වන තත්ත්වයකට ගෙන එම සඳහා අවශ්‍ය සියලු දේ කරන ලෙස නියම කෙරෙන දන්වීමක් එම බත්කඩයේ, ආපනශාලාවේ හෝ තේ හෝ කෝපි කඩයේ බලපත්‍රලාභියාට භාරදෙනු ලැබීමට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් හෝ සැලැස්විය හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ ලිඛිත දන්වීමක් භාරදෙනු ලැබූ කිසිම තැනැත්තකු, එහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත එම දන්වීමට අනුකූලව කටයුතු කළ යුතුය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ වූ යම් දන්වීමක්, බලපත්‍ර ලාභියා බත්කඩයේ, ආපනශාලාවේ හෝ තේ හෝ කෝපි කඩයේ ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ අලවනු ලැබුව හොත් එය බලපත්‍රලාභියා විසින් එම ස්ථානයේ සේවය යොදවනු ලැබ ඇති යම් තැනැත්තකු වෙත තබා ගියහොත් එම දන්වීම බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබූ ලෙස සැලකිය යුතුය.

4. බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකුම විසින් ඔහුගේ ස්ථානයේ පිටපැත්තේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් ඔහුගේ නම සහ " බලපත්‍රලත් බත්කඩය " හෝ " බලපත්‍රලත් ආපනශාලාව " හෝ " බලපත්‍රලත් තේ සහ කෝපි කඩය " යන වචන පැහැදිලිව පෙනෙන ආකාරයට අඳින ලද පුවරුවක් සවිකළ යුතුය.

5. බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින් ම බත්කඩ, ආපනශාලා හෝ තේ හෝ කෝපි කඩ සම්බන්ධයෙන් අදාළ වන මේ අතුරු ව්‍යවස්ථාවල පිටපතක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ද බලපත්‍රය ද රාමු කරවා එම ස්ථානයේ ප්‍රකට තැනක එල්ලා තැබිය යුතුය. එම ස්ථානයේ සේවයේ යොදවනු ලැබ සිටින සියලුම සේවා නියුක්තයන්ගේ නම් සහ ලිපිනය ඇතුළත් ලැයිස්තුවක්, සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් සියලු සාධාරණ වේලාවන් වලදී පරීක්ෂා කර බැලිය හැකි වනු පිණිස එම ස්ථානයේ තැබිම විය යුතුය.

6. බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින්ම, බලපත්‍රලත් ස්ථානයේ කොටසක් වන සෑම කාමරයකම බිත්තිවල හා සිලිමේ සෑම අවුරුද්දකටම එක්වරක් දෙසැම්බර් මාසයේ දී හුණු ගෑමට සැලැස්විය යුතුය. ලීවලින් සාදා කොටස්වල හුණු ගෑමට හෝ ඒවායේ තෙල් සායම් හා ඇත්නම් යටත් පිරිසෙයින් අවුරුද්දකට එක් වරක්වත් දෙසැම්බර් මාසයේ දී ද සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනලද යම් තැනැත්තකු විසින් නියම කරනු ලබන වෙනත් කාලවල දී උණුදියෙන් සහ සබන්වලින් සේදීමට හෝ සැලැස්විය යුතුය.

7. බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින්ම එම ස්ථානයේ සෑම කොටසක් ම ද එහි වටපිටාව හා කාණු ද පිරිසිදුව ද මනා අලුත්වැඩියා තත්ත්වයකින් ද බලපත්‍රලත් ස්ථානයේ ඇති යම් කාණුවකින්, වැසිකිළියකින්, කසල වලකින් හෝ වෙනත් මිනිසුන් ඇතිවන දුර්ගන්ධයෙන් තොරව ද පවත්වා ගැනීමට සැලැස්විය යුතුය. ආහාර හෝ පාන වර්ග පිළියෙල කිරීම විකිණීම හෝ පරිභෝජනය කිරීම සඳහා භාවිතා කෙරෙන භාණ්ඩ, භාජන හා උපකරණ පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයකින් ද පවත්වා ගැනීමට සැලැස්විය යුතුය.

8. යම් බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින් ම ආහාර හෝ පානවර්ග පිළියෙල කිරීම, විකිණීම සහ පරිභෝජනය සඳහා වූ සියලු භාජන යටත් පිරිසෙයින් පැය හතරකට වරක්වත් සබන් සහ ජලය යොදා සේදීමට සැලැස්විය යුතුය.

9. යම් බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින් ම එම ස්ථානයේ පාරිභෝගිකයකු විසින් ප්‍රයෝජනයට ගන්නා ලද සෑම භාජනයක් ම එසේ ප්‍රයෝජනයට ගැනීමෙන් පසුව ද වෙනත් තැනැත්තකු විසින් ප්‍රයෝජනයට ගැනීමට පළමුවද වහාම සබන් හා ජලය යොදා සේදීමට සැලැස්විය යුතුය.

10. යම් බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු ම විසින්, ව්‍යාපාර සහ ගෘහ කාර්යවල දී එකතුවන සියලු කැලි කසල අපාරගම්‍ය ද්‍රව්‍යයකින් සෑදූ වැසූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එම කැලි කසල දිනපතා එම ස්ථානයෙන් ඉවත් කිරීමට, සැලැස්විය යුතුය. භාජනයේ කැලි කසල දමන අවස්ථාවේ දී හැර අන් සියලු වේලාවන්වල දී එම භාජනය මූඩි වලින් වසා තැබිය යුතුය. ඉවත දමන තේ, කෝපි, කිරි හෝ ආහාරවලින් ඉතිරි වන ද්‍රව්‍ය හෝ පිලිස්සී දී ඉවතලන දේ සියල්ලම වීසි නොකොට එම භාජනයට දැමීමට සැලැස්විය යුතුය.

11. තේ, කෝපි, හෝ කිරි භාජන හා කවුන්ටරය හෝ වෙනත් ස්ථානයක් තුත්තනාගම් හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර ඇත්නම් මිස, එවැනි කවුන්ටරයක් හෝ ස්ථානයක් කිසිම බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියකු විසින් එම කාර්යය සඳහා භාවිතා නොකළ යුතුය.

12. ස්ථානයට පැමිණෙන තැනැත්තන් මෙන්ම සේවා නියුක්තයින් විසින් ද ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි වූ සනීපාරක්ෂක කසල භාජනයක් ද යටත් පිරිසෙයින් පරීක්ෂාම් ලෙසක් ද යම් බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින් බලපත්‍රලත් ස්ථානයේ සෑම වේලාවකම තබා තිබිය යුතුය.

13. යම් බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු ම විසින්, එම ස්ථානය මීයන්ගෙන්, දඩාවතේ යන බල්ලන්, බළලුන් සහ හරකුන්ගෙන් මැස්සන්ගෙන්, මදුරුවන්ගෙන් සහ රෝග කාරක සතුන්ගෙන් තොරව තබාගත යුතුය.

14. යම් බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු ම විසින්, එම බලපත්‍රලත් ස්ථානයට ප්‍රමාණවත් වන පරිදි බීමට සුදුසු ජලය සැපයිය යුතුය.

15. මැස්සන්ගෙන්, දූවිල්ලෙන් සහ නානා සතුන්ගෙන් දූෂණවීම වැළැක්වෙන පරිදි සකසා ලද භාජනයක ආහාර තබා ඇත්නම් මිස, යම් බත් කඩයක, ආපන ශාලාවක, හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියකු විසින් එම ආහාර තැබීම, තබවා කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය. ඔහු විසින් එම භාජනය පිරිසිදු සහ සනීපාරක්ෂක තත්ත්වයකින් පවත්වා ගත යුතුය.

16. යම් බත් කඩයක, ආපන ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක ස්ථානයකදී බාල කළ කිරි තිබිමක් තබා ගැනීම හෝ විකිණීම නොකළ යුතුය.

මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා '' බාලකල කිරි '' යන්නෙන්, ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයක් එක් කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 8.5 කට අඩු හෝ කිරි මේද සියයට 3.5 කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ට අඩු හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ. මේ අතුරු ව්‍යවස්ථාව කඩ කිරීමක් පිළිබඳව වගකිව යුතු තැනැත්තා බලපත්‍රධාරියා වන්නේය.

17. කෙළ ගැසීම සඳහා තබා ඇති පඩික්කමකට හැර, කිසිම තැනැත්තකු, බලපත්‍රලත් ස්ථානය ඇතුළත කෙළ නොගැසිය යුතුය.

18. යම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙළුනා වූ කිසිම තැනැත්තකු හෝ එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තකුට ළඟදී සාත්තු කරමින් සිටි කිසිදු තැනැත්තකු, ආසාදන හෝ බීජෝෂණ කාලය අවසන් වනතුරු බලපත්‍රලත් ස්ථානයට ඇතුළුවීම හෝ ආහාර හෝ බීම වර්ග හැසිරවීම හෝ විකිණීමෙහිලා සහභාගිවීම නොකළ යුතුය.

19. බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක කිසිම බලපත්‍රලාභියකු විසින් 17 වන අතුරු ව්‍යවස්ථාවේ හෝ 18 වන ව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමට කිසිම තැනැත්තකුට දැන දැනම ඉඩ නොදිය යුතුය.

20. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හා බත් කඩයේ, ආපනශාලාවේ හෝ තේ හෝ කෝපි කඩයේ බලපත්‍රලාභියා විසින් අත්සන් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් ආහාර ගෙන යන තැනැත්තාගේ සන්තකයේ ඇත්නම් මිස ද, යම් පිසූ ආහාර බලපත්‍රලත් ස්ථානයේ සිට වෙළඳ ආහාර වැසූ භාජනයක, විත් භාජනයක හෝ වෙනත් සුදුසු භාජනයක මිස ගෙන යන්නේ නම් මිස ද ... කිසිම බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියකු විසින් කිසිම තැනැත්තකුට ඉඩ ... සඳහා ප්‍රවාහනය කිරීමට කිසිම බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියකු විසින් කිසිම තැනැත්තකුට ඉඩ නොදිය යුතුය.

21. යම් ආහාරයක් අඩංගු කරන අවස්ථාවේ දී එම ආහාර ගෙන යාම සඳහා භාවිතා කෙරෙන සෑම වාහනයක්, කූඩයක්, විත් භාජනයක් හෝ වෙනත් සෑම භාජනයක්ම පිරිසිදුව පවතින බවට බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු ම වගබලා ගත යුතු ... විසින් සභාපතිවරයා වෙත ඉල්ලුම් කළ විට, විකිණීමට ...

22. යම් බත්කඩයක, ආපනශාලාවක, තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියකු විසින් සභාපතිවරයා වෙත ඉල්ලුම් කළ විට, විකිණීමට ගෙන යාම සඳහා එම බලපත්‍රලාභියා විසින් සේවයේ යොදවනු ලබන සෑම තැනැත්තකුගේම ප්‍රයෝජනය සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක්, සභාපතිවරයා විසින් ගාස්තු අය කිරීමකින් තොරව නිකුත් කළ යුතුය.

23. (1) සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් පොදුවේ හෝ විශේෂිතව බලය දෙන ලද ප්‍රාදේශීය සභා යම් නිලධරයකු යම් බත් කඩයකට, ආපනශාලාවකට හෝ තේ හෝ කෝපි කඩයකට සියලු සාධාරණ වේලාවන් ඇතුළත ඇතුළු වී පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) බත් කඩයේ, ආපන ශාලාවේ හෝ තේ හෝ කෝපි කඩයේ බලපත්‍රලාභියා හෝ එම ස්ථානය භාරව සිටින තැනැත්තා, එම ස්ථානයට ඇතුළු වී පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ සභාපතිවරයාගෙන් ලියවිල්ලකින් බලය ලත් තැනැත්තකුට ඉඩදිය යුතු අතර, අවශ්‍ය විය හැකි සියලු පහසුකම් සභාපතිවරයාට හෝ එම නිලධරයාට දිය යුතුය.

24. බත්කඩ, ආපනශාලා හෝ තේ හෝ කෝපි කඩවලට අදාළ මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් සම්බන්ධයෙන් කෙරෙන සෑම කඩ කිරීමක දී වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ එම රුපියල් පන්සිය පණහකට නොවැඩි දඩයකින් ද දිගටම කරගෙන යන කඩ කිරීමක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ ලිඛිත දැන්වීමක් කිරීම පිළිබඳව අවධානය යොමු කරවමින් සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධාරියකුගෙන් ලිඛිත දැන්වීමක් ලැබීමෙන් පසු එම කඩ කිරීම දිගටම සිදු කරගෙන යන සෑම දිනයක් සඳහා රුපියල් සියයකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ...

25. බත් කඩ, ආපනශාලා හෝ තේ හෝ කෝපි කඩවලට අදාළ මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබ ඇති බලපත්‍රලාභියකුට අධිකරණය විසින් පනවනු ලබන වෙනත් යම් දඬුවමකට අතිරේකව ඔහුගේ බලපත්‍රය නිසි බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, එම අවලංගු කිරීම සම්බන්ධයෙන් කිසිම වන්දියක් ලැබීමට බලපත්‍රලාභියාට හිමිකම් නොලැබිය යුතුය.

## 16. බේකරි

1. මේ අතුරු ව්‍යවස්ථාවල "බේකරිය" යන්නෙන් විකිණීම සඳහා පාන්, විස්කෝතු හෝ රස කැවිලි, සාදන යම් ස්ථානයක් අදහස් වන අතර ඊට එවැනි ආහාර පිළියෙල කරනු ලබන හෝ එවැනි ආහාර පිළියෙල කිරීම සඳහා ද්‍රව්‍ය ගබඩා කර තිබෙන යම් ස්ථානයක් ද ඇතුළත් වේ.

2. (1) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් හෝ ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් යම් බේකරියක් පිහිටුවීම හෝ බේකරි ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම හෝ කරනු නොලැබිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, 27 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවා නොවේ නම්, එය නිකුත් කරනු ලැබූ යම් වර්ෂයක් වෙනුවෙන් ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් අවසන් විය යුතුය.

(3) සෑම බලපත්‍රයක්ම නිකුත් කිරීම ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තුවට යටත් විය යුතුය.

3. බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ යම් ස්ථානයක් වෙනුවෙන් ද ඒ ස්ථානය සහ බේකරියේ උපකරණ පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිම තැනැත්තකුට බේකරියක් පවත්වා ගැනීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම් නොතිබිය යුතුය.

(1) (අ) ස්ථානය හොඳ අලුත්වැඩියා කළ තත්ත්වයෙන් තිබිය යුතු අතර, එහි මනා වාතාශ්‍රය ඇතිව හොඳින් ආලෝකය සපයා තිබිය යුතු විවෘත කරනු ලැබූ විට වර්ගඵලය, මතුපිට බිම ප්‍රමාණයෙන් පහළොවෙන් එකකට නොඅඩු විවෘත කළ හැකි ජනේල සෑම කාමරයක සපයා තිබිය යුතුය.

(ආ) සෑම කාමරයකම සෑම කොටසකම බිත්ති උසින් මීටර් 3.1 කට අඩු නොවිය යුතු අතර, ගඩොලින්, ගලින් හෝ කොන්ක්‍රීට්වලින් ඒවා තනා, එහි ඇතුළත හුණු කපරාරු කර, හුණු පිරියම් කර තිබිය යුතුය.

(ඇ) සියලු කෙළවරට බිම සිට යටත් පිරිසෙයින් මීටර් 1.83 ක් තිබිය යුතුය.

(ඈ) වහළ යම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය.

(ඉ) ද්‍රව්‍යයෙන් කළ කොටස්වල තෙල් සායම් ගා හෝ හුණු පිරියම් කර තිබිය යුතුය.

(ඊ) පොළොව සම්පූර්ණයෙන්ම සිමෙන්ති යොදා තිබිය යුතුය.

(උ) එම ස්ථානයට ප්‍රමාණවත් ජලපවහන සැපයුම තිබිය යුතුය.

(2) (අ) පිටි ඇනීම කරන කාමරයට වර්ග මීටර් 16.75 කට අඩු නොවන මතුපිට බිම ප්‍රමාණයක් තිබිය යුතු අතර, බිත්තිවල ඇතුළත මතුපිට පොළවේ සිට මීටර් 1.2 ක් ඉහළට උළු අල්ලා සිමෙන්ති යොදා කපරාරු කර තිබිය යුතුය.

(ආ) දොරවල් සහ ජනේල් සහිත පිටි අනන කාමරයේ යටත් පිරිසෙයින් පැති දෙකකවත් පළලින් මීටර් 2.14 කට නොඅඩු නිදහස් ... අවකාශයක් තිබිය යුතුය.

(ඇ) උළුගෙන් පෙර කෙළින්ම පිටි අනන කාමරයට විවෘතව නොතිබිය යුතුය.

(ඈ) සෑම පිටි අනන කාමරයකටම, කපරාරු කර හුණු පිරියම් කර ඇති හෝ එකට හැඩූ පාවුවලින් සාදා හුණු පිරියම් කර ඇති හෝ ... සායම් ගා ඇති සිවිලිමක් සපයා තිබිය යුතුය.

(3) (අ) පාන් සෑදීමේ දී ප්‍රයෝජනය ගන්නා තැටි, මේස සහ සියලු භාජන සහ බිත්ති සේදීමේ කාර්යය සඳහා එහා මෙහා ... හැකි විය යුතුය.

(ආ) පාන් සෑදීමේදී පාවිච්චි කරන මේසවල මතුපිට, මනාව පදම් කරන ලද එකිනෙකට තදින් සවිකළ ලෑලිවලින් හෝ ... ගැල්වනයිස් ද්‍රව්‍යයකින් හෝ සාදා තිබිය යුතුය.

(4) (අ) බේකරියට සනීපාරක්ෂක කසළ භාජනයක් පඩික්කම් දෙකක්, සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ආ) බේකරිය, කිසියම් වැසිකිළියකින්, කසළ වළකින් පොහොර ගොඩකින් හෝ විවෘත ජලාපවහන කානුවකින් යටත් පිරිසෙයින් මීටර් 15.24 කට ඈතින් තිබිය යුතුය.

(ඇ) බේකරියක් තුළ හෝ බේකරියට කෙළින්ම සම්බන්ධව හෝ කසළ වලක්, වැසිකිළියක් හෝ අලු වලක් නොතිබිය යුතුය.

4. (1) යම් බේකරියක් සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්නම් යම් කාල සීමාවක් සඳහා ද, ඒ කාල සීමාව තුළ යම් අවස්ථාවකදී, ඒ බේකරියේ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන යම් ගොඩනැගිල්ලක්, (3) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල වීම අවශ්‍ය කරන අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලද තැනැත්තකු විසින් හෝ එම බේකරියේ බලපත්‍රලාභී වෙත දැන්වීමක් භාර දීමට සලස්වා, ඒ දැන්වීමේ නියමිත දිනයකට පෙර එම ගොඩනැගිල්ල එම විධිවිධානවලට අනුකූල කිරීම සඳහා අවශ්‍ය සියලු දේ කරන ලෙස ඔහුට නියම කරනු ලැබිය හැකිය.

(2) මේ අනුව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදෙනු ලැබුවේ යම් බේකරියක බලපත්‍රලාභියකුට ද, ඒ බලපත්‍රලාභියා එම දැන්වීමෙහි නියමිත කාලය ඇතුළත, එම දැන්වීමට අනුව කටයුතු කිරීම පැහැර නොහැරිය යුතුය.

(3) (1) වන ඡේදය යටතේ වූ යම් දැන්වීමක්, බලපත්‍රලාභී බේකරිය ව්‍යාපාරය පවත්වා ගෙන යන ස්ථානයෙහි අලවා ඇත්නම් හෝ බලපත්‍රලාභී විසින් එම ස්ථානයෙහි සේවයේ නියුක්ත කර ගෙන සිටින යම් තැනැත්තකු වෙත භාරදී ඇත්නම් හෝ එය බලපත්‍රලාභී වෙත භාර දී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

5. බේකරියක සෑම බලපත්‍රලාභියකු විසින් ම, තම ස්ථානයෙහි පිටත, ප්‍රකටව පෙනෙන පරිදි තම නම සහ "බලපත්‍රලත් බේකරිය" යන වචන පැහැදිලිව සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් පින්තාරු කරන ලද පුවරුවක් එල්ලා තැබිය යුතුය.

6. බේකරිය සෑම බලපත්‍රලාභියකු විසින්ම, බේකරිවලට අදාළ සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් වූ මේ අනුව්‍යවස්ථාවල පිටපතක්, රාමු කර බලපත්‍රලත් ස්ථානයේ පැහැදිලිව පෙනී යන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ සියලු සාධාරණ වේලාවල දී පරීක්ෂා කිරීම පිණිස ලබා ගනු ලැබිය හැකි වන පරිදි (පාන් වෙළෙන්දන් ඇතුළුව) සියලු සේවා නියුක්තයන් ගේ නම් සහ ලිපින ලැයිස්තුවක්ද බේකරියෙහි තබා ගැනීමට සැලැස්විය යුතුය.

7. බේකරියක සෑම බලපත්‍රලාභියකු විසින් ම, බේකරියේ කොටසක් වන සෑම කාමරයකම බිත්ති සහ සිලිම අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේදී හුණු පිරියම් කිරීමට ද, දුමයෙන් කළු කොටස් යටත් පිරිසෙයින් අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී හෝ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ තැනැත්තා විසින් නියම කරනු ලැබූ හොත් වෙනත් යම් අවස්ථාවක දී හුණු පිරියම් කිරීමට හෝ ඒවායේ තෙල් සායම් ගා ඇත්නම් උණු වතුර සහ සබන් යොදා සේදීමට හෝ සලස්වනු ලැබිය යුතුය.

8. බේකරියක සෑම බලපත්‍රලාභියකු විසින් ම, දිනපතාම, බලපත්‍රයෙහි නියමිත යම් වේලාවක දී බිම් සහ බිත්තිවල උළු සහ සිමෙන්ති යෙදූ කොටස් ද, මේසවල මතු පිට ද සේදීමට සලස්වනු ලැබිය යුතුය.

බේකරියේ සෑම කොටසක් මද, එහි වටපිටාව සහ කානු, පිරිසිදු හා හොඳ අලුත්වැඩියා කළ තත්ත්වයෙන් තබා ගැනීමටත්, කිසියම් කානුවකින්, වැසිකිළියකින්, කසළ වළකින් හෝ බලපත්‍රලත් ස්ථානයේ වෙනත් යම් පිහිටුමකින් උද්ගත වන දුර්ගන්ධවලින් නිදහස්ව තබා ගැනීමටත් ඔහු සැලැස්විය යුතුය. පාන් සෑදීමේ දී ප්‍රයෝජනය ගන්නා සෑම භාණ්ඩ, භාජන සහ උපකරණ පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් තබා ගැනීමට, ඔහු සැලැස්විය යුතුය. ව්‍යාපාරයට අදාළ සහ නොවන සියලු අපද්‍රව්‍ය, දිනකට වරක් බේකරියෙන් ඉවත් කොට පිරිසිදු කරනු ලැබිය යුතු අතර ගමනා ආවරණය භාජනය වසාම තැන්පත් කිරීමට ඔහු සැලැස්විය යුතුය. අප ද්‍රව්‍ය ඇත්ත වශයෙන් ම එහි බහාලන විට හැර, භාජනය සෑම විටම වසා තැබිය යුතුය.

9. බේකරියක සෑම බලපත්‍රලාභියකුම, පාන් නිෂ්පාදනය කිරීමේදී හොඳ පිරිසිදු පිටි, ජලය සහ වෙනත් ද්‍රව්‍ය පාවිච්චි කළ යුතුය. මෙහි දක්වා ඇති ආකාරයට ඉදි කරන ලද වලය වේදිකාවක් මත ඔහු පිටි ගබඩා කළ යුතුය. වේදිකාව මනා පහසු දිගකින් සහ පළලකින් යුක්ත විය යුතුය. එය යටත් පිරිසෙයින් මීටර් 9 ක් උස පාද ආධාර කොට ගත් සහ ලෑලි සහිත කට්ටුවකින් යුක්ත විය යුතුය. වේදිකාවේ පාද ස්ථිරව පොළොවට සම්බන්ධ කොට නොතිබිය යුතුය. මීයන් පාද දිගේ වික් ලෑලි කට්ටුවේ අභිතකෝ ඇතුළුවීම වැළැක්වෙන පරිදි ලෑලි සහිත මත කට්ටුවේ කෙළවරවල්, පහළ රාමුවෙන් සෙන්ටිමීටර් 23 ක් පිටතට නෙරා තිබිය යුතුය. මීයන්ට රිංගීමට ලෑලි සහිත මුළුකොට යටින් රක්ෂා හෝ කුහර නොතිබෙන පරිදි, වේදිකාව සාදනු ලැබිය යුතුය. වේදිකාව ඉවත් කොට එය යට ඇති පිටි ඉවත් කොට ශුද්ධ කළ හැකි වන පරිදි වේදිකාව ඉවත් කළ හැකි එකක් විය යුතුය. එය බිත්තියේ සිට යටත් පිරිසෙයින් සෙන්ටිමීටර් 23 ක් ඈතින් තැබිය යුතුය.

10. බේකරියක සෑම බලපත්‍රලාභියකුම, 9 වන අනුව්‍යවස්ථාවේ සඳහන් වේදිකාව යට සහ අවට ඉඩ ප්‍රමාණය, සියලු බාධකවලින් තොරව තබා ගත යුතුය. ඔහු විසින් සනීපාරක්ෂක කසළ භාජනයක් සහ යටත් පිරිසෙයින් පඩික්කම් දෙකක් බලපත්‍රලත් ස්ථානයට සපයනු ලැබිය යුතුය. පාන් නිෂ්පාදනයෙහි නිරතව සිටින්නන්ට පඩික්කම් වෙත පහසුවෙන් ළඟා විය හැකි ආකාරයට ඔහු පඩික්කම් තැබිය යුතු නමුත්, ඒවා පිටි අනන කාමරයෙහි නොතැබිය යුතුය.

11. බේකරියක සෑම බලපත්‍රලාභියකුම, බේකරිය මීයන්ගෙන් සහ කෘමීන්ගෙන් නිදහස්ව තබාගත යුතු අතර, එම ස්ථානයෙහි දක්නට ලැබෙන සිදුරු සහ වෙනත් කුහර, බිඳුණු වීදුරු කැබලිවලින් පුරවා සිමෙන්තියෙන් කපරාරු කළ යුතුය.

12. කෙළ ගැසීම සඳහා සපයා ඇති පඩික්කමට හැර කිසිම තැනැත්තකු බේකරිය තුළ කෙළ ගැසීම නොකළ යුතුය.

13. කිසිම තැනැත්තකු කිසියම් හේතුවක් නිසාවත්, බේකරියක යම් සතකු හෝ පක්ෂියකු තබා නොගත යුතුය.

14. (1) බෝවෙන, ස්පර්ශයෙන් බෝවෙන හෝ චර්මගත රෝගයකින් පෙළෙන්නා වූ හෝ මෑතදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටියා වූ හෝ එවැනි රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑත දී ඇප උපස්ථාන කළා වූ කිසිම තැනැත්තකු, රෝගය බෝවන්නා වූ හෝ විෂබීජ බෝවන්නා කාල සීමාව අවසන් වන තුරු බලපත්‍රලත් ස්ථානයට ඇතුළු වීම හෝ, එහි පාන් කිසිවක් නිෂ්පාදනය කිරීමට හෝ විකිණීමට සහභාගී වීම හෝ එහි පිටි පාන් කිසිවක් ප්‍රවාහනය කිරීමෙහි නිරතවීම හෝ නොකළ යුතුය.

(2) බේකරියක කිසිම බලපත්‍රලාභියකු, මේ අනුව්‍යවස්ථාවෙහි 1 වන ඡේදයේ විධිවිධාන යම් තැනැත්තකු විසින් කඩ කරනු ලැබීමට, දැනුවත්ව ඉඩ නොදිය යුතුය.

15. බේකරියක කිසිදු බලපත්‍රලාභියකු විසින්, පාන් සෑදීමට යන්නා ද්‍රව්‍ය හැර, යම් භාණ්ඩයක්, ඇඳුම්, පැදුරු හෝ යම් ද්‍රව්‍ය, පාන් පිළියෙල කරනු ලබන හෝ ගබඩා කර තබනු ලබන තැනකවත් පාන් සෑදීමට සඳහාවූ ද්‍රව්‍ය ගබඩා කර තබනු ලබන කාමරයෙහි, ගබඩා කර තැබීම හෝ තැබීමට ඉඩදීම හෝ කරනු නොලැබිය යුතුය.

16. බේකරියෙහිම පිහිටි එම ගොඩනැගිල්ලෙහිම කොටසක් වන නිවසෙහි හෝ යම් ස්ථානයක්, බේකරියක යම් බලපත්‍රලාභියකු විසින්, නිදන්නා ස්ථානයක් ලෙස පාවිච්චි කිරීම හෝ එසේ පාවිච්චි කිරීමට ඉඩදීම, එම ස්ථානය පාන් පිළියෙල කරන හෝ ගබඩා කර තබන හෝ ඒවායේ ද්‍රව්‍ය ගබඩා කර තබන ස්ථාන වලින් පොළොවේ සිට සිලිම දක්වා විහිදෙන වන පරිදි වෙන් කරන ද්‍රව්‍ය වලින් මුළුමනින් වෙන්කර ඇත්නම් සහ එම නිදන්නා ස්ථානයට, විවෘත කළ විට පොළොවේ මතුපිට ඉඩ ප්‍රමාණයෙන් පහළොවෙන් එකකට අඩු නොවන බාහිර ජනේලයක් සපයා ඇත්නම් මිස කරනු නොලැබිය යුතුය.

17. පාන් පිළියෙල කිරීමේ දී සහ සෑදීමේ දී කර්මාන්තයෙහි නියුක්ත කර ගන්නා සෑම තැනැත්තකුම, පාන් සෑදීමේ ක්‍රියාවලියෙහි නිරත වීමට පෙර, තමාගේ අත් සෝදා ගත යුතු අතර, සුදුසු පිරිසිදු ආවරණය කරන පිරිසිදු සුදු ඇඳුම් හා පිරිසිදු සුදු තොප්පියක් හෝ [illegible] සිටිය යුතුය.

18. බේකරියක සෑම මලපහපහසුකම්, පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියමිත සබන් සහ පමණ සපයා තිබිය යුතු අතර, ඒවා පාන් නිෂ්පාදනයෙහි නිරත තැනැත්තන්ට පහසුවෙන් ලබාගත හැකි ආකාරයට තැබිය යුතුය.

19. බේකරියක සෑම මලපහපහසුකම, මලපහපහසුවන් ස්ථානයට ඇති තරම් ප්‍රමාණවත් ජලය සැපයිය යුතුය.

20. කිසි සඳහා ලද පිරිසිදු විදුරු අල්මාරි තුළ මැස්සන්ගෙන්, දූවිලි වලින් සහ කෘමි සතුන්ගෙන් තොරව පාන් තබා ඇත්නම් මිස, බේකරියක් කිසිම මලපහපහසුකම් විසින් මිලයට ස්ථානයෙහි පාන් විකිණීම සඳහා තැබීම හෝ තැබීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතුය.

21. බේකරියක සෑම මලපහපහසුකම් විසින්ම, මලපහපහසුවන් ස්ථානයේ ඇතුළිලිව සෙනෙහා ස්ථානයක තරාදියක් සහ ප්‍රමිති බර තැබිය යුතුය. යම් ගැණුම්කරුවකු ඉල්ලා සිටිය හොත්, එකී ස්ථානයේ විකුණනු හෝ විකිණීම පිණිස තබා ඇති හෝ පාන්වල බර කිරා දිය යුතුය.

22. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තකු විසින් ද බේකරියේ මලපහපහසුකම් විසින් ද, අත්සන් තබන ලද ලියාපදිංචි කාඩ්පතක් යම් තැනැත්තකු සතුව ඇත්නම් මිස, විකිණීම සඳහා තම බේකරියේ සිට පාන් ප්‍රවාහනය කිරීමට කිසිම තැනැත්තකුට බේකරියක කිසිම මලපහපහසුකම් ඉඩ නොදිය යුතුය.

23. බේකරියක මලපහපහසුකම් විසින්, සභාපතිවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, එම මලපහපහසුකම් විසින් විකිණීම සඳහා පාන් ප්‍රවාහනය කිරීම පිණිස සේවයෙහි නියුක්ත කර ගනු ලබන සෑම තැනැත්තකු විසින්ම පාවිච්චි කරනු ලැබීම සඳහා වූ ලියාපදිංචි කාඩ්පත්, එම තැනැත්තා යම් බෝවෙන රෝගයකින් පෙළෙන්නේ නැති බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සභාපතිවරයා විසින් අය කිරීමකින් තොරව නිකුත් කරනු ලැබිය හැකිය. එම කාඩ්පත් නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙහි ඒවා අවසන් විය යුතුය.

24. වසන ලද වාහනයක හෝ වසන ලද කූඩයක, එසේ නැතහොත් සුදුසු භාජනයක හැර, තම මලපහපහසුවන් ස්ථානයෙන් විකිණීම සඳහා කිසිවක් ප්‍රවාහනය කරනු ලැබීමට, බේකරියක කිසිම මලපහපහසුකම් ඉඩ නොදිය යුතුය. එසේ ප්‍රවාහනය කිරීමට පෙර මලපහපහසුකම්, එම වාහනය, කූඩය, බඳුන් භාජනය හෝ අවසාන භාජනය පරීක්ෂා කර, එය පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයක ඇති බවට ඔහු සෑහීමට පත්විය යුතුය.

25. (1) සභාපතිවරයා විසින් හෝ, ඒ සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියකු විසින් හෝ සියලු සාධාරණ වේලාවල දී සහ පිටි ඇනීමේ හෝ මෙහෙයවීමේ ක්‍රියාවලිය කරගෙන යන ඕනෑම වේලාවකදී බේකරියකට ඇතුළුව, එය පරීක්ෂා කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

(2) බේකරියෙහි මලපහපහසුකම් හෝ බේකරිය භාරව සිටින්නා හෝ විසින්, සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියකුට බේකරියට ඇතුළුව, එය පරීක්ෂා කිරීමට ඉඩදිය යුතු අතර, එම සභාපතිවරයාට හෝ නිලධාරියාට හෝ අවශ්‍ය විය හැකි සියලු සහාය ලබා දිය යුතුය.

26. බේකරිවලට අදාළ මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් පිළිබඳව කරනු ලබන සෑම කඩ කිරීමක් සඳහාම, රුපියල් පන්සිය පණක් නො ඉක්මවන දඩයකින් ද, කඩ කිරීම දිගටම කරගෙන යන විටක වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එම කඩ කිරීම පිළිබඳව අවධානය යොමු කරවමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව, කඩ කිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් සියයක් නොඉක්මවන අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතුය.

27. නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, බේකරිවලට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාරයක් වරදකරු කරනු ලැබූ මලපහපහසුකම්ගේ බලපත්‍රය අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය. එවැනි අවලංගු කිරීමක් සම්බන්ධයෙන් මලපහපහසුකම් කිසිදු වන්දියකට හිමිකම් නොලැබිය යුතුය.

## 17. කිරිපට්ටි හා කිරි වෙළඳාම

1. (1) කිසිම තැනැත්තකු, (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන කිරිපට්ටි සඳහා වූ බලපත්‍රයක් යටතේ මිස කිරිපට්ටියක් පවත්වා නොගත යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, 36 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එම බලපත්‍රය නිකුත් කිරීමට විෂය වූ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක්වන දින අහෝසි විය යුතුය.

2. බලපත්‍රය අදාළ වන ස්ථානය පහත දක්වෙන කොන්දේසිවලට අනුකූලව තබා ඇත්නම් මිස, කිසිම තැනැත්තකු කිරිපට්ටියක් පවත්වා ගෙන යාම සඳහා වූ බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොලැබිය යුතුය :—එම කොන්දේසි නම් :

(අ) ස්ථානය හොඳ අළුත්වැඩියා තත්ත්වයකින් පැවතිය යුතු අතර, හොඳින් වාතාශ්‍රය හා ආලෝකය සපයා තිබිය යුතුය.

(ආ) කිරි පට්ටියේ ගොඩනැගිල්ලේ බිත්ති සහ වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(ඇ) ලී වලින් සාදා ලද කොටස්වලට තෙල් සායම් හෝ හුණු ආලේප කර තිබිය යුතුය.

(ඈ) බිමට සිමෙන්ති දමා හෝ යම් තද අපරාගම්‍ය ද්‍රව්‍යයක් අල්ලා තිබිය යුතුය.

(ඉ) ස්ථානයේ ප්‍රමාණවත් ජලාපවහනය සලසා තිබිය යුතුය.

(ඊ) කිරි පට්ටියේ ප්‍රයෝජනය සඳහා පහසු දුර ප්‍රමාණයක ප්‍රමාණවත් පරිදි පිරිසිදු ජලය ප්‍රමාණවත් සැපයුමක් තිබිය යුතුය.

(උ) ගවයන් නැවීම සඳහා වූ සෑම ගොඩනැගිල්ලක් හෝ මඩුවක්ම ගඩොලින්, ගලින් හෝ කලුගල්වලින් තැනිය යුතුය. හුණු ගා තිබිය යුතු අතර, පොළොව මට්ටමේ සිට මීටර් 1.22 ක් උසට සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතුය. බිත්ති සහ කාණු [illegible] තිබිය යුතුය. බිමට ගඩොල් හෝ ගල් අල්ලා සිමෙන්ති, සිමෙන්ති කොන්ක්‍රීට් හෝ තාර දමා තිබිය යුතුය. වහලය ස්ථිර ද්‍රව්‍යවලින් ජලය හා වැසි ජලය වැසි කාණුවලට ගලා යන පරිදි සුදුසු ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය. [illegible]

(ඌ) කිරි කාමරය සුදුසු ස්ථානයක දැවටි මඩු සහ වෙනත් ගොඩනැගිලිවලින් මී.7.62 කට නොඅඩු දුරකින් ද පිහිටිය යුතුය.

(එ) කිරි කාමරයේ බිම සිමෙන්ති දමා තිබිය යුතු අතර, බිම සහ බිත්ති සම්බන්ධ වන ස්ථාන කවාකාර හැඩයට සකස් කර තිබිය යුතුය. කාමරයේ බිත්ති මී.2.14 ට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර, බිත්ති ගඩොලින්, ගලින් හෝ කලුගල්වලින් බැඳ ඇතුළත හුණු කපරාරු කර හෝ හුණු ආලේප කර තිබිය යුතුය. කිරි කාමරයේ යටත් පිරිසෙයින් එකිනෙකට ඉදිරියෙන් පිහිටි බිත්ති දෙකෙහි [illegible] විවෘත නොදෙකකට යාබදව පිහිටිය යුතුය. දූවිලි ඇතුළුවීම වැළැක්වීම සඳහා උචිත් දර බොරු ලෑලිවලින් සිලිං ගසා තිබිය යුතු අතර, එහි තෙල් සායම් ගා තිබිය යුතුය. සියලු කොළුවර පොළොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මී. 1.83 කට ඉහළින් විය යුතුය. [illegible] පිරිසෙයින් එක් ජනේලයක් සහ දොරක් තිබිය යුතුය. ජනේල ප්‍රදේශයේ ක්ෂේත්‍රඵලය බිම ප්‍රමාණයෙන් [illegible] ප්‍රමාණයෙන් [illegible] ට නොඅඩු විය යුතු අතර, ජනේල ප්‍රදේශය මැස්සන්ට ඇතුළු විය නොහැකි වන පරිදි වසා තිබිය යුතුය.

දොර, ජනේලයට මුහුණලා පිහිටිය යුතු අතර එය හොඳින් වැසෙන සේ සවිකර එහි මැස්සන් ඇතුළු නොවන පරිදි දැල් ගසා තිබිය යුතුය.

(ඒ) සෑම කිරි කාමරයකට මේසයක් තිබිය යුතු අතර, එහි මතුපිට කිරිගරුඬ, පසුරු පාෂාණ, තුත්තනාගම් හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් වසා තිබිය යුතුය.

(ඔ) කිරි කාමරයට සනීපාරක්ෂක කසළ භාජනයක් සපයා තිබිය යුතුය.

(ක) කිරි කාමරය කිසියම් වැසිකිළියකින්, කසළ වළකින්, පෝර ගොඩකින් හෝ විවෘත කසළ කානුවකින් යටත් පිරිසෙයින් මී. 30.5 ක දුර ප්‍රමාණයකට ඈතින් පිහිටිය යුතුය.

(ග) කිරි කාමරය තුළ හෝ කිරි කාමරයට කෙළින්ම සම්බන්ධ වන පරිදි කසළ වළක්, වැසිකිළියක් හෝ අළුවලක් නොතිබිය යුතුය.

(2) එක් එක් කිරි පට්ටියට බලපත්‍ර අපේක්ෂා කරන්නෝ එළදෙනුන් නිදහසේ සඳහා ද යනවිට බලපත්‍රය සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතු අතර, එම ගණන ගව මඩුවේ ඉඩ ප්‍රමාණයට ප්‍රමාණවත් විය යුතුය. එක් එක් එළදෙනා සඳහා මී.2.44 ක බිම් ප්‍රමාණයක් සහ ඝ.සෙ.මී. 1135 ක අවකාශ ප්‍රමාණයක් ඉඩ හැරිය යුතුය.

(3) යම් කිරිපට්ටියකට බලපත්‍රයක් නිකුත් කර ඇති කාල පරිච්ඡේදය තුළ යම් අවස්ථාවක, එම කිරි පට්ටියේ කාර්ය සඳහා භාවිතා කෙරෙන යම් ගොඩනැගිල්ලක් 2 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල නොවන බවට පත්ව ඇත්නම්, එම ගොඩනැගිල්ල එම විධිවිධානවලට අනුකූල තත්වයකට ගෙන ඒම සඳහා අවශ්‍ය සියලු දේ දැන්වීමේ නියමිතව සඳහන් දිනයකට පෙර ඉටුකරන ලෙසට වූ දැන්වීමක් කිරි පට්ටියේ බලපත්‍රලාභියාට භාර දීමට සභාපතිවරයා විසින් කටයුතු කළ හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු එම දැන්වීමේ නියමිතව සඳහන් කාලසීමාව ඇතුළත එම දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම පැහැර නොහැරිය යුතුය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ වූ යම් දැන්වීමක්, බලපත්‍රලාභියා, කිරිපට්ටි ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ අලවා තැබූව හොත් හෝ එය බලපත්‍රලාභියා විසින් ඒ ස්ථානයේ සේවයේ යොදවා ඇති යම් තැනැත්තකු වෙත තැබූව හොත් හෝ එය බලපත්‍රලාභියා වෙත නිසි ලෙස භාර දුන් ලෙස සලකනු ලැබිය යුතුය.

4. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම තමාගේ නමද "බලපත්‍රලත් කිරිපට්ටිය" යන වචන සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් ද පැහැදිලිව ඇඳ ඇත්තා වූ පුවරුවක් තමාගේ ස්ථානයේ පිටත හොඳින් පෙනෙන ස්ථානයක සවිකර තැබිය යුතුය.

5. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම විසින් කිරිපට්ටිවලට අදාළ මේ අතුරු ව්‍යවස්ථාවල පිටපතක් සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් ද මේ බලපත්‍රය ද රාමු කරවා කිරිපට්ටියේ හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද, (කිරි දෙවන්නන් ඇතුළුව) කිරිපට්ටියේ සේවයේ නියුක්තව සිටින සියලු සේවා නියුක්තයින්ගේ නම් සහ ලිපිනයන් ඇතුළත් ලැයිස්තුවක්, සියලු සාධාරණ වේලාවන්වල දී සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය ලත් වෙනත් තැනැත්තෙකු විසින් පරීක්ෂා කර බැලිය හැකිවීම සඳහා, කිරිපට්ටියේ තබාගත යුතුය.

6. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම එම කිරි පට්ටියේ කොටසක් වන සෑම කාමරයක ම බිත්ති අවුරුද්දකට දෙවතාවක් ජූලි සහ දෙසැම්බර් මාසවල දී හුණු ගෑමට සැලැස්විය යුතුය. ලීවලින් තැනූ කොටසේ යටත් පිරිසෙයින් අවුරුද්දට දෙවතාවක් ජූනි සහ දෙසැම්බර් මාසවල දී ද සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් නියම කරනු ලබන වෙනත් අවස්ථාවන්හි දී ද උණුවතුර සහ සබන් යොදා ඔහු විසින් සේදිය යුතුය.

7. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම කිරි කාමරයේ බිම සහ මේසය මතුපිට යටත් පිරිසෙයින් දිනකට එක් වරක්වත් සේදිය යුතුය.

8. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම කිරි පට්ටියේ ප්‍රයෝජනයට ගන්නා හෝ කිරිපට්ටියට අයිති සියලු භාජන, භාණ්ඩ සහ වෙනත් අවශ්‍ය උපකරණ පිරිසිදුව තබා ගැනීමට සැලැස්විය යුතුය.

9. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම කිරිපට්ටියේ සෑම කොටසක් ද එහි වටපිටාව සහ කානු ද පිරිසිදුව සහ මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගැනීමට සැලැස්විය යුතුය.

10. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම කිරි දමා පිටතට යවන සියලුම භාජන පිරිසිදු කිරීමට ද පිරිසිදු ද්‍රව්‍යයකින් නිසි ලෙස වැසීමට ද සැලැස්විය යුතු අතර, තමන් ද කිරි අපිරිසිදු වීම වැළැක්වීමට නිසි සියලු පූර්වාරක්ෂාව යෙදිය යුතුය.

11. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම කිරි තබා ගැනීම සඳහා වීදුරු, පෝසිලේන්, ඔප දමූ මැටි, එනැමල්, යකඩ, ගැල්වනයිස් කළ යකඩ හෝ ටින් භාණ්ඩ භාවිතා කළ යුතු අතර, එවැනි භාණ්ඩ ගව මඩුවේ තැබීමට ඉඩ නොදිය යුතුය.

12. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු ම යටත් පිරිසෙයින් දිනකට එක් වරක්වත් සියලු ගොම, කසළ, මුත්‍රා සහ සෝදන ජලය කිරිපට්ටියෙන් ඉවත් කිරීමට ද ඒවායින් පීඩාවක් නොවන ආකාරයකට ඒවා බැහැර කිරීමට ද සැලැස්විය යුතුය.

13. කිසිම හේතුවක් නිසා කිරිපට්ටි බලපත්‍රලාභියකු කිසිදු සතකු හෝ පක්ෂියකු කිරි කාමරයේ තබා නොගත යුතුය.

14. කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු කිරි භාජන, බටර් භාජන, ගිතෙල් සාදන භාජන, වෙනත් කිරීමේ උපකරණ හෝ කිරිපට්ටියේ වෙනත් භාණ්ඩ, ඒවායින් අපේක්ෂිත කාර්යය හැර වෙනත් කාර්යයකට යෙදවීමට ඉඩ නොදිය යුතු අතර, යටත් පිරිසෙයින් දිනකට එක් වරක්වත් ඒවා පැහෙන ජලය යොදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය.

15. යම් ස්පර්ශක, ආසාදන හෝ විෂම රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙළුනා වූ හෝ එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තකුට සාත්තු කිරීමෙහි මෑතදී යෙදී සිටියා වූ හෝ කිසිම තැනැත්තකු එම රෝගය බෝවීමේ කාලය සහ විසංක්‍රමණ කාලය ඉකුත් වනතුරු, කිරිපට්ටියකට ඇතුළුවීම හෝ කිරි සකස් කිරීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

16. කිරිපට්ටි බලපත්‍රලාභියකු හෝ කිරිපට්ටිය භාරව හෝ එහි පාලනය භාරව සිටින කිසිම තැනැත්තකු, විසින් යම් ස්පර්ශක, ආසාදන හෝ විෂම රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙළුණින් සිටි හෝ එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තකුට මෑතදී සාත්තු කරමින් සිටි යම් තැනැත්තකු, එම රෝගය බෝවීමේ සහ විසංක්‍රමණ කාලය ඉකුත් වනතුරු, දැනුවත්ව සේවයේ යෙදවීම හෝ කිරිපට්ටි භූමියට ඇතුළු වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

17. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකුම එම කිරිපට්ටිය සඳහා අවශ්‍ය ජලය—

(අ) පොදු ජලය සැපයුම් ක්‍රමයක් තිබෙන අවස්ථාවක නම්, එම පොදු ජල සැපයුම් ක්‍රමයෙන් ලබාගත යුතු අතර, එවැනි අවස්ථාවක දී ළඟම පිහිටි ප්‍රධාන ජල නලයේ සිට නල දැමීම විය යුතු අතර, ටැංකි සපයා ගන්නා ජලය ගොඩනැගිල්ල ඇතුළත ජල කරාම මගින් ලබාගත යුතුය. නැතහොත්

(ආ) පොදු ජල සම්පාදන ක්‍රමයක් නැති අවස්ථාවක නම්, පිරිසිදු ජලය සැහෙන ප්‍රමාණයක් සැපයිය හැකි සුදුසු ජල මූලාශ්‍රයකින් ලබාගත යුතුය.

18. පොදු ජල සැපයුමකින් හැර වෙනත් ප්‍රභවයකින් ජලය ලබාගන්නා සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකුම පොදු ජල සැපයුමක් ඇති කරගත් විට එම පොදු ජල සැපයුමෙන් ජලය ලබාගත යුතුය.

19. කිරි දොවන අවස්ථාවේදී එළදෙනගේ කිරි බුරුල්ල හා තනපුඩු පිරිසිදුව පවතින්නේ නම් ද එසේම කිරි දොවන පුද්ගලයාගේ අත් පිරිසිදුව සියලු ආසාදන සහ දුෂණවලින් තොරව පවතින්නේ ද නම් මිස, වෙළඳාම සඳහා කිසිම එළදෙනකුගෙන් කිරි දෙවීමට සැලැස්වීම කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින් නොකළ යුතුය.

20. කිරිපට්ටි බලපත්‍රලාභියා විසින් ස්වකීය කිරිපට්ටියේ සේවයේ යොදවා ඇති තැනැත්තන් අතර යම් ස්පර්ශක හෝ ආසාදක රෝගයක් වූවහොත් හෝ එසේ සැක කරනු ලැබුවහොත් ඒ පිළිබඳව සභාපතිවරයාට නොපමාවම දැන්වීමක් කළ යුතුය.

21. (1) ස්වකීය කිරිපට්ටියේ යම් සතකුට ස්පර්ශක හෝ ආසාදක රෝගයක් වැළඳුන විට සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින්ම ඒ කාරණය ගැන සභාපතිවරයාට දැන්වීමක් කළ යුතුය. රෝගය බෝවීම හෝ රෝගී සතා සමග සම්බන්ධවීම වැළැක්වීම සඳහා බලපත්‍රලාභියා විසින් එවැනි හෝ ආසාදක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන බවට සැක කරනු ලබන සතුගේ කිරිපට්ටියේ සිටින යම් සතකු නොපමාව අනෙක් සතුන්ගෙන් වෙන් කිරීමට සැලැස්විය යුතුය.

(2) යම් ස්පර්ශක හෝ ආසාදක රෝගයක් හඳුනාගනු විට එම රෝගය පැතිරීම පාලනය කිරීම සඳහා සභාපතිවරයා හෝ වෙනත් කිසියම් බලධරයකු විසින් දෙනු ලබන උපදෙස් සෑම කිරිපට්ටි අවසරපත්‍රලාභියකු විසින්ම ක්‍රියාත්මක කළ යුතුය.

(3) කිරි බුරුල්ලේ හෝ අන් තැනක ඇතිවන ක්ෂය රෝගයෙන්, තිවුස්තන පුදාහයෙන්, කුර හා මුව රෝගයෙන්, ඇන්ත්‍රැක්ස් රෝගයෙන්, බුරුල්ලේ ඇක්ටිනොමයිකෝසිස් රෝගයෙන් පෙළෙන යම් සතකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩදීම හෝ විකිණීමට හෝ මනුෂ්‍ය පරිභෝජනයට ඇති යම් වෙනත් සතුන්ගේ කිරිවලට එකතු කිරීම හෝ එකතු කිරීමට ඉඩදීම නොකළ යුතුය.

22. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින්ම, කඹ, බෙරොල් හා පිදුරු තැට, සියලුම ගව ආහාර මීයන්ට ඇතුළුවිය නොහැකි යුතුස භාජනවල තබා යුතුය.

23. (1) කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින් විකිණීමට ඇති කිරි, කිරි කාමරයේ හැර වෙනත් තැනක තැබීමට ඉඩ නොදිය යුතුය.

(2) කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින් කිරි කාමරය, කිරි ගබඩා කර තැබීමේ සහ සකස් කිරීමේ කාර්යය හැර වෙනත් කිසිම කාර්යයක් සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම නොකළ යුතුය.

24. කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කිරීමෙන් කිරි මාල නොකළ යුතුය. තවද මාල කළ කිරි විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ ඇවිදිමෙන් විකිණීම හෝ විකිණීමට භාරදීම ඔහු විසින් නොකළ යුතුය.

25. යොදය ඉවත් කළ කිරි, "යොදය ඉවත් කළ කිරි" යනුවෙන් සිංහලයෙන් සහ ඊට සමාන වචන දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් කියවිය හැකිවිටද නොදින් පෙනෙනසේ ද ලේබල් කොට ඇති භාජනයක අඩංගු කර එසේ වූ කිරි වශයෙන් විකුණනු ලබන්නේ නම් මිස, කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින් යොදය ඉවත් කළ කිරි විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ ඇවිදිමෙන් විකිණීම නොකළ යුතුය.

26. බලපත්‍රලත් කිරිපට්ටියක සිටින එළදෙනුන්ගෙන් හැර වෙනත් එළදෙනුන්ගෙන් ලබාගත් කිරි, කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු විසින් විකිණීම හෝ සැපයීම නොකළ යුතුය.

27. සභාපතිවරයාට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් පොදුවේ හෝ විශේෂිතව බලය පවරන ලද වෙනත් යම් නිලධරයකුට බලපත්‍රලත් කිරිපට්ටියකින් හෝ කිරි විකුණන, විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන, ඇවිදිමෙන් විකුණන හෝ භාරදෙන යම් තැනැත්තකුගෙන් විශ්ලේෂණය සඳහා කිරි සාම්පලයක්, එහි වටිනාකම ගෙවා, ලබාගැනීමට හිමිකම තිබිය යුතු අතර, වටිනාකම් ගෙවා ලැබුවට විශ්ලේෂණය සඳහා එවැනි සාම්පලයක් විකිණීමට කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියකු හෝ ලියාපදිංචි වෙළෙන්දකු හෝ වෙනත් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

28. තමාට සභාපතිවරයා විසින් නිකුත් කළ බලපත්‍රයක් යටතේ මිස කිසිම තැනැත්තකු විසින්, පරිපාලන ප්‍රදේශය ඇතුළත වූ යම් ස්ථානයක් විකිණීම සඳහා පාවිච්චි නොකළ යුතුය.

29. කිරි විකුණන ස්ථානය එම කාර්ය සඳහා සුදුසු බවට අදාළ පරිපාලන ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් නිර්දේශ කර ඇත්නම් මිස කිසිම තැනැත්තකු 28 වන අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොලැබිය යුතුය.

30. 28 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම එය නිකුත් කිරීමට විෂය වූ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා වලංගුව පැවතිය යුතුය.

31. සභාපතිවරයා විසින් පවත්නා වර්ෂය සඳහා නිසි ලෙස තමා වෙත නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් තමන් ළඟ ඇත්නම් මිස කිසිම තැනැත්තකු අදාළ පරිපාලන ප්‍රදේශය ඇතුළත විකිණීම සඳහා කිරි භාරදීම, බෙදාහැරීම හෝ ඇවිදිමෙන් විකිණීම නොකළ යුතුය.

32. 31 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් නිකුත් කරනු ලබන තැනැත්තා වෛද්‍ය නිලධරයකු විසින් පරීක්ෂා කර ඒ එම තැනැත්තා යම් ආසාදක හෝ ස්පර්ශක ඉන් වර්ග රෝගයකින් නොපෙළෙන බවට තීරණය කරනු ලැබ ඇත්නම් මිස, එම තැනැත්තාට එම කාඩ්පත නිකුත් කිරීම සභාපතිවරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

(අ) සේවායෝජකයාගේ නාම සහ ලේඛනයේ අංකය.

(ආ) සේවකයාගේ හෝ අනුයෝජිතයාගේ නාම සහ ඔහුගේ මායිමට ඇති විස්තර.

34. පවත්නා වර්ෂය සඳහා නිසි ලෙස නිකුත් කරන ලද කාඩ් පත පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් විශේෂිතව හෝ පොදුවේ බලය පවරා ලද යම් තැනැත්තකු විසින් නියම කරන ලද විට, එම කාඩ්පත ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත කිරි භාරදෙන හෝ විකිණීම සඳහා බෙදාහරින හෝ ඇවිදිමින් විකුණන කිසිම තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම නොකළ යුතුය.

35. කිසිම තැනැත්තකු විසින් පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත පහත දැක්වෙන දේ විකිණීම, විකිණීම සඳහා:—

(1) (අ) සියයට 3.5 කට අඩු මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය හෝ සියයට 3.5 කට කිරි මේද අඩංගු යම් එළකිරි;

(ආ) සියයට 9 කට අඩු මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය හෝ සියයට 7 කට අඩු කිරි මේද අඩංගු මී කිරි.

(2) "යොදය ඉවත් කළ කිරි" යනුවෙන් සිංහලෙන් සහ ඊට සමාන දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් පැහැදිලිව ද නොදින් පෙනෙන සේ ලේබල් කොට ඇති භාජනයක අඩංගු කර යොදය ඉවත් කළ කිරි වශයෙන් විකුණන්නේ නම් මිස, යම් යොදය ඉවත් කළ කිරි,

(3) ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යක් හෝ ද්‍රව එකතු කර මාල කළ කිරි, එසේ වුවද යම් තේ හෝ කෝපි කඩයක හෝ ආපන ශාලාවක භූමියේ සිට පරිභෝජනය සඳහා තේ, කෝපි හෝ කොකෝවා එකතු කරන ලද කිරි මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා මාල කළ කිරි වශයෙන් සලකනු නොලැබිය යුතුය.

(4) සබ්දාසි හෝ වෙනත් අපාරශුම ද්‍රව්‍යකින් සාට නොවැසූ බෝතල්වල අඩංගු කිරි.

36. (1) සියලු සාධාරණ වේලාවල්වල දී යම් කිරිපට්ටියකට හෝ කිරි විකුණන වෙනත් යම් ස්ථානයකට හෝ සභාපතිවරයා හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයාගේ ලියවිල්ලකින් පොදුවේ හෝ විශේෂිතව බලය දෙන ලද ප්‍රාදේශීය සභාවේ වෙනත් නිලධාරියකු හෝ ඇතුළු වී එම කිරි පට්ටිය හෝ ස්ථානය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) සභාපතිවරයාට හෝ සභාපතිවරයාගෙන් ලියවිල්ලක් මගින් බලයලත් යම් නිලධාරියෙකුට ස්ථානයට ඇතුළු වී පරීක්ෂා කිරීමට බලපත්‍ර ලාභියා හෝ කිරිපට්ටිය භාරව සිටින තැනැත්තා විසින් ඉඩදිය යුතු අතර, සභාපතිවරයාට හෝ ඒ නිලධාරියාට අවශ්‍ය සියලු සහාය දිය යුතුය.

37. කිරිපට්ටි වලට අදාල මේ අතුරු ව්‍යවස්ථා අතුරින් යම් අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වූ සෑම උල්ලංඝනය කිරීමක් සඳහා රුපියල් පන්සිය පණසකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි අතර, නොකඩවා කරගෙන යන උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ එම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරවමින් සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධාරියකුගෙන් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසු එම උල්ලංඝනය කිරීම නොකඩවා කරගෙන යනු ලබන සෑම දිනයකට රුපියල් දෙසිය පණසකට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

38. නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් පනවනු ලබන වෙනත් දඬුවමකට අතිරේකව කිරිපට්ටිවලට හා කිරි වෙළඳාමට අදාළ මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් අතුරු ව්‍යවස්ථාවක් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් බලපත්‍ර ලාභියකුගේ බලපත්‍රය එම අධිකරණය විසින් අවලංගු කරනු ලැබිය හැකි අතර, එම අවලංගු කිරීම සම්බන්ධයෙන් කිසිම වන්දියකට බලපත්‍ර ලාභියා හිමිකම් නොලැබිය යුතුය.

## 18. ආහාර විකිණීම

01. කිසිදු තැනැත්තකු විසින් යම් පිසූ ආහාරයක් කිරිබූ පිට්ටලින් සෑදූ කැවුම් රසකැවිලි පැණිරස කැවිලි සරුවත් පැණිබීම කල් තබා ගැනීමට සකස් කළ පළතුරු හෝ ජෙලි ආදිය, පොතු ගැලවූ කැපූ හෝ අනාහාරයකින් වහන ලද පරිභෝජනය සඳහා පිළියෙල කරන ලද පළතුරු දූවිල්ලෙන් මැස්සන්ගෙන් හෝ වෙනත් බෝකරන සාධකවලින් ආරක්ෂා වන පරිදි ස්ථිර ද්‍රව්‍යකින් සෑදූ පෙට්ටියක හෝ භාජනයක තබා ගෙන මිස, ඇවිද විකිණීම, විකිණීම සඳහා තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය. මිලු විසින් සෑම විටම එවැනි පෙට්ටියක් හෝ භාජනයක් පිරිසිදු තත්වයෙන් තබාගත යුතු අතර, එකී ද්‍රව්‍ය තැබීමේ හෝ එය පිරිසිදු කිරීමේ කාර්ය හැර එය වෙනත් කර තැබීමට නොගැලපෙන්විය යුතුය.

02. කිසිදු තැනැත්තකු විසින් යම් ආහාර ද්‍රව්‍යයක් ඒ තත්වයෙන් ම විකිණීමේ අදහස ඇතිව ඒ ආහාර ද්‍රව්‍යය සෞඛ්‍යයට හානිකර වූ යම් මූලික ද්‍රව්‍යයක් සමග හෝ වෙනත් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීම, පාට කිරීම, සායම් පෙවීමට හෝ කුඩු කිරීම හෝ වෙනත් යම් තැනැත්තකු විසින් එසේ මිශ්‍ර කිරීමට, පාට කිරීමට, සායම් පෙවීමට හෝ කුඩු කිරීමට නියම කිරීමට හෝ ඉඩදීම නොකළ යුතු අතර, කිසිදු තැනැත්තකු විසින් එසේ මිශ්‍ර කරන ලද, පාට කරන ලද, සායම් පොවන ලද හෝ කුඩු කරන ලද ද්‍රව්‍යයක් විකිණීම නොකළ යුතුය.

3. (1) විකිණීමට තබා තිබෙන හෝ ප්‍රදර්ශනය කර තිබෙන මස්, කුකුල් මස් අළුත් හෝ ලුණු දැමූ හෝ ටින්වල ඇසුරූ හෝ අයිස් දැමූ මාළු දිව මස්, එළවළු, පළතුරු, පිසූ ආහාර, කිරිබූ පිටියෙන් සෑදූ කැවුම්, රස කැවිලි, පැණිරස කැවිලි, සරුවත්, පැණිබීම, එළකිරි, මුද්‍රවාලද කිරි හෝ වෙනත් ආහාර සහ බීම වර්ග මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් පත් කරන ලද වෙනත් යම් නිලධාරියකු විසින් පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද ඒ ආහාර හෝ බීම මිනිසා පරිභෝජනය සඳහා අයෝග්‍ය හෝ නුසුදුසු බව ඒ නිලධාරියාට පෙනී ගිය හොත් ඒ ද්‍රව්‍ය සනාථයට ගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත යැවීම ද නීත්‍යානුකූල වන්නේය.

(2) (1) වන ඡේදය යටතේ සනාථයට ගන්නා ලද යම් ආහාර හෝ බීම ද්‍රව්‍යයක් මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය හෝ නුසුදුසු බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් සහතික කරනු ලැබුවේ නම්, ඒ ද්‍රව්‍යය සනාථයට ගන්නා ලද්දේ යම් තැනැත්තකුගේ සන්තකයෙන් ද, ඒ තැනැත්තාට වන්දි ගෙවීමක් නොමැතිව විනාශ කරනු ලැබිය යුතුය.

4. 1 වන අතුරු ව්‍යවස්ථාව කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර; නිසි අධිකරණ බලය ඇති අධිකරණයක දී වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පන්සිය පණසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය. තවද නොකඩවා කරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරවමින් සභාපතිවරයාගෙන් හෝ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද නිලධාරියකුගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු නොකඩවා දිගටම වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පණසකට නොවැඩි දඩයකට ද ඒ තැනැත්තා යටත් විය යුතුය.

## 19 මාළු විකිණීම

1 (1) තත් කාර්ය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස කිසිදු තැනැත්තකු විසින් මාළු විකිණීම සඳහා (වෙළඳ පොළක් හැර) යම් කාමරයක් හෝ ස්ථානයක් භාවිතා නොකළ යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම 24 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කළහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කවර වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් අවසන් විය යුතුය.

2. බලපත්‍රය ලබා ගැනීම සඳහා වූ ස්ථානය සහ ඒ වෙළඳ සැලේ ඇති උපකරණ පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වෙතොත් මිස, මාළු වෙළඳ සැලක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කිසිදු තැනැත්තකුට හිමිකම් නොතිබිය යුතුය:

(අ) කොමසාරිස්ගේ (මෙහි මින්මතු "සභාපතිවරයා" යයි සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල වන සේ සාදනු ලැබිය යුතුය.

(ආ) ස්ථානය යහපත් ප්‍රතිසංස්කරණ තත්වයෙන් සහ හොඳින් වාතාශ්‍රය සහ හොඳට ආලෝකමත්ව තිබිය යුතු අතර, සෑම කාමරයකටම විවෘත කළ හැකි විවෘත කළ විට මුළු භූමි ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ක්ෂෙත්‍රඵලයකින් යුත් ජනෙල් යොදා තිබිය යුතුය.

(ඇ) සෑම කාමරයකම සෑම බිත්තියකම බිත්ති මීටර් 2.14 කට නොඅඩු උසකින් විය යුතු අතර සිමෙන්ති ගඩොල් හෝ සිමෙන්ති බදාමයක් යොදා ඇති කොටස් හැර සුනු බදාමක් යොදා සුමට කර තිබිය යුතුය.

(ඈ) සියලුම සිවිලි පොළොවේ සිට මීටර් 1.83 ක් උසට තිබිය යුතුය.

(ඉ) ලීයෙන් කළ සෑම ආකාරයකම පෙල් පාසම් යා තිබිය යුතුය.

(ඊ) පොළොව බැඳුණු සිමෙන්තියෙන් සාද තිබිය යුතු අතර සිමෙන්තියෙන් බැද වැසිකිළි ආලෝක කළ කාණුවකට බිම එක්වන ජලය බැස යාමට ඇල ආකාරයට බෑවුමක් සහිත විය යුතුය.

(උ) මාළු තබන සෑම මේසයක් ම සුදුසු සිමෙන්ති හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතුය.

(ඇ) ස්ථානයට සනීපාරක්ෂක කසළ භාජනයක් සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ඈ) ස්ථානය වැසිකිළියක, වැසිකිළිවලක, පොහොර ගොඩක හෝ විවෘත කසළ කාණුවක සිට අඩු වශයෙන් මීටර් 15.24 ක් දුරින් පිහිටා තිබිය යුතුය.

(ඉ) ස්ථානය ඇතුළත හෝ ඒ හා කෙළින්ම සම්බන්ධව එන පරිදි හෝ යම්කිසි වැසිකිළි වලක්, වැසිකිළියක් හෝ අපවිලක් නොතිබිය යුතුය.

3. සෑම මාළු වෙළඳපොළ බලපත්‍රලාභියකු විසින් ම, එබඳු ස්ථානයේ පිටතින් ප්‍රකටව පෙනෙන තැනක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ඔහුගේ නම සහ "බලපත්‍රලත් මාළු වෙළඳ පොළ" යන වචන පැහැදිලිව පින්තාරු කළ ඵලකයක් සවිකර තිබිය යුතුය.

4. සෑම මාළු වෙළඳපොළ බලපත්‍රලාභියකු විසින්ම, මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පිටපතක් රාමුකර බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකට තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය.

5. තවද ඔහු විසින්, මාළු වෙළෙන්දන් ඇතුළුව, සියලු සේවකයන්ගේ නම් සහ ලිපිනයන් අඩංගු ලැයිස්තුවක්, සෑම වේලාවන්හිම පරීක්ෂා කළ හැකි පරිදි, ඒ ස්ථානයේ තැබිය යුතුය.

6. පිහිත් ගඩොල් අල්ලා ඇති හෝ සිමෙන්ති බදාමයෙන් යොද ඇති කොටස් හැර, මාළු වෙළඳපොළට අයත් වන සෑම කාමරයකම බිත්තිවල ගැම සහ ලීයෙන් කළ සියළුම කොටස්වල හුණු ගාම හෝ පෙල් සායම් ගා තිබේ නම්, උණු වතුර සහ සබන් යොද සේදීම අඩුම වශයෙන් අවුරුද්දකට දෙවරක් සහ ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් වේලාවන්හි දී සෑම මාළු වෙළඳපොළ බලපත්‍රලාභියකු විසින් සිදු කළ යුතුය.

7. සෑම මාළු වෙළඳපොළ බලපත්‍රලාභියකු විසින්ම, බලපත්‍රයෙහි නියම කර ඇති යම් වේලාවක දිනපතා එක් වරක් හෝ, බිත්තියෙහි පිහිත් ගඩොල් අල්ලා ඇති හෝ සිමෙන්ති ගා ඇති කොටස, මේස මතුපිට සහ මාළු තැබීමට ගන්නා ලී කොට හොඳට අතුල්ලා සේදීමට සැලැස්විය යුතුය. එල්ලා තැබීමට ගන්නා කොකු සියල්ලම මස දමා මලකඩ බැඳීමෙන් නිදහස්ව තැබීමට ද ඔහු විසින් සැලැස්විය යුතුය.

8. සෑම මාළු වෙළඳපොළ බලපත්‍රලාභියකු විසින් ම, මාළු වෙළඳපොළට අයත් සෑම කොටසක්, ඒ අවට කාණු, ගොහොරුව, භාජන ආදිය මාළු ගබඩා කිරීම, පිළියෙල කිරීම හෝ වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගන්නා උපකරණ හොඳ තත්වයකින් සහ පිරිසිදුව තැබිය යුතු අතර, යම්කිසි කාණුවකින්, වැසිකිළියකින්, වැසිකිළිවලකින් හෝ වෙනත් යම් ආපදාවක් ඇතිවන දුගඳකින් තොරව තැබිය යුතුය.

9. සෑම මාළු වෙළඳ පොළ බලපත්‍රලාභියකු විසින් ම, ස්ථානයෙහි සේවයෙහි නියුක්ත කර සිටින අය විසින් පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි, ඒ මාළු වෙළඳ පොළේ සනීපාරක්ෂක කසළ භාජනයක් සහ යටත් පිරිසෙයින් එක් පඩික්කමක්වත් තැබීමට සැලැස්විය යුතුය.

10. සෑම මාළු වෙළඳපොළ බලපත්‍රලාභියකු විසින් ම, සින්ක් හෝ ගැල්වනයිස් යකඩවලින් සෑදූ ආවරණය කළ භාජනයක සියලුම වගාකසළ සහ ගෘහස්ථ කසළ එකට ගෙන ලීමට සහ බලපත්‍රලත් ස්ථානයෙන් දිනපතා ඉවත් කිරීමට සැලැස්විය යුතුය. එකී භාජනයට නියම වශයෙන්ම තැළි හෝ ඔහාලන විට හැර අනිත් සෑම වේලාවකම එය වසා තැබීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

11. සෑම මාළු වෙළඳ පොළ බලපත්‍රලාභියකු විසින් ම බලපත්‍රලත් ස්ථානය, මීයන්ගෙන්, ගුල්ලන් සහ කැරපොත්තන්ගෙන්, බළලුන්ගෙන් හා බල්ලන්ගෙන්, මැස්සන්ගෙන්, මදුරුවන්ගෙන් සහ රෝග බෝකරන කෘමීන්ගෙන් තොරව තැබීම කළ යුතුය.

12. කිසිදු තැනැත්තකු විසින්, බලපත්‍රලත් ස්ථානයෙහි සත්වයින් හෝ පක්ෂීන් තබා ගැනීම නොකළ යුතුය.

13. කිසිදු තැනැත්තකු විසින්, මාළු වෙළඳපොළක් තුළ, ඒ සඳහා තබා ඇති පඩික්කමකට හැර, කෙළ ගැසීම නොකළ යුතුය.

14. ආසාදක, ස්පර්ශක හෝ වර්ධනය රෝගයකින් පෙළෙන්නා වූ හෝ මෑතක දී පෙළුණු හෝ එවැනි රෝගයකින් පෙළෙමින් සිටි යම් තැනැත්තකුට මෑතකදී උපස්ථාන කළ කිසිදු තැනැත්තකු විසින් මාළු වෙළඳ පොළකට ඇතුල්වීම හෝ එහි මාළු ගබඩා කිරීම, පිළියෙල කිරීම හෝ වෙළඳාම් කිරීම හෝ එතැනින් හෝ එතැනට මාළු ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

15. කිසිදු මාළු වෙළඳපොළ බලපත්‍රලාභියකු විසින්, 12 වන අතුරු ව්‍යවස්ථාව හෝ 13 වන අතුරු ව්‍යවස්ථාව හෝ 14 වන අතුරු ව්‍යවස්ථාව කඩකිරීමෙහි ලා යම් තැනැත්තකුට අනුබලදීම හෝ කඩකිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

16. මාළු ගබඩා කිරීම, පිළියෙල කිරීම හෝ විකිණීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ඒවා හැර, බලපත්‍රලත් ස්ථානයෙහි යම් ගෘහ භාණ්ඩ, නිදන පැදුරු හෝ වෙනත් භාණ්ඩ කිසිදු තැනැත්තකු විසින් නොතැබිය යුතුය.

17. කිසිදු මාළු වෙළඳපොළක බලපත්‍රලාභියකු විසින්, මාළු වෙළඳ පොළ හා සම්බන්ධව සහ එකම ගොඩනැගිල්ලේ කොටසක් වන යම්කිසි ස්ථානයක්, එහි වාසය කිරීමට දක්වා වූ වෙනත් කිසිදු මාළු වෙළඳ පොළකින් වෙන්කර තිබේ නම් මිස සහ විවෘත කළ විට මුළු භූමි ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ජනෙල්වලින් යුතු වාතාශ්‍රය සපයා තිබේ නම් මිස, නිදන ස්ථානයක් ලෙස පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

18. සෑම මාළු වෙළඳ පොළ බලපත්‍රලාභියකු විසින්ම, බලපත්‍රලත් ස්ථානයෙහි බීමට සුදුසු ජලය ප්‍රමාණවත් ප්‍රමාණයක් සපයා තිබිය යුතුය.

19. සෑම මාළු වෙළඳ පොළ බලපත්‍රලාභියකු විසින් ම, බලපත්‍රලත් ස්ථානය දිනපතා පෙ.ව. 7.00 සිට ප.ව. 7.00 දක්වා මාළු විකිණීම පිණිස විවෘත කර තැබිය යුතුය.

20. කිසිදු මාළු වෙළඳ පොළ බලපත්‍රලාභියකු විසින්, සභාපතිවරයා විසින් සහ මාළු වෙළඳ පොළේ බලපත්‍රලාභියා විසින් අත්සන් තබන ලද ලියාපදිංචි කිරීමේ කාඩ් පතක් තබා ගෙන තිබේ නම් මිස, යම් තැනැත්තකුට බලපත්‍රලත් ස්ථානයේ සිට, විකිණීම පිණිස, මාළු ප්‍රවාහනය කිරීමට ඉඩ නොදිය යුතුය.

21. කිසිදු මාළු වෙළඳ පොළ බලපත්‍රලාභියකු විසින්, ආවරණය කළ වාහනයක හෝ ආවරණය කළ කූඩයක, ටින් එකක හෝ වෙනත් සුදුසු භාජනයක තබාගෙන මිස, මාළු කිසිවක් විකිණීම පිණිස, සිය බලපත්‍රලත් ස්ථානයේ සිට ප්‍රවාහනය කිරීමට ඉඩ නොදිය යුතුය.

එවැනි වාහනයක්, කූඩයක්, ටින් එකක් හෝ වෙනත් භාජනයක් සියලු කල්හි පිරිසිදුව සහ යෝග්‍ය ලෙස නඩත්තු කර ඇති බවට ඔහු විසින් වග බලා ගත යුතුය.

22. මාළු වෙළඳ පොළ බලපත්‍රලාභියා විසින් ඉල්ලීම් කළ විට, එවැනි බලපත්‍රලාභියකු විසින් මාළු විකිණීම පිණිස ප්‍රවාහනය කිරීම සඳහා සේවයට ගෙන සිටින සෑම තැනැත්තකු විසින්ම ප්‍රයෝජනයට ගැනීම පිණිස ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් සභාපතිවරයා විසින් නොමිලයේ නිකුත් කිරීම නීත්‍යානුකූල වන්නේය.

23. (1) සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා පොදුවේ හෝ විශේෂයෙන් බලය පවරන ලද සභාවේ යම් නිලධාරියකු විසින් සියලු සාධාරණ වේලාවන් තුළදී මාළු වෙළඳාම සඳහා වූ යම් පරිශ්‍රයකට හෝ ස්ථානයකට ඇතුල් වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) මාළු විකිණීම සඳහා වූ සාප්පුවේ හෝ ස්ථානයේ බලපත්‍රලාභියා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින්, සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල් වීමට සහ පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතු අතර, සභාපතිවරයාට හෝ ඒ නිලධාරියාට අවශ්‍ය විය හැකි සියලු සහාය දෙනු ලැබිය යුතුය.

24. මාළු විකිණීමට අදාළ වූ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවකම සෑම කඩකිරීමක් ම වෙනුවෙන්, රුපියල් හත්සිය පණහකට නොවැඩි දඩයකින්ද, නොකඩවා කරන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ එ කඩ කිරීම ගැන අවධානය යොමු කරමින්, සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකුගෙන්, ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු නොකඩවා දිගටම වරද කරගෙන යන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පණහකට නොවැඩි දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතුය.

25. නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව, මාළු වෙළඳාම් කිරීමට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් කඩ කිරීම වෙනුවෙන් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියකුගේ බලපත්‍රය ඒ අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, ඒ අවලංගු කිරීම වෙනුවෙන් බලපත්‍රලාභියාට යම් වන්දියක් ලැබීමට හිමිකමක් නොතිබිය යුතුය.

## 30. මස් විකිණීම

1. (1) ඒ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස, කිසිදු තැනැත්තකු විසින් මස් විකිණීම සඳහා (වෙළඳ පොළක් හැර) යම් සාප්පුවක් හෝ ස්ථානයක් භාවිතා නොකළ යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, 25 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කළහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කවර වර්ෂයක් සඳහා ද? ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතුය.

2. බලපත්‍රය ලබා ගැනීම සඳහා වූ ස්ථානය සහ ඒ වෙළඳ සැලේ ඇති උපකරණ පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වෙතොත් මිස, මස් වෙළඳ සැලක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් දීම තැනැත්තකුට නිකුත් නොකළ යුතුය :—

(1) ගොඩනැඟිල්ල සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල වනසේ සාදනු ලැබිය යුතුය.

(2) ස්ථානය යහපත් ප්‍රතිසංස්කරණ තත්වයෙන් සහ හොඳින් වාතාශ්‍රයට සහ හොඳට ආලෝකමත්ව තිබිය යුතු අතර, සෑම කාමරයකම විවෘත කළ හැකි, විවෘත කළ විට මුළු බිම් ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ක්ෂේත්‍රඵලයකින් යුත් ජනෙල් සපයා තිබිය යුතුය.

(3) සෑම කාමරයකම සෑම කොටසකම බිත්ති උසින් අඩි හතරට නොඅඩු විය යුතු අතර, ගඩොල්, කළුගල් හෝ කොන්ක්‍රීට්වලින් සාද එකී ඇතුළත සුමුදු බදාමයක් යොදනු ලැබ තිබිය යුතුය. ඒ එක් එක් බිත්තියේ ඇතුල් පැත්තේ පහළ කොටස, බිම සිට මීටර් 1.2ක් උසට සිමෙන්ති ගඩොලින් හෝ සිමෙන්ති බදාමයෙන් ආවරණය කර තිබිය යුතුය.

(4) සියලුම සිවිලි පොත්ත බිම සිට මීටර් 1.8 ක් උසට තිබිය යුතුය.

(5) වහළ යම්කිසි ස්ථිර ද්‍රව්‍යයකින් සාද තිබිය යුතුය.

(6) සියලුම ලීයෙන් කළ කොටස්වල තෙල් සායම් හෝ සුණු ගා තිබිය යුතුය.

(7) බිම සම්පූර්ණයෙන්ම සිමෙන්ති දමා තිබිය යුතුය.

(8) ස්ථානයට ප්‍රමාණවත් ජලාපවහනයක් තිබිය යුතුය.

(9) බිම සහ බිත්ති පිරිසිදු කිරීමේ කාර්යය සඳහා මේස සහ අනිකුත් සියලුම ගෘහ භාණ්ඩ එහා මෙහා ගෙන යා හැකි විය යුතුය.

(10) මස් තබන සෑම මේසයක් ම මතුපිට සින්ක් හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතුය.

(11) ස්ථානයට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් ද, සනීපාරක්ෂක කසළ භාජනයක් සහ යටත් පිරිසෙයින් එක් පඩික්කමක් ද සපයා තිබිය යුතුය.

(12) ස්ථානය, පොදු මහා මාර්ගයක, වැසිකිළියක, වැසිකිළිවලක, පොහොර ගොඩක හෝ විවෘත කාණුවක සිට අඩු වශයෙන් මීටර් 15.24 ක් දුරින් පිහිටා තිබිය යුතුය.

(13) ස්ථානය තුළ හෝ ඒ හා කෙළින්ම සම්බන්ධ වන පරිදි කිසිදු වැසිකිළියක් හෝ අළුවලක් නොතිබිය යුතුය.

3. සෑම මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් ම, ස්වකීය ස්ථානයෙහි පිටතින් ප්‍රකටව පෙනෙන තැනක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ඔහුගේ නම සහ "බලපත්‍රලත් මස් වෙළඳ සැල" යන වචන පැහැදිලිව පින්තාරු කළ ඵලකයක් සවිකර තිබිය යුතුය.

4. සෑම මස් වෙළඳ සැල් බලපත්‍ර ලාභියකු විසින් ම, මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පිටපතක් රාමුකර බලපත්‍රලත් ස්ථානයෙහි ප්‍රකට තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය.

5. සිමෙන්ති ගඩොල් අල්ලා ඇති හෝ සිමෙන්ති බදාමක් යොදා ඇති කොටස් හැර මස් වෙළඳ සැලට අයත් වන සෑම කාමරයකම බිත්තිවල සුණු ගෑම සහ ලීයෙන් කළ සියලුම කොටස්වල සුණු ගෑම හෝ තෙල් සායම් හා තීන්ත ගෑම, උළුවහු සහ ජනෙල් සේදීම අවම වශයෙන් අවුරුද්දකට දෙවරක් සහ ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් වේලාවන්හි දී සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියකු විසින් ම සිදු කළ යුතුය.

6. සෑම මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් ම, බලපත්‍රයෙහි නියම කර ඇති යම් වේලාවක දිනපතා එක් වරක් හෝ වත්, බිත්තිවල සිමෙන්ති ගඩොල් අල්ලා ඇති හෝ සිමෙන්ති ගා ඇති කොටස, මේස මතුපිට සහ මස් තැබීමට භාවිතා ලී කොට හොඳට අතුල්ලා සේදීමට සැලැස්විය යුතුය. මස් එල්ලා තැබීමට භාවිත කොකු සියල්ලම ඔප දමා, මලකඩ බැඳීමෙන් නිදහස්ව තැබීමට ද ඔහු විසින් සැලැස්විය යුතුය.

7. සෑම මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් ම මස් වෙළඳ සැලට අයත් සෑම කොටසක්, ඒ අවට කාණු, ගෘහ භාණ්ඩ, භාජන ආදිය සහ මස් කැපීම කිරීම, පිළියෙල කිරීම හෝ වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගන්නා උපකරණ හොඳ තත්වයකින් සහ පිරිසිදුව තැබිය යුතු අතර, යම්කිසි කාණුවකින්, වැසිකිළියකින් හෝ වෙනත් යම් ආශ්‍රයකින් ඇති වන දුගඳකින් තොරව තැබිය යුතුය.

8. සෑම මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් ම, ස්ථානයෙහි සේවයෙහි නියුක්ත කර සිටින අය විසින් පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි, ඒ මස් වෙළඳ සැලේ සනීපාරක්ෂක කසළ භාජනයක් සහ යටත් පිරිසෙයින් එක් පඩික්කමක්වත් තැබීමට සැලැස්විය යුතුය.

9. සෑම මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් ම, සින්ක් හෝ ගැල්වනයිස් කළ ආවරණය කළ භාජනයක වාතාරෝධීව සහ ආරක්ෂිතව කැළිකසළ එකතු කිරීම සහ බලපත්‍ර ලත් ස්ථානයෙයි එය දිනපතා ඉවත් කිරීම කරනු ලැබිය යුතුය. එකී භාජනයට නියම වශයෙන් ම කැළිකසළ බහාලන විට හැර අනිත් සෑම වේලාවකම එය වසා තැබීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

10. සෑම මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් ම බලපත්‍ර ලත් ස්ථානය, මීයන්ගෙන්, දඩාවතේ යන බල්ලන්ගෙන්, බළලුන්ගෙන් හා කපුටන්ගෙන්, මැස්සන්ගෙන්, මදුරුවන්ගෙන් සහ වෙනත් හානිකර සතුන්ගෙන් තොරව තබාගත යුතුය.

11. කිසිදු තැනැත්තකු විසින් මලපතුලේ ප්‍රවේශයන්, සත්වයින් හෝ යන්ත්‍ර සහිත ගැනීම නොකළ යුතුය.

12. කිසිදු තැනැත්තකු විසින් මස් වෙළඳ සැල තුළ ඒ සඳහා සකස් ඇති පරිශ්‍රයකට හැර කෙළ ගැසීම නොකළ යුතුය.

13. ආසාදන, ස්පර්ශක හෝ වමනක රෝගයකින් පෙළෙන්නා වූ හෝ එසේ දී පෙනෙන හෝ එවැනි රෝගයකින් පෙළෙමින් සිටි යම් තැනැත්තකුට මාසයක් දී උපස්ථාන කළ කිසිදු තැනැත්තකු විසින් මස් වෙළඳ සැලකට ඇතුල්වීම හෝ එහි මස් කපා කිරීම, පිළියෙල කිරීම හෝ වෙළඳ කිරීම හෝ එහැසින් හෝ එහෙත් මස් ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

14. කිසිදු මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් 12 වන අතුරු ව්‍යවස්ථාව හෝ 13 වන අතුරු ව්‍යවස්ථාව යම් තැනැත්තකු විසින් කඩ කිරීම දැන දැනම ඉඩ නොදිය යුතුය.

15. මස් කපා කිරීම, පිළියෙල කිරීම හෝ විකිණීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ඒවා හැර, බලපත්‍රලත් ස්ථානයෙහි යම් ගෘහභාණ්ඩ, ඇඳ, නිදන පැදුරු හෝ වෙනත් භාණ්ඩ කිසිදු තැනැත්තකු විසින් නොතැබිය යුතුය.

16. කිසිදු මස් වෙළඳ සැලක බලපත්‍රලාභියකු විසින්, මස් වෙළඳ සැල හා සම මට්ටමේ සහ එකම ගොඩනැගිල්ලේ කොටසක් වන යම්කිසි ස්ථානයක්, එම සිට සිලිම දක්වා වූ වෙන් කිරීමකින් මස් වෙළඳ සැලෙන් වෙන්කර තිබෙන්නේ නම් මිස සහ විවෘත කළ විට මුළු භූමි ප්‍රමාණයෙන් සහෙළෙවෙන් පංගුවක් නොඅඩු ක්ෂෙත්‍රඵලයකින් යුතු බාහිර ජනේලයක් සහිත තිබෙන්නේ නම් මිස, නිදන ස්ථානයක් ලෙස පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

17. සෑම මස් වෙළඳ සැලක බලපත්‍රලාභියකු විසින් ම, බලපත්‍රලත් ස්ථානයෙහි බීමට සුදුසු ජලය සැපයීමට ප්‍රමාණයක් සපයා තැබිය යුතුය.

18. සෑම මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් ම, ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි පොදු ඝාතක මඩුවක දී මරණු ලැබ (201 වන අධිකාරය වන සත්ව ඝාතන ආඥාපනතේ 11 වන වගන්තිය හෝ ඝාතක ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ යථා පරිදි ප්‍රකාශිත හා ප්‍රකාශයට පත් කරන ලද්දා වූ සතුන්ගේ මස් හෝ එකී ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ යටතේ නිසි බලධරයා විසින් සත් කාර්ය සඳහා පත් කරන ලද ස්ථානයක දී මරණ ලද සතුන්ගේ මස් හෝ එකී ආඥාපනතේ ... අවසර පත්‍රයක් යටතේ මරණ ලද සතුන්ගේ මස් හැර වෙනත් මස් කිසිවක් බලපත්‍රලත් ස්ථානයෙහි විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

19. සෑම මස් වෙළඳ සැල් බලපත්‍රලාභියකු විසින් ම බලපත්‍රලත් ස්ථානය, දිනපතා පෙ.ව. 7.00 සිට පෙ.ව. 10.00 දක්වාත්, ප.ව. 3.00 සිට ප.ව. ... දක්වාත් මස් විකිණීම පිණිස විවෘතව තැබිය යුතුය.

20. කිසිදු මස් වෙළඳ සැලක බලපත්‍රලාභියකු විසින්, (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සහ මස් වෙළඳ සැලේ බලපත්‍රලාභියා විසින් අත්සන් තබන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් සතු වෙන තිබෙන්නේ නම් මිස, යම් තැනැත්තකු බලපත්‍රලත් ස්ථානයේ සිට විකිණීම පිණිස මස් ප්‍රවාහනය කිරීමට ඉඩ නොදිය යුතුය.

21. කිසිදු මස් වෙළඳ සැලක බලපත්‍රලාභියකු විසින්, ආවරණය කළ වාහනයක හෝ වැසූ තුවායක, ටින් එකක් හෝ වෙනත් සුදුසු භාජනයක ගෙන මිස, මස් කිසිවක් විකිණීම පිණිස සිය බලපත්‍රලත් ස්ථානයේ සිට ප්‍රවාහනය කිරීමට ඉඩ නොදිය යුතුය. එවැනි වාහනයක්, තුවායක්, ටින් එක හෝ වෙනත් භාජනයක් සියලු කල්හි පිරිසිදුව සහ යෝග්‍ය ලෙස තබාගෙන ඇති බවට ඔහු විසින් වගබලා ගත යුතුය.

22. මස් වෙළඳ සැල් බලපත්‍රලාභියා විසින් ඉල්ලුම් කළ විට, එවැනි බලපත්‍රලාභියකු විසින් මස් විකිණීම පිණිස ප්‍රවාහනය කිරීම සඳහා මස් බෙදවා ගෙන ඇති සෑම තැනැත්තකු විසින් ම ප්‍රයෝජනයට ගැනීම පිණිස, ලියාපදිංචි කිරීමේ සහතිකයක් ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

23. (1) සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා පොදුවේ හෝ විශේෂිතව බලය පවරන ලද සභාවේ යම් නිලධාරියකු විසින් සියලු සාධාරණ වේලාවන් තුළ දී මස් වෙළඳාම සඳහා වූ යම් පරිශ්‍රයකට හෝ ස්ථානයකට ඇතුල්වීම සහ එය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය.

(2) මස් විකිණීම සඳහා වූ පරිශ්‍රයේ හෝ ස්ථානයේ බලපත්‍රලාභියා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින්, සභාපතිවරයාට හෝ සභාපති විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියකුට ඒ ස්ථානයට ඇතුල්වීමට සහ පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතු අතර, සභාපතිවරයාට හෝ නිලධාරියාට අවශ්‍ය විය හැකි සියලු සහාය දෙනු ලැබිය යුතුය.

24. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩකරන සෑම තැනැත්තෙක්ම රුපියල් පන්සිය ඉක්මවා නොයන දඩයකින් ද, එසේ කරන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ ඒ කඩකිරීම ගැන අවධානය යොමු කරමින්, සභාපතිවරයාගෙන් හෝ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද නිලධාරියකුගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු, නොකඩවා දිගටම වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දේසිය පනහකට නොවැඩි දඩයකින් ද, දඬුවම් කරනු ලැබිය යුතුය.

25. නිසි අධිකාරය බලය ඇති අධිකරණයක් විසින් පනවනු ලබන වෙනත් යම් දඬුවමකට අතිරේකව, මස් වෙළඳාම් කිරීමට අදාළ මෙම ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් කඩ කිරීම වෙනුවෙන් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියාගේ බලපත්‍රය අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතු අතර, ඒ අවලංගු කිරීම බලපත්‍රලාභියාට යම් වන්දියක් ලැබීමට හිමිකමක් නොහිමිවිය යුතුය.

## 21. අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම්

1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම්" යන්නෙන් සභාවේ යෝජනා සම්මතියකින් එසේ නියම්කර සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවල උපලේඛනයේ ඇතුළත් කරනු ලබන යම් වෙළඳාමක් අදහස් වේ.

2. (1) කිසිදු තැනැත්තකු විසින්, තමා සත් කාර්ය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු නම් මිස, සභා ප්‍රදේශ තුළ අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳාමක් කරගෙන නොයා යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් 16 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස; එය නිකුත් කිරීමට පෙරුණේ තුබන වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දායින් අවසන් විය යුතුය.

3. (1) වෙළඳාම කරගෙන යනු ලබන ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු අනුමත කරන ලද්දේ නම් මිස ; සහ

(2) ඒ ස්ථානය සහ ඒ වෙළඳාමේ කාර්ය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වේ නම් ඒ ගොඩනැගිල්ල පහත සඳහන් වන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තකුට අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳාම කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් නොකළ යුත්තේය:

(අ) ස්ථානය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ හොඳට වාතාශ්‍රය සහ හොඳින් ආලෝකමත් කර තිබිය යුතු අතර, විවෘත කළ විට ප්‍රමාණයෙන් පහෙළොවෙන් පංගුවකට නොඅඩුවන ප්‍රමාණයක ජනෙල් සෑම කාමරයකටම සපයා තිබිය යුතුය ;

(ආ) සෑම කාමරයකටම සිවිලිමේ සිට පොළොවට උසින් මීටර් 2.140 නොඅඩු විය යුතු අතර, ගඩොල්, ගල් හෝ කොන්ක්‍රීට් වලින් සාදා තිබිය යුතු බිත්ති ඇතුළේ පැත්ත අඩු වශයෙන් පොළොවේ සිට මීටර් 2ක් උසට සිමෙන්ති බදාම යොදා තිබිය යුතු අතර, ඇතුළේ පැත්තේ ඉතිරි කොටස බදාම යොදා සුදු ගා තිබිය යුතුය.

(ආ) සෑම සිලිම හෙවත් වහලක් පොළොවේ සිට මීටර් 1.83ක් උසට තිබිය යුතුය.

(ඇ) වහලය යම්කිසි ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(ඈ) ශී කර්මාන්ත ශාලාවේ බිත්ති හා බිම් හොඳින් ශුද්ධ කර තිබිය යුතුය.

(ඉ) බිම ප්‍රමාණවත් සිමෙන්ති දමා තිබිය යුතුය.

(ඊ) ස්ථානයෙහි ප්‍රමාණවත් තරම් කාණු සපයා තිබිය යුතුය.

(උ) ස්ථානයට සනීපාරක්ෂක කසළ භාජනයක් සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ඌ) වෙළඳාම කරගෙන යාමට ඇති ස්ථානයෙහි ඇතුළත විදුලි කම්බි ඇදීම හා එහි සවිකර ඇති ආරක්ෂක උපාංග සම්බන්ධයෙන් ඒ ස්ථානය (විදුලිය) අධිකාරීවරයා විසින් හෝ කාර්මික නිලධාරියා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියකු විසින් අනුමත කර තිබිය යුතුය.

4. (මෙහි මින් මතු ''බලපත්‍රලාභියා'' යනුවෙන් හැඳින්වෙන) අනුසන්න හෝ අන්තරාදායක වෙළඳාමක් පවත්වාගෙන යනු ලබන සෑම බලපත්‍රලාභියකු විසින්ම ඒ වෙළඳාම කරගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු ද්‍රව්‍ය දූෂිත නොවීම හෝ වෙනත් යම් ආකාරයක් ඇතිවීම වළක්වන අයුරින් ගබඩා කර තැබිය යුතුය.

5. සෑම බලපත්‍රලාභියකු විසින් ම, යම්කිසි නිෂ්පාදන මාර්ගයක දී පිටවන යම්කිසි අනුසන්න වාෂ්ප හෝ ගෑස්, ඒවා පිටදී යාමේ දී හානිකර හෝ අනුසන්නකාර ප්‍රතිඵල ඇති වීමට ඉඩක් නොමැති වන අන්දමින් හා උසකින් වායු ගෝලයට මුදාහැරීම කළ යුතුය. හැකි තාක් දුරට ඒවා පිරිසිදු කිරීමේ උපකරණයක් තුළින් පිටවීමට ඉඩ හැරිය යුතුය.

6. සෑම බලපත්‍රලාභියකු විසින් ම, එවැනි ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ස්ථානය සඳහා ප්‍රමාණවත් කාණු සැපයිය යුතු අතර, ඒ කාණු ක්‍රියාකාරක තත්ත්වයෙන් තබා ගැනීමත් දිනපතා ශෝධනය කරවීමත් කළ යුතුය.

7. සෑම බලපත්‍රලාභියකු විසින් ම, ඒ වෙළඳාම කරගෙන යනු ලබන ස්ථානයෙහි බිම යම්කිසි අපවිත්‍ර ද්‍රව්‍යයකින් කැදීමෙන්, පොළොව ප්‍රතිශෝධන තත්ත්වයෙන් පවත්වා ගෙන යාමටත්, දිනපතා ඉවත් කිරීමටත් කටයුතු සැලැස්විය යුතුය.

8. සෑම බලපත්‍රලාභියකු විසින් ම, ඒ වෙළඳාම කරගෙන යන්නා වූ ස්ථානයෙහි බිත්ති අවශ්‍ය ද, උරා ගැනීමෙන් ආරක්ෂා වන පරිදි, පහසු තත්ත්වය තබා ගත යුතු අතර, වර්ෂයක් පාසා ඒවායේ හුනු ගෑ යුතුය.

9. සෑම බලපත්‍රලාභියකු විසින්ම, ඒ වෙළඳාම සඳහා ප්‍රයෝජනයට ගන්නා උපකරණ සහ භාජන ඇතුළුව සියලු උපකරණ පිරිසිදුව තැබීමටත්, හැකි සෑම අවස්ථාවකම දිනපතා පිරිසිදු කිරීමටත් කටයුතු කළ යුතුය.

10. සෑම බලපත්‍රලාභියකු විසින් ම, ඒ වෙළඳාම කරගෙන යනු ලබන ස්ථානයෙන්, කසළ, අළු හා එකතු වූ බොල් වැනි සමන අපතේ ගිය ද්‍රව්‍ය සහ අතුරු නිෂ්පාදන, ඒවා ස්ථානයේ වැඩි වශයෙන් ව්‍යාපාර කටයුතුවලට බාධා නොවන්නේ නම් මිස, ආවරණය කළ භාජනවල බහා ස්ථානයෙන් දිනපතා ඉවත් කරවිය යුතුය.

11. සෑම බලපත්‍රලාභියකු විසින් ම, තම හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන වැංකි, දූෂිත නැතිව වැළැක්වීම පිණිස, අවශ්‍ය වන පරිදි නිරතුරුව ඉවත් කළ යුතුය.

12. කිසිදු බලපත්‍රලාභියකු විසින්, යම්කිසි ගංගාවක්, දිය පාරක්, ඇළක්, පොකුණක්, ළිඳක්, වැවක් හෝ යම් විවෘත ජල ප්‍රදේශයක් තුළට යම් අපවිත්‍ර, දූෂිත සමන හෝ අනුසන්න ජලය හෝ වෙනත් දියරක් යැවීමෙන් හෝ එතුළට ගලා යාමට සැලැස්වීමෙන් හෝ යම්කිසි අනුසන්න ද්‍රව්‍යයක් එහි සේදීමෙන් හෝ වෙනත් යම්කිසි අන්දමකින් හෝ එවැනි ගංගාවක්, දිය පාරක්, ඇළක් පොකුණක්, ළිඳක් හෝ විවෘත ජල ප්‍රදේශයක් දූෂිත කිරීම නොකළ යුතුය.

13. සභාපතිවරයා විසින් හෝ තත් කාර්ය සඳහා සභාපතිවරයා විසින් පොදුවේ හෝ විශේෂයෙන් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකු විසින්, සියලු සාධාරණ වේලාවන් තුළ දී, අනුසන්න හෝ අන්තරාදායක වෙළඳාමක් කරගෙන යන ස්ථානයකට ඇතුළු වී පරීක්ෂාකර බැලීම නීත්‍යනුකූල වන්නේය. තවද, එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් හෝ එහි භාරකාරත්වය දරණ තැනැත්තා විසින් ඉඩ දිය යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවල කඩ කරන සෑම තැනැත්තකු ම නීති අධිකරණ බලය ඇති අධිකරණයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සිය පණසකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය. තවද, ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරනු ලද නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු කඩ කිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පණහකට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

15. අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව, අනුසන්න හා අන්තරාදායක වෙළඳාම්වලට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියකුගේ බලපත්‍රය නීති අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යනුකූල වන්නේය. තවද, එවැනි බලපත්‍රලාභියකුට එසේ අවලංගු කිරීම පිළිබඳව කිසිදු වන්දියකට හිමිකම නොලැබිය යුතුය.

උපලේඛනය

1. ..............................

2. ..............................

3. ..............................

4. ..............................

5. ..............................

22. අයිස් කර්මාන්තශාලා

01. (1) තත් කාර්ය සඳහා (මෙහි මින්මතු ''සභාපතිවරයා'' යයි සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිදු තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ අයිස් කර්මාන්ත ශාලාවක් තබා නොගත යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, 17 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස, එය නිකුත් කිරීමට පෙරුණ් තුබූ වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දාසින් අවසන් විය යුතුය.

02. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව වෙනොත් මිස කිසිදු තැනැත්තකුට අයිස් ශාලාවක් සඳහා බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොලැබිය යුතුය.

(1) (අ) ස්ථානය හොඳ ප්‍රතිසංස්කරණ තත්වයකින් යුත හොඳට වාතාශ්‍රිතව සහ හොඳින් ආලෝකමත් කර තිබිය යුතු අතර, විට මුළු බිම් ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩුවන ප්‍රමාණයක ජනෙල් සෑම කාමරයකට සපයා තිබිය යුතුය.

(ආ) සෑම කාමරයකම බිත්ති සෑම කොටසක්ම මීටර් 2.14 ට නොඅඩු උසින් විය යුතු අතර ගඩොල් ගල් හෝ කලුගල් වලින් සාදා සුණු බදාමක් යොදා සුණු ගා තිබිය යුතුය.

(ඇ) සෑම පියසි කෙළවරක්ම පොළොවේ සිට අඩු වශයෙන් මීටර් 1.83ක් උසට තිබිය යුතුය.

(ඈ) වහලය යම්කිසි ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(ඉ) ලීයෙන් කළ කොටස් තෙල් පාටින් ගා හෝ හුණු ගා තිබිය යුතුය.

(ඊ) බිම මුළුමනින්ම සිමෙන්ති දමා තිබිය යුතුය.

(උ) ස්ථානයෙහි ප්‍රමාණවත් කරම් කාණු සපයා තිබිය යුතුය.

(ඌ) එවැනි කර්මාන්ත ශාලාවක එක කාමරයක් අයිස් සෑදීම සඳහා පමණක් යොදාගත යුතුය.

(එ) අපිරිසිදු වීමෙන් ආරක්ෂිත මාර්ගයකින් ලබා ගන්නා ලද සෑහෙන ජල සැපයුමක් ස්ථානයට ලබාදිය යුතු අතර, සංග්‍රහණයේ මුළුමනින්ම ආරක්ෂා වන පරිදි සෑහෙන ධාරිතා ඇති සහ එම ජලය රැස්කිරීම පිණිස තිබී අලුතින් සාදා ලද වැංකි හෝ ජලාශය තිබිය යුතුය.

(ඒ) කර්මාන්ත ශාලාවට සනීපාරක්ෂක කසල භාජනයක් සපයා තිබිය යුතු අතර, ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් ද සමග [illegible] පරීක්ෂකත් දෙකක්වත් සපයා තිබිය යුතුය.

(ඔ) කර්මාන්ත ශාලාව, පමණිබි වැසිකිළියක් මුත්‍රා වලකින් ගව මඩුවකින් පොහොර වළකින් හෝ විවෘත කාණුවකින් අඩු වශයෙන් මී[illegible] ක දුරින් පිහිටා තිබිය යුතුය.

(ඕ) කර්මාන්ත ශාලාව හා එය එල්ලේම සම්බන්ධ වී පිහිටි පමණිබි වැසිකිළියක්, මුත්‍රා වළක්, ගව මඩුවක්, පොහොර වළක් හෝ [illegible] නොතිබිය යුතුය.

(2) ඉන්ධන ගබඩා කිරීම පිණිස විශේෂ කාමරයක් හෝ ස්ථානයක් සපයා තිබිය යුතු අතර, අයිස් සාදන ගබඩා කර තිබෙන හෝ [illegible] පිණිස තබා තිබෙන කර්මාන්ත ශාලාවේ පමණිබි කාමරයක් මැදින් නොයා ඉන්ධන ද්‍රව්‍ය එහි ගෙන යා හැකි පරිදි සහ එහි සිට [illegible] ගෙනයා හැකි පරිදි ඒ කාමරය හෝ ස්ථානය පිහිටා තිබිය යුතුය.

(3) අයිස් සෑදීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ජලය සභාපතිවරයා විසින් අනුමත කරන ලද සුදුසු පිල්ටරයක් තුළින් යැවිය යුතු අ[illegible] යන්ත්‍රාගාරයට සම්බන්ධ කර තිබිය යුතුය.

එසේ වුවද අනුමත කරන ලද ජලසම්පාදන ක්‍රමයකින් ලබා ගන්නා ජලය සම්බන්ධයෙන් මෙම වගන්තිය ක්‍රියාත්මක කිරීමෙන් නිදහස් කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය.

3. සෑම අයිස් කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින්ම තමාගේ නම සහ "බලපත්‍රලත් අයිස් කර්මාන්ත ශාලාව" යන වචන සිංහල, [illegible] ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කර ඇති ඵලකයක් ස්ථානයෙහි පිටත ප්‍රකට තැනක සවිකර තැබිය යුතුය.

04. අයිස් කර්මාන්තශාලාවක සෑම බලපත්‍රලාභියකු විසින්ම අයිස් කර්මාන්ත ශාලාවලට අදාල මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ හා [illegible] භාෂාවලින් වූ පිටපතක් සහ බලපත්‍රය ද රාමුකර ඒ ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන තැනක ප්‍රදර්ශනය සඳහා තැබිය යුතුය. තවද, ඒ ස්ථානයේ [illegible] යොදවා ඇති සියලු තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් ද සහිත ලැයිස්තුවක් සියලු සාධාරණ වේලාවන්හි දී සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය [illegible] ලද යම් තැනැත්තකු විසින් පරීක්ෂා කර බැලීමට හැකිවන පරිදි ඒ ස්ථානයෙහි තැබීමට සැලැස්විය යුතුය.

5. කර්මාන්ත ශාලාවට අයත් වන සෑම කාමරයකම බිත්තිවල සහ ලී කර්මාන්තවල අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී හුණු ගෑම සෑම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින්ම කළ යුතුය. තීන්ත ගා තිබේ නම්, උණු වතුර සහ සබන් යොදා අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ [illegible] සභාපතිවරයා විසින් නියෝග කළ වෙනත් වේලාවන්හි දී සේදීම කළ යුතුය.

06. අඩු තරමින් සෑම දිනකටම වරක් වත් කර්මාන්ත ශාලාවේ බිම සේදීම සෑම අයිස් කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම කළ යුතුය.

07. සෑම අයිස් කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම කර්මාන්ත ශාලාවේ සෑම කොටසක්ම එහි වටා පිටාව, කානු, ලිමඩු, [illegible] සෑදීමට භාවිතා කරන උපකරණ පිරිසිදුව හා හොඳ තත්වයෙන් තබා ගැනීමට සැලැස්විය යුතුය.

08. අයිස් සෑදීමේ දී භාවිතා කරන ද්‍රව්‍ය හෝ භාණ්ඩ හැරුණු විට වෙන කිසිවක් කර්මාන්ත ශාලාවට ඇතුල් කිරීම කිසිදු අයිස් කර්මාන්ත[ශාලා] බලපත්‍රලාභියකු විසින් නොකළ යුතුය.

09. වයස අවුරුදු දාහතරකට අඩු යම් තැනැත්තකු කිසිදු අයිස් කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් සිය කර්මාන්ත ශාලාවෙහි සේවයේ [illegible] නොකළ යුතුය.

10. බෝවන රෝගයකින්, චර්මගත රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුනා වූ හෝ එබඳු රෝගයකින් [illegible] රෝගියකුට සාත්තු කිරීමෙහි යෙදී සිටියා වූ කිසිදු තැනැත්තකු විසින් එකී රෝගය බෝවීමට හා රෝග වීජයන් බෝවීමට ලැබීමට ගතවන කාල සීමාව [illegible] තෙක් ඒ කර්මාන්ත ශාලාවට ඇතුල්වීම හෝ අයිස් සෑදීම ඇල්ලීම විකිණීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

11. සෑම අයිස් කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම සියලු මල, කැළි කසළ, මුත්‍රා සහ ගව මඩුව, වැසිකිළි හෝ කර්මාන්ත ශාලා[illegible] කොටසක් සේදූ ද්‍රව්‍ය දිනකට යටත් පිරිසෙයින් එක් වරක්වත් ඒවායින් පීඩාවක් ඇති නොවීම පිණිස ඉවත් කර සුද්ධයක් කිරීමට සැලැස්විය යුතුය.

12. අයිස් කර්මාන්ත ශාලාවක කිසිදු බලපත්‍රලාභියකු විසින් කවර හෝ වර්ගයක් වන කර්මාන්ත ශාලාව තුළ යම් සතකු හෝ කුරුල්[illegible] ගැනීම නොකළ යුතුය.

13. සභාපතිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද[illegible] තකු විසින් එවැනි කර්මාන්ත ශාලාවක් විවෘතව පවත්නා ඕනෑම වේලාවක යම් කර්මාන්ත ශාලාවකට ඇතුල් වී එහි සාදන අයිස් වලින් ලබා ගන්නා [illegible] සාම්පල ගැනීම නීත්‍යානුකූල විය යුතු අතර එවැනි සාම්පල ගැනීමට අවසර දීම යම් අයිතිකරුවකු හෝ එවැනි කර්මාන්ත ශාලාවක් භාරව සිටින තැනැ[illegible] විසින් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

14. මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය හෝ නුසුදුසු ජලය අයිස් සෑදීම සඳහා යම් බලපත්‍රලාභියකු විසින් භාවිතයට නොගත යුතුය.

15. (1) සභාපතිවරයා විසින් හෝ ඒ සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් පොදුවේ හෝ විශේෂයෙන් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකු විසින් සියලු සාධාරණ වේලාවන් තුළදී යම් අයිස් කර්මාන්ත ශාලාවකට ඇතුල් වී පරීක්ෂා කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(2) බලපත්‍රලාභියා විසින් හෝ අයිස් කර්මාන්ත ශාලාව භාරව සිටින තැනැත්තා විසින් සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද යම් නිලධාරියකුට අයිස් කර්මාන්ත ශාලාවට ඇතුල් වී එය පරීක්ෂා කිරීමට අවසර දිය යුතු අතර සභාපතිවරයාට හෝ ඒ නිලධාරියාට අවශ්‍ය විය හැකි සියලු සහාය ඔහු විසින් දිය යුතුය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කරන සෑම තැනැත්තකු ම නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවිට රුපියල් පන්සිය පනකට නොවැඩි දඩයකට යටත් විය යුතුය. තවද ඒ කඩ කිරීම නොකඩවා කරගෙන යන අවස්ථාවක වරදකරු කිරීමෙන් පසු ඒ කඩකිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු කඩකිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් පනස්සිය පනකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතුය.

17. අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව අයිස් කර්මාන්ත ශාලාවලට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම වෙනුවෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියකුගේ බලපත්‍රය නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

## 23. සිසිල්බීම කර්මාන්තශාලා

(1) සන්නිවේදනය සඳහා මෙහි මින්මතු 'සභාපතිවරයා' යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිදු තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ යම් සිසිල්බීම කර්මාන්ත ශාලාවක් පවත්වා හෝ කරගෙන යාම නොකළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, 22 වන වගන්තිය යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස, එය නිකුත් කිරීමට පෙරුනේ ආසන්න වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දායින් අවසන් විය යුතුය.

(3) සෑම බලපත්‍රලාභියකුම ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තුවක් ගෙවීමට යටත් විය යුතුය.

2. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වෙනොත් මිස කිසිදු තැනැත්තකුට සිසිල්බීම කර්මාන්ත ශාලාවක් සඳහා බලපත්‍රයක් ලැබීමට හිමිකම් නැත්තේය.

(1) (අ) ස්ථානය හොඳ ප්‍රතිසංස්කරණ තත්වයකින් සහ හොඳට වාතාශ්‍රය සහ හොඳින් ආලෝකමත් කර තිබිය යුතු අතර, විවෘත කළ විට පුරා සිටි ප්‍රමාණයෙන් සපයන්වන් සංඛ්‍යාවට නොඅඩුවන ප්‍රමාණයක ජනෙල් ඇති කාමරයකටම පෙයා තිබිය යුතුය.

(ආ) සෑම කාමරයකමසිවිලිම සෑම කොටසක්ම මීටර් 2.140 කොඅඩු උසින් විය යුතු අතර, ගඩොල් ගල් හෝ කලුක්වලින් සාදා එහි ඇතුළත සුදු මදාගත් යොදා සුදු ගා තිබිය යුතුය.

(ඇ) සෑම බිත්ති කොළවරක්ම පොළොවේ සිට අඩු වශයෙන් මීටර් 1.83ක් උසට තිබිය යුතුය.

(ඈ) වහලය යම්කිසි ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(ඉ) ලීයෙන් කළ කොටස් පොල් තෙල් හෝ ආ හෝ සුදු ගා තිබිය යුතුය.

(ඊ) බිම මුළුමණින්ම සිමෙන්ති දමා තිබිය යුතුය.

(උ) ස්ථානයෙහි ප්‍රමාණවත් කාණු පද්ධතියක් සපයා තිබිය යුතුය.

(2) යටත් පිරිසෙයින් එක කාමරයක්වත් සිසිල්බීම පැදීම සඳහා වෙන් කරනු ලැබ තිබිය යුතුය.

(3) සිසිල්බීම නිෂ්පාදනයෙහි ලා ප්‍රයෝජනයට ගන්නා බිරළ් කාරයන් සහ වෙනයන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා මැස්සන්ගෙන් ආරක්ෂිතව වෙනම කාමරයක් තිබිය යුතුය.

(4) බෝතල සේදීම සඳහා වෙනම කාමරයක් සපයා තිබිය යුතුය.

(5) කර්මාන්ත ශාලාවේ භාවිතයට ගන්නා වූ ජලය අපිරිසිදු වීමෙන් ප්‍රමාණවත් ලෙස ආරක්ෂිත ස්ථානයකින් ලබාගත යුතුය. එම ජලය කර්මාන්ත ශාලාවට ලැබෙන්නාට සැලැස්වීමේ දී අපවිත්‍ර නොවීමට වගබලාගත යුතුය. එම ජලය කර්මාන්ත ශාලාවේ නිසි අයුරින් සාදන ලද වැංකිවල හෝ ජලාශ යන්හි ගබඩා කර තැබිය යුතුය.

(6) සිසිල්බීම නිෂ්පාදනයේ දී (සහ ඒ හා සම්බන්ධ යම්කිසි නිෂ්පාදන ක්‍රියා මාර්ගයකදී) සහ බෝතල, අම්බාර උපකරණ සහ භාජන සේදීමේ දී, ප්‍රයෝජනයට ගන්නා ජලය සභාපතිවරයා විසින් අනුමත කරන ලද සුදුසු පිරිසිදුකරණයක් තුළින් යැවීමට සැලැස්විය යුතු අතර, එය යන්ත්‍රාගාරයට සම්බන්ධ එසේ වූවද අනුමත කළ පොදු ජල සැපයුමකින් ලබා ගන්නා ජලය මේ අතුරු ව්‍යවස්ථාවෙන් නිදහස් කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය. කර තිබිය යුතුය. එම ජලය රසායනික හා ක්ෂුද්‍ර ජීව පරීක්ෂණයකින් පිරිසිදු සහ පෝෂණ බවට සහතික විය යුතුය.

(7) (අ) සිසිල්බීම කර්මාන්ත ශාලාවට සනීපාරක්ෂක කසල භාජනයක් සපයා තිබිය යුතු අතර, එහි සේවය කරන තැනැත්තන් සෑම දෙනෙකුට එක වැසිකිළියකට නොඅඩු වන සේ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ආ) සිසිල්බීම කර්මාන්ත ශාලාව යම්කිසි වැසිකිළියකින්, මුත්‍රාවලකින්, ගව ලෙඩුවකින්, පොහොර ගොඩකින් හෝ විවෘත කානුවකින් අඩු වශයෙන් මීටර් 15.24 ක දුරින් පිහිටා තිබිය යුතුය.

(ඇ) සිසිල්බීම කර්මාන්ත ශාලාව තුළ හෝ ඒ හා කෙලින්ම සම්බන්ධ වන සේ මුත්‍රාවලක්, වැසිකිළියක්, ගව ලෙඩුවක් හෝ අළු වලක් නොතිබිය යුතුය.

3. (1) සිසිල්බීම කර්මාන්ත ශාලාවක් වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ඇති කාල සීමාව තුළ කවර හෝ වේලාවක දී ඒ කර්මාන්ත ශාලාවේ භාවිත සඳහා භාවිත කරන යම් කොන්දේසියක් 2 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව නොපවතින බව පෙනී ගියහොත්, සභාපතිවරයා විසින් දැන්වීමේ නියමිත සඳහන් කරනු ලබන දිනයකට පෙරාතුව, ඒ කොන්දේසිය එකී විධිවිධානවලට අනුකූලවන සියලු දේවල් කරන ලෙස කර්මාන්ත ශාලාවේ බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් භාර දෙනු ලැබීමට සැලැස්විය හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබූ සිසිල්බීම කර්මාන්ත ශාලාවක කිසිදු බලපත්‍රලාභියකු විසින් ඒ දැන්වීමේ නියමිත සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කිරීම පැහැර නොහැරිය යුතුය.

(3) (1) වන ඡේදය යටතේ වූ දැන්වීම, බලපත්‍රලාභියා විසින් සිසිල්බීම කර්මාන්ත ශාලා ව්‍යාපාරය කරගෙන යන්නා වූ ස්ථානයේ එය ඇලවීමට හෝ ඔහුගේ නම හෝ ඒ ස්ථානයේ බලපත්‍රලාභියා විසින් සේවයෙහි යොදවා සිටින යම් තැනැත්තකුට එය භාර දීමට යෙදුනේ නම්, ඒ දැන්වීම බලපත්‍රලාභියා වෙත යථා පරිදි භාරදුන් ලෙස සලකනු ලැබිය යුතුය.

4. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකුම විසින් ඔහුගේ නම සහ " බලපත්‍රලත් සිසිල්බීම කර්මාන්ත ශාලාව " යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් පැහැදිලිව සින්හාරු කළ එලකයක් ස්ථානයෙහි ප්‍රකට තැනක සවිකර තැබිය යුතුය.

5. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම, මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් වූ පිටපතක් ... පත්‍රය රාමුකර, ඒ ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන තැනක ප්‍රදර්ශනය සඳහා තැබිය යුතුය.

තව ද ඒ ස්ථානයෙහි සේවය කරන (සිසිල්බීම වෙළෙන්දන් ද ඇතුළුව) සියලු තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් සහිත ලැයිස්තුවක් සියලු ... වේලාවන් හිදී සභාපති විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලද යම් තැනැත්තකු විසින් පරීක්ෂා කර බැලීමට හැකිවන පරිදි තබා තිබිය යුතුය.

6. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී සිසිල්බීම කර්මාන්ත ශාලාවට ඇතු... කාමරයකම බිත්තිවල තුළ සැම සුදු ගෑ යුතුය. යටත් පිරිසෙයින් අවුරුද්දක් පාසා දෙසැම්බර් මාසයේ දී සහ සභාපතිවරයා විසින් හෝ ඔහු වි... ලියවිල්ලකින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් නියම කරනු ලබන වෙනත් වේලාවන්හි දී එහි ලී කර්මාන්තශාලා තුළ ඇති සෑම ගෘහ භාණ්ඩ ... හා තිබේ නම්, ඒවා උණුවතුර සහ සබන් හා සේදීම හෝ කළ යුතුය.

7. සෑම සිසිල්බීම කර්මාන්ත ශාලා බලපත්‍රලාභියකු විසින් ම යටත් පිරිසෙයින් දිනකට වරක් වත් කර්මාන්ත ශාලාවේ බිම සේදීම සිදු කළ...

8. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම කර්මාන්ත ශාලාවෙහි ප්‍රයෝජනයට ගන්නා සියලුම බෝතල් පහත සඳහන් ආ... මැනවින් සේදීමට සැලැස්විය යුතුය:—

බෝතල් ඉවත් කිරීම සහ මූලික සේදීමේ කටයුතු සඳහා එක් ටැංකියක් සහ අවසන්වරට සේදීම සඳහා ටැංකියක් වශයෙන් ... සේදීම පිණිස වෙන වෙනම ටැංකි දෙකක් තිබිය යුතුය. නළ මාර්ගයෙන් වූ ජල සැපයුමක් තිබේ නම්, අවසන් වරට සේදීම ගලායන ජල... සිදු කළ යුතුය.

9. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම, කර්මාන්ත ශාලාවේ සෑම කොටසක් ඒ අවට කාණු, ගෘහ භාණ්ඩ සහ භාජන උපකරණ සහ සිසිල්බීම නිෂ්පාදනයෙහිලා ප්‍රයෝජනයට ගන්නා උපකරණ පිරිසිදුව සහ හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් තබා ගැනීමට සැලැස්විය...

10. සිසිල්බීම නිෂ්පාදනය සඳහා භාවිතයට ගන්නා ද්‍රව්‍ය හෝ උපකරණ හැර වෙනත් ද්‍රව්‍ය හෝ උපකරණ කිසිවක් සිසිල්බීම කර්මාන්ත... බලපත්‍රලාභියකු විසින් කර්මාන්ත ශාලාව තුළට නො ගත යුතුය.

11. කිසිදු සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින්, අපිරිසිදු, අයෝග්‍ය හෝ බාල තත්ත්වයෙන් වූ කිසිදු ද්‍රව්‍යයක්, කර්මාන්ත ශා... භාවිතය පිණිස නොගත යුතුය.

12. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම, කර්මාන්ත ශාලාවේ භාවිතයට ගනු ලබන ද්‍රව්‍ය කෘමි සතුන්ගෙන් ආරක්ෂිත ... වල හෝ රාක්කවල තැබීමට කටයුතු යෙදිය යුතුය.

13. සිසිල්බීම වර්ගයේ නම, නිෂ්පාදනය කළ ස්ථානය, කර්මාන්තශාලා අයිති තැනැත්තාගේ නම සහ සභාපතිවරයා විසින් කර්මාන්ත ශාලා... ඇති අංකය සඳහන් ලේබලයක් සිසිල්බීම බහා ඇති සෑම බෝතලයකම යෙදීම සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම කළ යුතුය.

14. කිසිදු සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ඒ සිසිල්බීම කර්මාන්ත ශාලාවේ වයස අවුරුදු දහහතරට අඩු කිසිම තැනැත්තකු සේව... නොයෙදිය යුතුය.

15. යම් බෝවෙන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්මගත රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙළුණු කිසිදු තැනැත්... හෝ එවැනි රෝගයකින් පෙළුණු යම්කිසි තැනැත්තකුට ළඟදී සාත්තු කළ කිසිදු තැනැත්තකු සිසිල්බීම කර්මාන්ත ශාලාවකට ඇතුල් නොවිය යුතු... සිසිල්බීම සෑදීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම පිළිබඳ කටයුතුවල නොයෙදිය යුතුය.

16. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම, සිසිල්බීම බෝතල් කිරීමේ යෙදෙන සෑම තැනැත්තකු විසින් ම එසේ යෙදී සි... දැල් යෙදූ ආවරණයක් හිසකට යොදා ගැනීමට සහ අත්වල විවිධ අත්මේස් පැළඳගෙන සිටීමට සැලැස්විය යුතුය.

17. සිසිල්බීම සෑදීමේ දී භාවිතා කරන සිරප්, සාරයන්, රසායනික හා වෙනත් ද්‍රව්‍ය ගබඩා කිරීම පිණිස වීදුරු, පිඟන් මැටි, ඔප දැමූ පිඟන්... ඇනමල් කළ වාසන්, ගැල්වනයිස් වාසන් හෝ ටින්වලින් සෑදූ භාජන සෑම සිසිල්බීම කර්මාන්ත ශාලා බලපත්‍රලාභියකු විසින් ම භාවිතයට ගත ... ඔහු විසින් මෙම භාජන වෙන යම්කිසි කාර්යයක් සඳහා ප්‍රයෝජනයට නොගත යුතු අතර, ඒවා ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුතුය.

18. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම, සියලු බිම, කැලි කසල සහ මුත්‍රා සහ වැසිකිළි, වැසිකිළි හෝ කර්මාන්ත ශා... යම් කොටසක් සේදූ ද්‍රව්‍ය දිනකට යටත් පිරිසෙයින් එක් වරක් වත්, ඒවායින් පීඩාවක් ඇති නොවීම පිණිස ඉවත්කර පිළියෙළ කිරීමට සැලැස්විය යුතුය.

20. සභාපතිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැ...තකු විසින්, ඒ ස්ථානය විවෘතව පවත්නා ඕනෑම වේලාවක යම් සිසිල්බීම අලෙවි හලකට ඇතුල්වීම ද, ඒ ස්ථානයෙහි නිෂ්පාදනය කරනු ලබන හෝ ... දාමට තබා තිබෙන ඕනෑම වර්ගයක සිසිල්බීම වල සැම්පලයක්, ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව ගෙවීමෙන් පසු ලබා ගැනීම ද නීත්‍යානුකූල වන්නේය. ... බලපත්‍රලාභියකු විසින් හෝ ඒ ස්ථානය භාරව සිටින තැනැත්තකු විසින් එවැනි සැම්පල ගැනීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩකරන සෑම තැනැත්තකුම නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් වරදකරු කරනු ... විට රුපියල් හත්සිය පණහකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතුය. තවද, ඒ කඩ කිරීම, නොකඩවා කරගෙන යන අවස්ථා... වරදකරු කිරීමෙන් පසු හෝ ඒ කඩකිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකු වි... ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු කඩකිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් පනහකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම් ... ලැබිය යුතුය.

22. අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, සිසිල්බීම කර්මාන්තශාලාවලට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවල ... අතුරු ව්‍යවස්ථාවක් කඩකිරීම වෙනුවෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියකුගේ බලපත්‍රය නිසි අධිකරණ බල... අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

## 34. මැලේරියාව වැළැක්වීම සහ මදුරුවන් විනාශ කිරීම

1. මදුරුවන්ගෙන් බෝවෙන රෝග වැළැක්වීමේ කාර්ය සඳහා සෑම ස්ථානයක ම පදිංචිකරු විසින් :—

(i) සියලු පොවැලු ටින්, බෝතල්, පෝච්චි, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ඉවත දැමූ ටයර්, පොල්ලෙලි, පොල් කටු සහ ජලය රැස්විය හැකි ... පිළිවන් ඒ ස්ථානයේ ඇති වෙනත් භාණ්ඩ ඉවත් කරවීමට, විනාශ කරවීමට හෝ අනාරක්ෂිත සාර්ථක ලෙස බැහැරකර ... සැලැස්විය යුතුය.

(ii) ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිළිවල පසුපස වැටෙන පයිප්පවල සහ කාණුවල ජලය ගලායාම පිළිබඳ සියලු අවහිරවීම් ඉවත් කරවිය යු...

(iii) ඒ ස්ථානයේ ඇති සියලු ජල ටැංකි, වැංකි සහ ජලය එකතු වන වෙනත් භාජන මනා ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් පවත්වා ගෙන, යාමට ද ඒවා මදුරුවන් ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීමට හෝ ආවරණය කර තැබීමට ද, තැපෑනකොට ඒවායේ මදුරුවන් බෝවීම වළක්වන තත්ත්වයකින් තබා ගැනීමට ද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකුට පරීක්ෂා කර බැලීමේ කාර්ය සඳහා, මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කරගෙන යාම සඳහා, ඒවාට පහසුවෙන් හා ආරක්ෂා සහිතව යා හැකි ප්‍රවේශයක් ඇති කිරීමට ද කටයුතු සැලැස්විය යුතුය.

(iv) ඒ ස්ථානයේ ඇති සියලුම ළිං යනාදිය ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතු අතර, මදුරුවන් බෝ නොවීම පිණිස වසා හෝ ආවරණය කර තැබීමට හෝ මදුරුවන් බෝවීම වළක්වාලන තත්ත්වයකින් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතුය.

(v) ජල සිරීමට සිදුවන් වන ආකාරයෙන් ඒ ස්ථානයේ සාද ඇති යම් කෘත්‍රිම පොකුණක් ඒ ස්ථානයේ වේ නම්, එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස් කළ යුතුය.

(vi) ඒ ස්ථානය මැදින් ගලා යන සියලුම ජල මාර්ග, ගංගා, ඇලවල් සහ වතුර බැසයන කාණුවල ජලය එකතු වී සිටින දිය කඩිති සෑදීම වැළැක් වීමට සිදුවන් වන අයුරින් ඒවා කඩින්නු කළ යුතුය.

(vii) සියලුම ගල්වලවල් සහ මැණික් පතල් වලවල් ඒවායේ ජලය එකතුවීම වළක්වන ආකාරයෙන් පවත්වා ගෙන යා යුතුය.

(viii) ඒ ස්ථානයේ යම් අහියම් ජලය එකතුවීමක් වේ නම් එය බැසයාමට සැලැස්විය යුතුය.

(ix) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැලෑටි හැර, අනිකුත් සියලු ලඳු කැලෑ හෝ යට් වගා සහ වක්කලතාදිය මදුනත, වාසස්ථානයක් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැඟිල්ලක හෝ ඉදිකිරීමක සිට මීටර් 5.4ක අරය විෂ්කම්භයක් ඇතුළත වූ ඒ ස්ථානයේ සැම කොටසකම ඉවත් කරනු ලැබිය යුතුය.

(x) "දිය පරඬැල්", "කොළ පාසි", "ගෙල් පාසි", "බරවා පාසි" හෝ "ගහයාවිරද්දි" යනුවෙන් සාමාන්‍යයෙන් ප්‍රදේශය තුළ හඳුන්වන ජලජ පැලෑටි හෝ මදුරුවන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දන්නට ලැබෙන වෙනත් යම් ජලජ පැලෑටියක් හෝ පැලෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතුය.

(xi) මේ නියෝගවල (x) වන ඡේදයේ සඳහන් කරන ලද පැලෑටි, යම් ජල මාර්ගයක් දිගේ පාවී යාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරීම වළක්වාලිය යුතුය.

(xii) වැසිකිළි දිය වලවල්, දිය උරන වලවල්, මුද කැලි වලවල් සහ ඒවායේ වටාපිටාව ද ඇතුළු ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිළි, මදුරුවන් බෝවීම වළක්වා ලන තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතුය, තව ද,

(xiii) සියලු පොල්පෙලි වලවල් සහ කොහු වලවල් මදුරුවන් බෝවීම වළක්වා ලන තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතුය.

(2) (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ තත් කාර්ය සඳහා පොදුවේ හෝ විශේෂයෙන් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් හිරු නැගීමෙන් පසු හා හිරු බැසීමට පෙර යම් වේලාවක දී, යම් ස්ථානයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ ස්ථානය පරීක්ෂා කර බැලිය හැකිය.

(i) ඒ ස්ථානයේ පදිංචිකරු විසින් අතුරු ව්‍යවස්ථාවල නියමයන් පිළිපැද තිබේද යන වග,

(ii) ඒ ස්ථානයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවර ගැනීම අවශ්‍ය වේ නම් ඒ පියවර මොනවාද යන වග,

(iii) ඒ ස්ථානය මදුරුවන් බෝවෙන ස්ථානයක් ද යන වග හෝ,

(iv) ඒ ස්ථානයෙහි කෘමි නාශක ඉසීම කාර්යක්ෂම ලෙස කර තිබේද යන වග.

3. සභාපතිවරයා විසින් හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් විශේෂයෙන් හෝ පොදුවේ ලිඛිතව බලය දෙන යම් නිලධාරියකු විසින් යම් ස්ථානයක පදිංචි කරුට යථා පරිදි දැන්වීමක් කිරීමෙන් පසු, දවල් කාලයේ දී හෝ රාත්‍රී කාලයේ දී රෝගී තැනැත්තන්ගෙන් සහ එවැනි තැනැත්තන් ඇසුරු කළ බවට සැක සිතෙන තැනැත්තන්ගෙන් ලේ සාම්පල් ලබා ගැනීමේ කාර්ය සඳහා ඒ ස්ථානයට ඇතුල් විය හැකිය.

4. (1) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා විශේෂයෙන් හෝ පොදුවේ ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් අවශ්‍ය වේ යයි සලකනු ලබන එවැනි පරීක්ෂණයකින් පසු ඒ දැන්වීමේ නිශ්චිතව දක්වන කාල සීමාවක් ඇතුළත පහත දැක්වෙන කාර්යය හෝ පියවර අතුරින් එක් කාර්‍යයක් හෝ පියවරක් හෝ ඊට වැඩි කාර්යයක් හෝ පියවර ගණනක් ක්‍රියාත්මක කරන ලෙස හෝ ඉටු කරන ලෙස ලිඛිත දැන්වීමකින් ඒ ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකිය.

(i) ඒ ස්ථානයේ ඇති සියලු වැලි පිලි පහතට වැටෙන පයිප්ප සහ කාණු අළුත්වැඩියා කිරීම,

(ii) ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට අවශ්‍ය විය හැකි යම් ජල ටැංකියක් ටැංකියක් හෝ කෘත්‍රිම පොකුණක් කලින් කල හිස් කිරීමට සිදුවන් වන අයුරු සෑදීම හෝ නැවත සෑදීම,

(iii) එවැනි යම් ජල ටැංකියක, ටැංකියක හෝ පොකුණක තාවකාලිකව ජලය බැස්සවීම හා පවිත්‍ර කිරීම සහ එය ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් පාවිච්චියට නොගන්නා විට වසා තැබීම,

(iv) මදුරුවන් බෝවීම වළක්වන තත්වයෙන් යම් ළිඳක් පිහිටුවීම හා පවත්වා ගෙන යාම,

(v) ඒ ස්ථානයේ ඇති යම් කැරු වලක්, පාවිච්චි නොකරන ළිඳක් වැසිකිළි වලක් පොකුණක් හෝ වෙනත් ජලය එකතුවන තැනක් පුරවා වසා දැමීම හෝ එවැනි ජලය ගලා බැස්සවීම හෝ මදුරු නාශක ඉස නිවාරණය කිරීම,

(vi) ඒ ස්ථානයේ වළවල්, කුල් සහ පහත් බිම් කොටස් පුරවා දැමීම,

(vii) ඒ ස්ථානයේ ඇති වතුරැබීම ජල මාර්ග සහ ජලය රැඳී තිබෙන කොටස් පුරවා දැමීම හෝ ඒවායේ ජලය බැස්සවීම හෝ මදුරු කිලිටි නාශක ඉසීමෙන් ඒවා නිවාරණය කිරීම,

(viii) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණයෙන් සහ කාලාන්තරයන් තුළ ඒ ස්ථානයෙහි කෘමිනාශක ඉසීම,

(ix) මදුරුවන් විනාශ කිරීම සහ බෝවීම වැළැක්වීම පිණිස අවශ්‍ය යයි නිසි බලධරයා විසින් හෝ බලය පවරන ලද නිලධාරියා විසින් සලකනු ලබන සහ ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති වෙනත් යම් කටයුත්තක් කිරීම හෝ පියවරක් ගැනීම,

(x) "දිය පරඬැල්" "කොළ පාසි", "ගෙල්පාසි", "බරවාපාසි" හෝ "ගහයාවිරද්දි" යනුවෙන් සාමාන්‍යයෙන් ප්‍රදේශය තුළ හඳුන්වන ජලජ පැලෑටි හෝ මදුරුවන් බෝවීමට ඉඩකඩ සලස්වන බව කලින් කල දන්නට ලැබෙන වෙනත් යම් ජලජ පැලෑටියක් හෝ පැලෑටි ඉවත් කොට විනාශ කරවීම ;

(xi) මේ අතුරු ව්‍යවස්ථාවේ (x) වන ඡේදයේ සඳහන් කරන ලද පැලෑටි යම් ජල මාර්ගයක් දිගේ පාවීයාම නවත්වන පරිදි සුදුසු වූ බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරීම වළක්වා ලීම ;

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ දැන්වීමක් භාරදෙන ලද යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ දී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතුය.

සිය ළේවල මැලේරියා පරපෝෂිතයා හෝ ලේවල, මුත්‍රාවල හෝ වෙනත් ශරීර ද්‍රව්‍යයක බරවා ක්ෂුද්‍ර ජීවීන් ඇති බව සොයා දැනගත් යම් තැනැත්ත ලධාරියාගේ දන්වීමේ නිශ්චිතව සඳහන් කරන ස්ථානයකදී හෝ චිකිත්සාගාරයකදී ඒ තැනැත්තා ඒ මැලේරියා පරපෝෂිත වලින් හෝ බරවා ්ගෙන් මිදෙන තුරු, සුදුසු නිවාරණ ප්‍රතිකාර ගන්නා ලෙස ලිඛිත දන්වීමක් මගින් සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

(1) සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව සහ ඒ ස්ථානයෙහි මදුරුවන් බෝවීම වැලැක්වීම සඳහා ඒ නිලධාරියා විසින් දෙනු ලබන ලිඛිත ලට අනුකූලව හැර යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින්, එහි යම් ළිඳක් හෑරීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, ් හෝ වතුර රඳවා තබන වෙනත් ජීව භාජනයක් ඉදිකිරීම නොකළ යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධානවලට පටහැනි වන සේ යම් අලුත් ළිඳක් හෑරීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජන මලක් හෝ වතුර රැස් කරන වෙනත් ජීව භාජනයක් ඉදිකිරීම කරනු ලැබූ අවස්ථාවක, සභාපතිවරයා විසින් ඒ ස්ථානයේ අයිතිකරු වෙත හෝ වෙත භාර දෙනු ලබන ලිඛිත දන්වීමක් මගින්, ඒ දන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළදී ඒ ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය, හෝ භාජනය පුරවා විනාශ කර දමන ලෙස හෝ අනාකාරයෙන් විනාශ කර දමන ලෙස නැතහොත් ඒ කාලය ඇතුළත, ඒ දන්වීමේ සඳහන් කරනු -රයට එය වෙනස් කරන ලෙස නියම කරනු ලැබිය හැකිය.

මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වන ඡේදය යටතේ දන්වීමක් භාර දෙනු ලැබූ යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින්, එහි නිශ්චිතව සඳ ත් කාලය තුළ ඒ දන්වීමේ නියමයන් ඉටු කළ යුතුය.

(1) 4 වන හෝ 6 වන අතුරු ව්‍යවස්ථාව යටතේ යම් දන්වීමක් යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට භාරදීම පුද්ගලිකව භාරදීමෙන් තිකරු සමග හෝ පදිංචිකරු සමග එකට ජීවත්වන යම් වැඩිහිටියකු වෙත රැඳවීමෙන් හෝ ඒ දන්වීම ඒ ස්ථානයේ හොඳින් පෙනෙනා තැනක ් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

යම් ස්ථානයක් සම අයිතිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් හවුලේ අයිවාසිය දරන අවස්ථාවක, එම අයිතිකරුවන් ගෙන් යිතිකරුවකු, 1 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් සහ 4 වන හෝ 6 වන අතුරු ව්‍යවස්ථාව යටතේ හවුලකරුවන් යම් අයකුට භාරදෙනු ලබන ා නියමයන් ඉටුකිරීම සම්බන්ධ යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට වෙන් වෙන්ව වගකිව යුතුය.

) 4 වන හෝ 6 වන අතුරු ව්‍යවස්ථාව යටතේ දන්වීමක් භාරදෙනු ලැබූ යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින්, ඒ දන්වීමේ නිය ත් කර ඇති කාලය තුළ ඒ දන්වීමේ නියමයන් ඉටු කිරීම දක්සුලු කරන හෝ ඉටු නොකරනු අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඒ දන්වීම ා නිලධාරියා විසින් හෝ සභාපතිවරයා විසින් හෝ නිලධාරියා විසින් තත් කාර්ය සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් මෙන් පසු සහ හිරු බැසීමට කලින් ඕනෑම වේලාවක, අවශ්‍ය විය හැකි සහායකින් සහ සේවකයන් සමග ඒ ස්ථානයට ඇතුල් වී ඒ දන් ව යදහන් කර ඇති කටයුතු හෝ පියවර ක්‍රියාත්මක කිරීම හෝ සිදු කිරීම නැතහොත් ක්‍රියාත්මක කිරීමට හෝ සිදු කිරීමට සැලැස්වීම කරනු ය.

යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 4 වන හෝ 6 වන අතුරු ව්‍යවස්ථාව යටතේ භාර දෙන ලද දන්වීමක නිශ්චිතව සඳහන් යම් ් හෝ පියවරක්, සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා හෝ ඒ දන්වීම නිකුත් කළ නිලධාරියා වෙනුවෙන් ක්‍රියාත්මක කළ විට හෝ ඉටුකළ, තු හෝ පියවර ක්‍රියාත්මක කිරීමේදී ලා හෝ ඉටු කිරීමේදී ලා දරන්නට සිදු වූ වියදමේ ප්‍රමාණය, ඒ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් සභා වෙත ගෙවිය යුතුය ; සභාපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ සඳහා ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින දහයක් ඇතුළත තිකරු හෝ පදිංචිකරු විසින් නොගෙවුවහොත්, එය ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු බදුක් ලෙස ඒ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් අයකර යුතුය.

මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් යටතේ සිය කාර්යය නීත්‍යානුකූල ලෙස ක්‍රියාත්මක කිරීමේදී , කිසිදු තැනැත්තකු විසින්, දැන දැනම හෝ , සභාපතිවරයාට හෝ වලයලත් නිලධාරියාට අවහිර කිරීම හෝ බාධා කිරීම නොකළ යුතුය.

කිසිම තැනැත්තකු විසින් දැන දැනම හෝ සිතා මතාම, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරගෙන යනු ලබන යම් මදුරු මර්දන පියවරක කාර්ය ය නිෂ්ඵල කරන්නා වූ හෝ එය ක්ෂයවී යාමට සලස්වන්නා වූ හෝ යම්කිසි ක්‍රියාවක් නොකළ යුතුය.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල—

''පදිංචිකරු'' යන්නෙන් , යම් ස්ථානයක පදිංචිව සිටින්නා වූ හෝ, තමාම වෙනුවෙන් හෝ තවත් අයකු වෙනුවෙන් නියෝජිතයෙක් වශයෙන් එහි භාරකාරත්වය, කළමනාකරණය හෝ පාලනය දරන තැනැත්තකු අදහස් වන නමුත් නවාතැන්කරුවකු ඇතුළත් නොවේ ;

''අයිතිකරු'' යන්නට, සම අයිතිකරුවකු සහ බද්දකරුවකු ද, යම් ස්ථානයක කුලියට හෝ ඵලදාවට කවර වූ ආකාරයක අයිතියක්වත් තිබිකාම යම් තැනැත්තකු ද ඇතුළත් වේ ;

''ස්ථානය'' යන්නට, යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් ඇතුළත් වන අතර, එහි පිහිටියා වූ යම් පොකුණක, ටැංකියක ා, ජල මාර්ගයක, කාණුවක හෝ ගසක නිම්නය ද වතුර පිරුම්ට ඇත්තා වූ හෝ නොමැත්තා වූ කවර ආකාරයක හෝ යම් බෝට්ටුවක් ද ත් වේ.

## 25. ස්පර්ශක සහ ආසාදිත රෝග

ූරිය, කොළරාව හෝ වෙනත් ස්පර්ශක හෝ ආසාදිත රෝගයකින් යම් තැනැත්තකු පෙළෙන්නේ වුද එම තැනැත්තා නිවසේ අයින් අය කර තැබීමේ මාර්ගයක් නොමැත්තා වුද අවස්ථාවක හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ අදහස් අනුව එකී තැනැත්තා තවත්වා ගෙන සිටීම අන්තරායකාරී වන අවස්ථාවක එවැනි යම් තැනැත්තකු යම් රෝහලකට හෝ වෙන්කර තැබීමේ නිවාසයකට යවන ලෙස එකී තැනැත්තා- ් ගෘහ මූලිකයාට ලිඛිත දන්වීමකින් විධාන කිරීම නීත්‍යානුකූල විය යුතුය. ඒ ගෘහ මූලිකයා විසා ඒ අනුව ක්‍රියා කළ යුතුය.

ම රජයේ රෝහල හෝ වෙන්කර තැබීමේ නිවාසය වෙනුවට එම තැනැත්තා හෝ ඔහුගේ මිත්‍රයන් හෝ කැමති වන්නා වුද එකී සෞඛ්‍ය වෛද්‍ය දිව නොවන්නා වුද යම් ප්‍රදේශයකට ඒ තැනැත්තා ගෙන යාමට සභාපතිවරයා විසින් අවසර දීම නීත්‍යානුකූල විය යුතුය.

වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි සභාපතිවරයාගේ අනුමතය ඇතිව හැර, යම් තැනැත්තකු විසින් වසූරිය, කොළරාව ස්පර්ශක හෝ ආසාදිත රෝගයකින් පෙළෙන තැනැත්තකු, එම තැනැත්තා සිටින ස්ථානයෙන් වෙනත් යම් නිවසකට හෝ ස්ථානයකට න් ගෙන යැමට උපකාරිවීම නොකරනු ලැබිය යුතුය.

භාපතිවරයා විසින් සපයා ඇති සියළු ආරෝග්‍යශාලා සහ වෙන්කර තැබීමේ නිවාස, වසූරිය කොළරාව හෝ වෙනත් ස්පර්ශක හෝ ආසාදිත පෙළෙන තැනැත්තන් භාර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අතර, නිරෝධායනය යටතේ තැබිය යුතුය. ඒ රෝහලේ හෝ වෙන්කර තැබී ් ප්‍රධාන වෛද්‍ය නිලධාරියාගේ අනුමතය ඇතිව මිස, කිසි ලෙස පත් කරන ලද උපස්ථායකයන් නොවන කිසිම තැනැත්තකුට එවැනි යම් ලටකට හෝ වෙන්කර තැබීමේ නිවාසයකට ඇතුළු වීමට හෝ ඉඩ දෙනු නොලැබිය යුතුය.

නැවු යාමට සුදුසු තත්ත්වයක සිටින බව සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් සහතික කරනු ලැබුව හොත් මිස, එවැනි යම් රෝහලක් හෝ බීමේ නිවාසයක් වෙතින් කිසිම රෝගියකු මුදා හැරීම හෝ පිටවීමට ඉඩදීම නොකළ යුතුය.

විවිමෙක වන රෝගීන්ට ස්නානය කිරීම සඳහා සපයා ඇති ස්ථානවල හැර කිසිම පොදු ස්ථානයක ස්නානය කිරීමට ...

7. වසූරිය හෝ කොළරාව හෝ වෙනත් ස්පර්ශක හෝ ආසාදක රෝගයකින් පෙළෙමින් සිටි යම් තැනැත්තකු ඉවත් කරනු ලැබූ විට යම් නිවසක හෝ ගොඩනැගිල්ලක සිට ද, එම නිවස හෝ ගොඩනැගිල්ල පිරිසිදු කිරීමේ සහ විෂබීජනාශනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන විට එම රෝගියා ඉවත් කරගත් ඉක්බිතිවම සභාපතිවරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන දින 7 කට නොඅඩු කාලයක් එම සභාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධරයා විසින් එම නිවස හෝ ගොඩනැගිල්ල නිරෝධායනය යටතේ තැබිය යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ අනුමතිය ඇතිව මිස, කවර හෝ කාර්යයක් සඳහා එම ගොඩනැගිල්ලට ඇතුළු වීමට හෝ සිටීමට නිසි ලෙස පත්කරන ලද උපස්ථායකයකුට හැර, වෙනත් කිසිම තැනැත්තකුට ඉඩ නොදිය යුතුය. ඉහත කී පරිදි නිරෝධායනය යටතේ තබන ලද යම් ගොඩනැගිල්ලක වාසය කරන තැනැත්තන් තාවකාලිකව නවාතැන් ගැනීමේ වියදම දරීම අවශ්‍ය යයි තීරණය කරනු ලැබුව හොත් එම වියදම ප්‍රාදේශීය සභාව විසින් දැරිය යුතුය.

8. යම් ගොඩනැගිල්ලක් වඩාත් ක්‍රියාත්මක ලෙස නිරෝධායනය යටතේ තැබීම සඳහා එම ගොඩනැගිල්ල වැටකින් හෝ සභාපතිවරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් සුදුසු යයි සලකන වෙනත් ආකාරයකින් වැට බැඳ ආවරණය කිරීම හෝ එම ගොඩනැගිල්ල අසලින් වැටී ඇති යම් පාරක් වීදියක් අඩි පාරක් හෝ මාර්ගයක් අවහිර කර මිනිසුන් ගමන් කිරීම වැළැක්වීම අවශ්‍ය නම් සභාපතිවරයා විසින් හෝ එකී වෛද්‍ය නිලධරයා විසින් එසේ කිරීම නීත්‍යානුකූල විය යුතුය.

9. කොළරාව, වසූරිය හෝ වෙනත් භයානක ස්පර්ශක හෝ ආසාදක රෝගයක් පැතිර පවත්නා අවධියක දී යම් මහජන ආරෝග්‍ය ශාලාවක් තුළ වෙන් කිරීමේ නිවාසයක් තුළ හෝ ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි නිරෝධායනය යටතේ තබන ලද ගොඩනැගිල්ලක් තුළ මිනිසුන් එකතු වීම හෝ රැස්වීම වැළැක්වීමට සභාපතිවරයා හෝ දිස්ත්‍රික්කයේ මහේස්ත්‍රාත්වරයාට බලය තිබිය යුතුය.

10. වසූරිය, කොළරාව හෝ වෙනත් භයානක ස්පර්ශක හෝ ආසාදක රෝගයකින් මියගිය තැනැත්තකුගේ මළ සිරුරක් මී. 1.80 කට අඩු ගැඹුරක නොවැළලිය යුතුය.

11. මේ අතුරු ව්‍යවස්ථා කිසිවක් කඩකරන තැනැත්තකු නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් වරදකරු කරනු ලැබූ විට රු. 750 කට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි අතර, කඩකිරීම දිගටම කරගෙන යන අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ එම කඩකිරීමට අවධානය යොමු කරවමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධරයකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසු, එම කඩකිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රු. 250 කට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

## 26. පොදු නාන ස්ථාන

1. ජලය ස්නානය කිරීමේ කාර්යය සඳහා පොදු ළිං භාවිතා වූ ද, මහජනයාට විවෘතව ඇත්තා වූ ද, සෑම ළිඳක්ම මීටර් 0.6096 කට නොඅඩු උසකින් යුත් ආරක්ෂක තාප්පයක් සහිත විය යුතු අතර, එම තාප්පය පිටත පොළොව මට්ටමෙන් පහතට මීටර් 0.6096 ක් ගැඹුරට සිමෙන්ති යොදා තිබිය යුතුය.

2. ඒ සෑම පොදු ළිඳක් වටා ආසන්නව ඇති බිම, ජලය පොළොවට උරා නොගෙන නිසි පිටවාහයකට ගලා යන පරිදි ඉදිකර ඇති කානුවකට බැස යා හැකි වන සේ, බැම්මක් සහිතව ගල් අල්ලා තිබිය යුතුය.

3. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් එක් පක්ෂයක ප්‍රයෝජනය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නාන ස්ථානයක් වශයෙන් වෙන් කොට ඇති එවැනි යම් පොදු ළිඳක් හෝ වෙනත් ස්ථානයක, අනෙක් පක්ෂයට අයත් කිසිම තැනැත්තකු නෑම, සේදීම හෝ ඒ ළිඳ හෝ ස්ථානයක ජලය වෙනත් යම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

4. ඉහත කී යම් පොදු ළිඳක නෑම සඳහා ප්‍රයෝජනයට ගන්නා බාල්දිවල සෑම හය මාසයකට වරක්වත් තීන්ත ආලේප කළ යුතු අතර, ඒවා දිනපතා පිරිසිදු කළ යුතුය.

5. කුෂ්ඨ හෝ වෙනත් යම් ආසාදක හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ එවැනි රෝගයකින් මෑතදී සුවය ලැබූ කිසිම තැනැත්තෙක්, එවැනි යම් පොදු ළිඳක හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක නෑම, සේදීම හෝ එහි ජලය වෙනත් කවර හෝ ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

6. නාන ස්ථානයක් වශයෙන් වෙන්කර ඇති යම් ස්ථානයක හෝ ඒ ආසන්නයේ කිසිම ගවයකු, අශ්වයකු, එළුවකු, ඌරකු, බැටළුවකු, සුනඛයකු හෝ වෙනත් යම් සතකු සේදීම හෝ සේදීමට සැලැස්වීම හෝ කවර වූ හෝ කාර්යයක් සඳහා එවැනි යම් ස්ථානයකට එවැනි කිසිම සතකු දක්කාගෙන යාම, පැන්නීම හෝ ගෙනයාම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

7. එවැනි යම් පොදු ළිඳක හෝ ඒ ආසන්නයේ හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක හෝ ශරීර කෘත්‍යය කිරීමෙන් කිසිම තැනැත්තකු විසින් පිඩාවක් සිදු නොකළ යුතුය.

8. එවැනි යම් පොදු ළිඳක අධිකාරී හෝ බලකාරී ද මෙයට ඉහතින් වූ අතුරු ව්‍යවස්ථාවල විධානයන් අනුව ක්‍රියා කළ යුතු අතර, ඒවා කිසිම ආකාරයකින් උල්ලංඝනය කිරීමට ඉඩ නොදිය යුතුය.

9. මේ අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම කඩ කිරීමක් සම්බන්ධයෙන් ම මහේස්ත්‍රාත්වරයකු විසින් රුපියල් සියයක පනහක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි විය යුතුය.

## 27. ලොන්ඩරි

1. මේ අතුරු ව්‍යවස්ථාවල, "ලොන්ඩරිය" යන්නෙන්, රෙදි සෝදන්නකු ලෙස ව්‍යාපාරය හෝ කර්මාන්තය කරගෙන යන යම් තැනැත්තකු විසින් රෙදි සේදීම පෙවීම සහ මැදීම යන කාර්යයන් සඳහා පාවිච්චි කරන කවර හෝ විස්තරයක ගොඩනැගිල්ලක් හෝ යම් ඉඩමක්, ස්ථානයක් හෝ පරිශ්‍රයක් අදහස් වන අතර, එවැනි යම් රෙදි සෝදා කිරීම සඳහා පාවිච්චි කරන යම් ගොඩනැගිල්ලක් ද, එවැනි තැනැත්තකු විසින් ඔහුගේ ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ළිඳක්, ටැංකියක් හෝ ජලය ලබා ගන්නා වෙනත් ප්‍රභවයක් ඊට ඇතුළත් වේ.

2. බලපත්‍රය ලබා ගැනීමට අදහස් කරන්නේ යම් ස්ථානයක් සඳහා ද, ඒ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, ලොන්ඩරියක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නොමැත.

(i) එම භූමිය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ යුතුය.

(ii) එම ස්ථානය මනා ලෙස ආලෝකවත්ව සහ වාතාශ්‍රයෙන් යුතුව සහ මනා වාතාශ්‍රයෙන් යුතුව තිබිය යුතු අතර, විවෘත කළ විට එය බිම් වර්ග ප්‍රමාණයෙන් සොළොස්වෙන් පංගුවකට අඩු නොවිය යුතු ජනෙල් සෑම කාමරයකටම සපයා තිබිය යුතුය.

(iii) සෑම ගොඩනැගිල්ලක සෑම කාමරයකම බිත්ති, උසින් මීටර් 2.14 ට අඩු නොවිය යුතු අතර, හුණු බදාම යොදා හුණු ආලේපකර හෝ සිමෙන්තිකර තිබිය යුතුය.

(iv) අතුර, පරෙල් සිමෙන්තියෙන් පොළොවේ සිට මීටර් 1.83 ක් උසින් තිබිය යුතුය.

(v) බිත්තිවලින් කිලිටි ගතිය සහ සේද ගෙදී සඳහා වෙනම වෙනම කාමර සපයා තිබිය යුතු අතර, කාමරවල බිම සිමෙන්ති දමා සහ බිත්ති පොළොවේ සිට මීටර 1.83 ක් උසට සිමෙන්ති කපරාරු කර තිබිය යුතුය.

(vi) ස්ථානයට වෙනම ජල සම්පාදනයක් තිබිය යුතුය.

(vii) නල ජල සැපයුමක් ස්ථානයට ඇත්නම්, රෙදි සේදීමේ සියලු කටයුතු සඳහා ඒ ජලය ප්‍රයෝජනයට ගත යුතුය.

(viii) ස්ථානයේ සේවයේ නියුක්ත කර සිටින සෑම තැනැත්තෙකුටම වෙනම විවේක ගැනීමට සහ දෙතැනකට එක වැසිකිළියකට අඩු නොවන පරිදි ස්ථානයට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ix) ස්ථානය, භූමිය දමන ජලය එක් රැස්ව පල්වීමෙන් තොර විය යුතුය.

(x) ස්ථානයෙහි යම් කොටසක් ගෘහ කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගනු ලබන්නේ නම්, නිදා ගැනීම සහ කෑම පිසීම සඳහා වෙනම සහ ප්‍රමාණවත් කාමර සපයා තිබිය යුතුය.

සෑම ලොජ්හවුස් බලපත්‍රධාරියකු විසින් ම, එම ස්ථානයේ පිට පැත්තේ ප්‍රකටව පෙනෙන තැනක, ඔහුගේ නම සහ "ලියාපදිංචි කළ ලොජ්හවුස්" යන වචන, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පින්තාරු කළ පුවරුවක් සවි කර තැබිය යුතුය.

4. සෑම ලොජ්හවුස් බලපත්‍රධාරියකුම :—

(i) ලොජ්හවුස් පිළිබඳව වන මේ අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ පිටපතක් සහ ඔහුට නිකුත් කර ඇති බලපත්‍රයේ පිටපතක් රාමුකර, එම ස්ථානයේ කොහේත් ප්‍රකටව පෙනෙන තැනක ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතුය ; තවද

(ii) ඒ ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සියලු තැනැත්තන්ගේ නම් සහ ලිපින ලැයිස්තුවක්, සියලු ප්‍රශ්න සහගත වෙලාවන්හි දී පරීක්ෂා කර බැලිය හැකි වන පරිදි, එම ස්ථානයෙහි තැබීමට සැලැස්විය යුතුය.

5. ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර දෙනු ලැබිය හැකි විශේෂ ස්ථානයක හැර, වෙනත් කිසි ස්ථානයක කිසිම ලොජ්හවුස් බලපත්‍රලාභියකු විසින් රෙදි සේදීම නොකළ යුතුය.

6. (i) සෑම ලොජ්හවුස් බලපත්‍රලාභියකුම තමාගේ පවුලේ හෝ ගෘහයෙහි යම් ආසාදන, ජනිතක හෝ චර්ම රෝගයක් ඇති වූ විට, ඒ බව, එය ඇති වී පැය 24ක් ඇතුළත ඔහු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට වාර්තා කළ යුතුය.

(ii) ලොජ්හවුස් බලපත්‍රලාභියකුට හෝ ඔහුගේ පවුලේ හෝ ගෘහයේ යම් සාමාජිකයකුට යම් ආසාදන හෝ ජනිතක රෝගයක්, වැළඳුනු විටක, ඔහු වහාම ලොජ්හවුසියේ සියලු වැඩ නතර කළ යුතු අතර, එම රෝගය වැළඳීමෙන් පසුව, එම රෝගය පවත්නා අතරතුර දී, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ විශේෂ අවසරයක් ඇත්ව හැර, ලොජ්හවුසියට රෙදි කිසිවක් භාර ගැනීමට හෝ ලොජ්හවුසියෙන් රෙදි කිසිවක් පිටතට යැවීමට හෝ ඉඩ නොදිය යුතුය.

7. ලොජ්හවුසියක සෑම බලපත්‍රලාභියකුම, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නියම කරනු ලබන විට, ඔහු රෙදි සේදීමේ සේවය සපයන්නේ යම් තැනැත්තන්ට ද ඒ තැනැත්තන්ගේ ලැයිස්තුවක් තැබිය යුතුය.

8. (1) සෑම ලොජ්හවුස් බලපත්‍රලාභියකුම ලොජ්හවුසියේ සෑම කොටසක්ම ද, ලොජ්හවුසියේ කාර්ය සඳහා පාවිච්චි කරන එම් අවට ද, කාණු, සහ භාණ්ඩ, භාජන සහ සියලු උපකරණ ද පිරිසිදුව සහ මනා අලුත්වැඩියා තත්ත්වයෙන් තබාගත යුතුය.

(2) සෑම ලොජ්හවුස් බලපත්‍රලාභියකුම කිලිටි රෙදි කාමරයේ ඇතුළු පැත්ත, අවුරුද්දකට වරක් හුණු ගෑමට හෝ පින්තාරු කිරීමට සැලැස්විය යුතුය.

9. (1) කිසිම ලොජ්හවුස් බලපත්‍රධාරියකු, කිලිටි රෙදි ගබඩා කිරීම සඳහා නිශ්චිතව සලසා ඇති කාමරයේ හැර වෙනත් කිසිම තැනක, කිලිටි රෙදි ගබඩා කර නොතැබිය යුතුය.

(2) කිසිම ලොජ්හවුස් බලපත්‍රධාරියකු විසින්, පස් දූ රෙදි ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති කාමරයේ හැර වෙනත් යම් කාමරයක තැබීමට ඉඩ නොදිය යුතුය.

10. මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳව වන සෑම උල්ලංඝනය කිරීමක්ම රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකින් ද, එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය නොකෙරේ අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද නිලධරයකු විසින් හෝ ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව, ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින් ද දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

## 28. සංචාරක වෙළෙන්දෝ

1. (අමාත්‍යවරයාගේ, සභාපතිවරයාගේ අනුමැතිය සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ඒ කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ඇත හැර, කිසිම තැනැත්තකු විසින් යම් වීදියක හෝ පොදු මාර්ගයක, උද්‍යානයක හෝ විවෘත භූමියක හෝ කරත්ත හෝ වෙනත් වාහන නතර කර තැබීම සඳහා වෙන්කර ඇති හෝ ප්‍රයෝජනයට ගන්නා යම් පොදු වාහන නැවතුම්පලක කවර වූ හෝ භාණ්ඩයක් විකිණීම හෝ වෙළෙඳාම සඳහා එහා මෙහා ගෙන යාම හෝ නොකළ යුතුය.

2. [illegible]

3. බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම සමග, ඉල්ලුම්කරුගේ (උරිස්තලයේ පමණක්) 2 1/2" × 2" ප්‍රමාණයේ ඡායාරූප පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය ලැබුණු විට සභාපතිවරයා විසින්, යෝග්‍යයැයි ඔහු සලකන විමර්ශන කිරීමට සැලැස්විය හැකි අතර, ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රය සභාපතිවරයා විසින් අනුමත කරනු ලැබූ විට ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කර ඇති ඡායාරූප පිටපත් දෙකෙන් එකක් ඉල්ලුම්කරුට නිකුත් කරන බලපත්‍රයකට ඇලවිය යුතු අතර, අනෙක් පිටපත ඉල්ලුම්පත්‍රය ද සමග, ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබාගත යුතුය.

4. බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා රුපියල් පනහක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කරනු ලැබේ.

5. ප්‍රාදේශීය සභාව විසින් නියමිත කරනු ලැබිය හැකි ගාස්තු ප්‍රමාණයක් සහ කොන්දේසි මත ආගමික උත්සව සමයන් සඳහා හෝ වෙළෙඳපොළ සහ සංචාරක වෙළෙන්දන්ට සභාපතිවරයා විසින් තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම නිත්‍යානුකූල වන්නේය.

6. නිකුත් කරන ලද බලපත්‍රයක් මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමේ හේතුව මත සභාපතිවරයා විසින් ප්‍රතිසංස්කරණය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකිය.

7. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම මෙහි උපලේඛනයේ දක්වෙන කොන්දේසිවලට යටත් වන්නේය.

8. බලපත්‍රය නිකුත් කිරීමට අදාළව නියම කර ඇති කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් බලපත්‍රධාරියා දෙවතාවකට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබීමේ දී මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක්, අධිකාරියක් විසින් අවලංගු කරනු ලැබීමට යටත් වන්නේය.

9. අධිකාරියක් විසින් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඒ බලපත්‍රය අලුත් කිරීමට අවසරයක් දෙනු නොලැබේ. එමෙන්ම බලපත්‍රය සඳහා ගෙවන ලද ගාස්තුවෙන් කිසි කොටසක් ආපසු ගෙවීම ද කරනු නොලැබේ.

10. සංචාරක වෙළෙඳ බලපත්‍රයක් ලබා නොගෙන යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ විකුණන හෝ එම වෙළෙඳාම සඳහා එහා මෙහා ගෙන යන කවර හෝ තැනැත්තෙක්, සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ නිලධරයකු විසින්, සිරභාරයට ගනු ලැබීමට සහ ඒ භාණ්ඩය හෝ භාණ්ඩ විකිණීමෙන් හෝ වෙළෙඳාම සඳහා එහා මෙහා ගෙන යාමෙන් වළක්වනු ලැබීමට යටත් වන්නේය.

11. මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් රුපියල් පන්සිය පණහක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

උපලේඛනය

(1) බලපත්‍රධාරියකු විසින් කවර හෝ දිනයක පෙ.ව. 6.00ත් ප.ව. 7.00ත් අතර කාලය තුළ හැර කිසිම භාණ්ඩයක් විකිණීම හෝ වෙළෙඳාම සඳහා එහා මෙහා ගෙනයාම නොකළ යුතුය.

(2) බලපත්‍රධාරියකු විසින් මිනිසෙකුට ව්‍යාපාරයේ කාර්ය සඳහා විසමන ගෙනයා හැකි ප්‍රමාණය පමණක් ගෙන යා යුතු අතර, ඒ සඳහා පාවිච්චි කරන පෙට්ටිය හෝ බඳුනේ කිසිම එක් පැත්තක දිග මීටර් 0.91කට වැඩි නොවිය යුතුය.

(3) වෙළෙඳාම සඳහා ආහාර ද්‍රව්‍ය එහා මෙහා ගෙන යන අවස්ථාවක ඒ සඳහා පාවිච්චි කරන පෙට්ටිය හෝ බඳුන සියලුම පැතිවලින් ආවරණය කර තිබිය යුතු අතර, ඒ ආහාර ද්‍රව්‍ය දූවිලි හෝ මැස්සන් මාර්ගයෙන් අපවිත්‍රවීම වළක්වනු පිණිස ගැළපෙන වැස්මක් සහිත විය යුතුය.

(4) තමාගේ වෙළෙඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම පිණිස බලපත්‍රධාරියා විසින් යම් ග්‍රැමෆෝනයක් ලවුඩ්ස්පීකරයක් හෝ ඇම්ප්ලිෆයරයක් හෝ වෙනත් ඒ සමාන උපකරණයක් පාවිච්චි නොකළ යුතුය.

(5) බලපත්‍රයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශයේ හැර වෙනත් කිසි ප්‍රදේශයක බලපත්‍රධාරියා විසින් කිසි භාණ්ඩයක් විකිණීම හෝ වෙළෙඳාම සඳහා එහා මෙහා ගෙනයාම හෝ නොකළ යුතුය.

(6) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් බලපත්‍රධාරියා විසින් වෙනත් යම් තැනැත්තකුට පැවරීම නොකළ යුතුය.

(7) බලපත්‍රධාරියා විසින් යම් වීදියක එහා මෙහා ගමනාගමනයට හෝ යම් වීදියක පදික වේදිකාව පාවිච්චි කරන පදිකයන් ගමන් කරන්නන්ට හෝ බාධාවක් සිදු නොකළ යුතු අතර, කවර හෝ පොලිස් නිලධරයකු ප්‍රජා සෞඛ්‍ය නිලධාරියකු හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු විසින් නියම කරනු ලැබූ විටක එසැණ යම් වීදියකින් හෝ පදික වේදිකාවකින් ඉවත් විය යුතුය.

29. ගව ගාල්

1. (1) සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිම තැනැත්තකු විසින් ගවගාලක් තබා නොගත යුතුය.

(2) 11 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වන දිනදී අවසාන වන්නේය.

(3) සෑම බලපත්‍රයක්ම, සභාව විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි, ගාස්තුවකට යටත් වන්නේය.

2. බලපත්‍රය ලබා ගැනීමට අයැදුම් කරන ස්ථානයක් සඳහා ද, ඒ ස්ථානය පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිම තැනැත්තකුට ගාලක් තබා ගැනීම පිණිස බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොලැබේ.

(1) ස්ථානය සවිමත් කර ජලය බැස යන පරිදි සකස් කර තිබිය යුතු අතර, බිම කළු හා මට්ටමට සිටින සේ ගල් අතුරා හෝ කොන්ක්‍රීට් දමා හෝ සම්පූර්ණ කර තිබිය යුතුය.

(2) බාලක ගවයන් සඳහා ඉඩකඩ සැලසීමට අදහස් කර ඇති සෑම කොටුවක්ම හෝ මඩුවක් ම ගඩොලින්, ගලින් හෝ කොන්ක්‍රීට් තැනිය යුතු අතර, බිත්ති සහ කුළුණු හුණු පිරියම් කර, පොළොව මට්ටමේ සිට මීටර් 1.22 උසට සිමෙන්තියෙන් සම්පූර්ණ කර තිබිය යුතුය. පොළොව සිමෙන්ති බදාමෙන් ගඩොල් හෝ ගල් අතුරා හෝ සිමෙන්ති කොන්ක්‍රීට් යොදා හෝ ගල්තාර යොදා හෝ සමාන ආකාරයකට සකස් කර තිබිය යුතුය. වැසි ජලය සහ අපවහන ජලය, ආවරණය කළ ප්‍රධාන කානුවකට හෝ වෙනත් කානුවකට ගලා යාමට, ඉතා ඉක්මනින් ගලා යන ලෙස කානු සපයා තිබිය යුතුය.

(3) බිම සේදීම සහ ස්ථානය පවිත්‍ර කිරීම සඳහා ප්‍රමාණවත් ජලසම්පාදනයක් එම ස්ථානයට සපයා තිබිය යුතුය.

(4) ස්ථානයට ප්‍රමාණවත් විදුලි ආලෝකය තිබිය යුතුය.

3. සෑම ගවගාල් බලපත්‍රධාරියකුම "බලපත්‍ර ලත් ගාල" යන වචන සහ බලපත්‍රධාරියාගේ නම ද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව ලියා ඇති පුවරුවක් තමාගේ ගවගාලේ සිට පැහැදිලිව පෙනෙන ස්ථානයක සවිකර තැබිය යුතුය.

4. සෑම ගවගාල් බලපත්‍රධාරියකුම ගවගාල් පිළිබඳ මේ අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වන පිටපතක් රාමු කර, බලපත්‍ර ලත් ස්ථානයේ කොහේ හෝ පෙනෙන තැනක එල්ලා තැබිය යුතුය.

5. සෑම ගවගාල් බලපත්‍රධාරියකුම ගාලේ බිත්ති සහ කුළුණු සෑම වර්ෂයකම දෙසැම්බර් මාසයේ දී හුණු පිරියම් කිරීමට හෝ තාර ආලේප කිරීමට සැලැස්විය යුතුය.

6. සෑම ගවගාල් බලපත්‍රධාරියකුම ගාල සහ එහි ඇති සියලු කොටස් හොඳ අලුත්වැඩියාවෙන් ද, පිරිසිදු සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් ද තබා ගැනීමට සහ එය දිනපතා සේදීමට සහ ඇමදීමට සැලැස්විය යුතුය.

7. සෑම ගවගාල් බලපත්‍රධාරියකුම, ස්ථානය පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් තබාගත හැකි වනු පිණිස, සියලු ගොම සහ අපද්‍රව්‍ය දිනපතා විසින් වරක් සහ ගොම ගාල් ශීඝ්‍රවශයෙන් වරින් වර එකතු කිරීමට සැලැස්විය යුතු අතර, එසේ එකතු කරන ලද ගොම හා අපද්‍රව්‍ය යම් විද්‍යාත්මකව හොඳින් ආවරණය කළ ප්‍රධාන එකක හෝ වැඩි ගණනක තැන්පත් කළ යුතුය.

8. සෑම ගවගාල් බලපත්‍රධාරියකුම සියලු ගොම, අපද්‍රව්‍ය, මුත්‍රා සහ අපද්‍රව ජලය දිනපතා යටත් පිරිසෙයින් එක් වරක්වත් ඉවත්කර ඒවා සභාවේ සිට හෝ ඉවත දිය යුතුය.

9. (1) සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ ප්‍රාදේශීය සභා නිලධරයකු විසින් කවර හෝ ගවගාලකට, ඕනෑම සාධාරණ වේලාවක් තුළ ඇතුළු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ නිලධරයකුට ඒජාතාට ඇතුළු වී පරීක්ෂා කිරීමට බලතලයක් ඇති අතර [illegible] විසින් හෝ භාරකාරව සිටින තැනැත්තා විසින් හෝ ඉඩ දෙනු ලැබිය යුතු අතර, සභාපතිවරයාට හෝ එවැනි නිලධරයකුට හෝ අවශ්‍ය විය හැකි සියලු සහාය දිය යුතුය.

10. ගව්ගාල් සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථා අනුගෙන් යම් පිළිබඳ වූ යම් කඩකිරීමක් සම්බන්ධයෙන් ම, වරදකරු කරනු ලැබීමෙන්, රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි අතර, ඒ වරද දිගටම කරගෙන යන අවස්ථාවකදී වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ ඒ කඩකිරීම නොකරන අවධානය යොමු කරමින් සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධරයකුගෙන් ලිඛිත දැන්වීමක් ලැබීමෙන් පසුව හෝ ඒ වරද කරගෙන යන එක් එක් දිනය වෙනුවෙන් රුපියල් සියයක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකිය.

11. ගව්ගාල් සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථා අනුගෙන් යම් කඩකිරීම සම්බන්ධව දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියකුට, නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබිය හැකි යම් දඬුවමකට අතිරේකව, එසේ වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියාගේ බලපත්‍රය, ඒ අධිකරණය විසින් අවලංගු කිරීම වෙනුවෙන් නිමිදු වන්දියක් ලැබීමට ඒ බලපත්‍රලාභියාට හිමිකමක් නොමැත්තේය.

## 30. පක්ෂීන් සහ වෙනත් සතුන් හා මල් ආදිය විනාශ කිරීම.

1. මේ අතුරු ව්‍යවස්ථාවල "දඩයම් සතුන්" යන්නෙන් හෝඅලුන්, තිත් මුවන්, රතු හෝ ඔලුවා මුවන්, වැල් මුවන්, මීමින්නන්, ලංකා වලිකුකුළන්, කබරගොයන්, තලගොයන් ඇත. විනෝදය හෝ ආහාරය සඳහා දඩයම් කරනු ලබන සිවුපා හෝ වල් සතුන් හෝ පක්ෂීන් අදහස් වන අතර, ඒ සතුන් ඊට ඇතුළත් වේ.

2. ප්‍රාදේශීය සභාවේ ප්‍රදේශය ඇතුළත, 1909 වන සත්ව ආරක්ෂණ ආඥාපනත යටතේ ලබාගත් යුතු බලපත්‍රයකට අතිරේකව, ලෙස මින් මතු සභාපතිවරයා යනුවෙන් සඳහන් කරනු ලබන, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව, කිසිම තැනැත්තකු විසින්,

(1) කපුටා (කෝවුස් ස්ප්ලෙන්ඩෙන්ස් කුල්මිනේටුස්) සහ පොදු දඩයම් කරන පක්ෂීන් හැර වෙනත් කිසිම දඩයම් සතුන් හෝ කැලෑ පක්ෂියකු ගොනයාම, මැරීම හෝ අල්ලා ගැනීම හෝ ගෙන යාම, මැරීමට හෝ අල්ලා ගැනීමට තැත් කිරීම හෝ කිසිම ආකාරයකින් ඔවුනට බාධා කිරීම; හෝ

(2) කපුටා සහ පොදුවේ දඩයම් කරන පක්ෂීන් හැර වෙනත් කිසිම කැලෑ පක්ෂියකුගේ කූඩුවක්, පැටවුන් හෝ බිත්තර ගෙනයාම හෝ විනාශ කිරීම හෝ ගෙනයාමට හැකගොත් විනාශ කිරීමට තැත් කිරීම හෝ

(3) යම් ගිනි අවියක් හෝ මුගුරු-කුඩාක්කුවක් පත්තු කිරීම හෝ කැටපෝලයක් පාවිච්චි කිරීම හෝ දඩයම් සතුන් හෝ කැලෑ පක්ෂීන් බියගැන්වීම හෝ පලවා හැරීම අරමුණු කරගෙන වෙනත් යම් ක්‍රියාවක් කිරීම නොකළ යුතුය.

3. කිසිම තැනැත්තකු විසින් සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටි යම් මුඩු හෝ පොදු ඉඩමක හෝ විවෘත බිමක හෝ පොදු විනෝද භූමියක හෝ ජාතියම් මල් පැලයක් හෝ ගසක් ඉදිකිරීම, විනාශ කිරීම හෝ හානිකර මල් පැලයකට හෝ ගසකට හානි කිරීම නොකළ යුතුය.

4. මීට ඉහතින් ඇති අතුරු ව්‍යවස්ථාවල කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක්ම රුපියල් පන්සිය පනහක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදක් කරන්නේය.

## 31. සත්ව හිංසා වැළැක්වීම

1. කිසිම තැනැත්තකු විසින්—

(අ) යම් සතකුට කෲර ලෙස පහරදීම, හිංසා කිරීම, ප්‍රමාණය ඉක්මවා සතකු දක්කීම, ප්‍රමාණය ඉක්මවා සතකු පිට උඩ යාම, අයථා ලෙස සතකු ගෙන් ප්‍රයෝජන ගැනීම හෝ සතකුට වද හිංසා කිරීම හැකගොත් කෲර ලෙස පහරදීමට, හිංසා කිරීමට ප්‍රමාණය ඉක්මවා දක්කීමට, ප්‍රමාණය ඉක්මවා පිට උඩ යාමට, අයථා ලෙස ප්‍රයෝජන ගැනීමට හෝ වදහිංසා කිරීමට සැලැස්වීම හෝ එසේ කරවීම ;

(ආ) යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මගින් යම් සතකුට අනවශ්‍ය වේදනාවක් හෝ දුකක් දීම ; හෝ

(ඇ) යම් සතකු අනවශ්‍ය වේදනාවකට හෝ දුකට පත්වන ආකාරයට විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එවැනි ආකාරයකින් තැනකහෝ ඉදිරිපත් කර යම් කැවිය, ගොනුවක, මල්ලක හැකගොත් යම් වාහනයක, කූඩුවක, පෙට්ටියක හෝ කූඩුවක හෝ වෙනත් යම් ආකාරයකට ගෙනයාම හෝ ගෙන යාමට සැලැස්වීම නොකළ යුතුය.

2. මෙහි මින් මතු සභාපතිවරයා යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ ඒ කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු හේ හෝ මතය අනුව යම් තැනැත්තෙක් (1) වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කරයි නම්, ඒ තැනැත්තා ඒ අනවශ්‍ය වේදනාවක් හෝ දුකක් සිදු කළ බව, සියලු කාර්ය සඳහා සැලකිය යුතුය.

3. කිසිම තැනැත්තකු විසින්, නිරාහාරව තැබීමෙන්, අංග ඡේදනයෙන් හෝ වෙනත් වදහිංසා මගින් කිසිම සතකුට වේදනාවක් සිදු නොකළ යුතුය.

4. අනවශ්‍ය ලෙස කෲර අන්දමින් කිසිම තැනැත්තකු විසින් කිසි සතකු නොමැරිය යුතුය.

5. කිසිම තැනැත්තකු විසින්, යම් රෝගයක්, අංග විකලතාවක්, තුවාලයක්, වණයක් හෝ වෙනත් හේතුවක් නිසා වැඩක යෙදවීමට අයෝග්‍ය යම් සතකු යම් වැඩක යෙදීම හෝ කම්කරුවන්ගේ හෝ තමාගේ පාලනය යටතේ සිටින එවැනි අයෝග්‍ය සතකු එසේ යෙදවීමට අවසර දීම හෝ නොකළ යුතුය.

6. තමා අයිතිකරුවන, රෝගී හෝ අබලන්වූ යම් කිසිම සතකුට යම් විදියක මිය යාමට කිසිම තැනැත්තකු විසින්, ප්‍රසිද්ධස්ථානයක හේතුවක් නොමැතිව, ඉඩ නොදිය යුතුය.

7. මේ අතුරු ව්‍යවස්ථා යටතේ වරදක් සිදු කළ දින සිට මාස තුනක් ඉකුත් වීමෙන් පසුව ඒ වරද සම්බන්ධයෙන් නඩු පැවරීමක් නොකළ යුතුය.

8. මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳව වන සෑම උල්ලංඝනයක් කිරීමක් රුපියල් පන්සිය පනහක් නොඉක්මවන දඩයකින් ද, එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය නොකරන අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් හෝ ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව, ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින් ද දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

32. ඝාතන මඩු

1. කිසිම සතකු, ඝාතනය කිරීමට යෝජිත බවට ප්‍රාදේශීය සභාවට පැය 48 කට කලින් දැනුම් දීමක් කර ඇත්නම් සහ ඒ සතා ඝාතනය කිරීමට සුදුසු බවට (මෙහි මින්මතු "රජයේ පශු වෛද්‍යවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍යවරයා හෝ (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් හෝ ලියවිල්ලකින් අනුමත කර ඇත්නම් මිස, ප්‍රාදේශීය සභාවේ බලප්‍රදේශය ඇතුළත ඝාතන මඩුවක ඝාතනය නොකළ යුතුය.

2. ඝාතනය කිරීම සඳහා ගෙන එන ලද සතුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ පශු වෛද්‍යවරයා හෝ ප්‍රාදේශීය සභාව විසින්, තත් කාර්යය සඳහා පත් කරන ලද වෙනත් යම් නිලධරයකු විසින් හෝ පරීක්ෂා කළ යුතු අතර, සියලුම පැටිකිරි වැස්සියන්, බැටළු, දෙනුන් සහ එළුදෙනුන් මෙන්ම මනුෂ්‍යාහාරය සඳහා ඝාතනය කිරීමට නුසුදුසු බව සාවර හෝ ස්තූතියක් නිසා මනුට පෙනී යා හැකි වෙනත් යම් සතුන්, ප්‍රතික්ෂේප කළ යුතුය.

3. ඝාතනය කිරීමට නුසුදුසු යැයි ප්‍රතික්ෂේප කරන ලද සෑම සතකුම, එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ විහාම, අයිතිකරු විසින් ඉවත් කරගනු ලැබිය යුතුය.

4. 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ, ඝාතනය කිරීම සඳහා අනුමත කරන ලද සතකු ඝාතනය කිරීමෙන් පසුව, එම සතාගේ මළකඳ රෝගයකට භාජන වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය බව පෙනී ගියහොත්, එය විනිශ්චය සඳහා ඉදිරිපත් කිරීම හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා ප්‍රයෝජනයට ගැනීම වළක්වනු පිණිස, එකී රජයේ පශු වෛද්‍යවරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධරයා හෝ විසින්, එය විනාශ කිරීමට හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට හෝ සැලැස්විය යුතුය.

5. මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය බවට දූෂණය කරන ලද යම් සතකුගේ මළකඳ හෝ එහි කොටසක් හෝ රජයේ පශු වෛද්‍යවරයාගේ හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියාගේ හෝ විධානය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින්, ඝාතන මඩුවෙන් ඉවත් නොකළ යුතුය.

6. කිසිම සතකු, වෙනත් සතුන් ඉදිරියේ හෝ කලින් ඝාතනය කරන ලද සතකුගේ මළකඳ ඝාතන මඩුවෙන් ඉවත් කරන තෙක් හැකතොත් එම කලින් සිදු කරන ලද ඝාතනය පිළිබඳ සළකුණු ඉවත් වන පරිදි එම ස්ථානය ශුද්ධ කරන තුරු, ඝාතනය කිරීමට සිටින සතාට නොපෙනෙන සේ මුවා කරන තෙක්, ඝාතනය නොකළ යුතුය.

7. සිත්ත් පෝරු ඇල්ලූ කරත්තයක හෝ ලෙ රියක හෝ හැර, කිසිම මස් වෙළෙඳ සැල් බලපත්‍රධාරියකු විසින් ඝාතන මඩුවෙන් මස් කිසිවක් ප්‍රවාහනය කිරීම හෝ ප්‍රවාහනය කරවීම නොකළ යුතුය.

8. ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුවේ ඝාතනය කරනු නොලැබූ කිසිම ගවයකුගේ, බැටළුවකුගේ, එළුවකුගේ, ඌරකුගේ හෝ නැත්නම් වෙනත් සතකුගේ, කිසිම මසක් විකිණීම සඳහා සභාපතිවරයාගේ විශේෂ බලපත්‍රයක් නොමැතිව, ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළට ගෙන නොආ යුතුය. එසේ ප්‍රවේශ ආනයනය කරන ලද සීත කළ මස් කෙරෙහි මේ අතුරු ව්‍යවස්ථාව අදාළ නොවන්නේය.

9. එවැනි විශේෂ බලපත්‍රයක් මත ගෙන එන ලද කිසිම මසක්, එය රජයේ පශු වෛද්‍යවරයා විසින් හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද තැනැත්තා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා විසින් හෝ ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුවේදී පරීක්ෂා කර බලා, මනුෂ්‍ය ආහාරය සඳහා යෝග්‍ය බවට අනුමත කර ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නීතානුකූල නොවන්නේය.

තවද, ඒ සෑම පරීක්ෂණයක් සඳහාම එසේ පරීක්ෂා කරන සෑම කිලෝ එකකටම රුපියල් දහයකට වැඩි නොවන ගාස්තුවක් නියම කර අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට හිමිකම් ඇත්තේය. ඒ ගාස්තුව ගෙවනු ලැබූ විට මස් පරීක්ෂා කරන ලද බව ප්‍රකාශිත සහ ඒවා විකිණීමට අවසර දෙන සහතිකයක් ඒ නිලධාරියා විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

10. ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුවක ඝාතනය කරන ලද කිසිම සතකුගේ මස් කිසිවක් හෝ මීට පූර්ව අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සළකා ඇති පරිදි පරීක්ෂා කරන ලද මස් කිසිවක් ඒ ඝාතනය හෝ පරීක්ෂා කිරීම සහතික කරන්නා වූ, රජයේ පශු වෛද්‍යවරයා හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද තැනැත්තා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ විසින් අත්සන් කරන ලද්දාවූ මෙහි පරිශිෂ්ටයේ 'ට' ආකෘතියෙහි පාස්පත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තකු විසින් ඉවත්කර නොගෙන යුතු අතර යම් බලපත්‍ර ලත් මස් වෙළෙන්දකුට ඒ බලපත්‍ර නිකුත් කිරීම රජයේ පශු වෛද්‍යවරයාගේ හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද තැනැත්තාගේ හෝ කාර්ය වන්නේය.

11. තමා විසින් පරීක්ෂා කරන ලද සියලුම ගවයන් පිළිබඳව, මඩුවේ විස්තර සහ මෙවුට තා පරිශිෂ්ටයේ 'උ' ආකෘතියෙහි දක්වෙන වෙනත් විස්තර පෙන්වන රෙජිස්ටරයක් ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා විසින් තබා ගත යුතුය. ඒ රෙජිස්ටරය මහජනයාට බලාගත හැකි විය යුතුය.

12. පරීක්ෂණය සඳහා ගෙන එන සෑම ගවයකු වෙනුවෙන්ම අයිතිය සනාථ කිරීමේ සහතිකයක් ඉදිරිපත් කරන ලෙස රජයේ පශු වෛද්‍යවරයා හෝ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද තැනැත්තා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ විසින් ගවයාගේ අයිතිකරුට දන්වා සිටිය යුතු අතර එකී සහතිකය සතා ලබා ගන්නේ හෝ මිලට ගන්නේ යම් තැනැත්තකුගෙන් ද තැනැත්තෙක් තැනැත්තාගෙන් ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් විසින් අත්සන් තබා තිබිය යුතුය. තවද, එකී සතා පිළිබඳ විස්තර ද එකී තැනැත්තා හෝ තැනැත්තන් පදිංචි ස්ථාන පිළිබඳ විස්තරද එහි ඇතුළත් විය යුතු අතර, ස්වාමි කරුවන් දෙදෙනකු විසින් එය අත්සන් කර තිබිය යුතුය. ඒ ස්වාමිකරුවන් දෙදෙනාගෙන් එක්කෙනෙකු සතා ලබාගත් ප්‍රදේශයේ ග්‍රාමසේවා නිලධාරිවරයා විය යුතුය. මෙකී සහතික හෝ වඩුවර රජයේ පශු වෛද්‍යවරයාගේ කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

13. ඉහත කී පරිදි යම් සතකු ප්‍රදර්ශනය පිණිස තබා තිබියදී හෝ ඝාතනය කිරීමට පෙර ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුව තුළ සිටියදී යම් තැනැත්තකු ඒ සතා පිළිබඳව හිමිකම් පෑවහොත්, රජයේ පශු වෛද්‍යවරයා හෝ ඝාතන මඩුව භාරව සිටින පරීක්ෂකවරයා හෝ වෙනත් බලයලත් තැනැත්තකු හෝ විසින් එකී සතා ඝාතනය කිරීම නැවැත්වීමට සැලැස්විය යුතු අතර, එසේ හිමිකම් පාන්නවුන් විසින් සැප විස්තරයක් ඇතුළත් මතුගේ හිමිකම් පෑම පිළිබඳ විස්තර සහ මතුගේ ලිපිනය ද රජයේ පශු වෛද්‍යවරයා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ වෙනත් බලයලත් තැනැත්තා හෝ අවශ්‍ය යැයි සලකන වෙනත් විස්තරයක් වේනම් එය ද ලියවිල්ලකින් ඉදිරිපත් කරන ලෙස, එසේ හිමිකම් පාන තැනැත්තාට නියම කළ යුතු බවද මෙයින් නියම කරනු ලැබේ.

14. රජයේ පශු වෛද්‍යවරයා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ බලය පවරනු ලැබූ වෙනත් තැනැත්තා හෝ ලබන ඒ විස්තර සපයනු ලැබූ වහාම ඒ සතා මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු අතර, එවිට ඒ හිමිකම් පෑම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් ලබු විභාගයක් පවත්වා, විනිශ්චය දිය යුතුය. හිමිකම් පාන්නා ඉහත නියමිත පරිදි මතුගේ හිමිකම් පිළිබඳව විස්තර සැපයීමට අපොහොසත් වුවහොත් හැර විභාගයකා සහතිකයට ඉකුත් වූ පසුව ඒ සතා ඝාතනය කිරීම පිණිස රජයේ පශු වෛද්‍යවරයා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ වෙනත් බලයලත් තැනැත්තා විසින් අවසර දීම නීතානුකූල වන්නේය.

15. පහත සඳහන් ගාස්තු ගෙවිය යුතුය.

(අ) මී ගවයකු හෝ ගවයකු සඳහා ඝාතන අවසර පත්‍ර ගාස්තුව සහ ප්‍රදර්ශනය මඩු ගාස්තුව ....................
(ආ) මී ගවයකු හෝ ගවයකු සඳහා හදිසි ඝාතන අවසර පත්‍ර ගාස්තුව ....................
(ඇ) බැටළුවකු හෝ එළුවකු සඳහා ඝාතන සහ ප්‍රදර්ශන මඩු ගාස්තුව ....................
(ඈ) බැටළුවකු හෝ එළුවකු සඳහා හදිසි ඝාතන අවසර පත්‍ර ගාස්තුව ....................
(ඉ) මී ගවයකුගේ හෝ ගවයකුගේ මළකඳ සහ ගොඩු ප්‍රවාහනය කිරීමේ ගාස්තු ....................
(ඊ) බැටළුවකුගේ එළුවකුගේ හෝ ඌරකුගේ මළකඳ සහ ගොඩු ප්‍රවාහනය කිරීමේ ගාස්තුව ....................
(උ) බැටළුවකුගේ, එළුවකුගේ, ඌරකුගේ මළකඳ සහ ගොඩු වෙළෙඳපොළෙන් පිටත ප්‍රවාහනය කිරීමේ ගාස්තු ....................

අවසර පත්‍ර නිකුත් කිරීමේ ගාස්තුව සහ වෙනත් ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කිරීම නියමානුකූල වන්නේය.

16. බලපත්‍රලාභී ඝාතකයකු නොවන කිසිම තැනැත්තකු විසින් සෞඛ්‍ය පරීක්ෂකයෙකුගේ ලත් විශේෂ බලපත්‍රයක් නොමැතිව හෝ ඒ බලපත්‍රයේ නියමයන්ට පටහැනිව යම් සතකු හෝ ඌරකු ඝාතනය නීත්‍යානුකූල නොවන්නේය. එවැනි සෑම බලපත්‍රයක් සඳහාම මුද්දර ගාස්තුවට අතිරේකව ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ගාස්තුවක් අය කරනු ලැබිය හැක්කේය.

17. මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙකු වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයක් නොඉක්මවන දඩයකට යටත් වන්නේය.

18. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස—

'සතා' යන්නෙන් ගවයන්, බැටළුවන්, එළුවන්, ඌරන් සහ කැස්බෑවුන් අදහස් වේ.

'ගවයන්' සහ බලපත්‍රලාභී ඝාතක යන යෙදුම්වල හෝ ඝාතන ආඥාපනතේ පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථයම ඇත්තේය.

ඝාතන මඩු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 10 වන අතුරු ව්‍යවස්ථාව

යටතේ 'උ' ආකෘති පත්‍රය

.................................................................පදිංචි............................................................................................නැමැති අය, ..................................................විසින් පරීක්ෂා කොට අවසර දීමෙන් පසු අද දින ගවයන් ....................................ඝාතනය කරන ලදුව/(හෝ අවස්ථාවෝචිත පරිදි, ප්‍රාදේශීය සභා ප්‍රදේශයෙන් පිටත දී ඝාතනය කරන ලද ගවයන් ....................................මස් මස්, පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලදුව) ඒ ඝාතන ..............................දර්ශනාගාරයෙන් ඔහු විසින් ගෙන යන ලද මස් අංක ..............................දර්ශන වෙළඳ සැලට භාර ගැනීමට අවසර දෙනු ලැබේ.

19......................දින.

ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුව භාර පරීක්ෂක

.................................................ප්‍රදේශීය

සභාවේ දීය.

ඝාතන මඩු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල II වන අතුරු ව්‍යවස්ථාව

යටතේ 'ඌ' ආකෘති පත්‍රය

19..........................දින..............................විසින් පරීක්ෂා කරන ලද සතුන් පිළිබඳ ලේඛනය.

| විස්තරය | වර්ණය | වයස | සළකුණු තිබුණේ | | ඝාතකයගේ නම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | | | දකුණු පැත්ත | වම පැත්ත | | |

## 33. පොදු වෙළඳ පොළවල්

1. මේ අතුරු ව්‍යවස්ථාවල "වෙළඳ පොළ ප්‍රදේශය" යන යෙදුමෙන්, යම් පොදු වෙළෙඳ පොළක් සඳහා වෙළෙඳ පොළ ප්‍රදේශයක් ලෙස ප්‍රාදේශීය සභාවක් විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය අදහස් වේ.

2. මේ අතුරු ව්‍යවස්ථා යටතේ ප්‍රාදේශීය සභාවක අධිකාරය මත හෝ ඒ යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් හෝ ටිකට් පතක් දරන්නකුගේ සේවකයකු නැතහොත් අනුයෝජිතයකු වන්නේ නම් මිස හෝ ඒ අවසර පත්‍රයක හෝ ටිකට් පතක නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූල නොවන වෙනත් ආකාරයකට, කිසිම තැනැත්තකු විසින් පොදු වෙළෙඳ පොළේ කවිසිලක්, ස්ථානයක් හෝ ඉඩ ප්‍රමාණයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතුය. තවද, ඒ සේවකයකුගේ හෝ අනුයෝජිතයකුගේ හෝ නම ප්‍රාදේශීය සභා කාර්යාලයේ ලියාපදිංචි කර ඇත්නම් මිස, ඒ සේවකයකු හෝ අනුයෝජිතයකු එවැනි යම් කවිසිලක්, ස්ථානයක් හෝ ඉඩ ප්‍රමාණයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතුය.

3. (1) පොදු වෙළෙඳ පොළෙහි කවිසිලක්, ස්ථානයක හෝ ඉඩ ප්‍රමාණයක කුලී නිවැසියාව මාසයකට නොඅඩු කාල සීමාවක් සඳහා වන්නා වූ හැම කාරණයක දීම මෙහි "අ" උපලේඛනයේ "අ" ආකෘති පත්‍රය අනුව දීනපතා නිකුත් කරන්නා වූ ද නිකුත් කරන ලද කාල සීමාව සඳහා පමණක් ප්‍රයෝජනයට ගත හැක්කා වූ ද, ටිකට් පතක් මගින් බලය පවරා දෙනු ලැබේ.

(2) පොදු වෙළඳ පොළෙහි කවිසිලක්, ස්ථානයක් හෝ ඉඩ ප්‍රමාණයක් එක් මාසයකට අඩු කාලසීමාවක් සඳහා පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම වෙනුවෙන්, මෙහි "අ" උපලේඛනයේ "ආ" ආකෘති පත්‍රය අනුව දීනපතා නිකුත් කරන්නා වූ ද, නිකුත් කරන ලද කාල සීමාව සඳහා පමණක් ප්‍රයෝජනයට ගත හැක්කා වූ ද, ටිකට් පතක් මගින් බලය පවරා දෙනු ලැබේ.

4. අවසර පත්‍රයක් හෝ ටිකට් පතක් දරන සෑම තැනැත්තකුම ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා නියම කරන අනුප්‍රමාණ අනුව වන කුලියක් හෝ ගාස්තුවක් ගෙවිය යුතුය.

5. වෙළෙඳ පොළ පරිශ්‍රය ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු කුලී සහ ගාස්තු එකතු කිරීමට ප්‍රාදේශීය සභාව විසින් නිලධාරියකු නියුක්ත නොකළ හොත්, එම සභාව විසින් ඒ කුලී සහ ගාස්තු එකතු කිරීමේ අයිතිවාසිකම යම් අනුමත තැනැත්තකුට—

(අ) පෞද්ගලික ගිවිසුමක් මගින් ;— හෝ

(ආ) වෙන්ඩර් කැඳවීමෙන් ; හෝ

(ඇ) ඒ අයිතිවාසිකම ප්‍රසිද්ධ වෙන්දේසියට දැමීමෙන් හෝ බදු දෙනු ලැබිය හැකිය.

6. (1) පොදු වෙළෙඳ පොළෙහි එක් එක් කඩකාමර, ආසනය හෝ ඉඩ ප්‍රමාණය සඳහා ගෙවිය යුතු කුලිය හෝ ගාස්තුව මෙහි පහත සඳහන් කර ඇති අවස්ථාවන්හි දී, අවස්ථාවෝචිත පරිදි ප්‍රාදේශීය සභාවට හෝ එවැනි කුලී හෝ ගාස්තු එකතු කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් පත් කරන ලද නිලධාරියාට හෝ (මෙහි මින්මතු සභාපතිවරයා යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව වෙනත් ආකාරයකට හෝ කල් ඉක්මවීමෙන් ගෙවිය යුතුය.

(2) ඒ කුලිය හෝ ගාස්තුව—

(අ) අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, එය නිකුත් කරන වේලාවේ දී හෝ ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලබන කාල සීමාවේ එක් එක් ලින් මාසයේ පළමුවන දිනයේ දී, මාසික වාරික වශයෙන් ;

සහ

(ආ) විකුණුම් පතක් නිකුත් කරනු ලබන අවස්ථාවක, එය නිකුත් කරන වේලාවේ දී ;

ගෙවිය යුතුය.

එසේ වුවද, අවසර පත්‍රයක් දරන්නකුගෙන් ලැබිය යුතු යම් කුලියක් ගෙවීම සඳහා, ප්‍රමාණවත් හේතු මත, ඔහුට එක් සතියක් නොඉක්මවන කාලයක් කල්දිය හැකි අතර, ඒ කාලය ඉකුත් වූ විට, ගෙවිය යුතු මුදල, අවසර පත්‍රයේ කාලසීමාවෙන්, කුලිය නොගෙවා සිටින එක් එක් දිනය වෙනුවෙන් රුපියලක අතිරේක කුලියක් ද සමඟ, ඉල්ලා සිටි විට ගෙවීමට ඔහු යටත් විය යුතුය.

7. (1) අවසර පත්‍රයක් හෝ විකුණුම් පතක් දරන්නකු විසින්, සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොලබා

(අ) ඒ අවසර පත්‍රය හෝ විකුණුම් පත වෙනත් තැනැත්තකුට පැවරීම හෝ

(ආ) තමාට ලැබී ඇති කඩකාමරයෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි යම් කොටසක් අතුරු කුලියට දීම

නොකළ යුතුය.

(2) සිදුකර ඇතැයි කියනු පැවරීමක් හෝ අතුරු කුලියක් යටතේ කිසිම තැනැත්තකු විසින්, පොදු වෙළෙඳ පොළෙහි යම් කඩකාමරයක්, ආසනයක් හෝ ඉඩ ප්‍රමාණයක් සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව, පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතුය.

8. එක් මාසයක් ඉක්මවන යම් කාල සීමාවකට අවසර පත්‍රයක් දරන යම් තැනැත්තෙක්, ඔහුගේ කුලී ගිවිසුම අවසන් කිරීමට තීරණය කළ විට, ප්‍රාදේශීය සභාවට එක් ලින් මාසයක් කලින් දැනුම් දීමක් කළ යුතුය. එසේ නොකළහොත් එම දැනුම්දීම වෙනුවට එක් මාසයක කුලිය ගෙවිය යුතුය.

9. අවසර පත්‍රය සහිත කඩකාමරයක් ඇති සෑම තැනැත්තෙක්ම—

(අ) ආහාර ද්‍රව්‍ය හෝ බීම විකිණීම සඳහා තබා ඇති හෝ ප්‍රදර්ශනය කර ඇති සෑම භාජනයක්, භාණ්ඩයක්, ඇඳුම් වර්ගයක් හෝ මේසයක්ම දිනපතා ඉතා හොඳින් පිරිසිදු කිරීමට සහ හෝ භාණ්ඩ විකිණීම සඳහා තබා ඇති හෝ ප්‍රදර්ශනය කර ඇති ප්‍රවරුවක් දිනපතා ප්‍රවේශමෙන් ද පැවැත්විය යුතුය.

(ආ) ජරාවාසයන්ගෙන්, දූවිලිවලින් සහ මීයන්ගෙන්, මදුරුවන්ගෙන්, කැරපොත්තන්ගෙන් සහ මැස්සන්ගෙන් ද රෝග වාහක සතුන්ගෙන් ද ආරක්ෂා කර තබා ගත යුතුය.

10. අවසර පත්‍රයක් හෝ විකුණුම් පතක් දරන කිසිම තැනැත්තෙක්—

(අ) පොදු වෙළෙඳ පොළකට පැමිණෙන කිසිම තැනැත්තකු කිසිම නිග්‍රහයකට, හිරිහැරයකට, බැණවැදීමකට හෝ ප්‍රචණ්ඩත්වයකට පාත්‍ර නොකළ යුතුය ;

(ආ) යම් වසංගත, ස්පර්ශ හෝ ආසාදන රෝගයකින් පෙළෙද්දී තමාගේ කඩකාමරය, ආසනය හෝ ඉඩ ප්‍රමාණය පරිහරණය කිරීම හෝ එවැනි යම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු, ඒ කඩකාමරයෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි සේවයේ යෙදවීම හෝ එය පරිහරණය කිරීමට එවැනි තැනැත්තකුට ඉඩදීම නොකළ යුතුය ;

(ඇ) සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව, තමාගේ කඩකාමරයෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි යම් කොටසක් ගොඩ කිරීම හෝ යම් ආවරණයක් හෝ වියනක් ඉදිකිරීම හෝ ඒ කඩකාමරයෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි තාවකාලික හෝ ස්ථිර යම් වෙනසක් කිරීම නොකළ යුතුය ;

(ඈ) සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව ප්‍රාදේශීය සභාවේ දේපළක් නොවන යම් පෙට්ටියක්, මේසයක්, පුටුවක් හෝ වෙනත් එවැනි භාණ්ඩයක් තමාගේ කඩකාමරයට ගෙන ඒම හෝ එහි තබා තැබීම හෝ ඒ කඩකාමරයෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි රැස්කර හෝ වෙනත් පරිදි පවත්වාගෙන යාම නොකළ යුතුය ;

(ඉ) අවසර පත්‍රයෙහි හෝ විකුණුම් පතෙහි නිශ්චිතව දක්වා නොමැති යම් භාණ්ඩයක්, හෝ ප්‍රාදේශීය සභාව විසින් තහනම් කර ඇති යම් භාණ්ඩයක් හෝ අපවිත්‍ර හෝ යම් ආකාරයකින් මිනිස් පරිභෝජනයට නුසුදුසු ආහාර ද්‍රව්‍යයක් තමාගේ කඩකාමරයෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම සඳහා තැබීම නොකළ යුතුය ;

(ඊ) මාළු කටු, වරල් හෝ කොරල කිසිවක් හෝ යම් ද්‍රව්‍ය දමන ලද, කැලි කසළ හෝ අනුගත ඉවත් කරන ද්‍රව්‍ය යම් කාණුවකට හෝ වෙළෙඳ පොළ පරිශ්‍රයෙහි යම් කොටසක් මත නොදැමිය යුතුය ;

(උ) යම් සතකුගේ සමක් හෝ වරල්, වේලීමේ හෝ පදම් කිරීමේ කාර්යය සඳහා, වෙළෙඳපොළ පරිශ්‍රයේ කිසි කොටසක අනාවරණය කර නොතැබිය යුතුය ;

(ඌ) වෙළෙඳ පොළ පරිශ්‍රය තුළ මාළු වේලීම, ලුණු දැමීම හෝ දුම් දැමීම නොකළ යුතුය.

11. පොදු වෙළෙඳ පොළක් ඇතුළත හෝ එහි පරිශ්‍රයෙහි, කිසිම තැනැත්තකු—

(අ) ඉඳුම් හිටුම් කිරීමක් නොකළ යුතුය ;

(ආ) බීමත්ව හෝ නොහික්මුණු ආකාරයෙන් හැසිරීමෙන් නොසිටිය යුතුය ; කෝලාහල කිරීම හෝ කලබල ඇති කිරීම නොකළ යුතුය ; වෙනත් තැනැත්තකු සමඟ දබර කිරීම හෝ අපහාසාත්මක, අසභ්‍ය හෝ අශිෂ්ට වචන පාවිච්චි නොකළ යුතුය ;

(ඇ) සිඟා කෑම නොකළ යුතුය ;

(ඈ) සාධාරණ හේතු දැක්වීම කළ නොහැකි වූ කිසියම් නැසිරීම හෝ වෙළෙඳ පොළ පාලක විසින් හෝ ප්‍රාදේශීය සභාවේ නිලධාරියකු විසින් හෝ සභිකයකු හෝ පොලිස් කොස්තාපල්වරයකු විසින් හෝ සභාපතිවරයාගේ නීත්‍යානුකූල නියමයක් මත ක්‍රියා කරන තැනැත්තකු විසින් හෝ පිටවන ලෙස දැනුම් දෙනු ලැබීමෙන් පසුව රැඳී සිටීම නොකළ යුතුය.

12. කිසිම තැනැත්තෙක්—

(අ) වෙළෙඳපොළ ගොඩනැගිලිවල කිසි කොටසකට හෝ තහනම්වලට හෝ ලාම්පුවලට හෝ පොදු වෙළෙඳපොළ තුළ හෝ අවට ඇති ප්‍රාදේශීය සභාවේ දේපලවලට හෝ හානියක් හෝ විරූප කිරීමක් නොකළ යුතුය.

(ආ) පොදු වෙළෙඳපොළක ප්‍රයෝජනය සඳහා සපයා ඇති ජලය අපවිත්‍ර කිරීම හෝ නාස්ති කිරීමද ඒ ජලයෙන් නෑමට හෝ යම් සත්ත්ව රෙදි හෝ භාණ්ඩයක් සේදීම ද නොකළ යුතුය.

(ඇ) වෙළෙඳපොළ පරිශ්‍රය තුළට යම් සුනඛයකු හෝ විගාලයක් හෝ ගෙන නොයා යුතුය.

13. (1) පොදු වෙළෙඳ පොලක කඩකාමරයක් ඉඩ, ප්‍රමාණයක් හෝ ආසනයක් පරිහරණය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු කුලී හෝ ගාස්තු ලැයිස්තුවක් සභාපතිවරයා විසින් වෙළෙඳපොළේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරවිය යුතුය.

(2) කිසිම වෙළෙඳ පල පාලකයකු හෝ බදුකරුවකු හෝ කුලී හෝ ගාස්තු එකතු කිරීමට බලකරු විසින් පත් කරන ලද තැනැත්තකු,

(අ) ඉහත කී ලැයිස්තුවේ නිශ්චය කොට දක්වෙන ප්‍රමාණයට වඩා වැඩි මුදලක් කුලී හෝ ගාස්තු වශයෙන් ඉල්ලා සිටීම හෝ ලබා ගැනීම නොකළ යුතුය.

(ආ) තමා වෙත පැවරී ඇති හෝ භාර වී ඇති යම් කාර්යයක් ඉටු කිරීමේ හෝ බලයක් ක්‍රියාත්මක කිරීමේ නිමිත්තෙන්, යම් තැනැත්තකු අනවශ්‍ය පීඩාකර පැලකිල්ලකට භාජන නොකළ යුතුය.

14. කිසියම් කුලියක් හෝ ගාස්තුවක් පිළිබඳව වන කවර හෝ මතභේදයක් විභාග කොට ඒ පිළිබඳව සුදුසු යැයි තමාට පෙනී යන නියමයක් කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

15. (1) සභාපතිවරයා හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ විසින් පොදු වෙළෙඳපොළක් පරීක්ෂා කිරීමේ දී යම් කඩකාමරයක් ආසනයක් හෝ ඉඩ ප්‍රමාණයක් භාවිත කරන හෝ පරිහරණය කරන කවර හෝ තැනැත්තකුට නිකුත් කර ඇති අවසර පත්‍රය හෝ ටිකට් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමක් නීත්‍යානුකූල වන්නේය.

(2) සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් යථා පරිදි බලය පවරනු ලැබූ නිලධරයකු විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ විගස අවසර පත්‍රය හෝ ටිකට් පත පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම අවසර පත්‍රයක් හෝ ටිකට් පතක් දරන්නාගේ යුතුකම වන්නේය.

## පෞද්ගලික වෙළෙඳ පොලවල් සහ වෙනත් බලපත්‍ර ස්ථාන

16. යම් පොදු වෙළෙඳ පොලක, වෙළෙඳ පොළ ප්‍රදේශය ඇතුළත කිසිම තැනැත්තකු විසින්, ඒ වෙළෙඳපොළ හැර වෙනත් ස්ථානයක මස්, කුකුළු ආදී සතුන් මාළු, පළතුරු හෝ එළවළු විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය. එසේ වුවද මේ අතුරු ව්‍යවස්ථාව පූර්වයෙන් ඇති විධිවිධාන පහත සඳහන් ඒවාට අදාළ නොවන්නේය.

(අ) නියමිත ස්ථානයක වෙළෙඳාම් නොකරන හෝ එම වෙළෙඳාම් සාධුප්‍රණ සඳහා ප්‍රසිද්ධ පාරවල හෝ පොදු ස්ථාන ආසන්නයේ ස්ථානයක් ඇතුළත් කර නොගන්නා සංචාරක වෙළෙන්දන් විසින් කුකුළු ආදී සතුන්, පළතුරු හෝ එළවළු විකිණීම ;

(ආ) බලපත්‍ර ලත් සංචාරක වෙළෙන්දන් විසින් වෙළෙඳපොළ ප්‍රදේශය ඇතුළත මාළු විකිණීම ;

(ඇ) බත් කඩයක් හෝ තේ හෝ කෝපි කඩයක හෝ පළතුරු කඩයක, බලපත්‍රලාභියා විසින් ඒ ස්ථානයේම පරිභෝජනය සඳහා විකිණීම ;

(ඈ) පොදු වෙළෙඳපොල හැර වෙනත් යම් බලපත්‍ර ස්ථානයක උපදින ලද පළතුරු හෝ එළවළු විකිණීම. මේ ඡේදයෙහි "අවසරලත් ස්ථානය" යන්නෙන් තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයකින් බලය දෙන ලද කවර හෝ ස්ථානයක් අදහස් වේ ;

(2) (1) වන ඡේදයේ සඳහන් සෑම බලපත්‍රයක්ම—

(අ) මෙහි "ආ" උපලේඛනයේ ඇති ආකෘතියට සානුකූල විය යුතුව ; තවද

(ආ) ඒ බලපත්‍රයෙහි නිශ්චය කොට දක්වෙන එක් මාසයකට නොවැඩි පත මාස දොළහක් නොඉක්මවන කාල සීමාවක් තුළ බලපැවැත්විය යුතුය.

(3) (1) (අ) ඡේදයේ සඳහන් බලපත්‍රයක් සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඇති ගාස්තුව ගෙවන තෙක් ඒ ඡේදය යටතේ බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(4) සෑම බලපත්‍රලාභියකුම ඔහුගේ විකුණුම් සේවකයන්ගේ නම්, ප්‍රාදේශීය සභා කාර්යාලයෙහි ලියාපදිංචි කර තැබිය යුතුය.

(5) ප්‍රාදේශීය සභා කාර්යාලයේ නම ලියාපදිංචි කර නොමැති කිසිම විකුණුම් සේවකයකු කිසිම බලපත්‍රලත් ස්ථානයක කිසි විකිණීමක සහභාගි නොවිය යුතුය.

17. ප්‍රාදේශීය සභාව විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු හැර, කිසිම තැනැත්තකු විසින්, වෙළෙඳ ප්‍රදේශය ඇතුළත මස් හෝ මාළු කිසිවක් විකිණීම සඳහා එහා මෙහා ගෙන යාම නොකළ යුතුය. එවැනි බලපත්‍රයක් අසාදන, ස්පර්ශක හෝ වමනීය රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකුට නිකුත් නොකළ යුතුය.

### සාමාන්‍ය විධිවිධාන

18. අපවිත්‍රකාරක තත්වයක සංහාරය කරනු නොලැබූ කිසිම සතකුගේ මළ සිරුර හෝ මස් කිසිවක්, කිසිම තැනැත්තකු විසින්, ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත කිසිදු පොදු වෙළෙඳපොලකට හෝ පෞද්ගලික වෙළෙඳ පලකට හෝ වෙනත් ස්ථානයකට ගෙන ඒම හෝ වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම හෝ නොකළ යුතුය.

එසේ වුවද දිවයිනට ආනයනය කරන ලද ශීත කළ මස් විකිණීම හෝ දඩ මස් විකිණීම හෝ කෙරෙහි මේ අතුරු ව්‍යවස්ථාව අදාළ නොවිය යුතුය.

19. (1) පොදු වෙළෙඳපොලක කඩකාමරයක් ව්‍යාපාර කටයුතු සඳහා පෙ.ව. 6.00 සිට ප.ව. 9.00 දක්වා විවෘත කර තැබිම ඒ කඩකාමරයක් සඳහා අවසර පත්‍රය දරන සෑම තැනැත්තකුගේම කාර්යය වන්නේය.

(2) ඒ කිසිම අවසර පත්‍රධාරියකු විසින්, යුක්ති සහගත හේතුවක් නොමැතිව මහජනයාට සේවය සැපයීම නිකාමකාම් පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතුය.

20. (1) මේ අතුරු ව්‍යවස්ථා අනුගේ යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවන වරට හෝ පස්චාත්කාලව කිසි බලය ඇති අධිකරණයක් විසින් අවසර පත්‍රධාරියකු වරදකරු කිරීමේ දී, මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කර ඇති යම් අවසර පත්‍රයක් ඒ අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) (අ) අවසර පත්‍රය අවලංගු කරනු ලැබ ඇති තැනැත්තකුට හෝ මේ අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති තැනැත්තකුට අලුතෙන් අවසර පත්‍රයක් නිකුත් කිරීම ; හෝ

(ආ) මේ අතුරු ව්‍යවස්ථා කඩ කිරීමක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති යම් තැනැත්තකුට අලුතෙන් ටිකට් පතක් නිකුත් කිරීම, ප්‍රාදේශීය සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

21. සභාපතිවරයා විසින් හෝ ප්‍රාදේශීය අධිකාරී කවර හෝ නිලධරයකු විසින්, යම් වෙළෙඳපලක් පරීක්ෂා කිරීම සහ අපිරිසිදු ආහාරයක් ලෙස මිනිස් පෙනී යන්නේ නම්, ඒ වෙළෙඳපලෙහි විකිණීම සඳහා ඉදිරිපත් කර හෝ ප්‍රදර්ශනය කර ඇත්නම්, යම් ආහාර ද්‍රව්‍යයක් අත්අඩංගුවට ගෙන ඒ ආහාර ද්‍රව්‍ය

ආහාර හෝ වෙනත් ද්‍රව්‍ය නිලධරයා වෙත යැවීම නීත්‍යානුකූල වන්නේය. තවද, එසේ පහතමට ගෙන්වා ලද යම් ආහාර ද්‍රව්‍යයක් අපවිත්‍ර ආහාරයක් බවට ඒ නිලධරයා විසින් සහතික කරනු ලැබුව හොත්, එය පහතමට ගෙන්වා ලද්දේ යම් තැනැත්තකු සන්තකයේ තිබියදී ද, ඒ තැනැත්තාට වන්දි ගෙවීමකින් තොරව, ඒ ද්‍රව්‍යය විනාශ කර දැමිය හැකිය.

22. වෙළෙඳපොළ පාලනය සඳහා හෝ එහි කුලිය හෝ ගාස්තු එකතු කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් පත්කර ඇති වෙළෙඳපොළ පාලකට හෝ වෙනත් නිලධරයකුට හෝ තැනැත්තකුට හෝ සිනුගේ කාර්ය ඉටුකිරීමේ දී කිසිම තැනැත්තකු විසින් විරෝධය පෑම, බාධා කිරීම අවහිර කිරීම හෝ අපහර කිරීම නොකළ යුතුය.

23. මේ අතුරු ව්‍යවස්ථාව පිළිබඳ වන යම් උල්ලංඝනය කිරීමක්, රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකින් සහ එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක නීති බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරමින් සභාපති වරයා විසින් යවන දැන්වීමක් භාරකරවීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය කරගෙන යන එක් එක් දිනය වෙනුවෙන් රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

අ. උපලේඛනය

අ. ආකෘති පත්‍රය

(3 (1) වන අතුරු ව්‍යවස්ථාව)

ගෙවන ලද ගාස්තුව : ..............................

.............................. පදිංචි .............................. වන, මෙහි දරන තැනැත්තාට, මෙහි පසු පිටෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව .............................. දිනයෙන් අවසන් වන මාස .............................. ක කාල සීමාවක් සඳහා වෙළෙඳ පොළෙහි .............................. විකිණීම පිණිස අංක .............................. දරන කඩපිල/ඉඩ ප්‍රමාණය දැරීමට මෙයින් අවසර දෙනු ලැබේ.

..............................

ප්‍රාදේශීය සභාවේ සභාපති.

(ආකෘති පත්‍රයේ පසුපිට)

(1) කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි කිසිම සතකු හෝ පක්ෂියකු තබා ගැනීම හෝ එය තුළට සතකු හෝ පක්ෂියකු ගෙන ඒම නොකළ යුතුය.

(2) ප.ව. 9.00න් පසුව කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි ගිනි දැල්වීමට හෝ ආලෝකයක් දැල්වීමට අවසර නොදිය යුතුය.

(3) ප.ව. 9.00 න් පසුව කිසිම තැනැත්තකු කඩපිලක හෝ වෙළෙඳ පොළෙහි හෝ රැඳී නොසිටිය යුතුය.

(4) සවර හෝ දිනය ප.ව. 9.00 න් පසුව ඊළඟ දිනයේ පෙ.ව. 6.00 අතරතුර කඩපිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි තබා යන භාණ්ඩ යනාදී පිළිබඳ අවදානම අවසර පත්‍රය දරන්නාගේ වගකීම වන්නේය.

(5) මේ කොන්දේසි කඩ කිරීම, අතුරු ව්‍යවස්ථා යටතේ වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, මේ අවසර පත්‍රය දරන්නාගේ කුලී නිවැසියාට අවසාන කරනු ලැබීමට යටත් වීමට හේතු විය හැකිය.

"ආ" ආකෘති පත්‍රය

(3 (2) වන අතුරු ව්‍යවස්ථාව)

පරිහරණය කිරීමේ වීසාව පත

ගෙවන ලද ගාස්තුව ..............................

.............................. පදිංචි .............................. වන, මෙය දරන තැනැත්තාට මෙහි පසු පිටෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව .............................. දිනයෙන් අවසන් වන මාස .............................. ක කාල සීමාවක් සඳහා, වෙළෙඳ පොළෙහි .............................. විකිණීම පිණිස අංක .............................. දරන කඩපිල/ඉඩ ප්‍රමාණය පරිහරණය කිරීමට මෙයින් අවසර දෙනු ලැබේ.

..............................

ප්‍රාදේශීය සභාවේ සභාපති.

(ආකෘති පත්‍රයේ පසුපිට)

(1) කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි කිසිම සතකු හෝ පක්ෂියකු තබා ගැනීම හෝ එය තුළට සතකු හෝ පක්ෂියකු ගෙන ඒම නොකළ යුතුය.

(2) ප.ව. 9.00න් පසුව කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි ගිනි දැල්වීමට හෝ ආලෝකයක් දැල්වීමට අවසර නොදිය යුතුය.

(3) ප.ව. 9.00න් පසුව කිසිම තැනැත්තකු කඩපිලක හෝ වෙළෙඳ පොළෙහි හෝ රැඳී නොසිටිය යුතුය.

(4) සවර හෝ දිනය ප.ව. 9.00න් පසුව ඊළඟ දිනයේ පෙ.ව. 6.00 අතරතුර කඩපිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි තබා යන භාණ්ඩ යනාදී පිළිබඳ අවදානම අවසර පත්‍රය දරන්නාගේ වගකීම වන්නේය.

(5) මේ කොන්දේසි කඩ කිරීම, අතුරු ව්‍යවස්ථා යටතේ වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, මේ අවසර පත්‍රය දරන්නාගේ කුලී නිවැසියාට අවසාන කරනු ලැබීමට යටත් වීමට හේතු විය හැකිය.

## 34. ජලසම්පාදනය

1. මෙම අතුරු ව්‍යවස්ථාවල—

ජලසම්පාදනයට සම්බන්ධ ව්‍යවහාර කෙරෙන "ගෘහ කාර්ය" යන්නට විකිණීම පිණිස හෝ කුලියට දීම පිණිස අශ්වයන් හෝ ගවයන් පෝෂණය හෝ තබාගෙන ඇති විට ඒ අශ්වයන් හෝ ගවයන් සඳහා වූ වතුර හෝ රථවාහන සේදීම සඳහා වූ වතුර හෝ වතුර මලක් සඳහා හෝ රථ ගරාජයක් සඳහා හෝ නැරඹිලි සඳහා හෝ යාන්ත්‍රික කාර්ය සඳහා හෝ වාරිමාර්ග කටයුතු සඳහා හෝ අවැසි ජලය ඇතුළත් නොවේ.

### මූලික කරුණු

2. පොදු ජලකළුවලින් හෝ වතුර මල්වලින් හෝ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වූ ජලාශයකින් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවලින් නියම කර ඇති වෙනත් යම් අන්දමකින් හෝ හැර සභාවේ ජල කර්මාන්තයකින් ජලය ලබා නොගත යුතුය.

### පොදු ජලකළු

3. (1) සභාපතිවරයාගේ ලිඛිත අවසරයක් කලින් ලබාගෙන ඇත්නම් මිස—

(අ) කිසිම තැනැත්තකු විසින් අතින් අල්ලා ගෙන යනු හෝ අතින් උසුලාගෙන යා හැකි භාජනයක් නොවන භාජනයකින් පොදු ජලකළු වලින් ජලය ගෙනයාම නොකළ යුතුය.

(ආ) කිසිම තැනැත්තකු විසින් ජලය අපතේ යාමට ඉඩ දැකිය හැකි අන්දමේ යම් ප්‍රමාණයකින් හෝ ආකාරයකින් පොදු ජලකළු වලින් ජලය ගෙන යාම නොකළ යුතුය.

4. කිසියම් තැනැත්තකු විසින් පොදු ජලකළුවකට යම් හෝස්පයිප්පයක්, නළයක්, කානුවක් හෝ වෙනයම් ජලසැපයුම උපකරණයක් තාවකාලිකව හෝ ස්ථිරව සම්බන්ධ නොකළ යුතුය.

5. යම් පොදු ජලකළුවකට සවිකර ඇති හෝ එහි කොටසක් වන ස්වයංක්‍රීය (ඉබේ වැසෙන) වැල්වයක හෝ වෙනත් ස්වයංක්‍රීය උපකරණයක ක්‍රියාකාරීත්වය තාවකාලිකව හෝ ස්ථිරව වැලැක්වෙන පරිදි ඒ වැල්වයට හෝ උපකරණයට අනුකූල ලෙස බාධාවක් හෝ වෙනත් කිසිවක් යෙදීම පුද්ගලයකු විසින් නොකළ යුතුය.

6. කිසිම පාරිභෝගිකයකු විසින් ගෘහ කාර්යයන් හැරුණුවිට වෙනත් කාර්යයන් සඳහා පොදු ජලකණුවලින් ජලය ලබා ගැනීම නොකළ යුතුය.

7. යම් වසංගත රෝගයකින්, ස්පර්ශක රෝගයකින් හෝ ආසාදන රෝගයකින් පෙළෙන කිසිම පාරිභෝගිකයකු විසින් හෝ එවැනි පාරිභෝගිකයකු විසින් නියම කළ කිසිම පාරිභෝගිකයකු විසින් හෝ යම් පොදු ජලකණුවකින් ජලය ලබා ගැනීම නොකළ යුතුය.

8. කිසිම පාරිභෝගිකයකු විසින් කිසි කාලයක දී ප්‍රාදේශීය සභාව වෙත සැපයීම් ඇති හෝ සභාව විසින් නඩත්තු කරනු ලබන හෝ යම් ජලාශයක, ජල-මූලාශ්‍රය, ජලාශයක, ජල නාලිකාවක, නල පද්ධතියක හෝ වෙනත් ජල කර්මාන්තයක හෝ ඒ සඳහා ප්‍රවාහනය කිරීම හෝ ඉන් ගැටලුවක් යම් කොටසක් මත හෝ යම් ප්‍රජනක හෝ යම් වස්තුවක්, දෙවිලිම්, අපද්‍රව්‍ය හෝ වෙනත් කසළ දැමීම හෝ ඇතුළු කිරීම හෝ නොකළ යුතුය.

පෞද්ගලික ජල සේවාවන් හා සවි කිරීම් පිළිබඳ නියමයන්

9. මෙම උපලේඛනයේ 'ඇ' ආකෘතියේ දැක්වූ පරිදි සභාපතිවරයා වෙත ඉල්ලීමක් කොට සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය පළමුවෙන් ලබාගත්තේ නම් මිස කිසිම පාරිභෝගිකයකු විසින්—

(අ) අලුත් ජල සේවයක් ඉදිකිරීම හෝ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජල නලවලින් හෝ ජලකර්මාන්තවලින් යම් පෞද්ගලික ස්ථානයකට අලුත් සේවා නලයක් දැමීම හෝ එම කාර්ය සඳහා යම් කර්මාන්තයක් ආරම්භ කිරීම;

(ආ) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනලවලට හෝ ජල කර්මාන්තවලට සම්බන්ධ යම් පවත්නා සේවා නලයක් වෙනස් කිරීම, දිගු කිරීම, පිළිසකර කිරීම හෝ අලුත් කිරීම නොකළ යුතුය.

10. 9 වන අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයා විසින් අනුමත කරන ලද යම් කර්මාන්තයක්, සභාපතිවරයාගේ ලිඛිත උපදෙස්වලට අනුකූලව කළ යුතු අතර, සභාපතිවරයා විසින් අනුමත කරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ නිල මුද්‍රාවෙන් මුද්‍රා තබා ඇත්නම් මිස කිසිම සවි කිරීමක් හෝ උපකරණයක් එම කර්මාන්තය සඳහා භාවිතා නොකළ යුතුය.

11. ප්‍රාදේශීය සභාව විසින් සෑම ඉල්ලුම්කරුවකුට දෙනු ලබන සම්බන්ධතාවයේ ප්‍රමාණය තීරණය කළ යුතුය.

12. පෞද්ගලික ජල සේවයක් ඉදිකිරීම සඳහා භාවිතා කරන සියලුම නල ගැල්වනයිස් කළ යකඩවලින් හෝ තඹවලින් හෝ පී.වී.සී. ද්‍රව්‍යයකින් සෑදූ නල විය යුතු අතර, ඒවා සභාපතිවරයා විසින් හෝ ඒ වෙනුවෙන් සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය දුන් නිලධරයකු විසින් අනුමත කරනු ලබන ආකාරයකින් හා තත්ත්වයකින් යුක්ත විය යුතුය.

13. එසේ නියම කර ඇත්නම් මිස ප්‍රාදේශීය සභාව විසින් එක් අද්දරක් වශයෙන් සැපයීම කරනු ලැබ ඇත්නම් මිස යම් ස්ථානයක ජලය සැපයීම සඳහා ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජල නලවලින් හෝ ජල කර්මාන්තවලින් එක් සේවා නලයකට වඩා වැඩි ගණනක් සම්බන්ධ නොකළ යුතුය.

14. යම් ස්ථානයකට සවි කරනු ලබන සියලු ජල කරාම සභාපතිවරයා විසින් අනුමත කරනු ලබන ආකාරයේ සහ ප්‍රමාණයේ ජල කරාම විය යුතුය.

15. ජලය නාස්තිවීමක් පහසුවෙන් පෙනෙන ආකාරයට සෑම ජල කරාමයක ම පෙට්ටිය, විවෘත වූද පහසුවෙන් ළඟා විය හැකි වූද තැනක තිබිය යුතු අතර, එය කවර අවස්ථාවක දී වුවත් කිසිත් ජලයේ ලැබෙන යම් ජල භාජනයක හෝ ටැංකියක හෝ වෙනත් භාජනයක ඉහළම ජල මට්ටමට වඩා පහතින් නොතිබිය යුතුය.

16. ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයට සම්බන්ධ කර ඇති යම් පෞද්ගලික ජල සේවාවක ජල නලවල හෝ ජලකණු හා උපකරණ හා සවි කිරීම් අතර සියලුම සන්ධි ජලය නොවැදීමට තබන්නා තිබිය යුතුය.

17. සෑම නාන භාජනයකම, වැසිකිළි බේසමකම හෝ මූත්‍රාගාර බේසමකම ප්‍රවේශ මුඛය එහි අප මුඛයට වඩා ඉහළින් පිහිටා පෙනෙන සේ සවිකර තිබිය යුතු අතර, එය එම නාන භාජනයේ, වැසිකිළි බේසමේ හෝ මූත්‍රාගාර බේසමේ මුදුනේ සවිකර තිබිය යුතුය.

18. සෑම ජල භාජනයකම ප්‍රවේශ මුඛය හෝ සැපයුම් නලය එම ජල භාජනයේ ඉහළම ජල මට්ටමට ඉහළින් පිහිටන ආකාරයට සවිකර තිබිය යුතුය.

19. මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දිනයේ පටන්—

(අ) ගෘහ කාර්ය සඳහා සපයනු ලබන ජලයෙන් යම් කොටසක් රඳවා තබාගැනීම සඳහා ගැලුම් 1000 වැඩි ධාරිතාවක් ඇති ජල භාජනයක් කිසිම ස්ථානයක සවි නොකළ යුතුය.

(ආ) යම් ස්ථානයක සවි කරන හෝ ඉදිකෙරෙන ජල භාජනයේ ප්‍රමාණය සහ සැලසුම ද එහි ඉදිකෙරෙන හෝ සවි කෙරෙන ජල භාජන ගණන ද සභාපතිවරයා විසින් කලින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, කිසිම ස්ථානයක කිසිම ජල භාජනයක් සවි කිරීම හෝ ඉදිකිරීම නොකළ යුතුය.

20. ජල කර්මාන්තයකින් ජලය සැපයෙන සෑම ජල භාජනයකටම විරාම කරාමයක් ද අනුමත ආකාරයේ පිටාර බට සහිත බෝල වැල්වයක් ද සවිකර තිබිය යුතු අතර, ටැංකියේ ජල මට්ටම ටැංකියේ ගැට්ටට හෝ උතුරා යන මට්ටමට සෙන්ටිමීටර් ... තිබිය දී ජල සැපයුම නවතින ආකාරයට බෝල වැල්වය සකස් කර තිබිය යුතුය.

21. සෑම ජල භාජනයකටම පිටාර නලය නොසැඟවිල්ලේ පිටතින් සවිකර තිබිය යුතු අතර, ජලය නාස්තිවීමක් පහසුවෙන් නොපෙනෙන සේ තබාගැනීම සඳහා එහි කෙළවර නොඇදී පෙනෙන තැනක පවතින සේ තිබිය යුතුය. කිසිම හේතුවක් නිසා කිසිම ජල භාජනයක පිටාර නලය යම් කානුවකට හෝ යම් නාන භාජනයක, මූත්‍රාගාර බේසමක හෝ වෙනත් සනීපාරක්ෂක උපකරණයක අපවහන නලයකට හෝ වෙනත් යම් ජල භාජනයක පිටාර නලයකට හෝ සම්බන්ධ කර නොතිබිය යුතුය. එක් එක් ජල භාජනය වෙන් වෙන් වශයෙන් පිටාර නල සවිකර තිබිය යුතුය.

22. යම් ස්ථානයක සේවා නලය, ජල භාජනය හෝ වෙනත් සේවා සවි කිරීම් වෙනත් යම් ස්ථානයක සේවා නලයකට, ජල භාජනයකට හෝ වෙනත් සේවා සවි කිරීමකට සම්බන්ධ කර නොතිබිය යුතුය.

23. ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් ලිඛිත අනුමතය නොමැතිව, යම් පෞද්ගලික ජල සේවාවක කොටසක් වන කිසිම පයිප්පයක්, යම් විදුලි ජනක යන්ත්‍රයකට හෝ වෙනත් යාන්ත්‍රික උපකරණයකට කෙළින් ම සම්බන්ධ කර නොතිබිය යුතුය.

24. සෑම පෞද්ගලික ජල සේවාවකට ම,—

(අ) පහ පතුලකින් යුක්ත වූද කොන්ක්‍රීට් බිත්තිය, ඉදිකළ ගඩොල් හෝ විකාවීම්වලින් සෑදූ විරාම කාමරයක් සවිකර තිබිය යුතු අතර, එම විරාම කරාමය විකාවීම් වලින් සහා ඇත්නම් ජේනුව ඇස්බැස්ටෝස් වලින් අනුරා තිබිය යුතුය.

(ආ) බෝල වැල්වයක් සහිත අන්තරාල විරාම කරාමයක්,

(ඇ) විෂ්කම්භය සෙන්ටිමීටර් 5 කට වඩා වැඩි නලයකින් ජලය සැපයෙන අවස්ථාවක පෙරාවක් හෝ පෙරහන් කොටුවක් සපයා තිබිය යුතුය.

විරාම කරාමය හෝ කපාටය, එම විදියේ පදික වේදිකාවක් ඇත්නම් පදික වේදිකාවට යටින් ද, සේවා සැපයෙන ස්ථානයට හැකි තරම් ආසන්නව ද සවිකළ යුතු අතර, විරාම කරාමයට හෝ වේදිකාවකදීම පහසුවෙන් ළඟා විය හැකි ආකාරයට විනාවිවිච් වැසුම් පෙට්ටියක් හා පියනක් සපයා තිබිය යුතුය. විරාම කරාමය, කපාටය සහ වැසුම් පෙට්ටිය සභාපතිවරයා විසින් අනුමත කරන ලද වර්ගයක විය යුතුය.

25. සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය ලත් නිලධරයකු විසින් පරීක්ෂා කර ලියවිල්ලක් මගින් අනුමත කරනු ලබන තෙක්, යම් ස්ථානයකට අලුතින් ඉදිකර ඇති සේවාවක කොටසක් වන කිසිම නළ කපාට හෝ වෙනත් සවිකිරීම් වසා නොදැමිය යුතුය.

භූගත සම්බන්ධ කිරීම

26. (1) වෝල්ට් 500ක් හෝ ඊට වැඩි පීඩනයක් ඇති යම් විදුලි ධාරාවක් දරන යම් ට්‍රාන්ස්ෆෝමරයක හෝ වෙනත් විදුලි උපකරණයක ආවරණයේ සිට ජල කර්මාන්තයේ හෝ ජල කර්මාන්තයට සම්බන්ධ වෙනත් පෞද්ගලික සේවාවක කොටසක් වන යම් නලයකට හෝ උපකරණයකට භූගත සම්බන්ධයක් සවි කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(2) (1) වන ඡේදයේ සඳහන් යම් විදුලි ට්‍රාන්ස්ෆෝමරයක හෝ වෙනත් විදුලි උපකරණයක භූ කම්බිය හෝ භූගත සම්බන්ධකයෙහි යම් කොටසක් ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයේ හෝ එම ජල කර්මාන්තයට සම්බන්ධ පෞද්ගලික ජල සේවාවක කොටසක් වන යම් නලයකට හෝ උපකරණයකට යටත් පිරිසෙයින් මීටර් හැටක් ඇතින් පිහිටි විය යුතුය.

27. විදුලි ආලෝක ක්‍රමයකින් විදුලි ධාරාව සපයනු ලබන ඉඩක් විදුලි යන්ත්‍රයකට භූගත සම්බන්ධයක් අවශ්‍ය වන අවස්ථාවකදී එම භූගත සම්බන්ධකය ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයේ හෝ එම ජල කර්මාන්තයට සම්බන්ධ යම් පෞද්ගලික සේවාවක කොටසක් වන යම් නලයකට හෝ උපකරණයකට සෙන්ටි මීටර් හැටකට නොඅඩු දුර ප්‍රමාණයකින් සවි කරනු ලබන භූ කම්බියක් මගින් සාදනු ලැබිය යුතුය.

28. ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයට සම්බන්ධ වූ ජල මානයක් සවිකර ඇති යම් ස්ථානයක භූගත සම්බන්ධකයක් සවි කරන යම් තැනැත්තකු විසින් ඒ සම්බන්ධකය එම මානයෙන් ඈතලන පැත්තේ සවි කළ යුතුය. එසේ නැතහොත් ඒ මානය හරහා විද්‍යුත් පැමිණීමක් ඇතුළු කරනු ලැබිය යුතුය.

පෞද්ගලික සේවාවන් ප්‍රධාන ජල නලවලට සම්බන්ධ කිරීම

29. (1) අලුතින් ඉදිකරනු ලැබූ පෞද්ගලික ජල සේවයක් 25 වන අතුරු ව්‍යවස්ථාය යටතේ පරීක්ෂා කර අනුමත කරන ලැබූ පසු ඉල්ලුම්කරු විසින්—

(අ) සභාපතිවරයා විසින් තක්සේරු කරනු ලබන පරිද් කම්කරුවන්, ද්‍රව්‍ය හා අධීක්ෂණය පිළිබඳ ගාස්තු ඇතුළු ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජල නලවලට හෝ ජල කර්මාන්තයට එම සේවාව සම්බන්ධ කිරීමේ වියදම ;

(ආ) සම්බන්ධකය සහ ජල සැපයීම වෙනුවෙන් මූලික ගාස්තුවක් හෝ අතිරේක ගාස්තුවක් වශයෙන් රුපියල් 25/ක් සභාව වෙත තැන්පත් කළ යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ 1 වන ඡේදයෙන් නියමිත මුදල් ප්‍රමාණ නිසි ලෙස තැන්පත් කරනු ලබන තුරු එම සම්බන්ධ කිරීම සිදු නොකළ යුතුය.

30. (1) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජල නලවල සිට හෝ ජල කර්මාන්තවල සිට ජලය සැපයීමට ඇති යම් පෞද්ගලික ස්ථානයක සවිකර ඇති නලවලට සම්බන්ධකයක් ඇති කිරීම සභාපතිවරයාගෙන් බලය ලත් සභාවේ නිලධරයකුගේ අධීක්ෂණය යටතේ මිස නොකළ යුතුය.

(2) එම ස්ථානයට ජලය සැපයීම එම සම්බන්ධය නිසි ලෙස ඇති කරන ලද වේලාවේ සිට ආරම්භ වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතුය.

31. පෞද්ගලික ජල සේවයක් ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජල නලවලට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කරනු ලැබූ පසු ඒ සම්බන්ධ කිරීමේ පිළිබඳ විස්තරයක් මෙහි උපලේඛනයේ "ආ" ආකෘතියේ ඉදිරිපත් කළ යුතු අතර, ඒ ජල සේවය සම්බන්ධ කිරීමේ වියදම වශයෙන් ඉල්ලුම්කරු විසින් තැන්පත් තක්සේරු කරන ලද මුදලින් වියදම් කොට ඉතිරිව ඇති යම් මුදලක් වේ නම් එය ඉල්ලුම්කරු වෙත ආපසු ගෙවනු ලැබිය යුතුය. ඇස්තමේන්තු වශයෙන් දරන ලද වියදම තක්සේරු කරන ලද වියදමට වැඩි වූවහොත් අනතුරුව ඒ වියදම් පිළිබඳ විස්තරය ලැබුණු විට ඉල්ලුම්කරු විසින් ඒ අතිරික්තය මුදල නොපමාව ම ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

32. ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයෙන් යම් ස්ථානයකට සපයනු ලබන ජලය මැනීම සඳහා වූ සියලුම මානක ප්‍රාදේශීය සභාව විසින් සපයා සවිකළ යුතු අතර, ඒවා ප්‍රාදේශීය සභාවේ දේපළ ලෙස පවතින්නේය.

33. ජලය සපයනු ලබන ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් (කම්කරුවන්, ද්‍රව්‍ය හා අධීක්ෂණය පිළිබඳ ගාස්තු ද ඇතුළුව) මානක සවිකිරීමේ ගාස්තුව කලින් ගෙවිය යුතුය.

34. මානකය මගින් සපයනු ලබන යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු, මානකය නඩත්තු කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ගාස්තුව ගෙවීමට යටත් නොවන්නේය.

එසේ වුවද ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් හිතාමතාම කළ ක්‍රියාවක් හෝ ඔහුගේ නොසැලකිල්ල නිසා හෝ මානකයට සිදුවූ හානියක් හේතුකොට ගෙන යම් අලුත්වැඩියා කිරීමක් හෝ අලුත් කිරීම හෝ අවශ්‍ය වූ විටක ඒ අලුත්වැඩියා කිරීමේ හෝ අලුත් කිරීමේ ගාස්තුව සභාපති විසින් ඉල්ලා සිටිනු ලැබූ විට සභාවට ගෙවීම ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් කළ යුතුය.

35. (1) මානකය පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණ අනුව ගණන් බලනු ලබන ලියැවිලි මානකයක් මගින් ජලය සපයනු ලබන යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් කාර්තුවක් පාසා ප්‍රාදේශීය සභාවට ගෙවීම හෝ ගෙවීමට සැලැස්වීම කළ යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා කාර්තුවක් යන්නෙන්, එක් එක් වර්ෂයක ජනවාරි 1, අප්‍රේල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවල ආරම්භ වන අනුගාමී මාස තුනක කාල පරිච්ඡේද අදහස් වේ.

36. (1) යම් කාර්තුවක් ආරම්භයේ දී හෝ අවසානයේ දී පිළිවෙලින් සටහන් කරන ප්‍රථම මානක කියවීම හා අවසාන මානක කියවීම අතර වෙනස සැලකිල්ලට ගෙන ඒ කාර්තුව තුළ පරිභෝජනය කරන ලද ප්‍රමාණය මෙහි පහත සඳහන් පරිදි ගණන් බැලිය යුතුය.

(2) අලුතින් සවි කරන ලද මානකයක් සම්බන්ධයෙන් වූ විට ප්‍රථම කියවීම ඒ මානකය සවි කරන ලද අවස්ථාව යටතේ සඳහන් කරන ලද කියවීම වන අතර, වෙන යම් අවස්ථාවක පෙරාතුවම වූ කාර්තුව සඳහා වූ අවසාන කියවීම ප්‍රථම කියවීම වන්නේය. යම් කාර්තුවක් සඳහා හෝ අවසාන කියවීම ඒ කාර්තුව අවසාන වීමෙන් දස දිනකට ප්‍රථම හෝ පසුව නැගෙන දිනයක් නොවන යම් දිනක කරන ලද කියවීම වන්නේය.

එසේ වුවද අලුත්වැඩියා කිරීම සඳහා මානකය ඉවත් කොට ලදුව එකී කාලය ඇතුළත දී අවසාන කියවීම සටහන් කරනු ලැබිය නොහැකි වූ අවස්ථාවක ඒ මානකය ඉවත් ගෙන යාමට ප්‍රථම අවසාන කියවීම කරනු ලැබිය යුතුයි.

(3) යම් කාර්තුවක් තුළ යම් ස්ථානයක දී මානක දෙකක් හෝ ඊට වැඩි ගණනක් පාවිච්චි කරන ලද නම්, ඒ ඒ මානකවල සඳහන් වූ ප්‍රමාණවල එකතුව කාර්තුව තුළ පරිභෝජනය කරන ලද ජල ප්‍රමාණය වන්නේය.

37. (1) මාපකයක් ක්‍රියා විරහිතව ඇති බව දැනගත් කල්හි හෝ අපක්ෂපාතීව ක්‍රියා කිරීමට හෝ වෙනස් කිරීමට ඉවත් කරන ලද කල්හි හෝ එම කාලය තුළ කිසියම් මාපකයක් සවි කරන ලද කල්හි හෝ නැවත සවිකරන ලද කල්හි ඒ බවට සටහනක් ඒ මාපකයෙන් ජලය සපයනු ලබන ස්ථානයේ තබනු ලැබිය යුතුය.

(2) මාපකය ක්‍රියා විරහිත වී ඇති අවස්ථාවක හෝ අපක්ෂපාතීව ක්‍රියා කිරීමට නොහැකි වෙනත් යම් හේතුවක් නිසා එය ඒ ස්ථානයෙන් ඉවත් කර ඇති අවස්ථාවක හෝ මාපකය ක්‍රියා විරහිත වී තිබුණු හෝ මාපකයක් රහිතව ජලය සපයන ලද හෝ කාලය තුළ පරිභෝජනය කරන ලද ජල ප්‍රමාණය, 28 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන තුළින් වූවත් ඒ කාලයට පෙරාතුව වූ කාර්තුව තුළ සාමාන්‍යයෙන් දිනකට පරිභෝජනය කරන ලද ජලයෙහි සාමාන්‍ය ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබිය යුතුය.

38. (1) යම් ස්ථානයක පදිංචිකරුවකු තම ස්ථානයෙහි ඇති මාපකයේ නිවැරදිභාවය ගැන ප්‍රශ්න කරයි නම් ඒ පදිංචිකරුගේ ඉල්ලීම පිට මණ්ඩලය විසින් රැඳියල් විසිපහක්වූ පරීක්ෂණ ගාස්තුවක් කලින් ගෙවන ලද කල්හි ඒ පදිංචිකරු ඉදිරියෙහි හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් තැනැත්තකු ඉදිරියේදී සභාපතිවරයා විසින් ඒ මාපකය පරීක්ෂා කරනු ලැබීමට සැළැස්විය යුතුය. ඒ පරීක්ෂණයෙහි ප්‍රතිඵලය සභාපතිවරයා කෙරෙහි හා පදිංචිකරු කෙරෙහි අනුගමනවිය යුතු අතර, 35 (2) වන අතුරු ව්‍යවස්ථාවෙහි අර්ථ නිරූපනය කරන ලද පරිදි ඒ කාර්තුව සඳහා මාපකයෙහි සඳහන් ජල ප්‍රමාණය පරීක්ෂණයෙහි ප්‍රතිඵලය අනුව නිවැරදි කරනු ලැබිය යුතුය.

(2) මාපකයේ සඳහන් ජල ප්‍රමාණය නිවැරදි වන හෝ නියම විශයෙන්, සපයන ලද ජල ප්‍රමාණයෙන් සියයට දෙකකට නොවැඩි ප්‍රතිශතයකින් වෙනස් වන හෝ අවස්ථාවක (1) වන ඡේදය යටතේ කලින් ගෙවන ලද පරීක්ෂණ ගාස්තුව සභාපතිවරයා විසින් තබාගත යුතුය.

(3) මාපකයේ සඳහන් ජල ප්‍රමාණය නියම වශයෙන් සපයද ලද ප්‍රමාණයෙන් සියයට දෙකකට වැඩිවන ප්‍රතිශතයකින් වෙනස් වන අවස්ථාවක (1) වන ඡේදය යටතේ කලින් ගෙවන ලද පරීක්ෂණ ගාස්තුව අයිතිකරු හෝ පදිංචිකරුවෙන ආපසු ගෙවනු ලැබිය යුතුය.

39. (1) සභාපතිවරයා විසින් නියම කරනු ලබන කාලවලදීද කාර්තුවකට නොඅඩු වාර ගණනක් ද මාපකය කියවිය යුතුය.

(2) මාපකයක් කියවන ලද සෑම අවස්ථාවක දීමද පදිංචිකරු අමතන ලද ඒ කියවීම පිළිබඳ සටහනක් ඒ මාපකය මඟින් ජලය සපයනු ලබන ස්ථානයෙහි තබනු ලැබිය යුතුය.

## ජලය සැපයීමේ ගාස්තු

40. (1) ගෘහ කාර්ය සඳහා ජලය සැපයීම ප්‍රාදේශීය සභාවේ අභිමතය පරිදි මාපකයක් මඟින් වෙනත් ආකාරයකින් කළ හැකි වන අතර, ඒ සඳහා වූ ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මඟින් කලින් කල නියම කරනු ලබන අනුපාතිකය අනුව විය යුතුය.

(2) ගෘහ කාර්යය හැර වෙනත් කාර්ය සඳහා ජලය සැපයීම ප්‍රාදේශීය සභාවේ අභිමතය පරිදි මාපකයක් මඟින් හෝ වෙනත් ආකාරයකින් කළ හැකි [illegible]

(3) සභාවේ ජල කර්මාන්ත මඟින් ජලය සපයා ඇති සෑම හෝ ස්ථානයකට සෑම හෝ අවස්ථාවක සභාව විසින් මාපකයක් සවි කළ හැකි [illegible]

41. (1) ගෘහ කාර්ය හැර වෙනත් කාර්ය සඳහා මාපකයක් මඟින් ජලය සපයා ඇති අවස්ථාවක සපයන ලද සෑම ගැලුම් ද සඳහාම රුපියල් මැනීම අනුපාතිකයට ගාස්තු ගණන් බැලිය යුතුය.

(2) ගෘහ කාර්ය හැර වෙනත් කාර්ය සඳහා මාපකයක් මඟින් හැර වෙනත් ආකාරයකට ජලය සපයා ඇති අවස්ථාවක කලින් කල සභාව විසින් යෝජනා සම්මතයක් මඟින් නියම කරනු ලබන ගාස්තු එක් එක් පෞද්ගලික සේවාව වෙනුවෙන් මාසිකව ප්‍රාදේශීය සභාව වෙත කලින් ගෙවිය යුතුය.

42. 41 වන අතුරු ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ විධිවිධාන සලස්වනු ලැබ ඇති අවස්ථාවල දී හැර, පෞද්ගලික ජල සැපයුමකින් ලබාගත් ජලය ගෘහ කාර්ය හැර වෙනත් කාර්ය සඳහා භාවිතා කිරීම සැපයුමෙන් ජලය ලබා ගන්නා තැනැත්තා මෙහි උපලේඛනයේ දැක්වෙන 'අ' ආකෘතියේ ගිවිසුමක් ඇතුළත්ව ඇත්නම් මිස, නොකළ යුතුය.

එසේ වූවද්දකු කී ගිවිසුම අනුව වූ ජල සැපයුම නිසා වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෘහ කාර්ය සඳහා වූ ජල සැපයුමට බාධා ඇතිවේ නම් හෝ බාධා ඇතිවීමට ඉඩ ඇත්නම්, එම ගිවිසුම නොතකා දෙවැනි හෝ දෙන්වන කෙටි ලියවිල්ලක් යටතේ නොවිද සභාව විසින් එකී තැනැත්තාට සපයන ජලය නතර කිරීම, අත්හිටුවීම හෝ අඩු කිරීම කළ හැකිය.

43. යම් පෞද්ගලික ස්ථානයකට සපයන ජලය සඳහා වූ ගාස්තු මෙහි උපලේඛනයේ දැක්වෙන 'ඇ' ආකෘතියේ වූ බිල්පතක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු දින පසළොස්ක් ඇතුළත සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ඒ වෙනුවෙන් බලය දෙන ලද සභාවේ නිලධාරියකුට එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගෙවිය යුතුය.

## ගාස්තු වැළැක්වීම

44. (1) ප්‍රභාවේ ජල කර්මාන්තවලට සම්බන්ධ නොවූ යම් ස්ථානයක ඇති පෞද්ගලික ජල සේවයක නොවෙනස් වන යම් කාලයක කරාමයක් වැල්ලයක මාපකයක හෝ වෙනත් සවි කිරීමක පිළිවෙල ප්‍රමාණය විකිරීම ස්වභාවිය හෝ තත්ත්වය හේතු කොටගෙන ජල කර්මාන්තයෙන් පොදු හෝ පෞද්ගලික පාවිච්චිය සඳහා සපයනු ලබන ජලය අපතේ යෑමට අයුතු ලෙස පාවිච්චි කිරීමට අයුතු ලෙස පරිභෝජනය කිරීමට හෝ අපවිත්‍ර කිරීමට ඇතැයි හෝ ජල කර්මාන්තයේ ජලය නිසි ලෙස සපයා කිරීමට හා බෙදා හැරීමට බාධා ඇති වීමට ඉඩ ඇතැයි හෝ විශ්වාස කිරීමට සභාපතිවරයාට හේතු ඇති අවස්ථාවක, මෙහි උපලේඛනයේ 'ඉ' ආකෘතියේ දැක්වෙන ආකෘතියේ වූ දැන්වීමක් එම ස්ථානයේ අයිතිකරු වෙත භාර දෙනු ලැබිය යුතුය.

(2) එවැනි සෑම දැන්වීමක ම අවශ්‍ය යයි සභාපතිවරයා විසින් සලකනු ලබන වෙනස් කිරීම නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර, දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක් ඇතුළත අයිතිකරු විසින් එම වෙනස් කිරීම සභාපතිවරයා සෑහීමට පත්වන ආකාරයට සිදු [illegible] යුතුය.

(3) අයිතිකරුගේ නම හෝ ඔහු පදිංචි ස්ථානය දැන ගැනීමට නොහැකි අවස්ථාවක එම දැන්වීම අදාළ වන ස්ථානයේ හොඳින් පෙනෙන තැනක අලවනු ලැබූව හොත් එය අයිතිකරු වෙත නිසි ලෙස භාරදුන් ලෙස සලකනු ලැබිය යුතුය.

45. යම් ස්ථානයකට සපයන ජලය නතර කිරීම, අත්හිටුවීම, අඩු කිරීම හෝ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනලවලින් හෝ ජල කර්මාන්තයෙන් එම ස්ථානයට ජලය සපයන නලය විසන්ධි කිරීම පහත සඳහන් අවස්ථාවලදී සභාපතිවරයා විසින් සිදුකළ හැකිය:

(අ) එම ස්ථානයේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ ඉල්ලීම පිට;

(ආ) එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ගෙවිය යුතු මුදල් ගෙවා නැති විට;

(ඇ) එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම සේවය වැඩි දියුණු කිරීම හෝ නලය දැමීම හෝ වෙනස් කිරීම මේ අතුරු ව්‍යවස්ථා විධිවිධානවලට අනුකූලව සිදුකර නැති විට;

(ඈ) ජල කර්මාන්තයට අලාභ කිරීම, ජලය අපවිත්‍ර කිරීමට නාස්ති කිරීමට හෝ අයුතු ලෙස පාවිච්චි කිරීමට අදාළ මේ අතුරු ව්‍යවස්ථා විධිවිධානවලට පටහැනිව එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් යම් ක්‍රියාවක් හෝ දෙයක් කර ඇති හෝ නොකර තැබූ [illegible] ඇති අවස්ථාවක.

46. ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයේ පෞද්ගලික ජල සේවයක් සපයනු ලැබ ඇති ස්ථානයක පදිංචිකරු විසින් ඒ සේවයෙහි කොටසක් වන යම් කරාමයකින් නළයකින්, මානයකින් හෝ වෙනත් යම් සවි කිරීමකින් ජලය අපතේ යාමක් සිදුවන කවර විටක වුවද ඒ බව වහාම සභාපතිවරයාට දැනුම් දිය යුතුය.

47. පෞද්ගලික ජල සේවයක කොටසක් වන යම් කරාමයකින් නළයකින් මානයකින් හෝ වෙනත් යම් සවි කිරීමකින් ජලය අපතේ යන බව දැනගත් කවර විටක වුවද සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් යථා පරිදි බලය දෙන ලද යම් නිලධාරියකු විසින් ප්‍රාදේශීය ජල කර්මාන්තයෙන් ඒ සේවය වහාම විසන්ධි කළ යුතු අතර එලෙස අපතේ යාමට හේතුවූ වරද ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් නිවැරදි කරනු ලබන තුරු ඒ සේවය නැවතත් සම්බන්ධ කරනු නොලැබිය යුතුය.

48. 45 වන අනුව්‍යවස්ථාවේ දක්වා ඇති යම් හේතුවක් මත විසන්ධි කරන ලද යම් පෞද්ගලික සේවා නළයක් නැවත ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජල නළවලට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කිරීමේ වියදම වශයෙන් සභාපතිවරයා විසින් ඇස්තමේන්තු කරනු ලබන මුදල් ප්‍රමාණය, එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ප්‍රාදේශීය සභාවට කලින් ගෙවිය යුතුය. එම වැඩය සම්පූර්ණ වූ පසු වියදම් ගෙවූ පසු ශේෂයක් වේ නම් එය අයිතිකරුට හෝ පදිංචිකරුට ආපසු ගෙවිය යුතුය. ඇත්ත වශයෙන් සිදු වූ වියදම ඇස්තමේන්තු කළ වියදමට වඩා වැඩි වුවහොත් වැඩය සම්පූර්ණ කළ විගස ම එම අතිරික්තය අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගෙවිය යුතුය.

සාමාන්‍ය විධිවිධාන

49. මේ අනුව්‍යවස්ථා සාමාන්‍ය විධිවිධාන යටතේ අය විමට ඇති හෝ පසුවට අයවීමට ඇති යම් ජල බද්දක් මාසික කුලියක් හෝ වෙනත් මුදල් ප්‍රමාණයක් අයකර ගැනීමට හානියක් නොමැතිව, සම්පූර්ණයෙන් හෝ කොටසක් ජල කර්මාන්තයට සම්බන්ධ කර ඇති යම් ප්‍රධාන ජල නළයක පොදු විදුරු මලක, සේවා නළයක හෝ වෙනත් උපකරණයක මාර්ගයෙන් ජල සම්පාදනය නතර කිරීම, අත්හිටුවීම, අඩු කිරීම හෝ දැමීම හෝ වෙනස්කර නැවැත්වීම සඳහා සිදුවීම ඇතිවීමට ඉඩ ඇති බවට සභාපතිවරයා සෑහීමට පත්වන කවර අවස්ථාවක දී වුවද සභාපතිවරයා විසින් කළ හැකිය. එම කාරණා නම්:

(අ) ජල කර්මාන්තයේ ඇති ජලය ප්‍රමාණවත් නොවන බව හෝ,

(ආ) ප්‍රධාන ජල නළයකට ජල කර්මාන්තය දීර්ඝ කිරීමේ, වෙනස් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා හෝ සේවා නළ ප්‍රධාන නළවලට සම්බන්ධ කිරීමේ කාර්යය සඳහා එවැනි ක්‍රියාවක් අවශ්‍යානුකූල බව හෝ අවශ්‍ය බව හෝ,

(ඇ) කිසියම් පොදු ජල නාලිකාවට වූ යම් හානියක් හෝ වැඩි ජලය අපවිත්‍රවීම හෝ අපතේ යාම හේතු කොටගෙන එවැනි ක්‍රියාවක් අවශ්‍යානුකූල බව හෝ අවශ්‍ය බව හෝ,

(ඈ) ගින්නක් ඇතිවීමේ දී ජල කර්මාන්තයට හානියක් සිදුවූ බව හෝ සිදුවීමට ඉඩ ඇති බව.

50. එක් එක් පෞද්ගලික සේවාවේ විරාම කරාමය හෝ වැල්වය ද විරාම කරාමය හෝ වැල්වයත් සහ ප්‍රධාන ජලනළය අතර සේවා නළයේ කොටසද ප්‍රාදේශීය සභාවේ දේපළ වශයෙන් සැලකිය යුතු අතර, එම කොටස නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ අලුත් කිරීම පිළිබඳ වියදම ප්‍රාදේශීය සභාව විසින් දැරිය යුතුය.

51. 25 වන අනුව්‍යවස්ථාව යටතේ යම් පෞද්ගලික සේවා නළයක් හෝ සවිකිරීම අනුමත කිරීම හෝ පෞද්ගලික සේවා ජල නළය සම්බන්ධ කරනු ලබන ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට මේ අනුව්‍යවස්ථාවල යම් කොටසක් යටතේ යම් අවසරයක් හෝ පහසුකමක් දීම නිසා නළයේ යම් කොටසක් පුපුරා යෑම හෝ නල සවිකිරීම්වල යම් කොටසකින් ජලය උතුරා යෑම හේතු කොටගෙන සිදුවූ යම් අලාභයක් පිළිබඳව වගකීම ප්‍රාදේශීය සභාවට පැවරෙන බව කිසිම කාර්යයක් සඳහා නොසැලකිය යුතුය.

52. ජලය සැපයීමට නොහැකිවීම අසාමාන්‍ය නියඟය හෝ යම් කර්මාන්තයක් කිරීම නිසා ජල සැපයුමට ඇතිවන තාවකාලික බාධා හෝ යම් නොවැළැක්විය හැකි හේතුවක් හෝ අනතුරක් නිසා සිදු වුවක් නම් ජලය සැපයීම කරනු ලබන්නේ කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් හෝ වෙනත් ආකාරයකින් වුව ද එසේ ජලය සැපයීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් අලාභ ගෙවීමට ප්‍රාදේශීය සභාව යටත් නොවිය යුතුය.

53. (1) ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා යම් ස්ථානයකට ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයෙන් දී ඇති තාවකාලික සම්බන්ධ කිරීමක් මගින් ජලය සපයනු ලබන අවස්ථාවක ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි ඉදිකරනු ලැබූ විට, ඒ සැපයීම නතර කරනු ලැබිය යුතුය.

(2) (1) වන ඡේදයේ සඳහන් කාර්යය සඳහා සපයන ලද ජලය සඳහා වූ ගාස්තු 41 වන අනුව්‍යවස්ථාවෙහි ගෘහ කාර්යයන් නොවන කාර්යයන් සඳහා නියමිත ප්‍රමාණයක් අනුව විය යුතුය.

54. මේ අනුව්‍යවස්ථා යටතේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු සියලුම මුදල් සභාපතිවරයාට හෝ ඒ කාර්යය සඳහා සභාපතිවරයාගෙන් ලියවිල්ලකින් බලයලත් නිලධරයකුට ගෙවනු ලැබිය යුතුය.

55. මේ අනුව්‍යවස්ථා සම්බන්ධයෙන් කෙරෙන සෑම කඩ කිරීමකටම රුපියල් හත්සිය පණහකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, නොකඩවා සිදු කරගෙන යන වරදක් සම්බන්ධයෙන් වූ විට, වරදකරු කරනු ලැබීමෙන් හෝ එම කඩ කිරීමට අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධරයකුගෙන් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු එම වරද දිගටම සිදු කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පණහකට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

ප්‍රාදේශීය සභාව

ජල කර්මාන්ත දෙපාර්තමේන්තුව

'අ' ආකෘතිය

(9 වන අනුව්‍යවස්ථාව)

අංකය :———

———ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතය,

මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකාරට—

———කොට්ඨාශයේ

———වීදියේ

අංක———දරන නිවසේ

පෞද්ගලික ජල සේවා

* ඉදිකිරීම
* වෙනස්කිරීම

* දීර්ඝ කිරීම
* පිරිසිදු කිරීම

සඳහා ඔබගේ ලිඛිත අනුමතය මම මෙයින් ඉල්ලා සිටිමි.

කුලී නිවාසියකු පදිංචි නම් වාර්ෂික කුලිය රු.

අයිතිකරු පදිංචි නම් වාර්ෂික වටිනාකම රු.

පවතින සේවාවේ ප්‍රමාණය :........................

ජලය අවශ්‍ය වන්නේ ගෘහ කාර්යය සඳහා ද නැතහොත් වෙනත් කාර්යය සඳහා ද යන බව :............

ස්ථානය භාවිත කෙරෙන්නේ කුමන කාර්යයක් සඳහා ද යන බව :———.

තැන්පත් කළ මුදල :———.

උපලේඛනය

| පෞද්ගලික ස්ථානයේ නළ | | කරාම | | ජල මාපක | | |
|---|---|---|---|---|---|---|
| දිග | ප්‍රමාණය | ගණන | පිහිටීම | ප්‍රමාණය | ධාරිතාවය | පිහිටීම |

වෙනත් කරුණු —

කරුණාකර පැහැදිලිව ලියන්න.

* අයිතිකරුගේ අත්සන:———.
* අයිතිකරුගේ නම :———.
* අයිතිකරුගේ ලිපිනය :———.
* පදිංචිකරුගේ අත්සන :———.
* පදිංචිකරුගේ නම :———.
* අනවශ්‍ය කොටස් කපා හරින්න.

කාර්යාලය විසින් පිරවීම සඳහාය.

අනුමත කරන ලදී.

..............................

ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා.

මුදල බැර කළ දිනය :———.

ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවට යොමු කළ දිනය :———.

වැඩය නිම කිරීමේ වාර්තාව :———.

කරාමවල පිහිටීම දක්වමින් ස්ථානයේ නළ පද්ධති සැලැස්මක් මෙහි පහත ඇතුළත් කරන්න :—

සටහන :

(1) ජල සම්පාදනය සඳහා කරනු ලබන සියළුම ඉල්ලීම් ඉදිරිපත් කළ යුත්තේ කාර්යාලීය 'අ' ආකෘති පත්‍රයෙනි.

(2) ජල සම්පාදනය සඳහා කරනු ලබන සියළුම ඉල්ලීම් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ යුතුය.

(3) පෞද්ගලික ජල සේවයකට ඉඩ දෙන ලද විටෙක ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන නළය හෝ අතිරේක ප්‍රධාන නළය හා ජලය සැපයිය යුතු ස්ථානය සම්බන්ධ කිරීම, සභාපති විසින් ලබා දෙනු ලැබූ ප්‍රාදේශීය සභාවේ නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ කළ යුතුය.

(4) පෞද්ගලික ජල සේවයක් සඳහා රු. 25 ක ගාස්තුවක් අය කරනු ලැබේ.

(5) සේවා නළ සහ සවි කිරීම් යෙදීම හා සවිකිරීම සභාපතිවරයා විසින් යථා පරිදි බලය දෙනු ලැබූ නළ කාර්මිකයන් විසින් පමණක් කළ යුතුය. තවද සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධාරියකු විසින් අනුමත කරනු ලබන තෙක් එකී නළ හා සම්බන්ධ කිරීම ද පාවිච්චි කරනු නොලැබිය යුතුය.

(6) ගෘහස්ථ නොවන කාර්යයන් සඳහා සපයනු ලබන ජලය වෙනුවෙන් මාපකයක් මගින් ගාස්තු අය කරනු ලැබේ. මාපකයක් සවිකර නොමැති අවස්ථාවල දී ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රමාණ අනුව ගාස්තු අය කරනු ලැබේ.

(7) පෞද්ගලික ජල සේවයක් ඉදිකරන ලද නිවසක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එහි පදිංචිකරු වෙනස් වීමට ආසන්න නම් කවර අවස්ථාවක වුව ද ඒ බව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට දැනුම් දිය යුතුය.

(8) පෞද්ගලික ජල සේවයක් සපයන ලද නිවසක හෝ ස්ථානයක පිහිටි යම් කරාමයකින්, මාපකයකින්, නළයකින් හෝ වෙනත් සවි කිරීමකින් ජලය අපතේ යන බවක් දැනගත් විගස ඒ බව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත දැනුම් දීම ඒ නිවසෙහි හෝ ස්ථානයෙහි සෑම අයිතිකරුවකුගේ ම හෝ පදිංචිකරුවකුගේම යුතුකම වන්නේය.

ඉල්ලුම්කරු.

"ඊ" ආකෘතිය

(31 වන අතුරු ව්‍යවස්ථාව)

ප්‍රාදේශීය සභා කාර්යාලය
198 ..................

අංකය : ..........................

ප්‍රාදේශීය සභාවේ බිල්පත

| දිනය | විස්තරය | රු. ශ. |
|---|---|---|
| | ———, විදියේ අංක ———, දරන ස්ථානයට සේවාව සැපයීම හෝ මාංශ ය පරීක්ෂණ සඳහා වූව<br>ඉහත කාර්යය සඳහා මුළු හා අධීක්ෂණය<br>ප්‍රධාන නළයට සම්බන්ධ කිරීමේ ගාස්තුව | ——— |
| | එකතුව<br>හැන්දෙන් කළ මුදල<br>ගෙවිය යුතු ශේෂය | ——— |

ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා

ප්‍රාදේශීය සභාව

"ඇ" ආකෘතිය

(42 වන අතුරු ව්‍යවස්ථාව)

1. එක් පාර්ශ්වයක් ලෙස (මෙහි මින්මතු 'අයිතිකරු' වශයෙන් සඳහන් කරනු ලබන) ——— හිමි විදියේ අංක ——— දරන ස්ථානයේ අයිතිකරු සහ අනික් පාර්ශ්වය ලෙස ——— ප්‍රාදේශීය සභාව ද අතර ගෘහස්ථ නොවන කාර්යයන් සඳහා මාපකයක් මගින් ජලය සැපයුම් කිරීම සම්බන්ධව ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

2. ගෘහස්ථ නොවන කාර්යයන් සඳහා ඉහත කී ස්ථානයට ජල සේවයක් ලබාදීම සඳහා ප්‍රතිෂ්ඨාව, එනම් :—

(අ) ———.
(ආ) ———.
(ඇ) ———.

මෙහි මින්මතු දක්වා ඇති කොන්දේසි වලින් බැඳී සිටීමට අයිතිකරු මෙයින් එකඟ වෙයි.

(අ) අගල් ———. මාපකයක් මගින් ජලය සැපයිය යුතුය.

(ආ) අයිතිකරු විසින් මාපකයේ කුලී වශයෙන් රු. ——— ක (රු. ———) මුදලක් එක් කාර්තුවකට කලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවිය හෝ ගෙවීමට සැලැස්විය යුතුය.

(ඇ) එක් එක් මාසයක දී සපයන ලද ජල ප්‍රමාණය මීටරයෙන් කියවූ අනුව රු. ———. (රු. ———.) බැගින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවිය හෝ ගෙවීමට සැලැස්විය යුතුය. ගෙවිය යුතු ———. ගෙවිය යුතු දින කල යුතුය.

3. මාපකය සඳහා හෝ ජලය සඳහා වූ ගාස්තු නියමිත දිනයෙන් දින 15 ක් ඇතුළත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවනු නොලැබුවහොත් සේවාව සාවිච්ඡ කිරීමේ අයිතිය ඇතිවන අතර, ප්‍රාදේශීය සභාව විසින් ඩෙක කළ හැකිය.

4. දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක් විසින් වුවද ගිවිසුම අවසන් කිරීමට තමා අදහස් කරන බව දන්වන දින 30 ක දැන්වීමක් අනෙක් පාර්ශ්වයට දීමෙන් ගිවිසුම අවසන් කළ හැකිය. එය එසේ අවසන් කරනු ලැබූ විට අනෙක් ගිවිසුමකට එළඹෙන තුරු ස්ථානයේ අයිතිකරුට සේවාව සාවිච්ඡේදයට ලැබීම සඳහා අයිතිවාසිකම් නොමැත්තේය.

5. පරිභෝජනය කෙරෙන්නට ආසන්න කවර අවස්ථාවක වුව ද අයිතිකරු විසින් නිසි ලෙස දැන්වීමක් කළ යුතු අතර, ඉහත සඳහන් කොන්දේසි පිළිපැදීමට ලියවිල්ලක් මගින් එකඟ වන තෙක් කිසිම සැපයීමකට සේවාව සැපයීම කිරීමට හිමිකම් නොලැබේ.

———. ක්වූ ———. මස ———. වන දින දී අත්සන් කරන ලදී.

———.
අයිතිකරු.

———.
ප්‍රාදේශීය සභාවේ සභාපති.

අත්සනට සාක්ෂි :
1.
2.

'ඈ' ආකෘතිය

(43 වන අතුරු ව්‍යවස්ථාව)

අංකය : ———

———. ප්‍රාදේශීය සභා කාර්යාලය,
198———.

———. දිනයෙන් අවසන් වන කාර්තුව සඳහා ———. විදියේ අංක ———. දරන ස්ථානයට සපයන ලද ජලය සඳහා ප්‍රාදේශීය සභාව සමග බිල්පත.

| ගොවි අංකය | ජල ගිණුම | රු. ශ. |
| --- | --- | --- |

———— දින කියවීම.
———— දින කියවීම.
පැලුම් දාසේ ———— කාලයේ පාවිච්චි
කරන ලද ජලය ————
කෘෂිකර්ම නොවන කාර්යයන් සඳහා සපයන
ලද්දා මිළ මානයක් මඟින් මනින
නොලැබී ද ජලය ————.

ගෙවිය යුතු මුදල :

සැ.යු.— ඉහත කී දිනයෙන් දින පහළොවක් ඇතුළත ඉහත කී මුදල ගෙවන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

'ඉ' ආකෘතිය
(44 වන නියෝග වගන්තිය).

දෝෂ සහිත සේවය වෙනස් කිරීම සඳහා වූ දැන්වීම

ප්‍රාදේශීය සභා කාර්යාලය,
198..................

———— විදියේ අංක ———— දරන නිවසේ
අයිතිකරු හෝ පදිංචිකරු වෙතය.

ඉහත සඳහන් ස්ථානයේ ජල සේවය පරීක්ෂා කිරීමේ දී එහි පහත දක්වෙන දෝෂ ඇති බව පෙනී ගියෙන්, අවශ්‍ය බවට මා විසින් සෑහීමට පත් වෙන පහත දක්වෙන වෙනස් කිරීම් හෝ අලුත්වැඩියා කිරීම් සිදු කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ;

මේ දැන්වීම ලැබී දින ........... ඇතුළත මා සෑහීමට පත්වන පරිදි එකී වෙනස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සිදු කිරීමට පැහැර හරිනු ලැබුවහොත් සේවය ජල කර්මාන්තයෙන් විසන්ධි කරනු ලබන අතර, එය මා සෑහීමට පත්වන පරිදි අලුත් කිරීම, වෙනස් කිරීම සහ අලුත්වැඩියා කිරීම සිදු කරන තෙක් එය නැවත සම්බන්ධ කරනු නොලැබේ.

...................
සභාපති.

වෙනස් කිරීම සහ/හෝ අලුත්වැඩියාව.

........... ප්‍රාදේශීය සභාව.

## 55 — ළිං සෑදීම

1. මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ කල් තැබීමට ලිඛිත අවසරයක් ලබා නොගෙන ඇත්නම් මිස කිසිම තැනැත්තකු විසින් සභාවේ පරිපාලන සීමාව ඇතුළත ළිඳක් කැණීම හෝ ළිඳක් කැණීමට සැලැස්වීම නොකළ යුතුය.

2. (1) යම් ළිඳක සැලැස්ම සහ පිරිවිතර, සභාපතිවරයා විසින් අනුමත කර ඇත්නම් මිස, හෝ එසේ අනුමත කරන ලද සැලැස්ම සහ පිරිවිතරවලට අනුකූලව නොවන වෙනස් ආකාරයකින්, කිසිම තැනැත්තකු විසින්, පානය හෝ වෙනත් ගෘහස්ථ කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස හෝ වාණිජ්‍යමය ජලය විකිණීම හෝ සැපයීම පිණිස හෝ යම් ළිඳක් කැණීම හෝ යම් ළිඳක් කැණීමට සැලැස්වීම නොකළ යුතුය.

(2) යම් වැසිකිළි වළක, කුණුදිය වළක, දිය බස්නා වළක, ගව ගොටුවක, ගව මඩුවක, වළ වැසිකිළියක, හෝ පලුදු වූ නාලිකාවක් ඉදි නොකළ කාණුවක හෝ එවැනි කිසිවක කාර්යය සඳහා සෑම දිශාවකටම අවම වශයෙන් මීටර් 30.5ක දුර ප්‍රමාණයක් ඇතුළත කිසිම ළිඳක් ඉදිකිරීම සඳහා යම් සැලැස්මක් අනුමත කිරීම හෝ අවසර දීම හෝ නොකළ යුතුය. එසේ වුවද යම් කාරණයකට අදාළ විශේෂ අවස්ථාවක කාලගුණ අනුව සහ පරිසර, ජල මට්ටම හෝ වෙනත් යම් කාරණා සැලකිල්ලට ගෙන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ උපදෙස් මත, ඊට වඩා අඩු දුර ප්‍රමාණයක් සඳහා, සභාපතිවරයා විසින් අනුමතය දෙනු ලැබිය හැකිය.

3. පානය සඳහා හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා හෝ ජලය සැපයීම පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් ළිඳක සිට මීටර් 30.5ක දුර ප්‍රමාණයක් ඇතුළත යම් ස්ථානයක, කිසිම තැනැත්තකු විසින් —

(අ) කිසිම වැසිකිළි වළක්, කුණු දිය වළක්, දිය බස්නා වළක්, වළ වැසිකිළියක්, ගාලක්, ගව මඩුවක් හෝ ඉදිනොකළ කාණුවක් කැපීම හෝ කැණීමට සැලැස්වීම අවසර දීම ; හෝ

(ආ) (ගොම හෝ කොම්පෝස්ට්) පොහොර කිසිවක් හෝ දිරාපත්වන සත්ව හෝ ශාක කොටස් කිසිවක් තැන්පත් කිරීම හෝ තැන්පත් කිරීමට සැලැස්වීම හෝ අවසර දීම ; හෝ

(ඇ) සෞඛ්‍යයට යටත් පිරිසෙයින් එක් වරක්වත් ඉවත් කරනු නොලබන අප ද්‍රව්‍ය කිසිවක් එකතු වීමට සැලැස්වීම හෝ එකතුවීමට ඉඩදීම ; හෝ

(ඈ) කිසියම් කාණුවක් පලුදු වූ තත්ත්වයෙන් තිබෙන්නට ඉඩ හැරීම ; හෝ
නොකළ යුතුය.

4. පානය පිණිස හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා ජලය සැපයීමට ප්‍රයෝජන ගන්නා ළිඳක් පිහිටා ඇති ඉඩමක අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු විසින්, සෑම විටම—

(අ) කවර හෝ දුරක සිට ළිඳට මතුපිට ජලය එක රැස්වී ගලා ඒම ;

(ආ) ළිඳේ පැවිටේ සිට මීටර් 4.5 කට අඩු දුරක සිට මතුපිට ජලය ළිඳට කාන්දු වීම ;

(ඇ) ළිඳට යාබද පිහිටි බිමේ, බිම මට්ටමේ සිට මීටර් 3.0 කට වඩා අඩු ගැඹුරකින් යටි බිම ජලය ළිඳට කාන්දු වීම ;
පිණිස අවශ්‍ය විය හැකි තත්ත්වයකින් සහ අලුත්වැඩියාවෙන් යුතුව තබාගත යුතුව , තවද,

(2) ළිඳේ මීටර් 30.5 ක් දුරකින් ඇතුළත, එම ඉඩමේ ඇති සෑම කාණුවක්ම පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් ද හොඳ අලුත්වැඩියාවෙන් යුතුව ද තබා ගත යුතුය.

5. පානය පිණිස හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා ජලය සැපයීමට ප්‍රයෝජන ගන්නා ළිඳකින් ජලය ඇදීමට, කිසිම තැනැත්තකු විසින්, කිසිම අපිරිසිදු භාජනයක් පාවිච්චි නොකළ යුතුය.

6. මහජනයාට ජලය සැපයීම පිණිස ප්‍රයෝජනයට ගන්නා ළිඳක සිට මීටර් 4.5 ක දුරක් ඇතුළත, කිසිම තැනැත්තකු විසින් රෙදි සේදීම නොකළ යුතුය.

7. පානය හෝ ගෘහස්ථ කාර්ය සඳහා ජලය ප්‍රයෝජනයට ගන්නා ළිඳක් ඉසීම, ශුද්ධ කර විශෝධනය කිරීම හා අලුත්වැඩියා කිරීම අවශ්‍ය බව සභාපතිවරයා සලකන කවර හෝ අවස්ථාවක, එවැනි ළිඳක් පිහිටා ඇති යම් ඉඩමක අයිතිකරුට, බදුකරුට හෝ පදිංචිකරුට, ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නියම කොට දැක්වෙන යම් කාල සීමාවක් ඇතුළත එම ළිඳ ඉසින ලෙස සහ එය ශුද්ධ කර විශෝධනය කරන ලෙස ද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ උපදෙස් අනුව අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන වෙනත් යම් අලුත්වැඩියාවක් කරන ලෙසද, දැනුම් දීමට සැලැස්විය හැකි අතර, එම දැන්වීමේ නියම කොට දැක්වෙන කාල සීමාව ඇතුළත, ඒ අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීම අනුව ක්‍රියා කළ යුතුය.

8. මේ සම්බන්ධයෙන් වන මේ යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක්, වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ද ඒ වරද දිගටම කරගෙන යන අවස්ථාවක, කිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීම කරනු ලැබීමෙන් පසුව හෝ එම උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරන සභාපතිවරයාගේ හෝ වෙනත් බලයලත් නිලධාරියකුගේ හෝ ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව, ඒ උල්ලංඝනය කරගෙන යන එක් එක් දින වෙනුවෙන් රුපියල් සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

## 36—පුස්තකාල

1. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, පුස්තකාල පිළිබඳව වන මේ අතුරු ව්‍යවස්ථාවල "පුස්තකාලයාධිපති" යන යෙදුමෙන්, පුස්තකාලය භාරව සිටීමට, ප්‍රාදේශීය සභාව විසින් පත් කරනු ලබන තැනැත්තෙක් අදහස් වන අතර, ඔහුගේ සහායකයා ද ඊට ඇතුළත් වේ.

2. ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවා පවත්වා ගෙන යනු ලබන මහජන පුස්තකාලය—

(අ) බැහැර දෙන පුස්තකාලය ;

(ආ) ආශ්‍රය පුස්තකාලය සහ

(ඇ) කියවීම් ශාලාව ;

යන ඒවායින් සමන්විත වේ.

3. (1) මහජන පුස්තකාලයේ අධීක්ෂණය සහ සාමාන්‍ය පරිපාලනය, (මෙහි මින් මතු පුස්තකාල කමිටුව යනුවෙන් සඳහන් කරනු ලබන) පුස්තකාල කමිටුවක් වෙත පැවරෙන්නේය. එම කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වේ.

(අ) (මෙහි මින් මතු 'සභාපතිවරයා' යනුවෙන් සඳහන් කරනු ලබන) තත් කාලයෙහි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලද වෙනත් යම් තැනැත්තෙක්,

(ආ) ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභාවේ සභිකයන් අතුරෙන් තෝරා ගනු ලබන තුන් දෙනකුට නොවැඩි සභිකයන් සංඛ්‍යාවක්, සහ

(ඇ) ඒ රැස්වීමේ දී ප්‍රාදේශීය සභාව විසින් තෝරාපත් කරනු ලබන ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පදිංචි විශිෂ්ට තැනැත්තන් පස්දෙනෙක්.

(2) මහජන පුස්තකාලය භාරව සිටීම ප්‍රාදේශීය සභාව විසින් පුස්තකාලයාධිපතිවරයකු පත් කරනු ලැබිය හැකි අතර, පුස්තකාලයෙහි ක්‍රමවත් භාවය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය.

4. (1) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නිල බලයෙන්, කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, කමිටුවේ සෑම රැස්වීමකම ඔහු මූලාසනය දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට, පැමිණ සිටින සාමාජිකයන් විසින් කමිටුවේ සාමාජිකයන් අතුරෙන් තෝරා පත්කර ගන්නා සාමාජිකයකු ඒ රැස්වීමෙහි මූලාසනය දැරිය යුතුය.

(2) කවර හෝ රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට එක් මුලික ඡන්දයක් ද යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වූවහොත් තීරක ඡන්දයක් ද ඇත්තේය.

5. සාමාජිකයන් පස් දෙනකුගෙන් ගණපූරණය වී ඇත්නම් මිස, කමිටුවේ කිසි රැස්වීමක දී කිසි කටයුත්තක් නොකළ යුතුය.

6. කමිටුව විසින් අවශ්‍යයයි සලකන කොන්දේසිවලට යටත්ව යම් තැනැත්තකුට මහජන පුස්තකාලයේ පරිශ්‍රයෙහි යම් කොටසක් පාවිච්චි කිරීමට අවසර දීමට හෝ යම් තැනැත්තකු විසින් පුස්තකාල පිළිබඳව වන මේ අතුරු ව්‍යවස්ථා අතුරෙන් යමක් උල්ලංඝනය කර ඇත්නම් ඒ තැනැත්තාට එම පරිශ්‍රයෙහි යම් කොටසක් පාවිච්චි කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීමට හෝ කමිටුවට බලය ඇත්තේය.

### බැහැර දෙන පුස්තකාලය

7. (1) යම් තැනැත්තෙක්—

(අ) වයස අවුරුදු දොළහකට නොඅඩු වේනම් මිස,

(ආ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචිව සිටී නම් හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ කාර්යාලයක් හෝ ව්‍යාපාර ස්ථානයක් ඇතිව සිටී නම්, මිස

(ඇ) පුස්තකාලයාධිපතිවරයා වෙත රුපියල් විස්සක මුදලක් තැන්පත් කර ඇත්නම් මිස' සහ

(ඈ) ප්‍රාදේශීය සභාවේ බදු ගෙවන්නකු විසින් නිර්දේශ කර ඇත්නම් මිස,

ඒ තැනැත්තා බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයකු ලෙස ඇතුළත් කර නොගත යුතුය.

(2) බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයකු ලෙස ඇතුළත් වීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකුම පුස්තකාලයාධිපතිවරයාගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රයක් මත ඒ සඳහා ඉල්ලුම් කළ යුතු අතර, ඔහු විසින් ඒ ඉල්ලුම් පත්‍රය මෙහි පහත සඳහන් තැනැත්තකු ලවා සහතික කරවා ගත යුතුය.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ;

(ආ) ප්‍රාදේශීය සභාවේ සභිකයෙක් ;

(ඇ) කමිටුවේ සාමාජිකයෙක් ;

(ඈ) ආගමික පූජකවරයෙක් ;

(ඉ) වෛද්‍ය වෘත්තියේ හෝ නීති වෘත්තියේ සාමාජිකයෙක් ;

(ඊ) සාමදාන විනිශ්චයකාරවරයෙක් ;

(උ) වාර්ෂික සිවිල් ලැයිස්තුවෙහි නම ඇතුළත් වී ඇති ආණ්ඩුවේ සේවකයෙක්,

(ඌ) ද්විතීය පාසැලක ප්‍රධානාචාර්යවරයෙක්,

(එ) රු. 14,400කට නොඅඩු වාර්ෂික ආරම්භක වැටුපක් ලබන, ප්‍රාදේශීය සභාවේ සේවකයෙක් හෝ ;

(ඒ) ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරිවරයෙක්.

(3) මුළු ශේෂය වශයෙන් ඉල්ලුම් පත්‍රයක් සහතික කිරීමට එකඟ වී ඇති කිසිම තැනැත්තකුට ඔහුගේ ඉල්ලුම් පත්‍රය සහතික කරවා ගත යුතු යැයි බලකර සිටිය යුතුය.

8. මැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයකු ලෙස ඇතුළත් කර ගන්නා සෑම තැනැත්තකුටම පුස්තකාලයාධිපති වරයා විසින් ටිකට්පත් දෙකක් නිකුත් කළ යුතු අතර, ඒ තැනැත්තකුට එක් ටිකට් පතකට එක් පොතක් බැගින් ලබාගැනීමට හිමිකම් ඇත්තේය.

9. මැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයකුට නිකුත් කරන ලද ටිකට් පතක් එය ඔහු විසින් රැගෙන යන ලද යම් පොතක් සඳහා ඔහු වගකිව යුතුය.

10. මැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයකුට නිකුත් කරන ලද ටිකට් පතක් ඔහු අතින් නැතිවූ අවස්ථාවක, එම නැතිවීම ගැන ඔහු විසින් පුස්තකාලයාධිපති වරයාට දැනුම් දිය යුතුය. ඒ ටිකට් පතට මැහැර දෙන පුස්තකාලයෙන් පොතක් කියවීමට ගෙන නොමැති බවට පුස්තකාලයාධිපති වරයා සෑහීමට පත්වුවහොත්, ඔහු විසින් ඒ සාමාජිකයාට ටිකට් පතක අනුපිටපතක් නිකුත් කළ හැකිය. ටිකට්පතක් නැති වී ඇති බව දැනුම් දෙනු ලැබූ දිනයේ සිට යටත් පිරිසෙයින් දවස් තිහක කාල සීමාවක් ඉකුත් වී ඇත්නම් මිස, පුස්තකාලයාධිපතිවරයා විසින් ටිකට්පතක එවැනි අනුපිටපතක් නිකුත් නොකළ යුතුය.

11. මැහැර දෙන පුස්තකාලයෙන් සාමාජිකයකු විසින් කියවීමට ලබාගන්නා පොතක්, එය කියවීමට ගත් දින සිට දවස් දාහතරක කාලයක් ඇතුළත පුස්තකාලයාධිපති වරයාට ආපසු භාර දිය යුතුය. එවැනි යම් පොතක් වෙනත් සාමාජිකයකු විසින් ඉල්ලා නොමැති නම්, ඒ පොත වැඩිපුර දවස් දාහතරක් සඳහා කියවීමට තැබීමට පුස්තකාලයාධිපති වරයා විසින් ඒ සාමාජිකයාට ඉඩදිය හැකිය.

12. 11 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දවස් දාහතරක කාල සීමාව ඇතුළත යම් පොතක්, පුස්තකාලයාධිපති වරයාට ආපසු භාරදීම සාමාජිකයකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ පොත් ආපසු භාර දිය යුතු දිනය ඉක්මවා යන එක් එක් දවස වෙනුවෙන් සත පණහක් බැගින් දඩයක් ගෙවීමට ඒ සාමාජිකයා යටත් වන්නේය.

13. මැහැර දෙන පුස්තකාලයෙන් තමා විසින් කියවීමට ගන්නා පොතක් 11 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දවස් දාහතරක කාල සීමාව ඉකුත් වීමෙන් පසුව දවස් තිහක් ඇතුළත ආපසු භාරදීම, සාමාජිකයකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ පොත නැතිවූවක් සේ සලකනු ලැබිය යුතුය.

14. සාමාජිකයකු විසින් කියවීමට ගන්නා ලද පොතක් නැති වී ඇති හෝ නැති වී ඇති ලෙස සලකනු ලබන අවස්ථාවක ඒ පොත ආපසු සපයා ගැනීමේ වියදම ඒ සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

15. කිසි සාමාජිකයකු විසින්, මැහැර දෙන පුස්තකාලයෙන් කියවීමට ගත් පොතකට හානි කිරීම හෝ කවර හෝ ආකාරයකින් එය විරූප කිරීම හෝ නොකළ යුතුය.

16. මැහැර දෙන පුස්තකාලයෙන් තමා කියවීමට ගැනීමට අපේක්ෂා කරන පොතකට සිදුවී ඇති හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපති වරයාට දැනුම් දීම සෑම සාමාජිකයකුගේම යුතුකම වන්නේය. එවැනි හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම යම් සාමාජිකයකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක ඒ පොත ඔහුට හානියකින් හෝ විරූප කිරීමකින් තොරව නිකුත් කරන ලද සේ සැලකිය යුතුය.

17. සාමාජිකයකු විසින් ආපසු භාර දෙන ලද පොතක්, තවදුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඔහු විසින් හානිකර හෝ විරූප කර ඇති බවට පුස්තකාලයාධිපති වරයා සෑහීමට පත්වන්නා වූ අවස්ථාවක, ඒ පොත නැවත සපයා ගැනීමේ වියදම දැරීමට ඒ සාමාජිකයා බැඳී සිටින්නේය. ඒ පොත නැවත සපයා ගැනීමෙන් පසුව, හානි වූ පොත, "මහජන පුස්තකාලය — හානි වූ පොතක් ලෙස විකුණන ලදී" යනුවෙන් මුද්‍රා තබා ඒ සාමාජිකයාට දෙනු ලැබිය යුතුය.

18. (1) මැහැර දෙන පුස්තකාලයෙන් කියවීමට ගත් පොතක්, කිසිම සාමාජිකයකු විසින් කිසිම තැනැත්තකුට මැහැර නොදිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ සාමාජිකයකුගේ තැන්පත් මුදල අහිමි වන අතර, මැහැර දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

19. (1) ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු විසින් පාවිච්චි කළ බව තමා දන්නා කිසිම පොතක්, කිසි සාමාජිකයකු විසින්, මැහැර දෙන පුස්තකාලයට ආපසු භාර නොදිය යුතුය.

(2) මැහැර දෙන පුස්තකාලයෙන් සාමාජිකයකු විසින් කියවීමට ගන්නා ලද පොතක් ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන තැනැත්තකු විසින් පාවිච්චි කර ඇති විට, ඒ පොත විනාශ කළ යුතු අතර, එය නැවත සපයා ගැනීමේ වියදම ඒ සාමාජිකයා පුස්තකාලයාධිපතිවරයාට ගෙවිය යුතුය.

20. කිසියම් පොතක් කියවීමට ලැබිය යුත්තේ කවර සාමාජිකයකුට දැයි න පිළිබඳ මතභේදයක්, මැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයන් දෙදෙනකු හෝ වැඩි ගණනක් අතර උද්ගත වූ විටක, ඒ මත භේදය පුස්තකාලයාධිපති වරයා විසින් විසඳිය යුතුය.

21. වෙනත් සාමාජිකයකු විසින් කියවීමට ගෙන ගොස් ඇති යම් පොතක් කියවීමට ගැනීමට යම් සාමාජිකයකු අපේක්ෂා කරන විට, ඔහු තමාගේ නමද පොතේ නම, ඒ කාර්යය සඳහා තබා ඇති රෙජිස්ටරයක සටහන් කළ යුතුය. ඒ පොත ගෙන ගොස් ඇති සාමාජිකයා එය ආපසු භාරදුන් විට පුස්තකාලයාධිපතිවරයා විසින්, එය රෙජිස්ටරයේ නම සටහන් කර ඇති සාමාජිකයාට නිකුත් කළ යුතුය. යම් පොතක් සඳහා සාමාජිකයන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් රෙජිස්ටරයෙහි නම සටහන් කර ඇති අවස්ථාවක, ඔවුන් රෙජිස්ටරයේ නම සටහන් කර තිබෙන අනුපිළිවෙළ අනුව ඒ පොත ඔවුනට නිකුත් කළ යුතුය.

22. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචිය හෝ කාර්යාලයක් නැතහොත් ව්‍යාපාර ස්ථානයක් තබාගැනීම නතර කරන යම් සාමාජිකයකු, මැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයකුව සිටීම නතර වන අතර, 8 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඔහු වෙත නිකුත් කර ඇති ටිකට්පත් දෙක පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාර දිය යුතුය.

23. යම් තැනැත්තකු විසින් 7 (1) (ආ) අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවා ඇති රුපියල් විසිපහක් වන තැන්පත් මුදල, මැහැර දෙන පුස්තකාලයට ඔහුගෙන් අයවිය යුතු යම් මුදලක් වේනොත් එය අඩුකර, ඒ තැනැත්තාගේ සාමාජිකත්වය අවසානවීමේ දී ඔහුට ආපසු ගෙවිය යුතුය.

24. මැහැර දෙන පුස්තකාලය, ඉරිදා දින, ප්‍රසිද්ධ නිවාඩු දින සහ යටත් පිරිසෙයින් සාමාජිකයන්ට දවස් හතක දැනුම් දීමකින් පසු, පොත් ගණන් ගැනීම සඳහා සභාව විසින් නියම කරන වෙනත් යම් දිනයක් හැර, දිනපතා, පෙ.ව. 9.00 සිට ප.ව. 6.00 අතර කාලය තුළ විවෘතව තැබිය යුතුය.

### ආශ්‍රේය පුස්තකාලය

25. (අ) ආශ්‍රේය පුස්තකාලය පාවිච්චි කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ලබාගෙන ඇත්නම් මිස ; සහ

(ආ) ආශ්‍රේය පුස්තකාලයේ තබා ඇති රෙජිස්ටරය අත්සන් කර ඇත්නම් මිස ;

කිසිම තැනැත්තකු විසින් ආශ්‍රේය පුස්තකාලය පාවිච්චි කරනු නොලැබිය යුතුය.

26. පුස්තකාලයාධිපතිවරයා විසින්–

(අ) කියවීමට සහ ලිවීමට හැකි,

(ආ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචි,

(ඇ) වයස අවුරුදු දොළහට නොඅඩු

තැවර හෝ තැනැත්තකුට ආශ්‍රිත පුස්තකාලය පාවිච්චි කිරීමට අවසර දිය හැකිය.

27. කියවා බැලීම සඳහා තමා වෙත නිකුත් කරන ලද කිසිම පොතක් කිසි තැනැත්තකු විසින් ආශ්‍රිත පුස්තකාලයෙන් පිටතට ගෙන නොයා යුතුය.

28. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව ආශ්‍රිත පුස්තකාලය පෙ.ව. 8.00 මධ්‍යාහ්න 12.00 දක්වා ද ප.ව. 2.30 සිට ප.ව. 6.00 දක්වා විවෘතව තැබිය යුතුය.

(2) ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින්,

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ නිශ්චය කොට දැක්වෙන වේලාවන් දීර්ඝ කළ හැකිය.

(ආ) එම යෝජනා සම්මතයේ නිශ්චය කොට දක්වනු ලැබිය හැකි වේලාවන් තුළ ඉරු දිනයන්හි සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි ආශ්‍රිත පුස්තකාලය විවෘතව තබන ලෙස කමිටුවෙන් ඉල්ලා සිටිය හැකිය,

(ඇ) පොත ගණන් බැලීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දිනවල ආශ්‍රිත පුස්තකාලය වසා තබන ලෙස කමිටුවෙන් ඉල්ලා සිටිය හැකිය,

## කියවීම් ශාලාව

29. කිසිම තැනැත්තකු විසින්–

(අ) පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය පත්කාර්යය සඳහා ලබාගෙන ඇත්නම් මිස, සහ

(ආ) කියවීම් ශාලාවේ තමා ඇති රෙජිස්ටරය අත්සන් තබා ඇත්නම් මිස;

කියවීම් ශාලාව ප්‍රයෝජනයට නොගත යුතුය.

30. (අ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචිකරුවකු වන සහ

(ආ) වයස අවුරුදු දොළහට අඩු නොවන

තැවර හෝ තැනැත්තකුට කියවීම් ශාලාව ප්‍රයෝජනයට ගැනීමට පුස්තකාලයාධිපතිවරයා විසින් අවසර දෙනු ලැබිය හැකිය.

31. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව කියවීම් ශාලාව පෙ.ව. 8.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ද, ප.ව. 2.30 සිට ප.ව. 6.30 දක්වා ද විවෘතව තැබිය යුතුය.

(2) ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින්–

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ නිශ්චය කොට දැක්වෙන වේලාවන් දීර්ඝ කළ හැකිය.

(ආ) පොත ගණන් බැලීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දිනවල කියවීම් ශාලාව වසා තබන ලෙස කමිටුවෙන් ඉල්ලා සිටිය හැකිය.

32. කියවීම් ශාලාවේ තමා ඇති හෝ කියවීම් ශාලාවට අයත් කිසිම පුවත්පතක් වාර ප්‍රකාශනයක් සඟරාවක් සිතියමක් ලියවිල්ලක් අත් පිටපතක් හෝ වෙනත් යම් ලිපියක් කිසි තැනැත්තකු විසින් කියවීම් ශාලාවෙන් ඉවත් කරගෙන නොයා යුතුය.

## සාමාන්‍ය

33. යම් ආසාදන, ස්පර්ශක හෝ වසංගත රෝගයකින් පෙළෙන හෝ මෑතක දී පෙළුනු තැනැත්තකු නම් ඒ රෝගයකින් පෙළෙන තැනැත්තකුට මෑතක දී උපස්ථානයේ යෙදුනු කිසිම තැනැත්තකු රෝගය බෝවීමේ කාලය සහ නිරෝධන කාලසීමා ඉකුත් වන තෙක් මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය.

34. කිසිම තැනැත්තකු–

(1) මහජන පුස්තකාල පරිශ්‍රයක් තුළ හෝ අවට නොහික්මුණු ආකාරයෙන් හැසිරීම හෝ රණ්ඩු සරුවල් ඇති කිරීම, හෝ නොකළ යුතුය.

(2) මහජන පුස්තකාලයෙහි හෝ ඒ අවට ප්‍රාදේශීය සභාවේ යම් නොටිස් බිල්පත් කොටියකට හෝ යම් ගොඩනැගිල්ලකට අලාභයක් කිරීම හෝ යම් ආකාරයකින් විරූප කිරීම, හෝ නොකළ යුතුය.

(3) මහජන පුස්තකාලය වැසූ පසුව අනුද්දේශයක් හේතු දැක්වීමක් කළ නොහැකිව පුස්තකාල පරිශ්‍රය තුළ රැඳී සිටීම හෝ නිකරුණේ හැසිරීම, හෝ නොකළ යුතුය.

(4) මහජන පුස්තකාල පරිශ්‍රය තුළ දුම් බීම හෝ කෙළ ගැසීම නොකළ යුතුය.

(5) මහජන පුස්තකාල පරිශ්‍රය ඇතුළත දඬු කැටවලින් හෝ කෑලි කුට්ටිවලින් ක්‍රීඩාවෙහි නොයෙදිය යුතුය.

(6) මහජන පුස්තකාල පරිශ්‍රය ඇතුළත ඝෝෂා කිරීමෙන්, ගී ගැයීමෙන් හෝ වෙනත් ශබ්ද නැගීමෙන් එම පුස්තකාලය පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.

(7) අපිරිසිදු තත්ත්වයකින් මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය.

(8) මහජන පුස්තකාල පරිශ්‍රයට කිසි සුනඛයකු හෝ වෙනත් සත්තු ගෙන නොයා යුතුය.

(9) මහජන පුස්තකාල පරිශ්‍රයේ යම් කොටසක් තුළ නිදා ගැනීම හෝ යම් ආහාරයක් කෑම නොකළ යුතුය.

(10) පුස්තකාලයාධිපතිවරයාට හෝ පුස්තකාලයාධිපතිවරයාගේ නියමය යටතේ ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තකුට මේ අතුරු ව්‍යවස්ථා යටතේ තමුගේ බලතල නීත්‍යනුකූලව ක්‍රියාත්මක කිරීමේදී බාධා නොකළ යුතුය.

35. 2 වන අතුරු ව්‍යවස්ථාව, 33 වන අතුරු ව්‍යවස්ථාව හෝ 34 වන අතුරු ව්‍යවස්ථාව පිළිබඳ යම් උල්ලංඝනය කිරීමක් රුපියල් සියයකට නොඉක්මවූ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු වරදකි.

## 37.—අනාරක්ෂිත ළිං

1. ප්‍රාදේශීය පාලන පරිපාලන සීමාවන් තුළ පිහිටියා වූද, යම් ළිඳක් පිහිටා ඇත්තා වූද, යම් ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු විසින්, ඒ ළිඳ බිම් මට්ටමේ සිට අඩි [illegible] පමණ උසට ගල් බැම්මකින් හෝ වෙනත් සුදුසු නිර්මාණයකින් වටකර තැබීමට සැලැස්විය යුතු අතර, ඒ බැම්ම හෝ වෙනත් නිර්මාණය නිසි අලුත්වැඩියාවකින් යුතුව තබා ගැනීමට සැලැස්විය යුතුය.

2. අත්හැර දමනලද සෑම ළිඳක්ම, ඒ ළිඳ පොළොවට සමතලා වන සේ පුරවා ප්‍රාදේශීය පාලන සභාපතිවරයා විසින් ලිඛිත දැන්වීමක් කරනු ලැබීමෙන් පසුව ඒ ළිඳ පිහිටි ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් පොඩි කරනු ලැබිය යුතුය.

3. මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳව වන සෑම උල්ලංඝනයක් නිර්මාණ රුපියල් පන්සිය පදනම් නොඉක්මවන දඩයකින් ද, එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය කෙසේ අවසානය යොමු කරමින් ප්‍රාදේශීය පාලන සභාපතිවරයා විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව, ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන් ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින් ද, දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

## 38.—කොණ්ඩා කැපීමේ සැලූන්හල් සහ බාබර් සාප්පු

1\. (1) කොණ්ඩා කැපීමේ සැලූන්හලක් හෝ බාබර් සාප්පුවක් සඳහා (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය පාලන සභාපතිවරයා විසින් නිකුත් කරනලද බලපත්‍රයක් මත මිස කිසිම තැනැත්තෙකු විසින් කොණ්ඩා කැපීමේ සැලූන්හලක් හෝ බාබර් සාප්පුවක් පවත්වා ගෙන නොයා යුතු ය.

(2) 14 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නේය.

2\. කොණ්ඩා කැපීමේ සැලූන්හල හෝ බාබර් සාප්පුව සඳහා ප්‍රයෝජනයට ගන්නා ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස සහ එහි උපකරණ මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට හා නියමයන්ට අනුකූල වන්නේ මිස, කොණ්ඩා කැපීමේ සැලූන්හලක් හෝ බාබර් සාප්පුවක් පවත්වා ගෙනයාම සඳහා බලපත්‍රයක් ලැබීමට කිසිම තැනැත්තෙකුට හිමිකමක් නොමැත:

(1) ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස—

(අ) සන්නිවේශව සැදා තිබිය යුතු අතර, වර්ග අඩි 11.150 නොඅඩු බිම් ප්‍රමාණයකින් යුක්ත විය යුතුය.

(ආ) බිත්ති සුදු මිදුලමයෙන් සහා සුදු වර්ණයකින් තිබිය යුතු අතර, බිත්ති ශ්‍රීලේස් හෝ සමාන ද්‍රව්‍යයකින් හෝ සැලූ පිදුලකට ආලේප කළ සිවිලිමක් තිබිය යුතුය. තවද, බිම සිමෙන්ති දමා, බිත්ති සහ බිම ගැටෙන ස්ථානය සිමෙන්තියෙන් වටකුරු, හැඩයට සකස් කොට තිබිය යුතුය.

(ඇ) හොඳින් ආලෝකය සහ වාතාශ්‍රය ලැබෙන සේ සකස් තිබිය යුතුය.

(ඈ) ප්‍රමාණවත්, ශක්තිමත් සපයා තිබිය යුතු අතර, ගොඩනැගිල්ල ඇතුළත හෝ භූමිය තුළ සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(2) ගොඩනැගිල්ලේ යම් කොටසක් නිවාසයක කාර්ය සඳහා ප්‍රයෝජනයට ගන්නේ නම් හෝ ප්‍රයෝජනයට ගැනීමට අදහස් කෙරේ නම්; ඒ ස්ථානය (199 වැනි අධිකාරය වන) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(3) සැලූන්හල හෝ සාප්පුව සඳහා පහත සඳහන් දෑ සපයා තිබිය යුතුය:

(අ) සැලූන්හල හෝ සාප්පුව, ගනුදෙනුකරුවන් සඳහා වියහට ඇති සියලු වේලාවන්හි ප්‍රමාණවත් ජලසම්පාදනයක්,

(ආ) දිනපතා පාවිච්චි කරන ආයුධ සහ උපකරණ පිරිසිදු කිරීම හෝ විෂබීජහරණය සඳහා ප්‍රමාණවත් උණුවතුර ජලය හෝ විෂබීජ නාශක හෝ සපයා ගැනීමේ ක්‍රමයක්,

(ඇ) කොණ්ඩා කපන්නන්ට සහ බාබර්වරුන්ට අත්වල වැඩ කරගෙන යාමේදී අත් සෝදා ගැනීම සඳහා පහසුකම්,

(ඈ) ආයුධ හෝ උපකරණ විෂබීජහරණය පිණිස පාවිච්චි කරන විෂබීජනාශක සඳහා ප්‍රමාණවත් බඳුන් සංඛ්‍යාවක්,

(ඉ) ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් තුවා සහ ඇඳිරිපිලි සංඛ්‍යාවක්,

(ඊ) ගනුදෙනුකරුවන්ට සහ සේවා නියුක්තයන්ට පහසුවෙන් ලඟාවිය හැකි පරිදි, ආසනවලට ආසන්නව තබා ඇති ප්‍රමාණවත් පඩික්කම් සහ අළු බඳුන් සංඛ්‍යාවක්, සහ

(උ) කපනලද කෙස් සහ අපද්‍රව්‍ය බැහැලීම සඳහා, ආවරණය කළ යන එහා මෙහා ගෙනයා හැකි බඳුනක්, සහ

(ඌ) ප්‍රමාණවත් අවශ්‍ය දෑ සපයා ඇති ප්‍රථමාධාර පෙට්ටියක්.

3\. කොණ්ඩා කැපීමේ සැලූන්හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රලාභියා විසින්

(අ) අවස්ථාවෝචිත පරිදි "බලපත්‍රලත් කොණ්ඩා කැපීමේ සැලූන්හල" හෝ "බලපත්‍රලත් බාබර් සාප්පුව" යන වචන පැහැදිලිව සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පින්තාරු කළ පුවරුවක්, සැලූනයේ හෝ සාප්පුවේ පිටත, ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

(ආ) සැලූනයේ හෝ සාප්පුවේ ඇතුළත, ප්‍රකටව පෙනෙන ස්ථානයක, කොණ්ඩා කැපීමේ සැලූන්හල් සහ බාබර් සාප්පු පිළිබඳ වන මේ අතුරු ව්‍යවස්ථාවල, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ පිටපතක්, ප්‍රදර්ශනය කර තබා ගත යුතුය.

4\. කොණ්ඩා කැපීමේ සැලූන්හලක් හෝ බාබර් සාප්පුවක් සඳහා බලපත්‍රලාභියකු විසින්—

(අ) ඒ සැලූනයේ හෝ සාප්පුවේ බිත්ති, වටත් පිරිසිදුව පිහිටියක් දින නිත්‍ය තබා ගැනීමට සහ පිට [illegible] ... සැලැස්විය යුතුය, තවද,

(ආ) ඒ සැලූනයේ හෝ සාප්පුවේ බිම, බිත්ති සිවිලිම, පඩික්කම්, ගෘහ භාණ්ඩ, සහ උපකරණ, සෑමවිටම පිරිසිදුව තබා ගැනීමට සැලැස්විය යුතුය.

5\. කොණ්ඩා කැපීමේ සැලූන්හලක් හෝ බාබර් සාප්පුවක බලපත්‍රලාභියා විසින් සේවයේ නියුක්ත කර ඇති සෑම කොණ්ඩා කපන්නෙකු ම පිරිසිදුව—

(අ) තමන්ගේ ශරීරය සහ ඇඳුම් පැළඳුම් පිරිසිදුව තබා ගන්නා බවට,

(ආ) තමන්ගේ නියපොතු කපා, කෙටියෙන් කොට තබා ගන්නා බවට, සහ

(ඇ) එක් එක් ගනුදෙනුකරුවකුගේ කොණ්ඩය කැපීමට හෝ රැවුල කැපීමට පෙරාතුව සබන් හා අත් සෝදා ගන්නා බවට වග බලා ගැනීම අවශ්‍ය පියවර, බලපත්‍රලාභියා විසින් ගනු ලැබිය යුතුය.

6. කොණ්ඩා කැපීමේ සැලුන් හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රලාභියා විසින්—

(අ) ඒ සැලුන් හලේ හෝ බාබර් සාප්පුවේ ඇතිකැම සවිකිරීම් පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් තබා ගත යුතුය.

(ආ) ඒ සැලුන් හලේ හෝ සාප්පුවේ පාවිච්චි කරන සෑම කොණ්ඩා මුරුසුවක්ම හෝ පනාවක්ම දිනපතාම සේදීමට හෝ පිරිසිදු කරවීමටත්, විෂබීජහරණය හෝ විෂබීජනාශනය කරවීමටත්, සෑම විටම ඒවා පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂක තත්ත්වයක තබා ගැනීමටත් සැලැස්විය යුතුය.

(ඇ) සැලුන්හලේ හෝ සාප්පුවේ පාවිච්චි කරන, රැවුල් කැපීමේදී ප්‍රයෝජනයට ගන්නා සෑම දැහැටියක් හෝ කතුරක් ද සමග මුරුසු, ක්ලිපර්, රේසර් හෝ වෙනත් කැපීමේ උපකරණ ද පාවිච්චියට ගත් සෑම අවස්ථාවකම උණු ජලයෙන් සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය. තවද

(ඈ) එක් එක් ගනුදෙනුකරුගේ කොණ්ඩා කැපීම හෝ කැපීම සිදුකළ පසුව සියලු ගස් කොට සහ වෙනත් අපද්‍රව්‍ය, ඒවා දැමීම සඳහා ඇති බඳුනකට දැමීමට සැලැස්විය යුතුය.

7. කොණ්ඩා කැපීමේ සැලුන් හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රලාභියා විසින්

(අ) කිසිම ලේ නවත්වන පැන්සල් වර්ගයක් සියරු වලක් හෝ ස්පොන්ජියක්, හෝ

(ආ) යම් ලේ ගැලීමක් නතර කිරීමේ කාර්යය සඳහා සිනක්කාරම් හෝ වෙනත් ද්‍රව්‍යයක්, (එය කුඩු විශයෙන් හෝ ද්‍රව විශයෙන් ඇත්නම් මිස) කිසිම ගනුදෙනුකරුවකු සඳහා පාවිච්චි කිරීම හෝ ඒ සැලුන්හලේ හෝ සාප්පුවේ සේවයේ යෙදවා සිටින කිසිම කොණ්ඩා කපන්නකුට හෝ බාබර් කෙනෙකුට, ගනුදෙනුකරුවකු සඳහා පාවිච්චි කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

8. කොණ්ඩා කැපීමේ සැලුන් හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රලාභියා විසින් යම් ගනුදෙනුකරුවකුගේ ප්‍රයෝජනය සඳහා සෝදනු ලැබීමෙන් පසුවමිස වෙනත් ගනුදෙනුකරුවකුට පාවිච්චි කරන තුවායක් හෝ පිරිසිදු නැති "කවරයක්" උඩ දැමීම හෝ නොකළ යුතුය.

9. කොණ්ඩා කැපීමේ සැලුන් හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රලාභියා විසින්—

(අ) කුෂ්ඨ ආකාරයක හෝ ආසාදන, ස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙළෙන තැනැත්තෙක් එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තකුට බැව් උපස්ථාන කළ හැකි තැනැත්තකුට, දැනුවත්ව, සැලුන්හලට හෝ සාප්පුවට, කිසිම කාර්යයක් සඳහා ඇතුළුවීමට ඉඩ නොදිය යුතුය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් කිසිම තැනැත්තකු සැලුන් හලේ හෝ සාප්පුවේ කිසිම කාර්යයකින් සේවයේ නියුක්ත නො කළ යුතුය.

(ඇ) සැලුන්හලේ හෝ සාප්පුවේ තමා විසින් සේවයේ නියුක්ත කර සිටින කිසිම කොණ්ඩා කපන්නකුට හෝ බාබර් කෙනෙකුට, ඉහත (අ) ඡේදයේ සඳහන් කිසිම තැනැත්තකුට සේවය කිරීමට, දැනුවත්ව ඉඩ නොදිය යුතුය.

(ඈ) (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකුට වැරදීමකින් හෝ අනුමානයෙන් සේවය කළ එවැනි යම් කොණ්ඩා කපන්නකුට හෝ බාබර් කෙනෙකුට, ඔහුගේ දෑත් සෝදා පිරිසිදු කර ගැනීමෙන් පසුව මිස, වෙනත් යම් ගනුදෙනු කරුවකුට සේවය කිරීමට ඉඩ නොදිය යුතුය.

(ඉ) ඉහත (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සඳහා පාවිච්චි කළ කවර හෝ උපකරණයක්, විෂබීජහරණය කරන තෙක් වෙනත් යම් තැනැත්තකු සඳහා පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

10. කිසිම තැනැත්තකු විසින්, කොණ්ඩා කැපීමේ සැලුන්හලක් හෝ බාබර් සාප්පුවක් තුළදී රති සපයා ඇති පරිශ්‍රයක තුළට කෙළ නොගැසිය යුතුය.

11. කොණ්ඩා කැපීමේ සැලුන් හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රලාභියකු විසින් එම බලපත්‍ර ලත් ස්ථානය,

(අ) කිසිම වේලාවක දී ආහාර ගැනීමේ ස්ථානයක් ලෙස, හෝ

(ආ) ගනුදෙනු කරුවන් සඳහා විවෘතව නොමැති රාත්‍රී කාලයේදී හැර, නිදාගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි කිරීම හෝ වෙනත් යම් තැනැත්තකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ දීම හෝ නොකළ යුතුය.

12. (i) සභාපතිවරයා විසින් හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලක් මගින් බලය දෙන ලද ප්‍රාදේශීය සභාවේ නිලධාරියකු විසින් හෝ කවර හෝ කොණ්ඩා කැපීමේ සැලුන්හලකට හෝ බාබර් සාප්පුවකට සියලු යුක්ති සහගත වේලාවන්හිදී ඇතුළුවී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(ii) සභාපතිවරයා/ලේකම්/සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් බලය දෙනලද නිලධාරියකුට ස්ථානයට ඇතුළුවී එය පරීක්ෂා කිරීමට, කොණ්ඩා කැපීමේ සැලුන්හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රලාභියා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් ඉඩ දිය යුතු අතර, සභාපතිවරයාට හෝ ඒ නිලධාරියාට අවශ්‍ය විය හැකි සියලු පහසු දිය යුතුය.

13. කොණ්ඩා කැපීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පු පිළිබඳව වන මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධ සෑම උල්ලංඝනය කිරීමක්ම රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකින් සහ එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය, සම්බන්ධ අවවාදය කරමින් සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ලිඛිත දැන්වීමක් භාර කරවීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන් ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

14. කොණ්ඩා කැපීමේ සැලුන් හල් හෝ බාබර් සාප්පු පිළිබඳ මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියකුට හිමි බලය ඇති අධිකරණයක් විසින් නියම කරන වෙනත් යම් දඬුවමකට අතිරේකව, ඒ බලපත්‍රලාභියාගේ බලපත්‍රය ඒ අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, එම අවලංගු කිරීම වෙනුවෙන් හිමි වන්දියක් ලැබීමට බලපත්‍රලාභියාට හිමිකමක් නොමැති විය යුතුය.

## 30. ප්‍රචාරක දැන්වීම්/දැන්වීම් පුවරු

1. කිසිම තැනැත්තකු විසින්, යම් බිත්තියට, පාරකට, ඇලකට, වැටකට, මිදුලට හෝ පෙනෙන ඕනෑම ස්ථානයක කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම, ඒ සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස, කරනු නොලැබිය යුතුය.

2. කවර හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම, මේ අතුරු ව්‍යවස්ථා වල 3 වන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයට පෙර මාස තුනකට නොඅඩු කලින් සභාවට ඉදිරිපත් කළ යුතුය.

3. 2 වන අතුරු ව්‍යවස්ථාව පරිදි ඉදිරිපත් කරන සෑම ඉල්ලුම් පත්‍රයක්ම, පහත දැක්වෙන ලේඛනවලින් සමන්විත විය යුතුය.

(අ) ලේකම්වරයාට භාරදී කළ ලිඛිත ඉල්ලුම් පත්‍රය.

(ආ) දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීම පෙන්වමින් 1 : 1000 පරිමාණයට නොඅඩු පරිමාණයකින් අඳින ලද භූමි සැලැස්ම.

(ඇ) 1 : 1000 පරිමාණයට නොඅඩු පරිමාණයකට අඳින ලද එම නිර්මිතයේ රූ සටහනක්.

(ඈ) එම සැලැස්ම්, රූප සටහන් හෝ පිරිවිතරවල, මේ අතුරු ව්‍යවස්ථා වලට අනුකූලවනු පිණිස කරන සංශෝධන වෙතොත් ඒ සංශෝධන.

(ඉ) ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමෙහි පොදු පෙනීම වර්ණ සියල්ලම පොදු කුඩා පරිමාණයකට අඳින ලද ඒ දැන්වීමේ පිටපතක්.

(ඊ) පාරවල් වීදිවලට සහ ප්‍රධාන භූමි සළකුණු වලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමෙහි පිහිටීම දක්වන සැලැස්මක්.

(උ) මේ සභාවේ යෝජනා සම්මතයක නිශ්චය කොට දක්වන සහ ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ලද ගාස්තුව.

(ඌ) ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය දීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු.

4. ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද සැලසුම් වලට, රූප සටහන් වලට සහ පිරිවිතරවට අනුකූලව මිස, කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත, යම් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස කිසිම පුවරුවක්, බිල් පුවරුවක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් නිර්මිතයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීම නොකළ යුතුය.

5. 2 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, නියමිත ගාස්තුව ගෙවනතෙක් ඉල්ලුම්කරුට බලපත්‍රය නිකුත් කරනු නොලැබිය යුතුය.

6. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් තැනැත්තකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් ප්‍රදර්ශනය කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකම බලපත්‍රයේ යොමු අංකය සහ බලපත්‍රධාරියාගේ නම ඇතුළත් කරන ලෙස ප්‍රාදේශීය සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

7. මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන, පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් කිසිවකට ඒ දැන්වීම් පුද්ගලික ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් නාම පුවරුවක් හෝ වනහොත් මිස, අදාළ නොවිය යුතුය.

(අ) ලබන ඉදිරි මුල් ප්‍රසංගය, ප්‍රසංග කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයකට අදාළ දැන්වීමක්,

(ආ) කිසියම් ප්‍රසංගයක් පවත්වනු ලබන ස්ථානයේ, ඒ ප්‍රසංගයට අදාළව ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක්,

(ඇ) ආගමික, දේශපාලන හෝ මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක්,

(ඈ) " කුලියට දීමට තිබේ " යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්,

(ඉ) " විකිණීමට තිබේ " යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්,

(ඊ) ගෘහනාම පුවරු (එහි විශාලත්වය ප්‍රාදේශීය සභාව විසින් නිරණය කරනු ලැබේ.)

(උ) වෘත්තීය කටයුතු සඳහා යොදනු ලබන, ප්‍රමාණයෙන් වර්ග මීටර් 0.093 ක් නොඉක්මවන නාම පුවරුවක්,

(ඌ) වෙළෙඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන ගොඩනැගිල්ලක එම වෙළෙඳ කටයුත්තේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය දක්වෙන සහ අයිතිකරුගේ නම, ලිපිනය, දුරකථන හෝ ටෙලෙක්ස් අංකය ආදිය දක්වෙන ප්‍රචාරක දැන්වීමක්,

8. කිසිම තැනැත්තකු විසින්—

(i) යම් වීදියක, පාරක හෝ අඩි පාරක පිය මගට උඩින් හෝ හරහා හෝ තොරා සිටින ආකාරයකට ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම, හෝ

(ii) පොළොවේ සිට මීටර් 12 ක් ඉක්මවන උසකින් ඇති යම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ,

(iii) කිසියම් වීදියකට හෝ පාරකට මුහුණලා යාව සිටින ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළෙඳ කාලා නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිලි මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගකින් යුත් ප්‍රචාරක දැන්වීමක් සවිකොට තැනතොත් එල්ලා තැබීම,

(iv) ගුවන් නාම පුවරුවක ස්වරූපයේ ප්‍රචාරක දැන්වීමක් ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන යම් ආකාරයකට තැනීම හෝ ඉදිකිරීම.

නොකළ යුතුය.

9. කිසිම තැනැත්තකු විසින්, පෞද්ගලික හෝ පොදු ගොඩනැගිල්ලක, පොදු ප්‍රජනීය ස්ථානයක, පොදු උද්‍යානයක, හෝ යම් පාලමක හෝ පාරට ඇති මායිම් පාලමක, දුරකථන හෝ විදුලි රැහැන් කණුවක, ගස් බැම්මක, ගුවන් වේල්ලක, අලිංසක, බෝක්කුවක, පර්වතයක, ගුවර්ගක හෝ ගසක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතුය.

10. මේ සභාවේ යෝජනා සම්මතයක නිශ්චය කොට දක්වන සහ ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ලද යම් ප්‍රදේශයක කිසිම ප්‍රචාරක දැන්වීමක ඒ දැන්වීම ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ ආකාරයට තනා හෝ ඉදිකර ඇති වෙළෙඳ කාලා පුවරුවක් හෝ නාම පුවරුවක් වනහොත් මිස, ප්‍රදර්ශනය නොකළ යුතුය.

11. කිසිම තැනැත්තකු විසින්, ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් වීදියක හෝ පාරක,

(i) යම් පුවරුවක, ආධාරකයක හෝ රාමුවක ප්‍රදර්ශිත යම් ප්‍රචාරක දැන්වීමක් ගෙන යාම හෝ ගෙන යාමට සැලැස්වීම නොකළ යුතුය.

(ii) යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට හෝ හඳුන්වා දීමේ කාර්යය සඳහා ගුවන් විදුලි යන්ත්‍රයක්, ග්‍රැමෆෝනයක්, සංගීත භාණ්ඩයක් මිනුවක් හෝ වෙනත් උපකරණයක් පාවිච්චි නොකළ යුතුය.

12. (i) යම් ප්‍රචාරක දැන්වීමක අවලක්ෂණ හෝ පිළිකුල් සහගත සහ මහජන සදාචාරයට හානිකර ලෙස නිරූපනය වන අවස්ථාවක, ප්‍රාදේශීය සභාව විසින් ලිඛිත නිවේදනයක් මගින්, ඒ නිවේදනයේ නිශ්චය කොට දක්වෙන යම් කාලයක් ඇතුළත, ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කර දමන ලෙස, ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය සිදු කරන තැනැත්තාට නියම කළ හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (i) වන ඡේදය යටතේ නිවේදනයක් භාරදෙනු ලැබූ කවර හෝ තැනැත්තකු විසින් එහි නිශ්චය කොට දක්වෙන කාලය ඇතුළත ඒ නිවේදනය අනුව ක්‍රියා කළ යුතුයි.

13. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින්,

(අ) ඒ පුවරුව නිසි අළුත්වැඩියාවෙන් යුතුව සහ තැනැත්තන්ගේ ආරක්ෂාවට හානිවිරහිත ආකාරයෙන් පවත්වා ගෙන යා යුතුය, තවද

(ආ) ඒ පුවරුවේ ඉදිරිපස, ප්‍රකටව පෙනෙන තැනක, පැහැදිලි හා කියවිය හැකි අකුරෙන්, ඔහුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කළ යුතුය.

14. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත බලපත්‍ර ගාස්තුව ගෙවා ඇති බව පෙන්වීමට යම් ප්‍රචාරක දැන්වීමක ප්‍රාදේශීය සභාව විසින් ඇතුළත් කර ඇති යම් ලාංඡනයක්, සළකුණක්, අක්ෂරයක්, වචනයක් හෝ ඉලක්කමක්, කිසිම තැනැත්තකු විසින් විරූප කිරීම හෝ කැපීම නොකළ යුතුය.

15. මේ අතුරු ව්‍යවස්ථා පිළිබඳ සෑම උල්ලංඝනය කිරීමක්ම සම්බන්ධයෙන් රුපියල් පන්සිය පනහකට නොවැඩි දඩයකින්ද, ඒ උල්ලංඝනය දිගටම කෙරෙගෙන යන අවස්ථාවක, වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය නොකරන ලෙස අවවාදය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් යවන ලද ලිඛිත දැන්වීමක් භාර කරනු ලැබීමෙන් පසුව ඒ වරද කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් පනහක් නොඉක්මවන අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතුය.

16. (1) යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් තුළ, අවසර පත්‍රයක් නොමැතිව හෝ බලපත්‍රයෙහි යම් කොන්දේසි වලට හෝ නියමයන්ට පටහැනිව හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනයක් ආරම්භ කර හෝ පවත්වා ගෙන යන හෝ යළි ආරම්භ කර ඇති හෝ සම්පූර්ණ කර ඇති අවස්ථාවක, මේ අතුරු ව්‍යවස්ථා යටතේ ඇති වෙනත් ප්‍රතිකර්මයකට අගතියක් නොමැතිව, ප්‍රාදේශීය සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ ප්‍රචාරක ප්‍රදර්ශනය ක්‍රියාත්මක කරන හෝ ක්‍රියාත්මක කළ හෝ ක්‍රියාත්මක කර වූ දවස් සහතව අඩු නොවන්නා වූ දිනයක දී හෝ ඊට පෙර :—

(අ) ඒ ප්‍රචාරක දැන්වීම කඩවුනු සහර කරන ලෙස ; හෝ

(ආ) ඒ ප්‍රචාරක දැන්වීම සඩා දමන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ මිනා දමන ලෙස හෝ

නියම කළ හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ දැන්වීමක් භාර කරනු ලැබූ තැනැත්තකු විසින්, ඒ දැන්වීමෙහි නිශ්චිත කොට දක්වන කාලය ඇතුළත හෝ කාලය දීර්ඝ කරවා ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් පත්‍රයක් මත ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝ කරන යම් කාල සීමාවක් ඇතුළත හෝ ඒ දැන්වීමෙහි දක්වෙන කවර හෝ නියමයක් අනුව කටයුතු කළ යුතු වේ.

(3) (අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ දැන්වීමක් භාරගනු ලැබූ තැනැත්තකු විසින් එහි සඳහන් කාලසීමාව ඇතුළත හෝ ප්‍රාදේශීය සභාව වි ‍..න් ගෙදනු ලැබිය හැකි යම් වැඩිදුර කාලසීමාවක් ඇතුළත, ඒ දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හැරියහොත්, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රචාරක දැන්වීම සහර කිරීමට, කඩා දැමීමට වෙනස් කිරීමට හෝ මකා දැමීමට ප්‍රාදේශීය සභාවට බලයලත් ආඥාවක් කරන ලෙස ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාථමික අධිකරණයකට ඉල්ලීමක් කළ හැකි අතර, අදාළ තැනැත්තාට දැන්වීමක් භාර කරවා, ඔහුට කීමට ඇති කරුණුවලට සවන්දීමෙන් පසුව, ඒ බවට මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම් එසේ ආඥාවක් මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(ආ) (1) වන ඡේදය යටතේ වූ දැන්වීම අනුව කටයුතු කිරීමට ඒ තැනැත්තා සාර්ථක නොවූයේ, ඒ තැනැත්තාට එසේ කටයුතු කිරීමට අවස්ථාවක් පැවතුණු මිණිය යුතුව යයි අදහස් නොකෙරේ නම්, ඒ ආඥාව ක්‍රියාත්මක කිරීමට වැයයන් නොඉක්මවන මුදලක් යයි අදහස් කරන කාලයකට කල් තැබිය හැකි ය.

උපලේඛනය

| | |
|---|---|
| ආදර්ශ අයදුම් පත්‍රය | I වන කොටස |
| බලපත්‍රයක් දීම සඳහා අයකළ යුතු ගාස්තු | II වන කොටස |
| ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සීමාකර ඇති ප්‍රදේශ | III වන කොටස |

40.—වාහන සහ සතුන්

1. වාහන සහ සතුන් පිළිබඳ මේ සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථාවල, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස.—

" පනත " යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අදහස් වේ.

" ආදායම් පරීක්ෂක " යන්නෙන් සභාවේ ආදායම් පරීක්ෂක අදහස් වේ.

2. පනත මගින් නිදහස් කර ඇති වාහන හැර සභාවේ සීමාව ඇතුළත තබාගෙන ඇති සියලු වාහන පිළිබඳව සහ සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවකු හෝ අලියෙකු පිළිබඳ වූ පනතේ 147 වන සහ 148 වන වගන්තිවල විධිවිධාන යටතේ නියමකර ඇති වාර්ෂික බද්ද එක් එක් වර්ෂයේ මාර්තු මස තිස් එක් වැනි දින දී හෝ ඊට පෙර සභාවේ කාර්යාලයට ගෙවිය යුතුය.

3. (1) වාර්ෂික බද්ද ගෙවනු ලැබූ සෑම වාහනයක් සඳහාම, ඒ වාහනයට උචිත වූ සහාව විසින් කන් කාර්යය සඳහා නියම කරනු ලැබිය හැක්කා වූ ද, හඳුනාගැනීමේ අක්ෂරය සහ නිකුත් කරන තහඩුව අදාළ වන වර්ෂය ද, වාහන ලේඛනයේ දැක්වෙන අනුරූප අංකය ද, දැක්වෙන අංක සහිත ලෝහ තහඩුවක් ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කළ යුතුය. තැනැත්තෝ නිකුත් කිරීමට සැලැස්විය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද යම් තහඩුවක්, පාවිච්චිය නිසා හෝ අන් හේතුවක් නිසා හෝ අපැහැදිලි බවට පත් වුවහොත් හෝ විරූප වුවහොත්, එම තහඩුව ප්‍රාදේශීය සභාවට දී රුපියල් භාගයක ගෙවීමක් කළ විට අලුතෙන් තහඩුවක් ලබා ගැනීමට, ඒ තහඩු අයිතිකරුට හිමිකම ඇත්තේ ය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද යම් තහඩුවක් නැතිව හෝ හොරකම් කර ඇති බවට, දිවුරුම් පත්‍රයක් අනුව හෝ අන්‍යාකාරයකින් ප්‍රාදේශීය සභාව සෑහීමට පත්වේ නම් එහි අයිතිකරු විසින් ඉල්ලීම් පත්‍රයක් ඉදිරිපත් කොට ඔහු විසින් රුපියල් භාගයක් ගෙවනු ලැබූ විට, ඒ නැති වූ හෝ හොරකම් කරන ලද තහඩුව වෙනුවට, එහි අයිතිකරුට ප්‍රාදේශීය සභාව විසින් අලුත් තහඩුවක් නිකුත් කළ හැකි ය.

4. (1) 3 වන අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර තහඩුවක් නිකුත් කරනු ලැබූ යම් වාහනයක අයිතිකරු, භාරය හෝ පාලනය දරන තැනැත්තා විසින් ඒ තහඩුව ඒ වාහනයේ ප්‍රකටව පෙනෙන තැනක සවි කිරීමට සැලැස්විය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක්ම රුපියල් පනස්සිය පණහක් නොඉක්මවන දඩයකින් දඬුවම් ලැබීමට යටත් විය යුත්තේ ය.

5. (1) සභාවේ සීමාව ඇතුළත මිනැම පාරක ගමන් කරන මිනැම වාහනයක්, 4 (1) වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලෝහ තහඩුව පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ආදායම් පරීක්ෂකවරයා හෝ යම් පොලිස් නිලධාරියකු හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරාලද වෙනත් යම් නිලධාරියකු විසින් නොමැතරකර රඳවා තබාගැනීම නීත්‍යානුකූල වන්නේය. එවැනි යම් වාහනයක් පදවන්නා හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිවරයාට හෝ ඒ නිලධාරියාට එම පරීක්ෂණය කිරීමට ඉඩ දිය යුතු අතර, අවශ්‍ය විය හැකි සියලු සහයද දිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙක්, රුපියල් සියයක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි වරදක් කරන්නේය.

41.—ගස

1. පොදු පහසු සැලසුම් කාර්යයන් එකක් හෝ වැඩි ගණනක් සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයක්, ප්‍රාදේශීය සභාව විසින් ණයට ගත හැකිය.

(අ) ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ භාරගන්නා ස්ථිර ස්වභාවයක වන යම් වැඩක් ක්‍රියාත්මක කිරීම.

(ආ) ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ භාරගන්නා යම් පොදු සේවාවක් පිහිටුවීම, සම්පූර්ණ කිරීම, වැඩි දියුණු කිරීම, හෝ සංවර්ධනය කිරීම ;

(ඇ) එවැනි යම් වැඩක් හෝ පොදු සේවාවක කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගැනීම ;

(ඇ) එවැනි යම් වැඩක පොදු සේවාවක කාර්යය සඳහා අවශ්‍ය යම් යන්ත්‍ර සූත්‍ර, යන්ත්‍ර ප්‍රධාන හෝ උපකරණ සැපයීම, සහ

(ඈ) ප්‍රාදේශීය සභා පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ යටතේ මුදල් ණයට ගැනීමට සභාවට බලය පැවරී ඇති වෙනත් කවර හෝ කාර්යයක්,

2. සභාව විසින් ණයට ලබා ගන්නා මුදල් ප්‍රමාණයන් සහ ඒවාට උපචිත වන පොලිය ආපසු ගෙවීම සහතික කරනු පිණිස, සභාව විසින් නියම කර අයකර ගන්නා වරිපනම්, බදු සහ බලපත්‍ර ගාස්තු, සභාවට අයත් දේපළ සහ සභාවට උපචිත වන වෙනත් යම් ආදායම් ලැබෙන මාර්ග ද, ඒ ණය මුදල හෝ, මුදල් හෝ ඉන් යම් කොටසක් හෝ දෙනු ලබන්නේ යම් ණයහිමියකු හෝ ණය හිමියන් විසින් ද, නැතහොත් වෙනුවෙන් ද, ඒ ණයහිමියාට හෝ ණය හිමියන්ට, සභාව විසින් උකස් කර පවරා දෙනු ලැබිය හැකිය.

3. කවර හෝ ප්‍රාදේශීය සභාවක් සහ ප්‍රදේශයෙහි කලින් පැවතියා වූ ද, බලතල කාර්ය සහ කර්තව්‍යය, (1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 18 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව) සභාව වෙත පැවරී ඇත්තා වූද, සංවර්ධන සභාව විසින් ලබා ගන්නා ලද ණය වෙනුවෙන් ආපසු ගෙවිය යුතුව තිබෙන මුදල් ප්‍රමාණය ද ඇතුළුව, ප්‍රාදේශීය සභාව විසින් ලබාගත් ණය අවස්ථාවක ඊට පෙරාතුවම වූ වර්ෂ පහ සඳහා නියමිත වරිපනම් බදු, දේපළ සහ වෙනත් ආදායම් මාර්ගවලින් සභාව විසින් ලබා ගන්නා ලද සාමාන්‍ය වාර්ෂික ආදායම මෙන් පහක් ගුණයක් නොඉක්මවිය යුතු අතර, වර්ෂ පහක් පැවති නොමැති ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වන විට, අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව සභාව විසින් තක්සේරු කරන ලද එම එක් එක් වර්ෂයක දළ ආදායම මෙන් දස ගුණයක් නොඉක්මවිය යුතුය.

4. මේ අනුරූ ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයේදී පැවති යම් ප්‍රතිඥාවකට හෝ ඒ දිනයට පෙර ඇති කර ගන්නා ලද යම් ඇපකරයකට ප්‍රතිවිරුද්ධව කිසිවකින් බලපෑමක් නොවන්නේ ය.

5. (1) ප්‍රාදේශීය සභා පනතේ 178 වගන්තිය යටතේ ණයට ලබා ගන්නා ලද සෑම මුදල් ප්‍රමාණයක් ම අවුරුදු තිහක කාලයක් ඇතුළත ආපසු ගෙවිය යුතුය.

(2) 2 වන අනුරූ ව්‍යවස්ථාවේ නිශ්චය කොට දැක්වෙන කාර්යය සඳහා සභාවක් විසින් යම් මුදල් ප්‍රමාණයක් ණයට ගන්නා අවස්ථාවක, එකී ප්‍රතිපාදනයක්, එම වියදම අපරිහානි නොමැතිව පවත්නා කාල සීමාව හෝ එම වියදම දැරීම ආරම්භ වන මුදල් වර්ෂයට පසුව එන මුදල් වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාල සීමාව යන මෙයින් වඩා කෙටි කාල සීමාව සඳහා අන්තර්ගතවන ලෙස ණය හිමියාගේ එකඟත්වය ඇතිව නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

6. (1) සභාව විසින් ලබා ගන්නා ලද ණය මුදල් සහ ප්‍රදේශය ඇතුළත කලින් පැවති සංවර්ධන සභාව විසින් ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීම පිණිස සභාව විසින් සලසන ලද ප්‍රතිපාදන ප්‍රකාශවන වාර්තාවක් සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලැබීමෙන් මාසයක් ඇතුළත සභාවේ ලේකම් වරයා විසින් එම අමාත්‍යවරයාට යැවිය යුතුය.

(2) ණයට ගන්නා ලද මුදල් ප්‍රමාණ පිළිබඳ සියලු විස්තර එම වාර්තාවේ ඇතුළත් විය යුතු අතර, එය ලේකම් වරයා විසින් සහතික කර තිබිය යුතුය.

(3) සභාව විසින්—

(අ) ගෙවිය යුතු යම් වාරිකයක් ගෙවීම හෝ වාර්ෂික ගෙවීමක් හෝ පැහැර හැර ඇති බව ; හෝ

(ආ) යම් ණයක් නිදහස් කිරීම සඳහා යොදා ගත යුතු යම් මුදල් ප්‍රමාණයක් එසේ යොදාගැනීම පැහැර හැර ඇති බව,

මේ අනුරූ ව්‍යවස්ථා යටතේ සපයන ලද යම් වාර්තාවකින් හෝ අන්‍යාකාරයකින් අමාත්‍යවරයාට පෙනී ගිය හොත්, එම පැහැර හැරීම සිදු කර ඇත්තේ යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද, ඒ මුදල වහාම ගෙවන ලෙස අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකිය. අමාත්‍යවරයාගේ එම විධානය අනුව ක්‍රියා කළ විට, සභාව විසින් ඒ බව අමාත්‍යවරයාට දැනුම් දිය යුතුය. අවස්ථානුකූලත්වය අනුව අදාළ යැයි පෙනී ගියහොත්, සභාව විසින් අරමුදලින් ගෙවීම කළ යුතුය.

7. කිසියම් සිද්ධියකට වැය බරක් කළ හැකි වියදමක් දැරීම සඳහා සභාව විසින් ණය මුදලක් ලබා ගනු ලැබූ අවස්ථාවක, එම ණය මුදලේ මුල් මුදල ආපසු ගෙවීම සඳහා හෝ ඒ සඳහා පොලී ගෙවීම සඳහා හෝ අවශ්‍ය මුදල් ප්‍රමාණයක් ඒ සිද්ධියට බර කළ යුතුය.

## උකස් පිළිබඳ විධිවිධාන

8. (1) මේ අනුරූ ව්‍යවස්ථාවල කාර්ය සඳහා, 3 වන අනුරූ ව්‍යවස්ථාවේ නිශ්චය කොට දැක්වෙන උකස ඔප්පුවක් මගින් ඇතිකර ගත යුතුය.

(2) මේ අනුරූ ව්‍යවස්ථා මගින් ඇතිකර ගන්නා උකසකට හිමිකමක් ඇති සෑම තැනැත්තකු විසින් ම එය ඔප්පුවක් මගින් පැවරිය හැකිය.

9. (1) මේ අනුරූ ව්‍යවස්ථා යටතේ සභාව විසින් ඇති කර ගන්නා ලද උකසට තැනැත්තන් දෙදෙනෙකුට හෝ වැඩි ගණනකට හවුලේ හිමිකම් ඇති අවස්ථාවක, සභාවට ප්‍රතිවිරුද්ධ දැන්වීමක් ලිඛිතව දී ඇත්නම් මිස, ඒ උකස සඳහා ගෙවන යම් පොලියක් වෙනුවෙන් ඒ කවර හෝ එක් තැනැත්තකු විසින් බල සහිත රිසිට්පතක් දිය හැකිය.

(2) මේ අනුරූ ව්‍යවස්ථා යටතේ සභාව විසින් ඇති කර ගන්නා ලද උකසක් වෙනුවෙන් බාල වයස්කරුවකුට ගෙවිය යුතු යම් මුදලක් සඳහා ඒ බාල වයස් කරුගේ භාරකරු විසින් දෙන ලද රිසිට්පතක්, සභාවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් වන්නේය.

10. (1) මේ අනුරූ ව්‍යවස්ථා යටතේ, සභාවක් විසින් උකසක් මගින් ණයට ලබා ගන්නා ලද සෑම මුදලක් ම වාර්ෂිකව, හෝ අර්ධ වාර්ෂිකව හෝ ත්‍රෛමාසිකව හෝ මාසික වාරික වලින් හෝ ආපසු ගෙවිය යුතුය.

(2) මේ අනුරූ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් සියලු වාරික, සභාව විසින්, අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

## ණය ගැනීමේ පරිපූරක බලතල

11. (1) 4 වන අනුරූ ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, සභාව විසින්—

(අ) කිසියම් සිද්ධි කාල සීමාවක් වෙනුවෙන් ලැබිය යුතු මුදල් ලැබෙන තෙක්, දැරිය යුතුව ඇති සහ ඒ වියදම් වැය බරක් කළ හැකි සිද්ධි කාල සීමාව තුළ දැරීමට ඇත්තා වූද, ඒ කාල සීමාව සඳහා සභාව විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තුවලදී ගණන් ගෙන ඇත්තා වූ ද වියදම් දැරීමේ කාර්යය සඳහා ; හෝ

(ආ) මේ අනුරූ ව්‍යවස්ථා යටතේ ලබා ගැනීමට සභාවට බලය දී ඇති ණයක් ලබා ගන්නා තෙක් දැරිය යුතු වියදම් දැරීමේ කාර්යය සඳහා බැංකුවකින් හෝ අන්‍යාකාරයකින් තාවකාලික ණයක් හෝ අයිරාවක් වශයෙන්, සභාවට තාවකාලිකව අවශ්‍ය විය හැකි මුදල් ලබා ගත හැකිය.

...වන ඡේදයේ (ආ) විෂයය යටතේ මුදල් ණයට ගනු ලැබූ අවස්ථාවක, ඉන් අනතුරුව ඒ ණය මුදල ලබා ගතහොත්, එවිට, මේ අතුරු ව්‍යවස්ථා පසු ගෙවීම විධිමත් කරන විධිවිධානවල කාර්ය සඳහා, ඉහතකී විෂයය යටතේ ණයට ගන්නා ලද මුදලේ ප්‍රමාණයට, ඒ ණය, එකී ඡේද ...නීම පිළිබඳ අවස්ථාවන් වන විට, ලබාගෙන තිබුණක් සේ සැලකිය යුතුය.

[illegible]) සභාවක් විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පහත සඳහන් කාර්යය, එනම් :—

[illegible]) මේ අතුරු ව්‍යවස්ථා යටතේ සභාව විසින් කලින් ණයට ගන්නා ලද යම් මුදල් සහ සභා ප්‍රදේශය ඇතුළත කලින් පැවති සංවර්ධන සභා විසින් ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවා නිදහස් වීම ;

[illegible]) කලින් ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීම සඳහා සභාවේ වෙනත් මුදල් වලින් පූර්ව දොළොස් මාසය තුළ තාවකාලිකව ලබා ගෙන ඇත්තාවූ ද, එසේ ආපසු ගෙවීම කළ අවස්ථාවේ දී, ණයට ගන්නා මුදලින් ප්‍රතිපෝජනය කිරීමට අදහස් කළාවූ ද, මුදල් ප්‍රතිපෝජනය කිරීම.

...දහා මුදල් ණයට ගත හැකිය. එසේ වුවද, කලින් ණයට ගන්නා ලදුව,

[illegible]) වාරික වලින් හෝ වාර්ෂික ගෙවීම් වලින් ;

[illegible]) ඉවත් කිරීමෙන් ලැබෙන මුදල් වලින් ;

[illegible]) ඒ කාර්යය සඳහා ණයට ගන්නා ලද මුදල් හැර, ආපසු ගෙවීමේ කාර්යය සඳහා නිසි පරිදි යොදාගත හැකි ප්‍රාග්ධන මුදලින් ආපසු ගෙවා ඇති මුදල් ප්‍රතිපෝජනය කිරීමේ කාර්යය සඳහා, මේ නියෝගය යටතේ මුදල් ණයට ගැනීමට සභාවකට බලය නොමැත.

...මේ අතුරු ව්‍යවස්ථා යටතේ ණයට ගන්නා ලද යම් මුදල්, මුදල් ණය මුදලේම කොටසක් වන්නාක් සේ, ආපසු ගෙවීමේ කාර්යය සඳහා සැලකිය ...මිත කාලසීමාවේ නොඉක්මවූ ඉකිවිට ඇති කාලය ඇතුළත ආපසු ගෙවිය යුතුය. තවද, තත්කාලයෙහි මුදල් ණය කෙරෙහි අදාළ වන විධිවිධාන ...ව්‍යවස්ථාව යටතේ ණයට ගන්නා මුදල් කෙරෙහි ද අදාළ විය යුතුය.

...වද, ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීමේ කාල සීමාව දීර්ඝ කරවා ගැනීමේ කාර්යය සඳහා සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ...වරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ණය හිමියා විසින්, මේ නියෝගය යටතේ ණයට ගන්නා ලද මුදල් ආපසු ...ඇති කාල සීමාව, සුදුසු යැයි අමාත්‍යවරයා අදහස් කරන දිනයක් දක්වා දීර්ඝ කළ හැකිය.

## 42 වැදි

...දේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් බද්දක් නියම කිරීමේ හෝ අයකර ගැනීමේ කාර්යය සඳහා ලේකම්වරයාගේ මතය අනුව අවශ්‍ය විය හැකි ...යාව දැන ගැනීම පිණිස, ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියක යම් වාර්තා සපයන ලෙස සහ එසේ නියම කරනු ...යම් තොරතුරු පිළිබඳ ප්‍රකාශයක් කරන ලෙස, ලේකම්වරයා විසින්, ඒ බද්දට යටත් හෝ යටත් වීමට ඉඩ ඇති සියලු තැනැත්තන්ට හෝ ...ප්‍රකාශ යටතේ යම් බද්දක්, නියම කර ඇති හෝ නියම කරනු ලැබිය හැකි යම් දේපළක අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් වන සියලු තැනැ...වියයුතු යැයි ලේකම්වරයා සලකන්නේ නම් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත සියලු ගෘහමූලිකයන්ට හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ...ලැබිය හැකිය.

...මේ අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තකුම, ඒ දැන්වීම භාරදුන් දින සිට දවස් දහහතරක් ඇතුළත, ඒ දැන්වීම මගින් ...සියලු තොරතුරු ලියවිල්ලක් මගින් සැපයිය යුතුය.

...දැන්වීමට ආකෘති පත්‍රයක් යාකර ඇති අවස්ථාවක, ඒ තොරතුරු ඒ ආකෘතියෙහි සැපයිය යුතු අතර, එය ඒ තැනැත්තා විසින් අත්සන් කොට ...ප්‍රාදේශීය සභා කාර්යාලයට එවිය යුතුය; නැතහොත් භාර දිය යුතුය.

...වන 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද දැන්වීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ 1 වන අතුරු ව්‍යවස්ථාවේ ...තොරතුරු සැපයීමට නිශ්චිත නියම කොට ඇති කාලසීමාව ඇතුළත ඒ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ නොසලකා හරින හෝ ...හෝ කිසියම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් තමාගේ දැනීම අනුව අසත්‍ය හෝ නිවැරදි නොවන යම් තොරතුරක් සපයන්නාවූ ...තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සිය පනහක් නොඉක්මවන දඩයකට ද ඒ වරද සම්බන්ධයෙන් නිසි ...බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නවදුරටත් කරගෙන යන එක්වීම් දවස වෙනුවෙන් රුපියල් සියයක් ...වන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

මේ අතුරු ව්‍යවස්ථාවල "ලේකම්වරයා" යන්නෙන් .......................................... ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා අදහස් වන්නේය.

(3) (1) වන ඡේදයේ (ආ) විෂයය යටතේ මුදල් ණයට ගනු ලැබූ අවස්ථාවක, ඉන් අනතුරුව ඒ ණය මුදල ලබා නොගතහොත්, එවිට, මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ ණය ආපසු ගෙවීම පිණිස කරන විධිවිධානවල කාර්ය සඳහා, දෙවැනි විෂයය යටතේ ණයට ගන්නා ලද මුදලේ ප්‍රමාණයට, ඒ ණය, එකී ආදාළ යටතේ ණය ගැනීම සිදුවූ අවස්ථාවන් වන විට, ලබාගෙන තිබුණේ සේ සැලකිය යුතුය.

12. (1) සභාවක් විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පහත සඳහන් කාර්යය, එනම් :—

(අ) මේ අතුරු ව්‍යවස්ථා යටතේ සභාව විසින් කලින් ණයට ගන්නා ලද යම් මුදල් සහ සභා ප්‍රදේශය ඇතුළත කලින් පැවති සංවර්ධන සභා විසින් ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවා නිදහස් වීම ;

(ආ) කලින් ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීම සඳහා සභාවේ වෙනත් මුදල් වලින් පූර්ව දොළොස් මාසය තුළ තාවකාලිකව ලබා ගෙන ඇත්තේ නම් ද, එසේ ආපසු ගෙවීම කළ අවස්ථාවේ දී, ණයට ගන්නා මුදලින් ප්‍රතිපෝෂණය කිරීමට අදහස් කරන්නේ ද, මුදල් ප්‍රතිපෝෂණය කිරීම,

යන කාර්යය සඳහා මුදල් ණයට ගත හැකිය. එසේ වුවද, කලින් ණයට ගන්නා ලදුව,

(අ) වාරික වලින් හෝ වාර්ෂික ගෙවීම් වලින් ;

(ආ) ඉඩම් විකිණීමෙන් ලැබුණු මුදල් වලින් ;

(ඇ) ඒ කාර්යය සඳහා ණයට ගන්නා ලද මුදල් හැර, ආපසු ගෙවීමේ කාර්යය සඳහා නිසි පරිදි යොදාගත හැකි ප්‍රාග්ධන මුදලින් ආපසු ගෙවා ඇති මුදල් ප්‍රතිපෝෂණය කිරීමේ කාර්යය සඳහා, මේ නියෝගය යටතේ මුදල් ණයට ගැනීමට සභාවකට බලය නොමැත.

(2) මේ අතුරු ව්‍යවස්ථා යටතේ ණයට ගන්නා ලද යම් මුදල්, මුල් ණය මුදලේම කොටසක් වන්නාක් සේ, ආපසු ගෙවීමේ කාර්යය සඳහා සැලකිය යුතු අතර, නියමිත කාලසීමාවේ නොගෙවී ඉතිරිව ඇති කාලය ඇතුළත ආපසු ගෙවිය යුතුය. තවද, තත්කාලයෙහි මුල් ණය කෙරෙහි අදාළ වන විධිවිධාන මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ණයට ගන්නා මුදල් කෙරෙහි ද අදාළ විය යුතුය.

එසේ වුවද, ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීමේ කාල සීමාව දීර්ඝ කරවා ගැනීමේ කාර්යය සඳහා සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් පත්‍රයක් මත අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ණය හිමියා විමසා, මේ නියෝගය යටතේ ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීම සඳහා ඇති කාල සීමාව, සුදුසු යැයි අමාත්‍යවරයා අදහස් කරන දිනයක් දක්වා දීර්ඝ කළ හැකිය.

### 42 වැනි

1. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් බද්දක් නියම කිරීමේ හෝ අයකර ගැනීමේ කාර්යය සඳහා ලේකම්වරයාගේ මතය අනුව අවශ්‍ය විය හැකි තොරතුරු නිසැකව දැන ගැනීම පිණිස, ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියක යම් වාර්තා සකසා ලෙස සහ එසේ නිශ්චය කරනු ලැබිය හැකි යම් තොරතුරු පිළිබඳ ප්‍රකාශයක් කරන ලෙස, ලේකම්වරයා විසින්, ඒ බද්දට යටත් හෝ යටත් වීමට ඉඩ ඇති සියලු තැනැත්තන්ට හෝ ප්‍රාදේශීය සභා පනත යටතේ යම් බද්දක් නියම කර ඇති හෝ නියම කරනු ලැබිය හැකි යම් දේපළක අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් වන සියලු තැනැත්තන්ට හෝ, අවශ්‍ය යැයි ලේකම්වරයා සලකන්නේ නම් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත සියලු ගෘහමූලිකයන්ට හෝ ලියාපදිංචි තැපෑලෙන් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකිය.

2. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තෙකුම, ඒ දැන්වීම භාර ලැබූ දවස් දහයක් ඇතුළත, ඒ දැන්වීම මගින් ඉල්ලා ඇති සියලු තොරතුරු ලියවිල්ලක් මගින් සැපයිය යුතුය.

3. ඒ දැන්වීමට ආකෘති පත්‍රයක් යාකර ඇති අවස්ථාවක, ඒ තොරතුරු ඒ ආකෘතියෙහි සැපයිය යුතු අතර, එය ඒ තැනැත්තා විසින් අත්සන් කොට නැවත යොදා ප්‍රාදේශීය සභා කාර්යාලයට එවිය යුතුය; නැතහොත් භාර දිය යුතුය.

4. තමා වෙත 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද දැන්වීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ 1 වන අතුරු ව්‍යවස්ථාවේ දී ඉල්ලා ඇති තොරතුරු සැපයීමට නිශ්චිත නියම කොට ඇති කාලසීමාව ඇතුළත ඒ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ නොසලකා හරින හෝ නිකර හරින හෝ කිසියම් වැදගත් විස්තරයක් පමිණිස් වීමෙන් තමාගේ දැනීම අනුව අසත්‍ය හෝ නිවැරදි නොවන එම තොරතුරක් සපයන්නා වූ හෝ තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ද ඒ වරද සම්බන්ධයෙන් නිසි විනිශ්චය බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නවතුරුවත් කරගෙන යන එක් එක් දවස වෙනුවෙන් රුපියල් සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

5. මේ අතුරු ව්‍යවස්ථාවල "ලේකම්වරයා" යන්නෙන් .............................................. ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා අදහස් වන්නේය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.